228 වන කාණ්ඩය - 06 වන කලාපය
தொகுதி 228 - இல. 06
Volume 228 - No. 06

2014 අගෝස්තු 20 වන බදාදා
2014 ஓகஸ்ட் 20, புதன்கிழமை
Wednesday, 20th August, 2014

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**කල්තැබීමේ ප්‍රශ්න**

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**இலங்கை சமுத்திரப் பல்கலைக்கழகச் சட்டமூலம் :**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**ஒத்திவைப்பு வினாக்கள்**

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

OCEAN UNIVERSITY OF SRI LANKA BILL:
Read a Second and the Third time, and passed as amended

ADJOURNMENT QUESTIONS

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2014 අගෝස්තු 20 වන බදාදා***
*2014 ஓகஸ்ட் 20, புதன்கிழமை*
*Wednesday, 20th August, 2014*

**අ.භා.1.00 ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012 වර්ෂය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත දැක්වෙන වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2011 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2011 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2011 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(iv) 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(v) 2012 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(vi) 2012 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(vii) 2012 වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 8 වන වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2013 වර්ෂය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2013 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව.- [ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2013 වර්ෂය සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව; සහ
2013 වර්ෂය සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [සමාජ සේවා අමාත්‍යතුමා වෙනුවට ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2013 වර්ෂය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [ජාතික උරුමයන් අමාත්‍යතුමා වෙනුවට ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Petroleum Industries)

ගරු කථානායකතුමනි, දුම්මලසූරිය, හතරමංහන්දිය, පිනැන්ස් වත්ත, 3 වන පටුමග යන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එස්.ඉන්දික මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු දුමින්ද දිසානායක මහතා (අධ්‍යාපන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - கல்விச் சேவைகள் அமைச்சர்)
(The Hon. Duminda Dissanayake - Minister of Education Services)

ගරු කථානායකතුමනි, අනුරාධපුර, උපුල්දෙනිය, රත්මලේ යන ස්ථානයෙහි පදිංචි රන්ජන් ඒ. කුලතුංග මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, වැල්ලවාය, ඇතලිවැව, තෙලුල්ල ජනපදය, ආර් 67 දරන ස්ථනයෙහි පදිංචි ඩී.එස්. දසනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

ගරු කථානායකතුමනි. පොතුහැර, එගොඩකැලේ වත්ත, අංක 17 දරන ස්ථානයෙහි පදිංචි ජේ. මල්ලිකා දයාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## "මිල්කෝ" ආයතනය: දූෂණ
## 'மில்கோ' நிறுவனம்: ஊழல்கள்
## "MILCO" COMPANY : CORRUPTION

2679/'12

**1. ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) \`මිල්කෝ' ආයතනයේ උසස් බලධාරින් කීප දෙනකු එකතු වී, මෙරට කිරි නිෂ්පාදනය සහමුලින්ම වනසා දැමීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බවත්;

(ii) ඔවුන් මීට මාස කීපයකට පෙර, ආයතනයේ සියලු වත්කම් ඇපයට තබා, රුපියල් මිලියන 700ක් වැය කර, දියර කිරි පැකට් සැකසුම් යන්ත්‍ර 2ක් ආනයනය කර ඇති බවත්;

(iii) නැවතත් රුපියල් මිලියන 40ක පමණ ණයක් ගෙන, යන්ත්‍රෝපකරණ ගෙන්වීමට මිල්කෝ සමාගම සැරසෙන බවත්;

(iv) පසු ගිය දෙසැම්බර් මාසයේ සිට මේ දක්වා එම ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට බැර විය යුතු මුදල ගෙවා නැති බවත්;

(v) එහි සැපැයුම්කරුවන්ට රුපියල් මිලියන 100කට අධික මුදලක් ණය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දූෂිත බලධාරින්ට එරෙහිව කටයුතු කොට \`මිල්කෝ' ආයතනය රැක ගැනීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கால்நடை வளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'மில்கோ' நிறுவனத்தின் உயர் அதிகாரிகள் சிலர் ஒன்றிணைந்து இந்நாட்டின் பால் உற்பத்தியை முற்றாக ஒழிப்பதற்கான வேலைத்திட்டமொன்றை அமுல்படுத்துகின்றார்கள் என்பதையும்;

(ii) அவர்கள் சில மாதங்களுக்கு முன்னர், நிறுவனத்தின் சகல சொத்துக்களையும் பிணையாக வைத்து, ரூபா 700 மில்லியனைச் செலவிட்டு, \`திரவப் பால்' பொதிசெய்யும் 2 இயந்திரங்களை இறக்குமதி செய்துள்ளார்கள் என்பதையும்;

(iii) மீண்டும் சுமார் ரூபா 40 மில்லியன் கடனாகப் பெறப்பட்டு, இயந்திர சாதனங்களைக் கொள்வனவு செய்வதற்கு \`மில்கோ' நிறுவனம் தயாராகி வருகின்றது என்பதையும்;

(iv) கடந்த டிசம்பர் முதல் இதுவரை மேற்படி நிறுவனம் ஊழியர் சேமலாப நிதியம் மற்றும் ஊழியர் நம்பிக்கை பொறுப்பு நிதியத்திற்கு வரவுவைக்க வேண்டிய பணத்தொகைகளைச் செலுத்தியிருக்கவில்லை என்பதையும்;

(v) அதன் வழங்குனர்களுக்கு ரூபா 100 மில்லியனுக்கும் அதிகமான பணத்தொகைகளைக் கடன்பட்டுள்ளார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) ஊழல்மிக்க அதிகாரிகளுக்கு எதிராக நடவடிக்கை மேற்கொண்டு \`மில்கோ' நிறுவனத்தைப் பாதுகாக்க நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Livestock and Rural Community Development:

(a) Is he aware that -

(i) several higher authorities of "MILCO" have got together and executing a scheme to totally destroy the milk production of the country;

(ii) they have pledged all assets of the institution a few months ago and imported 2 machines for packing liquid milk spending Rs. 700 million;

(iii) MILCO Company is set to bring down machinery, having again obtained a loan of about Rs. 40 million;

(iv) the institution has defaulted the dues to be credited to the Employees' Provident Fund and the Employees' Trust Fund from last December up to now; and

(v) it owes over Rs. 100 million to its suppliers?

(b) Will he inform this House whether steps will be taken to protect MILCO Company by taking action against corrupt officials?

(c) If not, why?

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
ගරු කථානායකතුමනි, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පිළිගත නොහැක.

(ii) නැත.

(iii) නැත.

(iv) ගෙවීම් සිදු කර ඇත.

(v) ණය වී නැත.

(ආ) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමන්ලා 2011 වර්ෂයේදී නවීන යන්ත්‍ර දෙකක් මිල දී ගත්තා. ඒවා වසර 10ක් පැරැණි යන්ත්‍ර. එම යන්ත්‍රයක වෙළෙඳ පොළේ මිල රුපියල් මිලියන 220යි. නමුත් ඔබතුමන්ලා යන්ත්‍රයකට ගෙවලා තිබෙනවා, රුපියල් මිලියන 357ක්. මම අහන්න කැමැතියි, මේ වාගේ දූෂිත ගනුදෙනු ක්‍රියාත්මක කරන්නට ඔබතුමන්ලා අනුබල දෙන්නේ ඇයි කියලා.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
එය සම්පූර්ණ අසත්‍යයක්. මෙය පිළිගත නොහැකි කාරණයක්, ගරු කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමාට ඒ කාරණය පිළිගන්නට බැරි වුණත්, ඒක තමයි සත්‍යය.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
අහලා තිබෙන ප්‍රශ්නයත් වැරැදියි. ඔබතුමා වර්ෂය මොකක්ද කියලාත් කියලා නැහැ. මට උත්තර දෙන්න තිබුණා. නමුත් ඔබතුමා ප්‍රශ්නය අහලා තිබෙන විධියට මට උත්තර දෙන්න බැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අහලා තිබෙන ප්‍රශ්නයට අදාළවයි, මම අතුරු ප්‍රශ්න අහන්නේ.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ඔබතුමා අහපු ප්‍රශ්නයේ කාල වකවානුවක් සඳහන් කරලා නැහැ. ඒකයි ප්‍රශ්නය වුණේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කාල වකවානුව සඳහන් නොකළත් මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ රට කිරිවලින් ස්වයංපෝෂිත කරනවාය කියලා ප්‍රකාශයට පත් කළත් විශේෂයෙන් මේ වාගේ නාස්තිකාර ගනුදෙනු තුළින් අපේ රටට ඉමහත් හානියක් සිද්ධ කරන්නට ඔබතුමන්ලා කටයුතු කරන්නේ ඇයි කියන එක ගැන.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු කථානායකතුමනි, ඉමහත් හානිය සිද්ධ කළේ එක්සත් ජාතික පක්ෂයයි. නවසීලන්තයෙන් කිරි පිටි ආනයනය කිරීම ආරම්භ කළේ එක්සත් ජාතික පක්ෂයයි, අප නොවෙයි. අප බලයට එන විට දේශීය කිරි නිෂ්පාදනය සියයට 20ක් වැනි මට්ටමක තිබුණේ. අද වන විට දේශීය කිරි නිෂ්පාදනය සියයට 40කට ආසන්න වෙලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා මේ රටේ කිරි ස්වයංපෝෂිතභාවය ඔය තරමටම තහවුරු කළා නම්, රටේම පාසල්වල දරුවන්ට ලබා දෙනවා කියපු කිරි වීදුරුව තවමත් ලබා නොදෙන්නේ ඇයි?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු කථානායකතුමනි, මේ කිරි වීදුරුව දීම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, පාසල්වලට කිරි ප්‍රවාහනය කිරීමේ දුෂ්කරතාවක් තිබෙනවා. විශාල දුර ප්‍රමාණවල සිට කිරි ප්‍රවාහනය කිරීමේ ගැටලු තිබෙනවා. ඒකට ක්‍රමවේදයක් සකස් කර ගන්නා තුරු ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපහසුයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් කාලය අවසානයි. ඔබතුමා අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි නේ.

## ස්ත්‍රී දූෂණ සහ ස්ත්‍රී ඝාතන සම්බන්ධ වරදකරුවන් : දඬුවම්

கற்பழிப்பு மற்றும் பெண் கொலைகள் தொடர்பான குற்றவாளிகள்: தண்டனை

INDIVIDUALS CONVICTED FOR RAPE AND MURDER: PUNISHMENTS

3330/'12

**3.** **ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) වර්ෂ 2008-2012 කාල සීමාව තුළ,

(i) ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් වරදකරුවන් බවට පත් වී ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) ස්ත්‍රී ඝාතන සම්බන්ධයෙන් වරදකරුවන් බවට පත් වී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාව තුළ ස්ත්‍රී දූෂණ හා ස්ත්‍රී ඝාතනවලට අදාළව වරදකරුවන් බවට පත්වූ, දේශපාලනයට සම්බන්ධ පුද්ගලයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වරදකරුවන් වෙත ලබා දී ඇති දඬුවම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) 2008ஆம் ஆண்டு தொடக்கம் 2012ஆம் ஆண்டு வரையிலான காலத்தில்,

(i) கற்பழிப்பு தொடர்பில் குற்றவாளிகளான வர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) பெண் கொலைகள் தொடர்பில் குற்றவாளி களானவர்களின் எண்ணிக்கை என்பதையும்

வருடாந்தம் வெவ்வேறாக குறிப்பிடுவாரா?

(ஆ) (i ) குறிப்பிட்ட காலப்பகுதியில் கற்பழிப்பு மற்றும் பெண் கொலைகள் தொடர்பில் குற்றவாளி களாகக் காணப்பட்ட அரசியலுடன் தொடர்புடைய நபர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு என்பதையும்,

(ii) இக்குற்றவாளிகளுக்கு வழங்கப்பட்டுள்ள தண்டனை யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state separately -

(i) the number of individuals convicted for rape; and

(ii) the number of individuals convicted for murdering women;

(iii) in each of the years between 2008 and 2012?

(b) Will he inform this House -

(i) separately, of the number of individuals connected to politics who were found guilty of rape and murder of women during the above period of time; and

(ii) the punishments meted out to those offenders?

(c) If not, why?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

| වර්ෂය | ස්ත්‍රී දූෂණ සම්බන්ධව වරදකරුවන් බවට පත්ව ඇති සංඛ්‍යාව |
|---|---|
| 2008 | 158 |
| 2009 | 98 |
| 2010 | 86 |
| 2011 | 52 |
| 2012 | 60 |

(ii)

| වර්ෂය | ස්ත්‍රී ඝාතන සම්බන්ධව වරදකරුවන් බවට පත්ව ඇති සංඛ්‍යාව |
|---|---|
| 2008 | 16 |
| 2009 | 13 |
| 2010 | 08 |
| 2011 | 03 |
| 2012 | - |

(ආ) (i) ඉහත කාල සීමාව තුළ ස්ත්‍රී දූෂණ හා ස්ත්‍රී ඝාතනවලට වරදකරුවන් බවට පත් වී ඇති පුද්ගලයින් දේශපාලනයට සම්බන්ධ බවට කරුණු අනාවරණය වී නොමැත.

(ii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්ව ආකාරයට මේ වන කොට ස්ත්‍රී දූෂණවලට සහ ඝාතනවලට සම්බන්ධ වූ අයගේ සංඛ්‍යාව 700 ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. ගරු කථානායකතුමනි, නමුත් මේ වන කොට ස්ත්‍රී දූෂණ සහ ඝාතනවලට සම්බන්ධව හිර දඬුවම් ලබන සංඛ්‍යාව 617යි කියලා වාර්තාගත වෙලා තිබෙනවා. මේකට හේතුවක් තිබෙනවාද? ඒ කියන්නේ ඇප මත නිදහස් වූ අය ඉන්නවාද, ඒ අය මොන පදනමක් මතද නිදහස් කර තිබෙන්නේ? ඔබතුමා හරියාකාරව ඒ පිළිබඳව දන්නවාද? ඒ අනුව මගේ පළමු වන අතුරු ප්‍රශ්නය, කී දෙනෙකු මේ වන කොට හිර දඬුවම් විඳිනවාද කියන එකයි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒ කියන්නේ ස්ත්‍රී දූෂණවලට සම්බන්ධවද?

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ඔව්, මගේ ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් මේක.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඔබතුමියගේ ප්‍රශ්නයෙන් ආවරණය වෙන්නේ 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වන කාල සීමාව පමණක්ය කියන කාරණය මම කියන්න ඕනෑ. එම කාලය තුළ කිසිම දේශපාලනඥයෙක්-

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
දේශපාලනඥයින් ගැන නොවෙයි මම අහන්නේ. ප්‍රශ්නයේ පළමුවැනි කොටසට අදාළව මම අහන්නේ.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ස්ත්‍රී ඝාතන සම්බන්ධව වරදකරුවන් බවට පත්ව ඇති සංඛ්‍යාව මම කිව්වා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මේ වන කොට කී දෙනෙකු ඇත්තටම දඬුවම් ලබනවාද? ස්ත්‍රී දූෂණවලට සහ ස්ත්‍රී ඝාතනවලට වරදකරුවන් වූ අය කී දෙනෙකු මේ වන කොට හිර ගෙදර ඉන්නවාද කියන්න, ගරු ඇමතිතුමනි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒ සංඛ්‍යා ලේඛන නම් මා ළඟ නැහැ. දැනට මම ඉදිරිපත් කළේ - [බාධා කිරීමක්] කී දෙනෙක්ද කිව්වාම සංඛ්‍යාව නේ අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමියගේ ප්‍රශ්නය පැහැදිලිව ඇහුවොත් හොඳයි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඔව්, ඔබතුමිය මගෙන් අහන්නේ සංඛ්‍යාව නේ. ඔබතුමිය ප්‍රධාන ප්‍රශ්නයෙන් අහලා තිබුණ ඒවාට අදාළ සංඛ්‍යාව මම දුන්නා. ගරු මන්ත්‍රීතුමියනි, වරදකරුවන් බවට පත් වුණු සංඛ්‍යාව මම කිව්වා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ඒ කිව්ව සංඛ්‍යාව දැනට හිරේ ඉන්නවාද?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
වරදකරුවන් බවට පත් වුණු සංඛ්‍යාව කාණ්ඩ දෙකයි. එකක් ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන්. අනෙක් කාණ්ඩය ස්ත්‍රී මරණ සම්බන්ධයෙන්.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ඔබතුමා කියනවා දේශපාලනඥයන් කිසි කෙනෙක් වරදකරුවන් බවට පත් වෙලා නැහැයි කියලා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඔව්, 2008 ඉඳලා 2012 දක්වා. 2008 ඉඳලා 2012 දක්වා අවුරුදු හතර තුළ කිසිම දේශපාලනඥයෙක් මේ වැරදි දෙකට දඬුවම් ලබලා නැහැ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මේ කාල සීමාව තුළ වරදකරුවන් බවට පත් වුණු, නඩු හබවලට සම්බන්ධ වෙලා තිබෙන අයගේ නාම ලේඛනයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමිය අසා තිබෙන ප්‍රශ්නයට දී තිබෙන පිළිතුර අනුව පැන නඟින අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
අවාසනාවට ඔබතුමිය බලාපොරොත්තු වන උත්තරය ලැබෙන්නේ නැහැ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, දේශපාලනඥයන් නැහැයි කිව්වාට, දේශපාලනඥයන් ඉන්නවා. ඒක වාර්තාගත වෙලා තිබෙනවා. පුවත් පත්වල පළ වුණා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
කවුද ඒ? ඉදිරිපත් කරන්න.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මම මේ ලේඛනය **සභාගත*** කරනවා. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නයත් ඇහුවා, දෙකත් ඇහුවා, දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, එහෙම නම් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න අවසර දෙන ලෙස මම කාරුණිකව ඉල්ලනවා. ගරු ඇමතිතුමනි, වරදකරුවන් බවට පත් වුණු දේශපාලනඥයන්ට ලබා දෙන දඬුවම මොකක්ද? එවැනි දේශපාලනඥයන් මාසයකට පක්ෂ සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වෙලා නැවත දේශපාලනය කරන බව අපි තවමත් දකිනවා. දේශපාලනඥයන් වරදකරුවන් බවට පත් වුණාම ඒ අයට නැවත වාරයක් දේශපාලනය කරන්න බැරි වන විධියේ ක්‍රමවේදයක් තිබෙනවාද?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒ ගැන මම පොදුවේ කියන්නම්. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරු දෙන්න ගරු ඇමතිතුමා ඉන්නවා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
කෙනෙක් වරදකරුවකු වීම නිසා ඔහුට දඬුවමක් -සිර දඬුවමක් වැනි- ලැබුණොත් එක්තරා කාල සීමාවකට වඩා ඔහු ඒ දඬුවම භුක්ති වින්දා නම් ඔහුට පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන්න බැරිකමක් තිබෙනවා. නීතිමය බාධාවක් තිබෙනවා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමිය අහගෙන ඉන්න. ඔබතුමිය කථා කරනවා නේ.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
දේශපාලනය කරන්න බාධාවක් නැහැ. දේශපාලනය කරන්න පුළුවන්. පාර්ලිමේන්තු මැතිවරණයකට ඉදිරිපත් වෙන්න බැහැ. ඒ බාධාව තිබෙනවා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු ඇමතිතුමනි, මගේ යෝජනාව තමයි දේශපාලනඥයෝ ගැවිලා ඉන්නවා නම් -[බාධා කිරීම්]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
එතුමිය යෝජනාවක් කරනවා. අපට ඒක පසුව සලකා බලන්න පුළුවන්. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ යෝජනාව ගැන අපට සලකා බලන්න පුළුවන්.

## පිළිකා රෝගය නිසා සිදුවන මරණ අවම කිරීම : ක්‍රියා මාර්ග

புற்றுநோய் மரணங்களைக் குறைத்தல்: நடவடிக்கை
MINIMIZING OF CANCER-RELATED DEATHS : MEASURES TAKEN

3923/'13

**4. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 1985, 1995, 2005 සහ 2012 යන එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවේ,

(i) පිළිකා රෝගවලට ගොදුරු වී ඇති වයස මාස 01ත් - අවුරුදු 18ත් අතර දරුවන් සංඛ්‍යාව;

(ii) පුද්ගලයින් ලක්ෂයකට සාපේක්ෂව පිළිකා රෝගයට ගොදුරු වූ පුද්ගලයින් සංඛ්‍යාව;

(iii) කාන්තාවන් ලක්ෂයකට සාපේක්ෂව පිළිකා රෝගය වැළඳී ඇති කාන්තාවන් සංඛ්‍යාව;

(iv) පුරුෂයින් ලක්ෂයකට සාපේක්ෂව පිළිකා රෝගය වැළඳී ඇති පුරුෂයින් සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂිකව සිදුවන මරණ සංඛ්‍යාවෙන් පිළිකා නිසා මිය යන සංඛ්‍යාව කොපමණද;

(ii) එම තත්ත්වය අවම කිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) 1985, 1995, 2005 மற்றும் 2012 ஆகிய ஒவ்வொரு வருடத்திலும் இலங்கையில்,

(i) புற்றுநோய்க்கு இரையாகியுள்ள 01 மாதத் திற்கும் - 18 வருடத்திற்கும் இடைப்பட்ட வயது டைய பிள்ளைகளின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) ஓர் இலட்சம் பேரில் ஒப்பீட்டளவில் எத்தனை பேர் புற்றுநோய்க்கு இரையாகியுள்ளனர் என்ப தையும்;

(iii) ஓர் இலட்சம் பெண்களில் ஒப்பீட்டளவில் எத்தனைப் பெண்களுக்கு புற்றுநோய் பீடித் துள்ளதென்பதையும்;

(iv) ஓர் இலட்சம் ஆண்களுக்கு ஒப்பீட்டளவில் எத்தனை ஆண்களுக்கு புற்றுநோய் பீடித்துள்ள தென்பதையும்

வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) இலங்கையில் வருடாந்தம் மரணிப்பவர்களின் எண்ணிக்கையில் புற்றுநோய் காரணமாக மரணிப்பவர்களின் எண்ணிக்கை யாதென்பதை யும்;

(ii ) இந்நிலைமையைக் குறைப்பதற்கு தற்போது மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state separately -

(i) the number of children affected with cancer, who are between the age of one month to 18 years;

(ii) the number of individuals affected with cancer per 100,000 individuals;

(iii) the number of females affected with cancer per 100,000 females; and

(iv) the number of males affected with cancer per 100,000 males;

(v) in each of the years 1985, 1995, 2005 and 2012 in Sri Lanka?

(b) Will he inform this House -

(i) the number of cancer-related deaths out of the number of annual deaths in Sri Lanka; and

(ii) the measures taken so far with a view to minimizing the aforesaid situation?

(c) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මං එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

| පිළිකා රෝගවලට ගොදුරු වී ඇති මාස 01ත් අවුරුදු 18ත් අතර දරුවන් සංඛ්‍යාව | 1985 | 1995 | 2005 | 2012 |
|---|---|---|---|---|
| | 283 | 341 | 523 | 677 |

(ii)

| පුද්ගලයන් ලක්ෂයකට සාපේක්ෂව පිළිකා රෝගයට ගොදුරු වූ පුද්ගලයන් සංඛ්‍යාව | 1985 | 1995 | 2005 | 2012 |
|---|---|---|---|---|
| | 5,012 | 7,325 | 13,372 | 12,550 |

(iii)

| කාන්තාවන් ලක්ෂයකට සාපේක්ෂව පිළිකා රෝගය වැළඳී ඇති කාන්තාවන් සංඛ්‍යාව | 1985 | 1995 | 2005 | 2012 |
|---|---|---|---|---|
| | 2,448 | 3,875 | 7,314 | 7,953 |

(iv)

| පුරුෂයින් ලක්ෂයකට සාපේක්ෂව පිළිකා රෝගය වැළඳී ඇති පුරුෂයින් සංඛ්‍යාව | 1985 | 1995 | 2005 | 2012 |
|---|---|---|---|---|
| | 2,564 | 3,450 | 6,058 | 4,578 |

(ආ) (i)

| වර්ෂය | මුළු මරණ ප්‍රමාණය | පිළිකා නිසා මිය ගිය සංඛ්‍යාව | පිළිකා මරණ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 2009 | 127,776 | 11.286 | 8.8% |

(ii) පිළිකා මර්දනයට අපි ගෙන ඇති ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් තිබෙනවා. එය ඇමුණුමෙහි සඳහන් වෙනවා. එම ඇමුණුම **සභාගත*** කරනවා.

(ඇ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

ඇමුණුම

පිළිකා මර්දනයට ගෙන ඇති ක්‍රියාමාර්ග

01. සියලු පිළිකා මර්දනය කිරීමේ පාර්ශවයන්ගේ අදහස් විමසා ශ්‍රී ලංකාවේ පිළිකා මර්දනයට හා පාලනයට ජාතික ප්‍රතිපත්තියක් 2014 දී පිළියෙල කිරීම.

02. පිළිකා මර්දනය හා පාලනය සඳහා වූ ජාතික කමිටුවක් ඇති අතර. එමගින් ඉහත සඳහන් කල ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලැබේ. ජාතික පිළිකා මර්දන වැඩසටහන මෙහි ප්‍රධාන පාර්ශවකරුවෙකු වේ.

03. ජාතික හා පළාත් මට්ටමින් පිළිකා මර්දනයට ගෙන ඇති ක්‍රියාමාර්ග

i. ප්‍රාථමික නිවාරණය

- මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පිළිකා මර්දනය / පාලනය සඳහා ජංගම ප්‍රදර්ශන පැවැත්වීම
- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ii. පිළිකා මර්දනය සඳහා වූ සෞඛ්‍ය උපදෙස් පත්‍රිකා පිළියෙල කිරීම හා බෙදාහැරීම.

iii. විවිධ මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීම.

iv. පිළිකා මර්දනයට සහය වන සෞඛ්‍ය නිලධාරින්ට තාක්ෂණික සහාය ලබාදීම.

- ජාතික පරමාණු බල ශක්ති අධිකාරිය හා එක්ව පිළිකා රෝගය නිර්ණය හා ප්‍රතිකාර හා සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල සඳහා විදේශීය පුහුණු වැඩසටහන් වලට යොමු කර ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.
- පිළිකා මර්දනය සඳහා පුහුණු පොත්පත් මුද්‍රණය කර ලබාදීම.
- මුඛ පිළකා හා පියයුරු පිළිකා සඳහා සෞඛ්‍ය සේවකයන්ට අත්පොත් මුද්‍රණය කර ලබාදීම.
- ස්ත්‍රී ප්‍රජනන පද්ධතිය ආශ්‍රිත පිළිකා රෝග සඳහා විශේෂඥ වෛද්‍යවරුන්ට අත්පොත් මුද්‍රණය කර ලබාදීම.

v. පිළිකා පූර්ව හඳුනාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

- වෛද්‍යවරුන්ට හා හෙදියන්ට නවතම පිළිකා හඳුනාගැනීමේ ක්‍රම ගැන විදේශ පුහුණුව ලබාදීම.
- යාපනය ශික්ෂණ රෝහලේ බඩවැල් ආශ්‍රිත පිළිකා හඳුනා ගැනීමේ අංශයක් ස්ථාපිත කිරීම.
- මුඛ පිළිකා හඳුනාගැනීමේ වැඩසටහන් දීප ව්‍යාප්තව සිදුකිරීම.
- සෑම පළාතකම පිළිකා හඳුනා ගැනීම සඳහා වර්ෂයකට වැඩසටහන් 10 ක් ක්‍රියාත්මක කිරීම.
- ජංගම හා දීප ව්‍යාප්තව පිළිකා හඳුනා ගැනීම සිදුකිරීම.

vi. පිළිකා රෝගීන්ගේ සුබසාධනය සහ පුනරුත්ථාපනය. පිළිකා සම්බන්ධ පර්යේෂණ කිරීම. සියලු රෝහල්වල පිළිකා සායන වැඩි දියුණු කිරීම හා නව සායන ස්ථාපිත කිරීම.

vii. පිළිකා සඳහා ප්‍රතිකාර කිරීමට අවශ්‍ය වන නවීන උපකරණ(ගැමා කිරණ යන්ත්‍ර. CT ස්කෑනර් යන්ත්‍ර වැනි) රෝහල්වලට ලබාදීමට කටයුතු කිරීම.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා පිළිකා රෝගීන් සම්බන්ධයෙන් දුන්නු දත්ත අනුව හරි පැහැදිලියි, 1980 දශකයේ සහ 1990 දශකයේ පිළිකා රෝගීන් සංඛ්‍යාවට සාපේක්ෂව 2000 ඉඳලා 2010 වෙන කල් දශකයේත්, ඒ වාගේම 2010න් පස්සේ මේ ගමන් කරමින් තිබෙන දශකයේත් පිළිකා රෝගීන් පෙර දශකයන්ට වඩා ආසන්න වශයෙන් දෙගුණයක වැඩිවීමක් වෙලා තිබෙනවා කියන එක. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරෙන් කියනවා රටේ සමස්ත මරණ සංඛ්‍යාවෙන් සියයට 8.8ක් පිළිකා රෝගයට අදාළ මරණ කියලා. ප්‍රතිශතයක් විධියට ඒකත් වැඩියි. කාන්තා රෝගීන් පිළිකාවලින් මිය යෑමට එරෙහිව -මම කියන්නේ රෝගයට ගත් ක්‍රියාමාර්ග නොවෙයි, රෝගය ඇති වීම වැළැක්වීමට- සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම කාන්තාවන් සඳහා විශේෂිත වූ පිළිකා වර්ග දෙකක් දැනට හඳුනාගෙන තිබෙනවා. එකක් තමයි කාන්තාවන්ට ඇති වන ගැබ් ගෙල පිළිකාව. අවුරුදු 40ට වැඩි සෑම කාන්තාවක්ම මේ සම්බන්ධයෙන් පරීක්ෂණයට යොමු කරන්න අවශ්‍ය සායන පහසුකම ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල හරහා ලබා දීලා තිබෙනවා. ඒ වාගේම දැයට කිරුළ වාගේ වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වන ජංගම සේවාවන් යටතේත් ඔවුන්ට ඒ පහසුකම ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා. ඊට අමතරව විශේෂයෙන්ම "පිළිකා පූර්ව හඳුනා ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම" කියන වැඩසටහන යටතේ වෛද්‍යවරුන්ට සහ හෙදියන්ට නවතම පිළිකා හඳුනා ගැනීමේ ක්‍රම පිළිබඳව විදේශීය පුහුණුව ලබා දීලා තිබෙනවා. ඒක ප්‍රධාන වෙනවා.

ඊළඟට ප්‍රධානම දේ තමයි දැනුවත් කිරීම සහ විශේෂයෙන්ම කාන්තාවන්ට ඇති වන ගැබ් ගෙල පිළිකාව සම්බන්ධයෙන් ඔවුන්ව දැනුවත් කිරීම. ඊළඟට මුඛ පිළිකාව වැළැඳීම සම්බන්ධයෙනුත් අවශ්‍ය උපදේශනය ජංගම සේවාවන් හරහා ලබා දීලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා, ගැබ් ගෙල පිළිකා පිළිබඳව. ගමේ කාන්තාවට සමීපතම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ආයතනය වන්නේ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයයි. ඒ වාගේම ගම් මට්ටමින් සිටින පවුල් සෞඛ්‍ය නිලධාරිනියන් ගමේ කාන්තාවට සමීපතම නිලධාරිනිය වනවා. අවුරුදු 40 ඉක්මවා ගිය කාන්තාවන් මේ පිළිකා තර්ජනයෙන් වළක්වා ගැනීමට ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවලින් සහ ගමේ සිටින පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ සේවය ලබා ගැනීමට ආණ්ඩුවට යාන්ත්‍රණයක් තිබෙනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

දැනටමත් එය ක්‍රියාත්මක වෙන්නේ ආණ්ඩුවේ යාන්ත්‍රණයෙන් තමයි.

විශේෂයෙන්ම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියෝ මව්වරුන් හමු වෙනවා; මේ සම්බන්ධයෙන් සම්මන්ත්‍රණ පවත්වනවා; විශේෂ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනවා. ඒවා මඟින් දැනුවත් කරලා තමයි ඒ අය කැඳවා ගන්නේ. බොහෝ විට මෙවැනි කාන්තාවන්ගේ පැමිණීමේ අඩුවක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් ප්‍රචාරය කරලා තිබුණත් බොහෝ අය එන්නේ නැහැ. ජංගම සේවා පවත්වද්දී අපට තිබෙන ප්‍රායෝගික අත් දැකීම අනුව අපි එය දන්නවා. ඒ සේවාව ගමට ගියාම වුණත් සහභාගි වන ප්‍රමාණය අඩුයි. ඒ ජංගම සේවාවන්හිදී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිතුමිය තමයි මේ සම්බන්ධයෙන් වැදගත්ම සේවාවක් ඉටු කරන්නේ. ගරු මන්ත්‍රීතුමා, ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්ත අනුව මුළු ලෝකයේම පිළිකා රෝගයෙහි විශාල ඉහළ යෑමක් තිබෙනවා. මෙය ලංකාවට විතරක් ආවේණික වූ දෙයක් නොවෙයි. බෝ නොවන රෝග වාගේම මුළු ලෝකයේම පිළිකා රෝගයේ වැඩි වීමකුත් තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ලෝකයේම එවැනි ප්‍රවණතාවක් තිබෙන බව ඇත්ත. හැබැයි ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අප අපේ රට සම්බන්ධයෙන් මේ තත්ත්වය පිළිබඳව වඩාත් සංවේදී විය යුතු අවස්ථාවක මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි පුරුෂයන්ට පිළිකා රෝගය වැළඳීම සම්බන්ධව. මුඛ පිළිකාවලට සහ පෙණහලු ආශ්‍රිත පිළිකාවලට ප්‍රධාන හේතුවක් වනවා දුම් කොළ සහ දුම් කොළ ආශ්‍රිත නිෂ්පාදන. විශේෂයෙන්ම සිගරැට්, සුදු බීඩි, සුරුට්ටු හා එවැනි නිෂ්පාදන. දුම් වැටි පැකැට්ටුවේ සියයට 80ක රූපමය අවවාද ප්‍රදර්ශනය කරවීමේ කටයුත්ත කරන්න අපට බැරි වුණා. එය සියයට 60 දක්වා පහළ ගියා. හැබැයි, පනතට සංශෝධනයක් ගෙනෙනවා නම් සියයට 80යි කියලා, ඒ කටයුත්ත ලේසියෙන් කරන්න පුළුවන්කම තිබෙනවා. ගැසට් එකක් මඟින් එය ගෙන ආ නිසායි ඒ ප්‍රශ්නය ඇති වුණේ. දුම් කොළ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධ පනත සංශෝධනය කිරීම දිගින් දිගට කල් යමින් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ අවශ්‍ය නීති කලට වේලාවට නොගෙන ඒමත් දුම් වැටි ආශ්‍රිතව සහ දුම් කොළ ආශ්‍රිතව පිළිකා වැඩි වීමට හේතු වන එක කාරණයක් කියලා ඔබතුමා පිළිගන්නවාද? ඒ සංශෝධන කඩිනමින් ගෙන එන්න කටයුතු කරන්නේ කවදාද? මා මේ ගැන මීට කලින් අහපු වෙලාවකත් ඔබතුමා කිව්වා ඒවා ඉක්මනින් ගෙන එනවා කියලා. හැබැයි තවමත් ගෙනැවිත් නැහැ. මා ඒ ගැන අහලා මාස හයකුත් වෙනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, දැනටමත් මේ දුම්කොළ හා දුම් වැටි ආශ්‍රිත පිළිකා වැළැක්වීම සඳහා අපේ රජය යටතේ ගරු ඇමතිතුමා මෙයට අදාළ පනත ගෙනැල්ලා ඒ අවශ්‍ය කටයුතු කර තිබෙනවා. අපේ රට තමයි ලෝක සෞඛ්‍ය සංවිධානයට අයත් රටවල් අතරින් මේ වැඩ පිළිවෙළට සම්බන්ධ වුණු ප්‍රධාන රටක් වන්නේ. අනෙකුත් රටවල් වාගේම අපි මේ සඳහා ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. දුම්වැටි ඇසුරුම්වල සියයට 80ක කොටසක රූපමය අවවාද ඇතුළත් කරන්න තීරණය කළත්, එය සියයට 60ක ප්‍රමාණයක විය යුතුයි කියලා උසාවිය තීන්දු කළා. අපට උසාවි නියෝගය පිළිගන්න සිද්ධ වෙනවා. අපි ඒකට අභියාචනයක් කරලා තිබෙනවා. ඒක එකක්.

ඇමතිතුමාගේ බලතල, එහෙම නැත්නම් regulations හරහා තමයි මේ කටයුතු කෙරෙන්නේ. ඉතින් ඒවා ඇතුළත් කරලා තිබෙනවා. දැනට මේ කාරණය අභියෝගයට ලක් වී තිබෙන නිසා

ඉදිරියේදී ඒ සංශෝධන ගෙනෙනවා. ප්‍රධාන වශයෙන් මේ පිළිබඳ දැනුවත් කිරීම් විශාල වශයෙන් සිදු කර තිබෙනවා. ප්‍රසිද්ධ ස්ථානවල දුම් බීම තහනම් කරලා තිබෙනවා. ඒ වාගේම අඩු වයස් දරුවන්ට ඒවා විකිණීම තහනම් කරලා තිබෙනවා. මේ වාගේ පියවර රාශියක් මේ පනත් හරහා අරගෙන තිබෙනවා.

දුම් බීමට අමතරව අද මුඛ පිළිකා රෝගයට ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ පුවක් භාවිතය. ඒ කියන්නේ, බුලත් විට කෑමත් මේ කාරණයට ප්‍රධාන හේතුවක් වෙලා තිබෙනවා. පුවක් ප්‍රධාන පිළිකා රෝග කාරකයක් බවට පත් වෙලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය දැනටමත් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබෙනවා. මේ බුලත්, පුවක් භාවිතය අපේ සංස්කෘතියත් එක්ක ඇඳුණු දෙයක්. දානයකදී දැහැත්විට පූජා කිරීමේදීත් සෞඛ්‍යයට හානි නොවන ආකාරයේ අලුත් දැහැත් විටක් අපි හඳුන්වා දීලා තිබෙනවා. මේ ගැනත් ජනතාව දැනුවත් කරන්න අපි කටයුතු කරගෙන යනවා. මේ ගැන වැඩි ප්‍රචාරයක් දුන්නොත් බුලත් කන්න දෙන්නේත් නැහැ කියලා විපක්ෂයෙන් චෝදනාවක් නඟන්නත් පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ කියන්නේ බුලත් කොළය තහනම් කරනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
තහනම් කරන්නේ නැහැ. කියන කොටම පැන්නා. බුලත් කොළය තහනම් කරනවා ද කියලා අහනවා. ඒක තමයි වැඩේ.

## චීන අපනයන ආනයන බැංකුවෙන් ලබාගත් ණය: විස්තර
## சீன ஏற்றுமதி, இறக்குமதி வங்கியிலிருந்து பெற்ற கடன் : விபரம்
## LOANS TAKEN FROM EXPORT-IMPORT BANK OF CHINA : DETAILS

4225/'13

5. **ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වර්ෂ 2005 සිට 2013 දක්වා කාල සීමාවේදී ශ්‍රී ලංකා රජය විසින් චීන අපනයන ආනයන බැංකුව (Export-Import Bank of China) වෙතින් ලබාගෙන ඇති ණය ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් වර්ෂයේදී ලබාගෙන ඇති ණය මුදල් ලබාගත් දිනය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ණය මුදල සඳහා ගෙවිය යුතු පොලී අනුපාතික වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2005 முதல் 2013ஆம் ஆண்டு வரையான காலப்பகுதியினுள் இலங்கை அரசாங்கத்தினால் சீன ஏற்றுமதி, இறக்குமதி வங்கியிலிருந்து (Export-Import Bank of China) பெற்ற கடன் தொகைகள் வருடாந்த அடிப்படையில் வெவ் வேறாக எவ்வளவு என்பதையும்;

(ii) ஒவ்வொரு வருடமும் பெற்ற கடன் தொகைகள், பெற்ற திகதிகளுக்கு அமைய வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு கடன் தொகைக்காகவும் செலுத்த வேண்டிய வட்டி வீதங்கள் வெவ் வேறாக எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) separately on annual basis, the loans taken by the Government of Sri Lanka from the Export-Import Bank of China from the year 2005 to 2013;

(ii) separately, the loans taken each year as per the date they were taken; and

(iii) separately, the interest rates to be paid for each such loan?

(b) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2005 සිට 2013 දක්වා කාල සීමාවේදී ශ්‍රී ලංකා රජය විසින් සෘජුවම හෝ වරාය අධිකාරිය, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගම වැනි රාජ්‍ය ව්‍යාපාර විසින් චීන අපනයන ආනයන බැංකුව වෙතින් ලබා ගෙන ඇති ණය ප්‍රමාණය වාර්ෂිකව පහත වගුවෙහි දැක්වේ.

| වර්ෂය | රජය ලබා ගත් ණය මුදල (එ.ජ. ඩොලර් මිලියන) | රාජ්‍ය ව්‍යාපාර ලැබූ ණය මුදල (එ.ජ. ඩොලර් මිලියන) | එකතුව (එ.ජ. ඩොලර් මිලියන) |
|---|---|---|---|
| 2005 | ලබා ගෙන නැත. | ලබා ගෙන නැත. | - |
| 2006 | ලබා ගෙන නැත. | ලබා ගෙන නැත. | - |
| 2007 | ලබා ගෙන නැත. | ලබා ගෙන නැත. | - |
| 2008 | ලබා ගෙන නැත. | ලබා ගෙන නැත. | - |
| 2009 | ලබා ගෙන නැත. | 154.1 | 154.1 |
| 2010 | 98.1 | 642.1 | 740.2 |
| 2011 | 193.5 | 150.9 | 344.4 |
| 2012 | 238.2 | 379.6 | 617.8 |
| 2013 | 396.3 | 412.8 | 809.1 |

මෙම ණය මුදල් දීර්ඝ කාලීනව ප්‍රතිලාභ ජනනය කරනු ලබන වරාය, මහා මාර්ග, ගුවන් තොටුපොළ හා

විදුලි බලාගාර වැනි සංවර්ධන ව්‍යාපෘති මූල්‍යනය සඳහා යොදවා ඇත.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

(ii) 2005 - 2013 දක්වා චීන අපනයන ආනයන බැංකුව වෙතින් එක් එක් වර්ෂයේදී ලබා ගෙන ඇති ණය මුදල් ලබා ගත් දිනය අනුව සහ එහි ආංශික එකතුව ඇමුණුමෙන් පෙන්නුම් කරයි. ඇමුණුම **සභාගත*** කරනවා.

(iii) ඉහත එක් එක් ණය මුදල සඳහා ගෙවිය යුතු පොලී අනුපාතික වෙන් වෙන් වශයෙන් ඇමුණුමේ වගුවෙහි අවසන් තීරුවෙන් පෙන්නුම් කරයි.

පොලී අනුපාතය වෙනස් වෙනවා. ඒකත් මම කියන්නම්. හම්බන්තොට වරාය පළමු වැනි පියවර සියයට 6.3යි.

හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ දෙවෙනි අදියර සඳහා පොලී අනුපාතිකය සියයට 2යි. හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ උපබද්ධ කාර්යයන් හා උපකරණ සම්පාදන ව්‍යාපෘතිය සඳහා පොලී අනුපාතිකය සියයට 2යි. හම්බන්තොට වරායේ බංකර හා තටාකාංග ව්‍යාපෘතිය සඳහා පොලී අනුපාතිකය සියයට 6.5යි. කොළඹ-කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ඒ2 කොටස සඳහා පොලී අනුපාතිකය සියයට 6.3යි. කොළඹ-කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ඒ1 කොටස සඳහා පොලී අනුපාතිකය සියයට 6.3යි. කොළඹ-කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ඒ3 කොටස සඳහා පොලී අනුපාතිකය සියයට 6.3යි. කොළඹ-කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඒ4 කොටස සඳහා පොලී අනුපාතිකය සියයට 6.3යි. ඉතිරි ව්‍යාපෘති සියල්ලටම පොලී අනුපාතිකය සියයට 2යි. ඒ සියලු විස්තර දෙන්නම්.

අපේ ප්‍රතිපත්තියත් මම ඔබතුමාට පැහැදිලි කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අපේ දළ පොලී අනුපාතිකය සියයට 2යි. යුද්ධ කාලයේදී අපි සාකච්ඡා - negotiate - කරපු ව්‍යාපෘති දෙකක් සඳහා විශේෂයෙන් යුද්ධ අවධියේදී strategic value එක නිසා සියයට 6ක පොලියක් ගෙවන්නට අපට සිද්ධ වුණා. නමුත් ඉන් පසුව සෑම ව්‍යාපෘතියක් සඳහාම -චීන විතරක් නොවෙයි, ලෝකයේ අනෙක් බැංකුවලින් ගන්නා මුදල්වලටත්- පොලී අනුපාතිකය සියයට 2කට සීමා කරලා තිබෙනවා. ඒ නිසා දැන් අපේ ප්‍රතිපත්තිය, චීන වේවා, වෙන ඕනෑම තැනකින් වේවා ගන්නා මුදලට පොලී අනුපාතිකය සියයට 2කට වැඩි වෙන්නේ නැති විධියට තමයි අපි කටයුතු කරන්නේ. [බාධා කිරීමක්]

(ආ) පැන නොනඟී.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් අපට පෙනෙනවා මේ ණය ගැනීමට සියයට 90ක් විතරම යොමු වෙලා තිබෙන්නේ චීනයේ එක්සිම් බැංකුවට බව. චීනයේ එක්සිම් බැංකුවත් එක්ක තිබෙන මේ සුවිශේෂ හිතවත්කමට හේතුව, මේ ණය ගනුදෙනුව හරහා කාට හෝ ලැබෙන කොමිස් මුදලද?

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ගරු ඇමතිතුමා වෙනදාට ඉතාම සවිස්තරව උත්තර දෙන නිහතමානි ඇමතිවරයෙක්. හැබැයි මේ නිශ්චිත ප්‍රශ්නය ඇහුවාම "නැත" කියන එක විතරක් කියලා, වෙන මොනවාත්ම නොකියා පරිස්සම් වන්නට එතුමා තීරණය කළා. බොහොම හොඳයි. ගරු කථානායකතුමනි, එතුමාට ඊට වඩා දෙයක් කියන්න බැහැ නේ. එහෙම කියන්න ඒක පිළිගන්නත් බැහැ නේ. කොමිස් ගන්නවා කියලා කියන්නත් බැහැ නේ. ඒ නිසා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, පොඩ්ඩක් ඉන්න ගරු මන්ත්‍රීතුමා. එතුමා ඊට වඩා වැඩි දෙයක් කියන්න හදනවා, පොඩ්ඩක් ඉන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමා, මම නැහැ යි කියලා කිව්වේ, ඔබතුමා මෙයට වෙනත් අර්ථ කථනයක් දෙන්න හදන නිසායි. ගරු කථානායකතුමනි, ඊයේත් මේ කාරණය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට බලාපොරොත්තු වුණා. ඊයේ මා රවි කරුණානායක මන්ත්‍රීතුමාට දුන් පිළිතුරක් සම්පූර්ණයෙන් විකෘති කර අද "The Island" පුවත් පතේ පළ වී තිබෙනවා. මම හිතන විධියට එතුමාම තමයි "The Island" පුවත් පතට එම කරුණු දීලා තිබෙන්නේ. ඒක හරි නැහැ. අපි සද්භාවයෙන් මෙහෙම විවාදයක් කරන වෙලාවක ඒකෙන් පොඩි කොටසක් අරගෙන ගිහිල්ලා විකෘති කරලා පත්තරේ දමන එක හොඳ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ විවෘතව කියන දෙයක් ගැන මාධ්‍යවේදීන් සියලු දෙනාම බලාගෙන සිටිනවා. ඒ නිසා මේ විධියට කිව්වාය කියලා, එක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට විතරක් යම් දෙයක් විකෘති කරලා කියන්න බැහැ. අනෙක් අතට රාජ්‍ය මාධ්‍ය තිබෙනවා; පාර්ලිමේන්තුවේ මාධ්‍ය අංශයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

"The Island" පත්තරයේ පළ කර තිබෙන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

"The Island" පත්තරයේ කාටද හිතවත්කම තිබෙන්නේ? අපිටද? "The Island" පත්තරයේ අපිට ආදරේටද එහෙම පළ කරන්නේ? නැහැ. ඒක ඇතුළේ ප්‍රශ්නයක්. ඔබතුමාට විරුද්ධව මොකක් හරි ප්‍රශ්නයක් ඇති.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පාර්ලිමේන්තුවේ දුන් පිළිතුරක් විකෘති කරලා තිබුණා. ඒ ගැන සොයා බලන්නට ඕනෑ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මම එහෙනම් දැන් මෙතුමාට සවිස්තර පිළිතුරක් දෙන්නම්. [බාධා කිරීමක්] -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ, එහෙම නොවෙයි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
දැන් ඔබතුමා අහපු වෙලාවේ -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, එහෙම නොවෙයි නේ -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඔබතුමාගේ අනෙක් ප්‍රශ්න ටික අහන්න කෝ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතුමාට උත්තර දෙන්න වෙනවා, මම ඇහුවාට පසුව. ගරු කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමාගෙන් ඇහුවාම මේ ණය මුදල් ලබා ගැනීමේ ක්‍රියාදාමයේ දී කොමිස් ලැබෙනවාද කියලා. එතුමා "නැත" යනුවෙන් පිළිතුරු දුන්නා. ඒ වාගේම එතුමාට පැහැදිලි කරන්නට පුළුවන්ද, ඔවුන් විසින් නියම කරන ලද කොන්දේසි මත unsolicited විධියට ටෙන්ඩර් නැතිව මේ ව්‍යාපෘති පවරමින් මේ ණය ලබා ගන්න චීනයේ එක්සිම් බැංකුවටම යන්නේ ඇයි කියලා.

මොකද, පොලී අනුපාතිකය පමණක් නොවෙයි මෙතැන තිබෙන්නේ ගරු කථානායකතුමනි. මේ එක්සිම් බැංකුවේ තිබෙන ගනුදෙනු සම්බන්ධයෙන් කවුද කොන්ත්‍රාත්කරු, ව්‍යාපෘතියේ වියදම කොච්චරද, ව්‍යාපෘතියට යන මුදල ගෙවන්නේ කොහොමද කියන ඒ සියල්ලම ඔවුන් කියනවා. ලංකාවට එන කම්කරුවෝ, ඉංජිනේරුවෝ සියලු දෙනාවම ඔවුන් තීරණය කරනවා. ඒ නිසා මොකක්ද මේ චීනය සමඟ තිබෙන සම්බන්ධතාව?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මෙතුමා එක්කෝ වැරදි මතයක සිටිනවා. එහෙම නැත්නම් කවුරු හරි වැරදි මතයක් එතුමාගේ ඔළුවට දමලා තිබෙනවා. ඒ නිසා - [බාධා කිරීමක්] කරුණාකර දැන් අහගන්න. ඔබතුමා කියන දේත් අපි සාවදානව අහගෙන සිටියා. ඒ නිසා දැන් මම කියන දේත් නිශ්ශබ්දව අහගන්න. පළමුවැනි කාරණාව නම්, අපි බැංකු ණය ලබා ගන්නේ Export-Import Bank එකෙන් විතරක් නොවෙයි. CDB කියන තවත් බැංකුවකින් අපි ණය ලබා ගන්නවා. ඒ නිසා පළමුවැනි තර්කය නම් අපි Export-Import Bank එකෙන් පමණක් ණය ලබා ගන්නවාය කියන එක සම්පූර්ණයෙන් සාවද්‍යයි. පිළිගන්න, ඒක එහෙම කියන එක වැරදියි. දෙවැනි කාරණාව, මේ බැංකුවත් එක්ක අපි ගනුදෙනු කරනවා වාගේම, මේ බැංකුවෙන් මුදල් ලබා ගන්න ලෝකයේම තරගයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. එම බැංකුව කුමන්ත්‍රණකාරී විධියට ලංකාවට විතරක් ණය දෙන්න බලාපොරොත්තු වනවාය කියන එක සම්පූර්ණයෙන් සාවද්‍යයි. එය නොදැනුවත්කම නිසා කරන ප්‍රකාශයක්. ඒ බැංකුව ලෝකයටම ණය ලබා දෙනවා. විශේෂයෙන්ම අප්‍රිකාව, ඒ වාගේම ආසියානු රටවල්වලට, ඒ හැම රටකටම වැඩියෙන්ම ණය ලබා දෙන රට බවට චීනය පත් වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. පසු ගිය දවසක පැවැති රැස්වීමකදී චීනයේ මුදල් ඇමතිතුමා කියල තිබෙනවා, "IMF එකත්, ලෝක බැංකුවත්, Asian Development Bank, ඒ වාගේම African Development Bank, Development Bank of Latin America යන ඒ හැම බැංකුවක්ම ලබා දෙන ණය ප්‍රමාණයට වඩා අපේ එක ප්‍රාදේශීය බැංකුවක් ණය ලබා දෙනවා" කියලා. ඒ නිසා තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නවා නම්, මේ චීනයේ Export-Import Bank එක තමුන්නාන්සේලාගේ වෙනත් ආයතන වාගේ අරයා මොනවාද කරන්නේ, මෙයා මොනවාද කරන්නේ කියලා බලාගෙන ඉන්නවා කියලා, එහෙම දෙයක් නැහැ.

මේවා ඒ රටේ ඒ ගොල්ලන්ගේ දේශපාලන පාර්ලිමේන්තු ක්‍රමයට වග කියන ආයතන. The Export-Import Bank is a State Bank. අපි මුලින් ගිහින් සාකච්ඡා කරන වෙලාවේ -මමත් එයට සහභාගි වුණා- බැංකුවෙන් කිව්වා, "නැහැ. අපි ස්වාධීන evaluation එකක් කරන්න ඕනෑ"යි කියලා. ඒ ණය ගැනීම අපට ප්‍රමාද වුණා.

ගරු කථානායකතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට ඔබතුමා ඒ සම්බන්ධයෙන් දන්නවා. ඒ ගොල්ලන්ගේම අය ඇවිල්ලා, ඒ ගොල්ලන්ගේම ඉංජිනේරුවරු ඇවිල්ලා ඒ පර්යේෂණය කළා. ඒ නිසා මාස හතක්, මාස අටක් කල් ගියා. මා හිතන හැටියට "මේ ව්‍යාපෘතිය කරන්න චීනය බලා ගෙන ඉන්නවා. වැරදි වැඩ කරන්න යනවා"යි කියා රටට දෙන්න හදන පණිවුඩය ඉතාම දුර්වල මානසික තත්ත්වයක්. ඇත්ත තත්ත්වය ඒක නොවෙයි. ඊට වඩා හොඳට කරුණු සොයා බලන්න. Internet එකට යන්න, ඒ රටවල වාර්තා බලන්න, ඒ ගොල්ලන් එක්ක සාකච්ඡා කරන්න. [බාධා කිරීමක්] ඒ දෙවන එක. [බාධා කිරීමක්] මා කියන දේ අහන්න. තුන්වන එක - [බාධා කිරීමක්] දැන් ඔබතුමා කථා කරන කොට මා කථා කළේ නැහැ නේ.

පළමුවන කාරණාව, මෙය එකම බැංකුව නොවෙයි. දෙවන කාරණාව, ඒ ගොල්ලන් ලංකාවට විතරක් ණය දෙන්න කරන කුමන්ත්‍රණයක් නොවෙයි. ගෝලීය ක්‍රමයක් තුළ වග කීමකින් තමයි ඒ ගොල්ලන් ණය දෙන්නේ. තුන්වන කාරණාව මෙයයි. අපට මූලික ව්‍යාපෘති දෙකක් තිබෙනවා. එක ව්‍යාපෘතියක් තමයි, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය. අනික් ව්‍යාපෘතිය තමයි හම්බන්තොට වරාය. ඒ ව්‍යාපෘති දෙක සඳහා විශේෂ strategic value එකක් තිබෙන නිසාත්, යුද්ධ කාලයේ අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරපු නිසාත්, ඒ වාගේම අපි ඒ ණය ක්‍රමයට අලුතින් සම්බන්ධ වුණු නිසාත් අපට සිද්ධ වුණා, සාකච්ඡා කරලා ඒ ගණන ගන්න.

ඊට පස්සේ අද අපි සෑම ණයක්ම ගන්නේ ඒ පොලියටයි. මොකද, මේ රටට ස්ථාවරයක් තිබෙනවා. මේ රටට හොඳ අනාගතයක් තිබෙනවා. මේ රටට ස්ථාවර රටක් හැටියට දැන්

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ලෝකයේ පිළිගැනීම තිබෙනවා. අපේ ආර්ථිකය - macroeconomic fundamentals -ස්ථාවරයි. ඒ නිසා අපි සියයට 2 ක පොලියටයි ණය ගන්නේ. අවුරුදු ගණනකට ඉස්සෙල්ලා සියයට 6 ක පොලියට ණය ගත්තාය කියා ඒ ගැන හැම දාම කථා කරනවා. නමුත් මේ අවුරුද්දේ, ගිය අවුරුද්දේ, එපිට අවුරුද්දේ සියයට 2ක පොලියට ණය ගත්ත එක ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. කාලය කියන ඔර්ලෝසුවේ මේ ගොල්ලෝ ඉස්සර හිර වෙලා හිටපු තැන ඉන්නේ. ආදි කාලේ පටන් හිර වෙලා. It is called the "time warp". එම නිසා දේශපාලන දුෂ්ට චේතනාවෙන් මේ ප්‍රශ්න අහන්න එපා. අද ණය ගන්න පොලී අනුපාතය සියයට 2යි. ඒක මම මේ ගරු සභාවේ ඉතාම වගකීමෙන් කියනවා. එම නිසා අතීතයේ ණය ගත්ත පොලී අනුපාතය ගැන කථා කරන්න එපා.

Do not get stuck in the time warp. ඒ ඔරලෝසුවේ ඔළුව හිර කර ගෙන කථා කරන්න එපා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, දූෂිත, ඒකාධිපති අප්‍රිකානු රාජ්‍යයන් එක්සිම් බැංකුවෙන් විශාල වශයෙන් ණය ගන්නවාය කියා එතුමා කියන කාරණය මා පිළිගන්නවා. [බාධා කිරීමක්] ඒක තමයි. [බාධා කිරීමක්] මගේ ප්‍රශ්නය අහන්න දෙන්නේ නැහැනේ. මගේ ප්‍රශ්නය අහන්න දෙන්න. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා මගේ ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා. හරි. මේ දන්නේ නැතිකෙනා අහන ප්‍රශ්නයට දන්න කෙනා උත්තර දෙන්න අහගෙන ඉන්න. [බාධා කිරීම්] මගේ ප්‍රශ්නය මෙයයි. ඔබතුමා කිව්වා නේ CDB - Chinese Development Bank - එකෙන් ණය ගන්නවා කියා. දැන් ඒකෙන් අරගෙන තිබෙන ණය ප්‍රමාණය සහ ඒකේ පොලී අනුපාතිකය කුමක් ද කියා ඔබතුමාට මේ මොහොතේ කියන්න පුළුවන් ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා ඒ ගැන ප්‍රශ්නයක් ඇහුවේ නැහැනේ. ඒ ගැන ප්‍රශ්නයක් අහන්න. අප උත්තර දෙන්නම්. මේක සම්පූර්ණයෙන් වෙනස් බැංකුවක් ගැන ප්‍රශ්න අහලා දැන් උත්තර දෙන්න කියන්නේ. සාමාන්‍යයෙන් පොලිය සියයට 2යි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6-4464/'13-(1), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කුරුණෑගල, වෙලන්ගොල්ල නිවාස යෝජනා ක්‍රමය : විස්තර
### குருநாகல், வெலன்கொல்ல வீடமைப்புத் திட்டம் : விபரம்
### WELANGOLLA HOUSING SCHEME, KURUNEGALA: DETAILS

4526/'13

**8. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) කුරුණෑගල, වෙලන්ගොල්ල නිවාස යෝජනා ක්‍රමය තුළ ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස යෝජනා ක්‍රමය සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවසක් ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iv) එම නිවසක විකුණුම් මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல், வெலன்கொல்ல வீடமைப்புத் திட்டத்தில் நிர்மாணிக்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இவ்வீடமைப்புத் திட்டத்துக்கு செலவாகிய பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) இவ்வீடமைப்புத் திட்டத்தின்கீழ் வீடு வழங்கப்படும் முறைமை யாதென்பதையும்;

(iv) மேற்படி ஒரு வீட்டின் விற்பனை விலை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(i) Will he inform this House -

(i) the number of houses that have been constructed in the Welangolla Housing Scheme in Kurunegala;

(ii0 the cost of construction of that Housing Scheme;

(iii) the methodology of granting a house under that Housing Scheme; and

(iv) the sale price of a house from that Housing Scheme?

(b) If not, why?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නිවාස 23කි.

(ii) නිවාස ඉදි කිරීම සඳහා සහ යටිතල පහසුකම් සඳහා රුපියල් මිලියන 182කි.

(iii) පුවත්පත් මඟින් ප්‍රසිද්ධ කර ඉල්ලුම්පත් කැඳවා ඒ අනුව සුදුසුකම් ලබන ඉල්ලුම්කරුවන් නිවාස ලබා දීම සඳහා තෝරා ගනු ලැබේ.

(iv) නිවාසවල විකුණුම් මිල ඇතුළත් කරන ලද ලේඛනය -ඇමුණුම- **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**සභාමේසය මත තබන ලද ඇමුණුම:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

ඇමුණුම

| අංකය | ලොට් අංකය | ඉඩමේ ප්‍රමාණය (පර්චස්) | නිවාස වර්ගය | සංශෝධිත විකුණුම් මිල රු.ශත |
|---|---|---|---|---|
| 1. | 1 | 12.7 | A Type | 9,910,000/= |
| 2. | 2 | 9.50 | C Type | 10,031,000/= |
| 3. | 3 | 9.00 | C Type | 9,931,000/= |
| 4. | 4 | 9.00 | C Type | 9,931,000/= |
| 5. | 5 | 8.80 | C Type | 9,891,000/= |
| 6. | 6 | 9.00 | C Type | 9,931,000/= |
| 7. | 7 | 9.00 | C Type | 9,931,000/= |
| 8. | 8 | 8.50 | C Type | 9,831,000/= |
| 9. | 9 | 9.50 | C Type | 10,031,000/= |
| 10. | 10 | 9.50 | C Type | 9,831,000/= |
| 11. | 11 | 10.00 | C Type | 9,731,000/= |
| 12. | 12 | 9.50 | C Type | 9,641,000/= |
| 13. | 15 | 9.50 | A Type | 9,195,000/= |
| 14. | 16 | 9.20 | A Type | 9,141,000/= |
| 15. | 17 | 9.10 | A Type | 9,123,000/= |
| 16. | 18 | 9.00 | A Type | 9,105,000/= |
| 17. | 19 | 8.50 | A Type | 10,221,000/= |
| | 20 | 6.70 | | |
| 18. | 23 | 10.20 | A Type | 9,270,000/= |
| 19. | 24 | 9.50 | A Type | 9,195 ,000/= |
| 20. | 25 | 9.50 | C Type | 9,641 ,000/= |
| 21. | 26 | 8.50 | C Type | 9,461 ,000/= |
| 22. | 27 | 10.00 | C Type | 9,731 ,000/= |
| 23. | 28 | 11.40 | C Type | 9,931 ,000/= |

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඇමතිතුමා මේ ගරු සභාවේ නැති නිසා එතුමාට අතුරු ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න පුළුවන්ද? නැත්නම් ඒ ප්‍රශ්න වෙන දවසක අහන්නද?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
දැනට මා වෙත ලබා දී තිබෙන පිළිතුර තමයි මට ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, අපේ වීරවංශ ඇමතිතුමා දකින්නත් ආසා නිසා අපට වෙන දවසක් ලබා දෙන්න.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒක හොඳයි.

## භූගත වස්තු නිරීක්ෂණය කළ හැකි ලේසර් යන්ත්‍රය : විස්තර

புதைபொருட்களை அவதானிக்கும் லேசர் இயந்திரம் : விபரம்

SUBTERRANEAN TREASURE DETECTING LASER MACHINE: DETAILS

4621/'13

**9. ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ලේසර් කිරණ භාවිතයෙන් භූගතව පවතින නිදන් වස්තු නිරීක්ෂණය කළ හැකි යන්ත්‍රයක් ශ්‍රී ලංකාවට ගෙන්වා ඇති බවත්, එය පොලිස් අත් අඩංගුවට පත් වූ බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම යන්ත්‍රය ගෙන්වීම සඳහා ආරක්ෂක ක්ෂේත්‍රයේ ප්‍රබල අයෙකුගේ මැදිහත්වීමක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයාගේ නම කවරේද;

(iii) මෙම ආරක්ෂක ක්ෂේත්‍රයේ ප්‍රබල තැනැත්තාගේ මැදිහත්වීම හේතුවෙන් එම යන්ත්‍රය පිළිබඳ පරීක්ෂණ නවතා දමා තිබේද;

(iv) නොඑසේ නම්, එම පරීක්ෂණවල වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ලේසර් යන්ත්‍රය ආනයනය කර ඇති රට කවරේද;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) ඉහත (අ) හි සඳහන් යන්ත්‍රයට අමතරව මෙරටට ගෙන්වා ඇති එවැනි යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් යන්ත්‍රය හෝ යන්ත්‍ර ගෙන්වීම හේතුවෙන් භූගතව පවතින නිදන් වස්තුවල ආරක්ෂාව සඳහා යම්කිසි බලපෑමක් ඇති විය හැකි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට අදාළව මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) லேசர் கதிர்களைப் பயன்படுத்தி நிலத்தின்கீழ் காணப்படும் புதைபொருட்களை அவதானிக்கக்கூடிய ஓர் இயந்திரம் இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்டுள்ளதென்பதையும், இது பொலிஸாரால் கைப்பற்றப்பட்டுள்ளதென்பதையும் அவர் அறிவாரா?

[ගරු සුජීව සේනසිංහ මහතා]

(ஆ) (i ) மேற்படி இயந்திரத்தை இறக்குமதி செய்வதற்காக பாதுகாப்புத் துறையின் பலம்வாய்ந்த ஒருவரின் தலையீடு நடைபெற்றுள்ளதா என்பதையும்;

(ii ) ஆமெனின், மேற்படி நபரின் பெயர் யாதென்பதையும்;

(iii ) மேற்படி பாதுகாப்புத் துறையின் பலம் வாய்ந்தவரின் தலையீட்டின் காரணமாக மேற்படி இயந்திரம் தொடர்பான விசாரணை நிறுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iv ) மேற்படி விசாரணைகளின் தற்போதைய நிலைமை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i ) மேற்படி லேசர் இயந்திரம் இறக்குமதி செய்யப்பட்ட நாடு யாதென்பதையும்;

(ii ) இதற்காக செலவிடப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii ) மேலே (அ)இல் குறிப்பிடப்பட்டுள்ள இயந்திரத்திற்கு மேலதிகமாக இந்நாட்டுக்கு இறக்குமதி செய்யப்பட்டுள்ள இவ்வாறான இயந்திரங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) (i ) மேலே குறிப்பிடப்பட்ட இயந்திரம் அல்லது இயந்திரங்கள் இறக்குமதி செய்யப்படுவதன் காரணமாக நிலத்தின் கீழுள்ள புதைபொருட்களின் பாதுகாப்பிற்கு ஏதேனும் நிர்ப்பந்தம் ஏற்படுமென்பதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii ) ஆமெனின், அதற்கேற்ப தற்போது மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware that a machine that can detect subterranean treasures using laser beams has been imported to Sri Lanka and that it has been taken into police custody?

(b) Will he state -

(i) whether a powerful individual of the defence sector has been involved in importing that machine;

(ii) if so, the name of that person;

(iii) whether investigations into that machine were stopped due to intervention by the said powerful individual of the defence sector; and

(iv) if not, the current situation of those investigations?

(c) Will he inform this House of -

(i) the country from which that laser machine has been imported;

(ii) the amount spent on that; and

(iii) the number of such machines imported to this country other than the one mentioned in (a) above?

(d) Will he also state -

(i) whether he admits that the safety of the subterranean treasures could be affected as a result of importing the machine or machines mentioned above; and

(ii) if so, the measures taken by now in that regard?

(e) If not, why?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) නැත. වෙනත් තාක්ෂණික උපක්‍රම මඟින් භූමි අභ්‍යන්තරය නිරීක්ෂණය කළ හැකි යන්ත්‍ර හමු වී ඇත.

(ආ) (i) නැත.

(ii) පැන නොනඟී.

(iii) අදාළ නොවේ.

(iv) ලේසර් නොවන වෙනත් තාක්ෂණික උපක්‍රම මඟින් භූමි අභ්‍යන්තරය නිරීක්ෂණය කළ හැකි එම යන්ත්‍ර පිළිබඳව විමර්ශන පවත්වා ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) ලේසර් නොවන වෙනත් තාක්ෂණික උපක්‍රම මඟින් භූමි අභ්‍යන්තරය නිරීක්ෂණය කළ හැකි යන්ත්‍ර 08ක් අත්අඩංගුවට ගෙන ඇත.

(ඈ) (i) ලේසර් නොවන වෙනත් තාක්ෂණික උපක්‍රම මඟින් භූමි අභ්‍යන්තරය නිරීක්ෂණය කළ හැකි එම යන්ත්‍ර ඉඳුරාම නිදන් වස්තු සෙවීම සඳහා යොදා ගත් බවට අනාවරණය වී නොමැත.

(ii) පැන නොනඟී.

(ඉ) පැන නොනඟී.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි. ඇමතිතුමනි, පිළිතුරේ "නැත" කිව්වාට පත්තරවල පළ වෙනවා, "මෙවැනි යන්ත්‍ර කිහිපයක් ගෙනැවිත් තිබෙනවාය, ඒවා ඒ කටයුතු සඳහා යොදා ගත්තා"ය කියලා. විශේෂයෙන්ම බිංගිරියේ පොලීසියට පවා යන්ත්‍රයක් අහු වෙලා තිබුණු බවටත්, ඒ සම්බන්ධයෙන් ඒ අය ක්‍රියාත්මක නොවුණු බවටත් ඒ පොලීසියේ නිලධාරී මහත්වරුන්ගේ නම්, තොරතුරු සමඟම දැනුවත් වෙලා

තිබෙනවා. "ජනරළ" පත්තරයේත් සඳහන් වුණා, නිදන් යන්ත්‍රය ගැන පරීක්ෂණ යට ගසයි, ආරක්ෂක අංශයේ ප්‍රබලයෙක් මේ සඳහා සම්බන්ධයි කියලා. මෙහි නිරවද්‍යභාවය ගැන මා දන්නේ නැහැ. ඔබතුමා මේ ගැන හොයලා බලන්න. මේ රටේ බලවත් පුද්ගලයෝ සම්බන්ධ වැරදි එළියට එන්නේ නැහැ. මේ සම්බන්ධව සොයා බලන්නය කියා විශේෂයෙන්ම මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේක රටට බලපාන දෙයක්. ගොඩක් වෙලාවට අවුරුදු 10ක්, 15ක් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔය කථාවක්ද, ප්‍රශ්නයක්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ප්‍රශ්නය අහන්නේ, ගරු කථානායකතුමනි. අපට ඉඳලා හිටලා ප්‍රශ්නවලට උත්තර ලැබෙන නිසා අපි ඒ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නවා. බොහොම ස්තුතියි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණයක් කරලා අපට වාර්තාවක් ඉදිරිපත් කරන්නය කියලා අපි එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඔබතුමාගේ ඒ ප්‍රශ්නය සම්බන්ධව අදාළ අමාත්‍යාංශයට දන්වන්නම්.

## කිරි ගවයින් ආනයනය : වෙන් කළ මුදල
## பாற்பசுக்கள் இறக்குமதி : பண ஒதுக்கீடு
## IMPORTATION OF DAIRY COWS : MONEY ALLOCATED

4759/'14

**11.** **ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කිරි ගවයින් ආනයනය කිරීමට වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) මේ වන විට ආනයනය කර ඇති කිරි ගවයින් සංඛ්‍යාව කොපමණද;

(iii) කිරි සහ ද්විත්ව කාර්ය එළුවන් ආනයනය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iv) 2013 වර්ෂය වන විට එම එළුවන් ආනයනය කර තිබුණේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கால்நடை வளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உள்நாட்டு பால் உற்பத்தியை அதிகரிக்கும்பொருட்டு பாற்பசுக்களை இறக்குமதி செய்வதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு;

(ii) தற்போது இறக்குமதி செய்யப்பட்டுள்ள பாற்பசுக்களின் எண்ணிக்கை யாது;

(iii) பால் மற்றும் இரட்டைப் பணிக்காக ஆடுகளை இறக்குமதி செய்வதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு;

(iv) 2013ஆம் ஆண்டளவில் மேற்படி ஆடுகள் இறக்குமதி செய்யப்பட்டுள்ளனவா

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minster of Livestock and Rural Community Development:

(a) Will he state -

(i) the amount that has been allocated for the importation of dairy cows to increase local milk production;

(ii) the number of cows that has been imported by now;

(iii) the amount allocated for the importation of milk producing and dual purpose goats; and

(iv) whether those goats had been imported by 2013?

(b) If not, why?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු කථානායකතුමනි, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

| වර්ෂය | ආනයනය සඳහා වෙන් කළ මුදල (මිලියන) |
|---|---|
| 2011 | රු. 105,000,000.00 |
| 2012 | රු. 862,600,000.00 |
| 2013 | රු. 793,000,000.00 |
| 2014 | රු. 66,200,000.00 |

(ii) මේ වන විට කිරි ගවයින් 2,000ක් ආනයනය කර ඇත.

(iii) 2013 සහ 2014 වසර සඳහා කිරි සහ ද්විත්ව කාර්ය එළුවන් ආනයනය සඳහා මුදල් වෙන් කර නොමැත.

(iv) 2013 වසර වන විට එළුවන් ආනයනය කර නොමැත.

(ආ) අදාළ නොවේ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. එතුමා කිව්වා, කිරි ගවයින් ආනයනය කරන්න රුපියල් කෝටි හයක් වෙන් කරලා තිබෙනවාය කියලා. පසු ගිය 2014 අය වැයේ දී මුදල් අමාත්‍යවරයා විධියට අතිගරු ජනාධිපතිතුමා කිව්වා, ගවයින්

[ගරු අශෝක් අබේසිංහ මහතා]

20,000ක් ආනයනය කිරීමට බලාපොරොත්තු වනවාය කියලා. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ තිබෙනවා, 2014 වසරේදී ගවයින් 2,500ක් ආනයනය කරනවාය කියලා. ගවයින් 2,500ක් ආනයනය කිරීම සඳහා රුපියල් කෝටි 80ක් අවශ්‍ය බවත් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ සඳහන් කරලා තිබුණා. ඒ අනුව එම වෙන් කළ මුදලට ඒ ගවයින් ප්‍රමාණය ආනයනය කරන්නේ කොහොමද? එහෙම කරන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවාද?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු කථානායකතුමනි, මේක අලුත් ප්‍රශ්නයක්. මේකට වෙනම තොරතුරු සොයලා උත්තර දෙන්න අවශ්‍යයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මම මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙනවා, කිරි සහ ද්විත්ව කාර්ය එළුවන් ආනයනය සඳහා වෙන් කළ මුදල සම්බන්ධයෙන්. ඒ කියන්නේ කිරි සඳහාත්, මස් පිණිසත් එළුවන් ආනයනය කිරීමයි. මා ළඟ තිබෙනවා, 2012 විගණකාධිපති වාර්තාව. ඒ විගණකාධිපති වාර්තාවට අනුව 2010 වර්ෂයේ එළුවන් 1,000ක් ආනයනය කරන්න රුපියල් කෝටි දෙකකුත්, 2011 වසරට රුපියල් කෝටි තුන හමාරකුත්, 2012 වසරට රුපියල් කෝටි හතරකුත් වෙන් කරලා තිබෙනවා. නමුත්, මුදල් වෙන් කළත් එළුවන් ආනයනය කරලා නැහැ. මූලික වැඩ කටයුතු සඳහා රුපියල් 210,487ක් වියදම් වෙලා තිබෙනවා. එළුවන් ආනයනය කරන්න අය වැයෙන් මුදල් වෙන් කෙරුවත්, එළුවන් ආනයනය කරලා නැත්තේ ඇයි?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න විධියක් නැහැ. දැන් තමයි මෙතුමා කාල සීමා දක්වන්නේ. එතුමාගේ ප්‍රශ්නයේ කාල සීමාවක් දක්වා නැහැ. මොකද, අය වැය ලේඛනයෙන් නේ මුදල් වෙන් කරන්නේ. උත්තර දෙන්න නම්, ඔබතුමා නිශ්චිත කාල වකවානුවක් දෙන්න ඕනෑ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මේ වසර ගැන කියන්න.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
2014 වර්ෂය ගැන ඔබතුමා අහලා නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වර්ෂය අනුව ඇහුවා නම් හොඳයි.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ඔබතුමා මොන වර්ෂයද කියලා අහලා නැහැ. ඒ නිසා කොහොමද, මම උත්තරයක් දෙන්නේ?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මේකයි. පශු සම්පත් අංශය දළ දේශීය නිෂ්පාදනයට සපයන දායකත්වය සියයට දශම 8ක් පමණ වෙනවා. එතකොට රාජ්‍ය අංශයේ කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 78 දක්වා අඩු වෙලා තිබෙනවා. මේ මඟින් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය වැඩි කිරීම සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය අරගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු කථානායකතුමනි, මේක අලුත් ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නයට උත්තර දෙන්න තොරතුරු සොයන්න ඕනෑ. අනෙක් එක කිරි නිෂ්පාදනය අඩු වෙලා නැහැ. ඔබතුමන්ලා නවසීලන්තයෙන් කිරි පිටි ආනයනය කරපු එක තමයි අපට අද තිබෙන ගැටලුව.

## බත්තුළුඔය - උඩප්පුව මාර්ගය ඉදිකිරීම : ඇස්තමේන්තුගත මුදල
## பத்துலு ஓய-உடப்பு வீதி நிர்மாணம் : மதிப்பீட்டுத் தொகை
## CONSTRUCTION OF BATTULUOYA-UDAPPUWA ROAD : ESTIMATED AMOUNT

4956/'14

**12. ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, බත්තුළුඔය - උඩප්පුව මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) මෙම මාර්ගයේ ඉදිකිරීම් පවරා ඇති ආයතනය කවරේද;

(iii) එකී සමාගම වෙත ඉදිකිරීම් පැවරීමේ දී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයේ ඉදිකිරීම් අතරමගදී නවතා දැමීමෙන් ජනතාව බලවත් දුෂ්කරතාවකට පත්ව ඇති බව දන්නේද;

(ii) එම මාර්ගයේ ඉදිකිරීම් නැවත ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iii) ඉහත මාර්ගයේ ඉදිකිරීම් කටයුතු දීර්ඝ කාලයක් තිස්සේ නතර කර තිබීම නිසා ගමනාගමන කටයුතුවලදී පීඩාවන්ට පත්ව සිටින ජනතාවට සහන සැලසීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) புத்தளம் மாவட்டத்தில் பத்துலு ஓய-உடப்பு வீதியை நிர்மாணிப்பதற்கு மதிப்பீடு செய்யப்பட்டுள்ள பணத்தொகை யாது என்பதையும்;

(ii ) இவ்வீதியின் நிர்மாணப் பணிகள் ஒப்படைக்கப் பட்டுள்ள நிறுவனம் யாது என்பதையும்;

(iii ) இக் கம்பனிக்கு நிர்மாணப் பணிகளை ஒப்படைக்கும்போது முறைசார்ந்த கேள்விப்பத்திர நடைமுறை கடைப்பிடிக்கப் பட்டதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i ) மேற்குறிப்பிட்ட வீதியின் நிர்மாணப் பணிகள் இடைநடுவில் கைவிடப்பட்டதால் மக்கள் கடும் சிரமங்களுக்குள்ளாகியுள்ளனர் என்பதையும்;

(ii ) இவ்வீதியின் நிர்மாணப் பணிகள் மீண்டும் ஆரம்பிக்கப்படும் திகதி யாது என்பதையும்;

(iii ) மேற்குறிப்பிட்ட வீதியின் நிர்மாணப் பணிகள் நீண்ட காலமாக நிறுத்தப்பட்டிருப்பதால் போக்குவரத்தின்போது பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம் வழங்க நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Highways, Ports and Shipping:

(a) Will he inform this House -

(i) the estimated amount for the construction of the Battuluoya-Udappuwa Road in the Puttalam District;

(ii) the institution to which the construction of this road has been handed over; and

(iii) whether the proper tender procedure has been followed when the construction was handed over to the said company?

(b) Will he state -

(i) whether he is aware that people have been severely inconvenienced as a result of the construction of the above road being abandoned midway;

(ii) the date on which the construction of the said road will be resumed; and

(iii) whether action will be taken to grant relief to the people who have been adversely affected as a result of the lengthy stoppage of the construction of the above road?

(c) If not, why?

**ගරු නිර්මල කොතලාවල මහතා (මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Minister of Highways, Ports and Shipping)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) සහ (ii)

බත්තුළුඔය - උඩප්පුව - ආඩිමුණේ මාර්ගය කොන්ත්‍රාත් සමාගම් 06ක් යටතේ සංවර්ධනය කරන ලදී.

| | මාර්ග කොටස | කොන්ත්‍රාත් සමාගම | ඇස්තමේන්තු මුදල (රු. මිලියන) | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01 | කි.මී. 0+000 සිට 1+000 දක්වා | කැනෝලා ඉදිකිරීම් සමාගම | 27.70 | වැඩ අවසන් කර ඇත. |
| 02 | කි.මී. 1+000 සිට 2+050 දක්වා | ලූමිනෙක්ස් ඉදිකිරීම් සමාගම | 18.54 | වැඩ අවසන් කර ඇත. |
| 03 | කි.මී. 2+050 සිට 5+300 දක්වා | සුදේශ් ඉදිකිරීම් සමාගම | 74.12 | වැඩ අවසන් කර ඇත. |
| 04 | කි.මී. 5+300 සිට 5+800 දක්වා | හෙන්රි ඉදිකිරීම් සමාගම | 36.07 | වැඩ අවසන් කර ඇත. |
| 05 | කි.මී. 5+800 සිට 7+600 දක්වා | සන් කන්ස්ට්‍රක්ෂන් සමාගම | 92.40 | 2014.07.08 දින වැඩ ආරම්භ කර ඇත. |
| 06 | කි.මී. 7+600 සිට 9+300 දක්වා | - | - | ඇස්තමේන්තු සකස් කර ඇත. ටෙන්ඩර් කැඳවීමට නියමිතය. |

(iii) ඔව්.

(ආ) (i) ඉදි කිරීම් කටයුතු අතර මග නවතා දමා නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ මාර්ගයේ අන්තිම අදියරේ වැඩ අවසන් වන්නේ කවදාද කියලා ඇමතිතුමාට කියන්න පුළුවන්ද? ඒ සඳහා නිශ්චිත දිනයක් දෙන්න පුළුවන්ද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු කථානායකතුමනි, අවසන් කොටසේ වැඩ ආරම්භ කරලා තිබෙන්නේ ජූලි 8 වැනි දිනයි. ගිවිසුම් පත්‍රය බලලා ගරු මන්ත්‍රීතුමාට මා ඒක නිවැරදිව කියන්නම්.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙම මාර්ගයේ සමහර කොටස් විටින් විට ගංවතුර තර්ජනයට ලක් වෙනවා, ගරු ඇමතිතුමනි. මේ පිළිබඳව ඉංජිනේරු වාර්තාවක් ඔබතුමාට ලැබී තිබෙනවාද? මේ ගැන කටයුතු කරන්න ඔබතුමන්ලාගේ දීර්ඝකාලීන වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇහුවේ මාර්ගයේ ඉදි කිරීම් සම්බන්ධයෙන්ද, නැත්නම් ගංවතුර පාලනය පිළිබඳවද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

ගරු ඇමතිතුමනි, මේ මාර්ගය හැදුවාම විටින් විට ගංවතුර ඇවිත් එය කැඩෙනවා. ඒ පිළිබඳව කුමක් හෝ වාර්තාවක් ඔබතුමන්ලාට ඉදිරිපත් වෙලා තිබෙනවාද? ඉදිරියේදී මේ මාර්ගය වෙනස් කරන්න යම් ක්‍රියා මාර්ගයක් ගන්න අදහසක් තිබෙනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු කථානායකතුමනි, මේ මාර්ගය සංවර්ධනය කිරීමේදී වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ අදාළ ඉංජිනේරු තාක්ෂණයත්, අපේ අමාත්‍යාංශයේ ඉංජිනේරු තාක්ෂණයත් භාවිත කර වැඩි culverts ප්‍රමාණයක් දමලා විවෘත කිරීම් කරලා යම් කිසි ප්‍රමාණයකින් උස්සලා තිබෙනවා. ඒ ඉස්සීම අනුව තමයි මේ මාර්ගය සංවර්ධනය කර තිබෙන්නේ. ඕනෑ නම් ඔබතුමාට ඒ වාර්තාවත් ලැබෙන්න සලස්වන්න පුළුවන්.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ මාර්ගයට සම්බන්ධව උඩප්පුව කෝවිලේ සිට පොලීසිය දක්වා තව මාර්ගයක් තිබෙනවා. ඒ මාර්ගය ධීවර කර්මාන්තයට ඉතාම වැදගත් වෙනවා. නමුත් ඒ මාර්ගය ඉතාම අබලන්. ඒ මාර්ගයත් යම්කිසි යෝජනාවක් යටතේ සංවර්ධනය කරන්නට සැලසුම් කර තිබෙනවාද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමනි, පොලොව්විකුලම දක්වා පාර ගැනද ඔබතුමා අහන්නේ?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

ඔව්.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ඒ පාරත් සංවර්ධනය කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා අනුමත කර තිබෙනවා.

## අන්තර්ජාලය ඔස්සේ ඖෂධ මිලදී ගැනීම : දැනුවත් කිරීම

### இணையத்தினூடாக மருந்துகள் கொள்வனவு : விழிப்புணர்வூட்டல்

### ONLINE PURCHASE OF PHARMACEUTICAL DRUGS: PUBLIC AWARENESS

5026/’14

**13. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් අන්තර්ජාලය ඔස්සේ ඇණවුම් කර ඖෂධ මිලදී ගැනීමේ ප්‍රවණතාව මෑතක සිට ඉතා ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බවත්;

(ii) එසේ අලෙවි කරනු ලබන බොහෝ ඖෂධ වර්ග ශ්‍රී ලංකාවේ ලියා පදිංචි කර නොමැති බවත්;

(iii) අන්තර්ජාලය ඔස්සේ ඇණවුම් කර ලබා ගන්නා ඖෂධ බොහෝ විට වෛද්‍යවරුන්ගේ නිර්දේශයකින් තොරව භාවිත කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අන්තර්ජාලය ඔස්සේ දේශීය ජනතාවට අලෙවි කරනු ලබන ඖෂධ පිළිබඳව විධිමත් අධ්‍යයනයක් කර තිබේද;

(ii) එසේ සිදු කරනු ලබන ඖෂධ අලෙවිය නියාමනය කිරීමේ නීතිමය හැකියාවක් මෙරට සෞඛ්‍ය බලධාරීන් හට තිබේද;

(iii) නොඑසේ නම්, වෛද්‍ය නිර්දේශයකින් තොරව අන්තර්ජාලය ඔස්සේ ඖෂධ මිලදී ගැනීම හා එම ඖෂධ භාවිත කිරීම සම්බන්ධයෙන් පවතින අන්තරායකාරී ස්වභාවය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ජනතාව ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை நுகர்வோர் இணையத்தினூடாக கொள்வனவுக் கட்டளை அனுப்பி மருந்துகளைக் கொள்வனவு செய்யும் போக்கு அண்மைக் காலத்திலிருந்து வெகுவாக அதிகரித்துள்ளது என்பதையும்;

(ii) அவ்வாறு சந்தைப்படுத்தப்படுகின்ற அநேகமான மருந்து வகைகள் இலங்கையில் பதிவு செய்யப்படாதுள்ளவை என்பதையும்;

(iii) இணையத்தின் ஊடாக கொள்வனவுக் கட்டளை அனுப்பி பெற்றுக்கொள்ளும் மருந்துகள் பெரும்பாலும் மருத்துவர்களின் சிபாரிசு இன்றி பயன்படுத்தப்படுகின்றதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) இணையத்தின் ஊடாக உள்நாட்டு மக்களுக்குச் சந்தைப்படுத்துகின்ற மருந்துகள் தொடர்பில் முறைசார்ந்த ஆய்வொன்று நடத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறு மேற்கொள்ளப்படும் மருந்துகளின் சந்தைப்படுத்தலை ஒழுங்குமுறைப்படுத்துகின்ற சட்ட ரீதியான இயலுமை இந்நாட்டின் சுகாதார அதிகாரிகளுக்கு உள்ளதா என்பதையும்;

(iii) இன்றேல், மருத்துவர்களின் சிபாரிசு இன்றி இணையத்தின் ஊடாக மருந்துகளைக் கொள்வனவு செய்தல் மற்றும் அவற்றைப் பயன்படுத்துதல் தொடர்பில் காணப்படும் அபாய நிலை தொடர்பாக மக்களை விழிப்புணர்வூட்ட நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) ஆமெனில், மக்களை அது தொடர்பாக விழிப்புணர்வூட்டும் முறை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) the trend among Sri Lankan consumers to order and purchase pharmaceutical drugs online has increased rapidly during recent times;

(ii) most of the pharmaceutical drugs sold in the aforementioned manner have not been registered in Sri Lanka; and

(iii) pharmaceutical drugs obtained through online orders are often used without proper recommendation from doctors?

(b) Will he state -

(i) whether a formal study has been carried out regarding pharmaceutical drugs that are sold to locals through the internet;

(ii) whether the local health officers have the legal authority to regulate the sale of pharmaceutical drugs that is carried out in the aforesaid manner;

(iii) if not, whether action will be taken to educate the public on the dangers of purchasing drugs online without a medical prescription and the use of such drugs; and

(iv) if so, the manner that will be adopted to educate the public regarding the aforesaid matter?

(c) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ලෝකයේ දියුණු රටවල ඖෂධ මිලදී ගැනීම සඳහා අන්තර්ජාලය සුලභව භාවිත කෙරේ. ශ්‍රී ලංකාවේ එවැනි ප්‍රවණතාවක් වර්ධනය වී ඇති නමුත් මෙම ප්‍රවණතාව ඉතා ශීඝ්‍රයෙන් ඉහළ ගොස් නොමැත.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශයේ විලවුන් උපකරණ හා ඖෂධ අධිකාරිය යටතේ ලියා පදිංචිය ලබා ගත යුතු වන්නේ බටහිර ඇලෝපති ඖෂධ පමණි. හෝමියෝපති ඖෂධ, ආයුර්වේද ඖෂධ සහ පෙති, කරල් වැනි බටහිර ඖෂධවලට ආවේණික වූ මාත්‍රා ස්වරූපවලින් පැවතියද, ඖෂධ යන අර්ථ නිරූපණයට ඇතුළත් නොවන පෝෂණ, ඌනපූරක (Neutracouticals) වැනි ද්‍රව්‍ය පවතින නීති රීතිවලට අනුව ඖෂධ අධිකාරියේ ලියා පදිංචි කිරීම අවශ්‍ය නොවන අතර, අන්තර්ජාලය ඔස්සේ ප්‍රචාරය කරන හා මිලදී ගනු ලබන බහුතරයක් ඖෂධ මෙම කාණ්ඩයට අයත්ය.

(iii) ඉහත (ii)හි සඳහන් පරිදි හෝමියෝපති ඖෂධ, ආයුර්වේද ඖෂධ, පෝෂණ ඌනපූරක විලවුන් උපකරණ හා ඖෂධ පනතට අනුව ඖෂධ යන අර්ථ නිරූපණයට ඇතුළත් නොවන නිසා ඒ සඳහා නීත්‍යනුකූලව වෛද්‍ය නිර්දේශයක් අවශ්‍ය නොවේ.

(ආ) (i) මේ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා මේ වන විටත් සැලසුම් සකස් කරමින් පවතී.

(ii) විලවුන් උපකරණ හා ඖෂධ පනතට අනුව ඖෂධ යන අර්ථ නිරූපණයට ඇතුළත් වන බටහිර ඖෂධ නියාමනය කිරීමේ හැකියාව සෞඛ්‍ය බලධාරීන් හට තිබේ.

(iii) ඔව්.

(iv) අන්තර්ජාලය ඔස්සේ සිදු වන ඖෂධ වෙළඳාමේ අහිතකර කරුණු පිළිබඳවත් ඒ හරහා සිදු වන නීතිවිරෝධී ක්‍රියා හා රැවටීම් පිළිබඳවත් ජනතාව දැනුවත් කිරීමට විලවුන් උපකරණ හා ඖෂධ අධිකාරිය පියවර ගෙන ඇත.

ජනමාධ්‍ය මඟින් වරින්වර මේ පිළිබඳව මහජනතාව දැනුවත් කර ඇත.

විලවුන් උපකරණ හා ඖෂධ අධිකාරිය විසින් සෞඛ්‍ය වෘත්තිකයන් සහ මහජනතාව සඳහා වරින්වර පවත්වන වැඩමුළුවලදී මේ සම්බන්ධව දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.

මෙම දැනුවත් කිරීම හා නීති විරෝධී තත්ත්වයන් පාලනය කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව හා පොලිස් දෙපාර්තමේන්තුව ආදී ක්ෂේත්‍ර ඒකරාශීව සිදු කළ යුතු පුළුල් කාර්ය භාරයක් බැවින් එම සියලු ආයතන මේ වන විට ඒ පිළිබඳව දැනුවත් කර ඇත.

(ඇ) පැන නොනඟී.

ඔබතුමා ඉතාම කාලෝචිත ප්‍රශ්නයක් අහලා තිබෙන්නේ. ඒ ගැනත් ස්තුතිවන්ත වෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, අපේ නියෝජ්‍ය අමාත්‍යතුමාත් දන්නවා සාමාන්‍යයෙන් වෛද්‍යවරයෙක් විසින් අනුමත කරපු බෙහෙත් වට්ටෝරුවක් නොමැතිව ෆාමසියකින්වත් බෙහෙත් දෙන්නේ නැහැ කියා. ඒක තමයි දැනට තිබෙන නීතියේ සාමාන්‍ය ස්වභාවය. එසේ තිබියදී අන්තර්ජාලයෙන් මේ බෙහෙත් order කරන එක ශීඝ්‍රයෙන් වැඩි වෙලා තිබෙනවා. එය වෛද්‍යවරුම කියනවා. එසේ ඇණවුම් කරලා ප්‍රශ්න ඇති වුණු අවස්ථාත් තිබෙනවා. ඔබතුමා කිව්වා ජනතාව දැනුවත් කරලා තිබෙනවා කියලා. නමුත් මේකට නීති රාමුවක් අවශ්‍යයි කියලා අපි විශ්වාස කරනවා. ඒකට අවශ්‍ය කරන නීති රාමුවක් හදන්න ඔබතුමා බලාපොරොත්තු වෙන්නේ නැද්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, යම් ඖෂධයක් කොයි ආකාරයෙන් ඇණවුම් කළත් ඒවා රේගුව හරහා එන්න ඕනෑ. අන්තර්ජාලය හරහා ඇණවුම් කළත් සාමාන්‍ය ක්‍රමවේදයට අනුව එන්න ඕනෑ. ඒවා මේ රටට එන්න එපායැ. ඒ ක්‍රමවේදයේදී යම්කිසි බටහිර ඖෂධයක් ගෙනැල්ලා තිබෙනවා නම් රේගුව විසින් එය නිදහස් කිරීමට ප්‍රථම ඒ සම්බන්ධයෙන් දැනුවත් කරලා අපේ විලවුන් උපකරණ හා ඖෂධ අධිකාරියේ අනුමැතිය ගන්නම ඕනෑ. එහෙම නැතුව බෙහෙතක් නිදහස් කරන්නේ නැහැ. ඒ පරිපාලනය ඒ ආකාරයෙන්ම තිබෙනවා. නමුත් මේ අනෙකුත් කාරණා සම්බන්ධයෙන් ඒ කියන්නේ සමහර පෝෂණ ද්‍රව්‍ය සම්බන්ධ - nutritions සම්බන්ධ- යම් නිෂ්පාදනත් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඒ පනතට අදාළ සංශෝධනයන් ඉදිරි කාලයේදී ගෙන එන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා අප රට තුළ ශීඝ්‍රයෙන් හොර දොස්තරලා බිහි වෙමින් පවතින බව. MBBS උපාධියක් තිබුණු පමණින් ඔවුන් එක් එක් ක්ෂේත්‍රවලට විශේෂඥයින් නොවෙයි. එවැනි අවස්ථාවන් නිසා පසු ගිය දවස්වල වෛද්‍යවරියකුත් මරණයට පත් වුණා. මෙවැනි දේවල් නොවෙන්න ඔබතුමන්ලා අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පසු ගිය දවසේ වෛද්‍යවරිය මිය ගිය සිද්ධියට අදාළ ඒ ප්‍රතිකාර කළ තැනැත්තා වෛද්‍ය සභාවේ ලියා පදිංචි වෛද්‍යවරයෙක්. ඒක පැහැදිලිව ප්‍රකාශ වුණා. ඔහුට ඒ කටයුත්ත කරන්න බලයක් තිබෙනවාද කියන එක සම්බන්ධයෙන් තමයි ප්‍රශ්නයක් තිබෙන්නේ. හොර දොස්තරලා 10,000ක් ඉන්නවා කියලා මතයක් තිබෙනවා. නමුත් හැම ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයෙකුටම මේ සඳහා බලතල තිබෙනවා, ගරු කථානායකතුමනි. පැමිණිල්ලක් ලැබුණොත් අපි ක්‍රියාත්මක වෙනවා. මේක වෘත්තිමය සම්බන්ධයක් තිබෙන කරුණක්. අපි පැන පැන අල්ලන්න ගියොත් තවත් දෙයක් වෙන්න පුළුවන්. එතකොට වෛද්‍ය වෘත්තිකයාට තමන්ගේ වෘත්තිය කරන්න දෙන්නේ නැහැ කියලා කියන්න පුළුවන්. අපට පැමිණිලි තිබෙනවා. ඒ 10,000 ලැයිස්තුව අපට දුන්නොත් කිසි ප්‍රශ්නයක් නැතුව අපට ඒක කරන්න පුළුවන්. 10,000ක් ඉන්නවා කියන එක කියනවා. පැහැදිලිවම ප්‍රාදේශීය වශයෙන් බෙහෙත් ගන්න වෛද්‍යවරයා වෛද්‍ය වෘත්තිකයෙක් නොවෙයි නම් ඕනෑම කෙනෙකුට ඒ පිළිබඳව පැමිණිල්ලක් කරන්න පුළුවන්. එහෙම පැමිණිල්ලක් ලැබුණොත් අනිවාර්යයෙන්ම අපි ඒ පිළිබඳව කටයුතු කරනවා. විශේෂයෙන්ම මේ සම්බන්ධ පැමිණිල්ලක් නැතුව සොයන්න -විමර්ශනයක් කරන්න- අමාරුයි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මම නම් ඒක පිළිගන්නේ නැහැ. පැමිණිල්ලක් අවශ්‍ය වෙන්නේම නැහැ ඒක කරන්න. ඒක වෛද්‍යවරුන්ට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මොකද, සුදුසුකම් තිබෙන වෛද්‍යවරු ඔවුන් ලබා තිබෙන උපාධිය හෝ විශේෂඥතාව මත ඔවුන්ගේ වෘත්තිය කරගෙන යනවා නම් ඔවුන්ට ප්‍රශ්නයක් වෙන්න බැහැ. ප්‍රශ්නය වෙන්නේ ඊට පරිබාහිරව තමන්ට අදාළ නැති දේවල් කරන අය සම්බන්ධයෙනුයි. මේ සඳහා කමිටුවක් පත් කරලා හෝ මේවා ගැන සොයා බලා, ඒ අය හඳුනාගෙන ඒ ගොල්ලන්ට දඬුවම් ලබා දීම කළ යුතුයි කියා අපි විශ්වාස කරනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අදහස මොකක්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඇත්තෙන්ම බොහෝ දුරට ඒ විධියට කටයුතු කරන වෛද්‍යවරුන් සම්බන්ධයෙන් දැනටමත් අපේ විමර්ශන අංශයෙන් පරීක්ෂණ කරලා දඬුවම් දීපු අවස්ථා තිබෙනවා. ඒ වාගේම පොලීසිය විසින් ඔවුන් අල්ලා ගත් අවස්ථාවලත් ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරලා තිබෙනවා. මොකද, අමාත්‍යාංශය හැටියට අපට සිටින නිලධාරින් සංඛ්‍යාව අනුව විමර්ශන ඒකකයෙන් මේ පරීක්ෂණ කටයුතු කරන්න අපහසුයි. අපට ලැබෙන හැම තොරතුරකදීම අපි ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම පෞද්ගලික වෛද්‍ය ආයතන සම්බන්ධයෙන් නියාමනය කිරීමට වෙනම පනතකුත් අපි හඳුන්වලා දීලා තිබෙනවා. එහි වැඩිම බලතල ප්‍රමාණයක් හිමි වෙන්නේ පළාත් සභාවල පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන්ටයි. ඒ අනුවත් කටයුතු සිද්ධ වෙනවා. කටවහරට කියනවා 10,000ක්, 50,000ක් විතර හොර දොස්තරවරු ඉන්නවා කියන එක.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පොලීසියට, අරගොල්ලන්ට, මේ ගොල්ලන්ට භාර දීලා නොවෙයි, සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට යම් කටයුත්තක් කළ යුතුයි කියලා ඔබතුමා විශ්වාස කරන්නේ නැද්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඇත්තෙන්ම අමාත්‍යාංශය විසින් දැනටමත් ඒක කරගෙන යනවා. දැනටමත් කරගෙන යන නිසා තමයි එවැනි අය බොහෝ දෙනා අහු වෙන්නේ.

## කොළඹ විශ්වවිද්‍යාලය : මූල්‍ය ප්‍රතිපාදන
## கொழும்பு பல்கலைக்கழகம் : நிதி ஏற்பாடுகள்
## UNIVERSITY OF COLOMBO: FINANCIAL PROVISION

2686/'12

**14. ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) කොළඹ විශ්වවිද්‍යාලයට අයත් පීඨ සංඛ්‍යාව කොපමණද;

(iii) එම පීඨයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයට වෙන් කළ ප්‍රතිපාදනවල මුළු වටිනාකම කොපමණද;

(ii) එම ප්‍රතිපාදනයන් 2012 වර්ෂය තුළ එම විශ්වවිද්‍යාලයේ පැවති සියලුම අවශ්‍යතාවන් සම්පූර්ණ කරලීම සඳහා ප්‍රමාණවත් වූයේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது கொழும்பு பல்கலைக்கழகத்தில் கல்வி கற்கும் மாணவர்களின் மொத்த எண்ணிக்கை யாது என்பதையும்;

(ii) கொழும்பு பல்கலைக்கழகத்திற்குரிய பீடங்களின் எண்ணிக்கை யாது என்பதையும்

(iii) இப்பீடங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2 0 1 2 ஆம் ஆண்டுக்காக கொழும்பு பல்கலைக்கழகத்துக்கு ஒதுக்கப்பட்ட நிதி ஏற்பாடுகளின் மொத்தப் பெறுமதி யாது என்பதையும்;

(ii) மேற்படி நிதி ஏற்பாடுகள் 2012ஆம் ஆண்டில் இப்பல்கலைக்கழகத்தில் நிலவிய அனைத்துத் தேவைகளையும் நிறைவு செய்வதற்குப் போதியதாக உள்ளதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education:

(a) Will he state -

(i) the total number of students studying at the University of Colombo at present;

(ii) the number of faculties belonging to the University of Colombo; and

(iii) the names of the aforesaid faculties?

(b) Will he also state -

(i) the total value of the provisions allocated for the University of Colombo for the Year 2012; and

(ii) whether the aforesaid provisions were sufficient for fulfilling all the requirements of the aforesaid university in the year 2012?

(c) If not why?

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 8,907යි.

පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 5,071යි.

මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 13,924යි.

(ii) පීඨ 07කි.

(මීට අමතරව මණ්ඩප 1ක්, උසස් අධ්‍යාපන ආයතන 6ක් සහ පශ්චාත් උපාධි ආයතන 1ක් කොළඹ විශ්වවිද්‍යාලය යටතේ ඇත.)

(iii) (1) කලා පීඨය

(2) අධ්‍යාපන පීඨය.

(3) නීති පීඨය.

(4) කළමනාකරණ හා මූල්‍ය පීඨය.

(5) වෛද්‍ය පීඨය

(6) විද්‍යා පීඨය

(7) උපාධි අධ්‍යාපන පීඨය

(ආ) (i) රුපියල් බිලියන 1.63කි.

(ii) ඔව්.

(ඇ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, 2005 ඉඳලා වාර්ෂිකව බැලුවාම ක්‍රමානුකූලව අධ්‍යාපන ක්ෂේත්‍රයේ මුදල් කප්පාදුවක් සිදු වෙලා තිබෙනවා. අද වන විට කොළඹ විශ්වවිද්‍යාලයේ තිබෙන යටිතල පහසුකම් පිළිබඳ ප්‍රශ්න දිහා බැලුවාම මේ මුදල් කප්පාදුව නිසා ඒ සිසු පරපුරට බලවත් අසාධාරණයක් සිදු වෙනවා නේද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, පළමුවැනිම දේ තමයි මුදල් කප්පාදුවක් වන්නේ නැහැයි කියන එක. අපේ රටේ දළ දේශීය නිෂ්පාදනය එන්න එන්න බොහොම වේගයෙන් වැඩි වෙනවා. දළ දේශීය නිෂ්පාදනය වැඩි වෙන කොට අපි වෙන් කරන මුදල් ප්‍රමාණය වැඩි වුණාට සියයට ගණන අඩු වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි වෙන් කළ මුදල් බැලුවොත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවෙලා සිටි අවුරුදු දෙකක කාලයේ විතරක් මුදල් අඩු වෙලා තිබෙනවා. අනෙක් හැමදාම මුදල් වැඩි වෙලා තිබෙනවා. අපේ කාලයේ දිගටම මුදල් වැඩි වෙලා තිබෙනවා. නමුත් රටේ දළ දේශීය නිෂ්පාදනය බොහොම වේගයෙන් ඉහළ යන නිසා සියයට ගණන අඩුවක් පෙනනවා. ඒ නිසා පළමුවැනි දේ තමයි කිසිම මුදල් අඩුවක් නැහැයි කියන එක. දිගටම මුදල් වැඩි වෙලා තිබෙනවා.

ඇත්තටම අපේ ගරු මන්ත්‍රීතුමා ඇහුව දෙවැනි කාරණය ගැන කියන්න තිබෙන්නේ මේකයි. කොළඹ විශ්වවිද්‍යාලයේ අපට තිබෙන ප්‍රධාන ගැටලුව වන්නේ ඉඩම්. අපි දැනට කොළඹ විශ්වවිද්‍යාලයට නේවාසිකාගාර හතරක් හදන්න ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. අපට ඒවා හදා ගන්න ඉඩම් නැහැ. එක ඉඩමක් තිබෙනවා. විහාරස්ථානයක් එක්ක එහි අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අපි දැන් ඉඩකඩම් සල්ලි දීලා ගැනීම සඳහා දැන්වීමකුත් පළ කර තිබෙනවා. ඒ අතර අපි නාගරික සංවර්ධන අධිකාරිය එක්කත් කථා කර ගෙන යනවා. ඉඩම් ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ. මුදල් ප්‍රශ්නයක් නොවෙයි. ඉඩම් තිබෙනවා නම් අපට කොළඹ විශ්වවිද්‍යාලය මීට වඩා හුගාක් දියුණු කර ගන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරෙන් නේවාසිකාගාර ගැන කථා කළ නිසා මම මේ කාරණය අහන්න කැමැතියි. නේවාසිකාගාර ගාස්තු හැටියට ඔබතුමන්ලා හැම ශිෂ්‍යයකුගෙන්ම රුපියල් 3000ක් අය කරනවා. පසු ගිය දවස්වල ඒ සිසුන්ගේ අරගළයක් තිබුණා, ඒ මුදල රුපියල් 800ට අඩු කරන්නය කියලා.

මහපොළ ශිෂ්‍යාධාර මුදල අඩුම ගණනේ රුපියල් 7,000ක් හෝ රුපියල් 8,000ක් කරලා විශ්වවිද්‍යාල සිසු පරපුරේ ඉගෙනීමේ ක්‍රියාවලියත් ශක්තිමත් කරන්න ඕනෑ. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, විශේෂයෙන්ම ඔබතුමන්ලාට නේවාසිකාගාර පහසුකම් ලබා දෙන්නට බැරි තත්ත්වයක් තුළ මේ අය කරන රුපියල් 3,000 මුදල, අඩු ගණනේ රුපියල් 800 දක්වා අඩු කරනවාද, එහෙම නැත්නම් මහපොළ ශිෂ්‍යාධාර මුදල රුපියල් 6,000ක් හෝ රුපියල් 7,000ක් දක්වා වැඩි කරනවාද කියලා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයේත් අඩු පාඩුකම් කිහිපයක් තිබෙනවා. පළමුවන කාරණය මෙයයි. විශ්වවිද්‍යාල විසින්

[ගරු එස්.බී. දිසානායක මහතා]

නේවාසිකාගාර සඳහා අය කරන මුදල රුපියල් 400 සිට තමයි පටන් ගන්නේ. සමහර විශ්වවිද්‍යාල රුපියල් 400ක් අය කරනවා. සමහර විශ්වවිද්‍යාල රුපියල් 500ක් අය කරනවා. සමහර විශ්වවිද්‍යාල රුපියල් 600ක් අය කරනවා. කොළඹ විශ්වවිද්‍යාලයේ සමහර නිවාසවලට රුපියල් 3,000ක් අය කරනවා ඇති. ඒ අය කරන මුදල අය කරන්නේ අවුරුද්දකටයි. ගරු කථානායකතුමනි, ඇත්තටම ඒ අය කරන මුදල ඒ කාමරයේ ඒ ළමයින් පාවිච්චි කරන විදුලිය හා වතුර වෙනුවෙන් අය කරන විදුලි බිලට හා වතුර බිලටවත් ප්‍රමාණවත් නැහැ. ඊටත් වඩා අඩු මුදලක් තමයි අපි අය කරන්නේ. ඒ වාගේම මේවායේ වෙනස්කම් තිබෙනවා. අපට නේවාසිකාගාර හදා ගැනීමේ ඉඩකඩ පිළිබඳ ගැටලුව තිබෙන නිසා කොළඹ විශ්වවිද්‍යාලය විවිධ ස්ථානවලින්, විවිධ ගණන්වලට ගෙවල් 30ක්, 40ක් කුලියට ගෙන නේවාසිකාගාර පවත්වා ගෙන යනවා. සමහර සිසුන්ට විශ්වවිද්‍යාලය ආසන්නයේ ඉන්න ඕනෑ ප්‍රශ්නත් තිබෙනවා.

දෙවන කාරණය තමයි, ඔබතුමා කිව්ව මහපොළ ශිෂ්‍යාධාර මුදල පිළිබඳ කාරණය. මහපොළ ශිෂ්‍යාධාර මුදල පිළිබඳව මේ වන කොට අතිගරු ජනාධිපතිතුමා අපත් සමඟ සාකච්ඡා පවත්වා තිබෙනවා. මා දැක්කා, ළමයිනුත් ඒ පිළිබඳව කථා කරලා තිබුණු බව. හැබැයි ඒ ළමයින් කථා කරන්නත් ඉස්සෙල්ලා, කවුරු කථා කරන්නත් ඉස්සෙල්ලා අතිගරු ජනාධිපතිතුමා මහපොළ ශිෂ්‍යත්ව අරමුදල සහ අප සමඟ සාකච්ඡා වට දෙකක් පවත්වා, ඔබතුමා කිව්වා වාගේ අඩුම ආදායම් ලබන ළමයින්ට දෙන මහපොළ ශිෂ්‍යාධාර මුදල් ප්‍රමාණය වැඩි කිරීම සඳහා දැන් අවශ්‍ය කටයුතු කර ගෙන යනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා අලුත්ම සූත්‍රයක් ඉදිරිපත් කළා, "කොහොමත් දළ දේශීය නිෂ්පාදනය ඉහළ යනවා. එම නිසා ප්‍රතිශතය වැදගත් වන්නේ නැහැ. ප්‍රතිශතය අඩු වුණාට ගැටලුවක් නැහැ. වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කරනවා"යි කියලා. ගරු ඇමතිතුමනි, ඊයේ දවසේ මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ වුණා, ජනාධිපති කොමිෂන් සභා 17කට රුපියල් කෝටි 27ක් වැය කර තිබෙනවාය කියලා. ඉතින් මා අහන්න කැමැතියි, ඔබතුමා ඔය කැබිනට් මණ්ඩලයේ ඉන්න කොට පොඩි අරගළයක් කරලා, අර රුපියල් කෝටි 27 මුදලට සාපේක්ෂව උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් වැඩි මුදලක් වෙන් කර ගෙන, අපේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ පහසුකම් ඌනතාවන්ගෙන් පෙළෙන විශ්වවිද්‍යාලවලට ඒ වැඩි මුදල හරහා වැඩි ප්‍රතිපාදනයක් ලබා දෙන්නට ඔබතුමාගේ ඔය සුපුරුදු සටන්කාමී ක්‍රියාවලිය යොදවන්නේ නැත්තේ ඇයි කියලා. ජනාධිපතිතුමාට පොඩ්ඩක් භයද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට කියන්නේ, ඔබතුමාගේ පියාත් සිටි ආණ්ඩුවෙන් 1977 සිට 1994 දක්වා වූ කාලය තුළ hostel එකක්වත් හැදුවේ නැහැ කියලායි. ඔබතුමා ඒක හොඳට මතක තබා ගන්න. විශ්වවිද්‍යාල දරුවන්ට hostels නොදෙන්න තීරණය කරලායි තිබුණේ. ඒ දරුවන්ට කළ අසාධාරණය නිවැරදි කරන්න තමයි අද අපි hostels 64ක් හදන්නේ. ඒකට වියදම, රුපියල් බිලියන 13.7යි.

ගරු කථානායකතුමනි, අද අපි තාක්ෂණ විශ්වවිද්‍යාලය හදනවා; වියදම රුපියල් බිලියන 13යි. අද අපි පේරාදෙණියේ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය හදනවා; වියදම රුපියල් බිලියන 12යි. අද අපි පේරාදෙණියේ පශ්චාත් ඉංජිනේරු උපාධි පීඨය හදනවා; වියදම රුපියල් බිලියන 9යි. ඒ නිසා හිතන්න එපා අපි මේ පොඩි පොඩි මුදල් ප්‍රමාණයන් ඉල්ලනවා කියලා.

ගරු කථානායකතුමනි, අපි යාපනය විශ්වවිද්‍යාලයට කිව්වා, "විශ්වවිද්‍යාල නගර සංවර්ධන වැඩසටහනක් - University Township Project එකක්- හදා ගෙන එන්න" කියලා. රුපියල් මිලියන 175කට හදා ගෙන ආවා. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්තුමා කිව්වේ, "මම දෙල්කඳ පොළටත් මීට වඩා වියදම් කරලා තිබෙනවා. මේක රුපියල් බිලියන 7, 8කට හදා ගෙන එන්න" කියලා. ඒක තමයි අද අපේ තත්ත්වය. ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ මුදල් ශක්තිය හොඳයි. ඉස්සර අපේ බැංකුවලට තිබුණේ රුපියල් බිලියන 3000ක, 4000ක ශක්තියක්. අද අපට රුපියල් බිලියන 12,000ක ශක්තියක් තිබෙනවා. අද අපි මුදල් අතින් උඩ ඉන්නේ. ඔය තුට්ටු දෙකේ ගණන් නොවෙයි. බිලියන 1,000, 3000, 4000 වාගේ ගණන්වලින් යන්නේ. ඕනෑ තරම් සල්ලි තිබෙනවා. අපට වියදම් කර ගන්නයි බැරි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා බිලියන ගණන්වලින් කථා කරන්නේ. එහෙම නම් ඇයි මහපොළ ශිෂ්‍යාධාර මුදල වැඩි කරන්නේ නැත්තේ?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
කලබල වෙන්න එපා. අපි ඒ ගැන කථා කර ගෙන යනවා. එදා තිබුණු විශ්වවිද්‍යාලය නොවෙයි අද තිබෙන්නේ. ගරු කථානායකතුමනි, අද මම විශ්වවිද්‍යාලයට ගියාම ළමයින් මට කියනවා, "අපට parking ප්‍රශ්නයක් තිබෙනවා." කියා. ගරු අගමැතිතුමනි, ළමයින් මට කියනවා, "අපට parking ප්‍රශ්නයක් තිබෙනවා" කියලා. මෙහෙමයි අද ළමයින් කථා කරන්නේ. එදා වාගේ නොවෙයි. අද ළමයින්ගේ ආර්ථික තත්ත්වයත් ටිකක් ඉහළ මට්ටමක තිබෙන්නේ. හැබැයි ඉතාම අඩු ආර්ථික මට්ටමක සිටින පොඩි පිරිසක් ඉන්නවා. ඒ ගැන ජනාධිපතිතුමා අපට කියා තිබෙනවා. අපි ඒ ගැන කටයුතු කර ගෙන යනවා. ඒක අපි කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
අතුරු ප්‍රශ්න තුන අසා ඉවරයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න තුනම ඇහුවා නේද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මටත් අතුරු ප්‍රශ්න ගණන හරියට බලන්න බැරි වුණා. හොඳයි, එක අතුරු ප්‍රශ්නයක් අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම හම්බන්තොට නිසා ඔබතුමා වැඩිපුර අතුරු ප්‍රශ්නයක් අහන්න ඉඩ දෙන්න. ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා බොහොම ලස්සනට මිලියන, බිලියන, ට්‍රිලියන කියලා, වාහන park කරන්නත් ඉඩ නැති එක විශ්වවිද්‍යාල ප්‍රශ්නයක් බවට පත් කරලා කථා කළා. නමුත් අද විශ්වවිද්‍යාල සිසු දරු දැරියන්ට නේවාසිකාගාර ප්‍රශ්නයක් තිබෙනවා. ඊට අමතරව බරපතළ සම්පත් ඌනතාවක් තිබෙනවා. කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දීමේ දී බරපතළ ගැටලුවක් තිබෙනවා, ළමයින්ට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රගුණත්වයක් නැති නිසා. [බාධා කිරීමක්]

ඔබතුමා බිලියන ගණන් කථා කළා, ට්‍රිලියන ගණන් කථා කළා, car parks ගැන කථා කළා. නමුත් කවදාද මේ හැම විශ්වවිද්‍යාලයකටම ජාත්‍යන්තර මට්ටමේ භාෂා විද්‍යාගාර ස්ථාපනය කරන්නට ඔබතුමන්ලා කටයුතු කරන්නේ?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
මේ ප්‍රශ්නය මගෙන් මීට කලිනුත් අපේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඇහුවා. එතුමා නොවේ නම් වෙනත් මන්ත්‍රීවරයෙක් ඇහුවා. අද අපේ හැම විශ්වවිද්‍යාලයකම තොරතුරු තාක්ෂණාගාර තිබෙනවා. විශාල තාක්ෂණාගාර දෙක, තුන, හතර තිබෙනවා. ඒ වාගේම අපේ හැම විශ්වවිද්‍යාලයකම භාෂාගාර දෙකක්, තුනක්, හතරක් තිබෙනවා. කොළඹ විශ්වවිද්‍යාලයේ ඒවා ඉතාම ඉහළ මට්ටමින් තිබෙනවා.

නේවාසිකාගාර ගැන මතක් කළ නිසා මම ඔබතුමාට නැවතත් කියන්නම්. ඔබතුමන්ලා 1977 සිට 1994 දක්වා එක නේවාසිකාගාරයක්වත් හැදුවේ නැහැ විතරක් නොවෙයි, ඔබතුමන්ලා හදපු එකම විශ්වවිද්‍යාලය වන රුහුණු විශ්වවිද්‍යාලයේත් එකම නේවාසිකාගාරයක්වත් හැදුවේ නැහැ. අද අපි නේවාසිකාගාර 64ක් හදනවා. ඒ නිසා නේවාසිකාගාර ප්‍රශ්නය වේගයෙන් විසඳෙමින් යනවා. අද අපි විශ්වවිද්‍යාලවල දරුවන්ගේ පහසුකම්, විශ්වවිද්‍යාලවල දරුවන්ගේ අධ්‍යාපන පහසුකම්, විශ්වවිද්‍යාල දරුවන්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් සියල්ල වේගයෙන් වැඩි කරගෙන යනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කොළඹ විශ්වවිද්‍යාලයේත්, හම්බන්තොට වැලිගත්තේත් hostel හදාගෙන යනවා. මන්ත්‍රීතුමා පොඩ්ඩක් ගිහින් බලන්න. දෙවන වටය.

## 'ජයිකා' ණය සහ ප්‍රදාන : විස්තර
## 'ஜைக்கா' கடன் மற்றும் கொடைகள் : விபரம்
## LOANS AND GRANTS OF JICA : DETAILS

3279/'12

**2. ගරු ජෝන් අමරතුංග මහතා ( ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2011, 2012 සහ 2013 වර්ෂවලදී ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන ලද ණය සහ ප්‍රදාන සම්බන්ධයෙන්,
   (i) ඒවායේ වටිනාකම කොපමණද;
   (ii) ණය කාල පරිච්ඡේදය කවරේද;
   (iii) සාමාන්‍ය පොලී වියදම කවරේද;
   (iv) ණය හෝ ප්‍රදානයන් ලබා දුන් කොන්ත්‍රාත් හෝ ව්‍යාපෘති කවරේද;

   යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011, 2012 ஆம் மற்றும் 2013 ஆம் ஆண்டுகளில் ஜப்பான் சர்வதேச கூட்டுத்தாபன முகவரினால் (JICA ) இலங்கைக்கு வழங்கப்பட்ட கடன்கள், கொடைகள் ஆகியவற்றின்,
   (i) பெறுமதிகள் எவ்வளவு என்பதையும்;
   (ii) கொடுத்துதவப்பட்ட காலப்பகுதி எவ்வளவு என்பதையும்;
   (iii) சராசரி வட்டிச் செலவு எவ்வளவு என்பதையும்;
   (iv) கடன்கள் மற்றும் கொடைகள் வழங்கப்பட்ட ஒப்பந்தங்கள் அல்லது கருத்திட்டங்கள் எவை என்பதையும்;

   அவர் கூறுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state pertaining to the loans and grants given to Sri Lanka by the Japan International Co-operation Agency - JICA - in the years 2011, 2012 and 2013 -
   (i) the values;
   (ii) the lending period;
   (iii) the average interest cost; and
   (iv) the contracts or projects that the loans and grants were given for?

(b) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

****සභාමේසය මත තබන ලද පිළිතුර:***
**சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
**Answer tabled:*

(අ) (i) ණය හා ප්‍රදාන

* ලබා දෙන ලද මුළු ණයවල වටිනාකම රුපියල් මිලියන 174,669.0
* ලබා දෙන ලද මුළු ප්‍රදානවල වටිනාකම රුපියල් මිලියන 6,796.3

2011, 2012, 2013 යන වර්ෂවලදී ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය -JICA- විසින් ලබා දෙන ලද ණය හා ප්‍රදාන

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

(ii) ණය කාල පරිච්ඡේද එක් එක් ව්‍යාපෘතියේ ස්වභාවය අනුව අවුරුදු 25 සිට 40 දක්වා වේ. (විස්තර ඇමුණුම 1* හි දක්වා ඇත. )

| වර්ෂය | ණය (රුපියල් මිලියන) | ප්‍රදාන (රුපියල් මිලියන) |
|---|---|---|
| 2011 | 53,836.0 | 2,443.6 |
| 2012 | 59,468.0 | 1,396.2 |
| 2013 | 61,365.0 | 2,956.2 |
| එකතුව | 174,669.0 | 6,796.3 |

(iii) ඉහත ණයවලට අදාළව වාර්ෂික සාමාන්‍ය පොලී වියදම රුපියල් මිලියන 262.8ක් වේ. (වාර්ෂික සාමාන්‍ය පොලී වියදම ඇතුළත් වගුව ඇමුණුම 2* හි දක්වා ඇත. )

ප්‍රදාන සඳහා පොලී වියදමක් නැත.

(iv) පහත සඳහන් ව්‍යාපෘති සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය -JICA- විසින් 2011, 2012, 2013 යන වර්ෂවලදී ණය ලබා දෙන ලදී.

2011

* මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - දෙවන අදියර (II)
* වවුනියා - කිලිනොච්චි විදුලි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය (II)
* ස්වාභාවික හදිසි ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය

2012

* නැඟී එන ප්‍රදේශයන්හි සෞඛ්‍ය සේවා පහසුකම් වැඩි දියුණු කිරීම
* හබරණ - වේයන්ගොඩ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය
* බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සවර්ධන ව්‍යාපෘතිය - දෙවන අදියර

2013

* මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ නාස්තිය අවම කිරීමේ ව්‍යාපෘතිය
* ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදි කිරීමේ ව්‍යාපෘතිය
* නාය යෑමේ ආපදාවලින් ජාතික මාර්ග ජාලය ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපෘතිය
* අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය

පහත සඳහන් ව්‍යාපෘති සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය -JICA- විසින් 2011, 2012, 2013 යන වර්ෂවලදී ප්‍රදාන ලබා දෙන ලදී.

2011

* ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ කාටුන් නිෂ්පාදන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය
* මඩකලපු කළපුව හරහා මන්මුනෙයි පාලම ඉදි කිරීමේ ව්‍යාපෘතිය
* අඩු වරප්‍රසාදලාභී ගොවි ජනතාව සඳහා ආහාර සුරක්ෂිතතා ව්‍යාපෘතිය
* මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව වැඩසටහන

2012

* කිලිනොච්චි ජලසම්පාදන යෝජනා ක්‍රමය පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් ප්‍රදාන ආධාර
* කැළණිය සහ සබරගමුව විශ්වවිද්‍යාලයන්හි ජපන් භාෂාව ඉගැන්වීමේ උපකරණ වැඩි දියුණු කිරීම සඳහා ජපන් ප්‍රදාන ආධාර
* මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව වැඩසටහන

2013

* මඩ කැණීම් යන්ත්‍රයක් නිර්මාණය කර සැපයීමේ ව්‍යාපෘතිය
* ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ගයන්හි ආරක්ෂිත ප්‍රවාහන පහසුකම් ස්ථාපිත කිරීම වෙනුවෙන් රථවාහන ගමනාගමන තොරතුරු පද්ධතියක් සැපයීමේ ව්‍යාපෘතිය
* මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව වැඩසටහන

(ආ) පැන නොනඟී.

*** ඇමුණුම්:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

**ඇමුණුම 1**

**2011,2012,2013 යන වර්ෂවලදී ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය විසින් ලබාදෙන ලද ණය සඳහා අදාළ කාලපරිච්ඡේදයන්**

| ව්‍යාපෘතිය | සක්‍රීය දිනය | අවසන දිනය | උපයෝජන කාල පරිච්ඡේදය වර්ෂ වලින් | සහන කාලය | ආපසු ගෙවීමේ කාලය | ණය කාල පරිච්ඡේදය (වර්ෂ වලින්) |
|---|---|---|---|---|---|---|
| මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - දෙවන අදියර (11) | 2011/07/15 | 2018/07/15 | 7 | 10 | 30 | 40 |
| වවුනියා කිලිනොච්චි විදුලි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය (11) | 2011/06/24 | 2016/04/20 | 5 | 10 | 30 | 40 |
| ස්වාභාවික හදිසි ආපදා පුනරුත්ථාපන කිරීමේ ව්‍යාපෘතිය | 2011/12/07 | 2016/12/17 | 5 | 10 | 30 | 40 |
| නැඟී එන ප්‍රාද්ශයන්හි සෞඛ්‍ය සේවා පහසුකම් වැඩිදියුනු කිරීම | 2012/07/23 | 2019/07/23 | 7 | 10 | 30 | 40 |
| හබරණ - වේයන්ගොඩ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය | 2012/07/23 | 2019/07/23 | 7 | 10 | 30 | 40 |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය | 2012/09/20 | 2018/09/20 | 6 | 10 | 30 | 40 |
| මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ නාස්තිය අවම කිරීමේ ව්‍යාපෘතිය | 2013/07/05 | 2020/07/20 | 7 | 10 | 30 | 40 |
| ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ | 2013/07/05 | 2021/07/05 | 8 | 10 | 30 | 40 |
| නාය යෑමේ ආපදා වලින් ජාතික මාර්ග ජාලය ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපෘතිය | 2013/07/05 | 2020/07/05 | 7 | 7 | 18 | 25 |
| අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1 | 2013/07/05 | 2020/07/20 | 7 | 7 | 18 | 25 |

| 2011,2012,2013 වර්ෂ වලදී ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය විසින් ලබාදෙන ලද ණය වල සාමාන්‍ය පොලී වියදම | | | | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘතිය | කල් පිරීමේ කාලය තුළ ගෙවීමට නියමිත පොලී වියදම | කල් පිරීමේ කාලය | වාර්ෂික සාමාන්‍ය පොලී වියදම වර්ෂයකට රු. මිලියන වලින් |
| 1 | මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - දෙවන අදියර (11) | 1,723.0 | 40 | 43.0 |
| 2 | වවුනියා කිලිනොච්චි විදුලි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය (11) | 272.1 | 40 | 6.8 |
| 3 | ස්වාභාවික හදිසි ආපදා පුනරුත්ථාපන කිරීමේ ව්‍යාපෘතිය | 21.6 | 40 | 0.5 |
| 4 | නැඟී එන ප්‍රාද්ශයන්හි සෞඛ්‍ය සේවා පහසුකම් වැඩිදියුනු කිරීම | 154.1 | 40 | 3.8 |
| 5 | හබරණ - වෙයන්ගොඩ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය | 767.3 | 40 | 19.1 |
| 6 | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය | 1,888.0 | 40 | 47.2 |
| 7 | මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ නාස්තිය අවම කිරීමේ ව්‍යාපෘතිය | 1,193.4 | 40 | 29.8 |
| 8 | ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ | 614.5 | 40 | 15.3 |
| 9 | නාය යෑමේ ආපදා වලින් ජාතික මාර්ග ජාලය ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපෘතිය | 1,415.7 | 25 | 56.6 |
| 10 | අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1 | 1,019.4 | 25 | 40.7 |
| | සාමාන්‍ය වාර්ෂික පොලී වියදම | | | 262.8 |

## කල්තොට දිසා රෝහල : පහසුකම්
## கல்தோட்ட மாவட்ட வைத்தியசாலை : வசதிகள்
## KALTHOTA DISTRICT HOSPITAL : FACILITIES

4485/'13

**7. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු තිස්ස අත්තනායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Tissa Attanayake)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) බලන්ගොඩ, කල්තොට දිසා රෝහල මේ වන විට අබලන්ව වැසී යාමේ තර්ජනයකට මුහුණ දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) කල්තොට දිසා රෝහලෙන් වෛද්‍ය සේවා ලබා ගන්නා පවුල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම රෝහලෙහි කාර්ය මණ්ඩලයේ දැඩි හිඟයක් පවත්නා බවත් සහ නිසි පරිදි සේවා සැපයීම සඳහා ප්‍රමාණවත් ගොඩනැගිලි පහසුකම් නොමැති බවත් පිළිගන්නේද;

(ii) එම රෝහලෙහි සේවය කරනු ලබන වෛද්‍යවරුන්, හෙදියන් සහ අනෙකුත් සේවක සේවිකාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහලේ අලුතින් ඉදි කළ යුතු සහ පිළිසකර කළ යුතු ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iv) ප්‍රදේශයේ ජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා එම රෝහලට අවශ්‍ය කාර්ය මණ්ඩලය සහ අනෙකුත් සියලු පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) பலாங்கொடை கல்தோட்ட மாவட்ட வைத்தியசாலை தற்போது சிதைவடைந்து மூடப்படும் ஆபத்தை எதிர்நோக்கியுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) கல்தோட்ட மாவட்ட வைத்தியசாலையிலிருந்து மருத்துவ வசதிகளை பெறுகின்ற குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி வைத்தியசாலையில் பணியாட் டொகுதியில் கடும் பற்றாக்குறை நிலவுகின்ற தென்பதையும், ஒழுங்காக சேவை வழங்குவதற்கு போதியளவு கட்டட வசதிகள் இல்லை என்பதையும் அவர் ஏற்றுகொள்வாரா;

(ii) மேற்படி வைத்தியசாலையில் கடமையாற்று கின்ற மருத்துவர்கள், தாதிமார்கள் மற்றும் ஏனைய ஊழியர்களின் எண்ணிக்கை தனித்தனியாக யாது;

(iii) மேற்படி வைத்தியசாலையில் புதிதாக அமைக்கப் பட வேண்டிய மற்றும் திருத்தப்பட வேண்டிய கட்டடங்களின் எண்ணிக்கை யாது;

(iv) பிரதேசத்தின் மக்களுக்கு வினைத்திறன்மிக்க சேவையை வழங்குவதற்காக மேற்படி வைத்திய சாலைக்குத் தேவையான பணியாட்டொகுதி யினரையும் ஏனைய அனைத்து வசதிகளையும் பெற்றுக் கொடுத்தல் தொடர்பில் மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that the Balangoda-Kalthota District Hospital is in a dilapidated condition and faced with the threat of closing down?

(b) Will he state the number of families that obtain medical services from the District Hospital, Kalthota?

(c) Will he inform this House -

(i) whether he admits that there is a severe dearth of staff in the aforesaid hospital and that sufficient building facilities are not available in order to provide proper services;

(ii) separately, of the number of doctors, nurses and other staff working at the hospital;

(iii) the number of buildings that must be constructed anew and the number of buildings that must be repaired in the hospital; and

(iv) the action that will be taken to provide the staff and all other facilities necessary for the hospital to provide an efficient service to the people of the area?

(c) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) එම රෝහල වැසී යාමේ තර්ජනයකට ලක්ව නොමැත.

(ආ)

| රෝහල අදාළ වන ග්‍රාම නිලධාරි වසම් | නිවාස සංඛ්‍යාව | ඇස්තමේන්තුගත ජනගහනය | ඇස්තමේන්තුගත සම්පූර්ණ ජනගහනය (රත්නපුර දිස්ත්‍රික්කයට අදාළ) |
|---|---|---|---|
| කල්තොට | 288 | 1,440 | |
| උග්ගල් කල්තොට දකුණු ඉවුර | 231 | 1,155 | |
| දියවින්න | 272 | 1,360 | |
| කළුපේදිගම | 255 | 1,275 | |
| වැලිපතයාය | 477 | 2,385 | 13,450 |
| කෝන්ගහමංකඩ | 469 | 2,345 | |
| මැදබැද්ද | 218 | 1,090 | |
| උග්ගල් කල්තොට වම් ඉවුර | 211 | 1,055 | |
| නෙලුයාය | 269 | 1,345 | |

(ඇ) (i) එම රෝහල් කාර්ය මණ්ඩලයේ තාක්ෂණික නිලධාරින්ගේ තරමක හිඟයක් පවතින අතර, රෝහලේ දැනට ඇති ගොඩනැඟිලි රෝගී සත්කාරක සේවා සඳහා ප්‍රමාණවත් මට්ටමක පවතී.

(ii)

| අනු අංකය | තනතුර | සිටින කාර්යය මණ්ඩලය |
|---|---|---|
| 1 | වෛද්‍ය නිලධාරි | 3 |
| 2 | දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි | 1 |
| 3 | සහකාර/ලියා පදිංචි වෛද්‍ය නිලධාරි | 1 |
| 4 | වාට්ටු හෙද පාලිකා | - |
| 5 | හෙද නිලධාරි | 4 |
| 6 | ඖෂධවේදි | 1 |
| 7 | වෛද්‍ය පර්යේෂණ කාර්මික විද්‍යාඥ | - |
| 8 | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි | 3 |
| 9 | ඖෂධ සංයෝජක | - |
| 10 | පළාත් රාජ්‍ය කළමනාකාරණ සහකාර | 1 |
| 11 | සංවර්ධන නිලධාරි | 2 |
| 12 | අන්වීක්ෂක | - |
| 13 | ආහාර නිරීක්ෂිකා | - |
| 14 | රියදුරු | 1 |
| 15 | උපස්ථායක | 2 |
| 16 | අරක්කැමි | - |
| 17 | රෝහල් ඕවර්සියර් | - |
| 18 | දුරකථන ක්‍රියාකරු | 1 |
| 19 | සෞඛ්‍ය කාර්යය සහායක (සාමාන්‍ය) | 12 |
| 20 | සෞඛ්‍ය කාර්යය සහායක (සනී) | 2 |
| 21 | අනියම් සෞඛ්‍ය කාර්යය සහායක (සාමාන්‍යය) | 3 |
| 22 | අනියම් සෞඛ්‍ය කාර්යය සහායක (සනී.) | 1 |
| 23 | ඉසීම් යන්ත්‍ර ක්රියාකරු | - |
| 24 | මුරකරු | - |
| | එකතුව | 38 |

(iii) දැනට පවතින ගොඩනැඟිලි රෝගී සත්කාරක සේවා පවත්වාගෙන යාමට ප්‍රමාණවත් වන අතර, තව ගොඩනැඟිලි ඉදි කිරීමේ අවශ්‍යතාවක් පැන නැඟී නොමැත. පහත අංශවල අලුත්වැඩියාවන් සිදු විය යුතු අතර, පළාත් නිශ්චිත කාර්යය සංවර්ධන ප්‍රදාන -PSDG- හා දෙවන සෞඛ්‍ය සේවා සංවර්ධන ව්‍යාපෘතිය -SHSDP- යටතේ මේ වන විට කටයුතු සිදු කරමින් පවතී.

- ළමා වාට්ටු ගොඩනැඟිලි
- ගිලන්රථ ගරාජය
- ලියා පදිංචි වෛද්‍ය නිල නිවාස
- මෘත ශරීරාගාරය
- බාහිර රෝගී අංශයේ වැසිකිළි පද්ධතිය
- මුළුතැන්ගෙය
- මධ්‍යම පරිසර අධිකාරියේ නියමයන්ට අනුව ඝන හා ද්‍රව අපද්‍රව්‍ය බැහැරලීමේ සාර්ථක ක්‍රමවේදයක් සැකසීම

(iv) දැනට සිටින කාර්ය මණ්ඩලය මඟින් රෝහල් සේවා කටයුතු කාර්යක්ෂමව හා අඛණ්ඩව පවත්වාගෙන යා හැකි අතර, රෝහලේ අලුත්වැඩියා කටයුතු හා අත්‍යවශ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා පළාත් නිශ්චිත කාර්යය සංවර්ධන ප්‍රධාන -PSDG- හා දෙවන සෞඛ්‍ය සේවා සංවර්ධන ව්‍යාපෘතිය -SHSDP- යටතේ මේ වන විට කටයුතු සිදු කරමින් පවතී.

(ඈ) පැන නොනඟී.

## අනවසර බීජ ආනයනය : වැළැක්වීම
### அனுமதியற்ற விதை வகை இறக்குமதி : தடுத்தல்
### UNAUTHORIZED IMPORT OF SEEDS : PREVENTION

4632/'13

**10. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු පී. හැරිසන් මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு பீ. ஹரிசன் சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. P. Harrison)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාවට අනවසරයෙන් බීජ වර්ග ආනයනය කරනු ලබන බව දන්නේද;

(ii) එසේ අනවසරයෙන් බීජ ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(iii) අනවසරයෙන් ආනයනය කරනු ලබන බීජ වර්ග කවරේද;

(iv) අනවසරයෙන් බීජ ගෙන්වීමට ඇති අවශ්‍යතාව කවරේද;

(v) විදේශ රටවලින් බීජ ගෙන්වීම සඳහා රාජ්‍ය මැදිහත්වීමක් සිදු කිරීමට ඇති අපහසුතාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනවසරයෙන් බීජ වර්ග ආනයනය කිරීම නිසා ගොවීන් විශාල අපහසුතාවලට පත් වන බව දන්නේද;

(ii) එසේ නම්, එය වැළැක්වීමට හා ඒ පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) අනවසරයෙන් බීජ ආනයනය කරන පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමේ හැකියාවක් තිබේද;

(iv) එසේ නම්, අනවසරයෙන් බීජ ආනයනය කරනු ලබන අයට දඬුවම් ලබා දීම සඳහා එම නීති ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்கு அனுமதியின்றி விதை வகைகள் இறக்குமதி செய்யப்படுகின்றதென்பதையும்;

(ii) அவ்வாறு அனுமதியின்றி விதை வகைகள் இறக்குமதி செய்யப்படும் நாடுகள் யாவை என்பதையும்;

(iii) அனுமதியின்றி இறக்குமதி செய்யப்படும் விதை வகைகள் யாவை என்பதையும்;

(iv) அனுமதியின்றி விதைகளைக் கொண்டுவருவதற் கான தேவைப்பாடு யாது என்பதையும்

(v) வெளிநாடுகளிலிருந்து விதைகளை இறக்குமதி செய்வதில் அரசு தலையீடு செய்வதிலுள்ள சிரமங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அனுமதியின்றி விதை வகைகள் இறக்குமதி செய்யப்படுவதனால் விவசாயிகள் பாரிய சிரமங்களை எதிர்நோக்குகின்றனர் என்பதையும்;

(ii) அவ்வாறாயின், இதைத் தடுப்பதற்கும் இது தொடர்பாக விவசாயிகளை அறிவூட்டுவதற்கும் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) அனுமதியின்றி விதைகளை இறக்குமதி செய்ப வர்களுக்கு எதிராக சட்ட நடவடிக்கைகளை மேற்கொள்வதற்கான இயலுமை உள்ளதா என்பதையும்;

(iv) அவ்வாறாயின் அனுமதியின்றி விதைகளை இறக்குமதி செய்பவர்களுக்கு தண்டனை வழங்கு வதற்காக மேற்படி சட்டத்தை நடைமுறைப் படுத்துவதற்கு மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) whether he is aware that various kinds of seeds are imported to Sri Lanka without permission;

(ii) of the names of countries from which seeds are imported in the aforesaid manner;

(iii) of the names of the seeds that are imported without permission;

(iv) of the nature of requirement for importing seeds without permission; and

(v) of the difficulty in making a Government intervention in importing seeds from foreign countries?

(b) Will he state -

(i) whether he is aware that farmers are greatly inconvenienced due to the unauthorized importation of seeds;

(ii) if so, the measures that have been taken to stop the unauthorized importation of seeds and to raise awareness among farmers on this matter;

(iii) whether there is any possibility of taking legal action against persons who import seeds without permission; and

(iv) if so, the steps that have been taken to enact the aforesaid laws in order to punish those who import seeds without permission?

(c) If not, why?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) අවශ්‍යතාවක් නොමැත.

(v) බීජ ආනයනය නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය මත සිදු කරන ව්‍යාපාරයක් බැවින් නිරෝධායන කටයුතුවලට හැර රජයේ මැදිහත් වීමක් අවශ්‍ය නැත.

(ආ) (i) පැන නොනඟී.

(ii) වගාවන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සහතික කළ බීජ භාවිතයට ගන්නා ලෙස නිරතුරුව ගොවීන් දැනුවත් කෙරේ.

(iii) ඔව්.

(iv) ඔව්.

(ඇ) අදාළ නොවේ.

## උපාධිධාරී අභ්‍යාසලාභීන්: විස්තර
### பட்டதாரிப் பயிலுனர்கள் : விபரம்
### GRADUATE TRAINEES : DETAILS

3280/'12

**15. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake)

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

[ගරු ජෝන් අමරතුංග මහතා]

(අ) (i) 2012 වර්ෂයේදී රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට පුහුණුවීමේ පහසුකම් සපයන ලද්දේ කවර ස්ථානයකදීද;

(iii) පුහුණු කාල සීමාව තුළ ඔවුන්ට දීමනාවක් හෝ වැටුපක් ගෙවනු ලැබුවේද;

(iv) ඔවුන්ගේ පුහුණු කාල සීමාව සහ පුහුණුකරුවන් කවරේද;

(v) පුහුණු අත්පොත් ලබාදී තිබුණේද;

(vi) 2013 වර්ෂයේදී බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් සංඛ්‍යාව කොපමණද;

(vii) උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ වර්තමාන වේතන සහ අනාගත වැටුප් පරිමාණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2012ஆம் ஆண்டில் அரசாங்க சேவைக்கு உள்ளீர்க்கப்பட்ட பட்டதாரிப் பயிலுனர்களின் எண்ணிக்கை என்னவென்பதையும்;

(ii) அவர்களுக்கான பயிற்சி வசதிகள் எங்கே வழங்கப் பட்டன என்பதையும்;

(iii) பயிற்சிக்காலத்தின்போது அவர்களுக்கு கொடுப்பனவா அல்லது சம்பளமா வழங்கப் பட்டது என்பதையும்;

(iv) பயிற்சிக்காலத்தின் அளவு மற்றும் அவர்களுக்கு பயிற்சியளித்த பயிற்றுவிப்பாளர்கள் யார் என்பதையும்;

(v) பயிற்சிக் கையேடுகள் வழங்கப்பட்டனவா என்பதையும்;

(vi) 2013ஆம் ஆண்டுக் காலப்பகுதியினுள் ஆட்சேர்க் கப்படவுள்ள பட்டதாரிப் பயிலுனர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்:

(vii) பட்டதாரிப் பயிலுனர்களின் தற்போதைய ஊதியம் மற்றும் எதிர்கால சம்பள அளவுத் திட்டம் ஆகியன யாவை என்பதையும்

அவர் கூறுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Will he state -

(i) the number of graduate trainees who had been absorbed to the Public Service in the year 2012;

(ii) as to where they have been provided training facilities;

(iii) whether they were paid an allowance or a salary during the training period;

(iv) the duration of the training and the trainers who trained them;

(v) whether the training manuals are available;

(vi) the number of graduate trainees who will be recruited during the year 2013; and

(vii) the present emoluments and future salary scales of the graduate trainees?

(b) If not, why?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne )

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2012 වසරේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන් සඳහා වන ව්‍යාපෘතිය යටතේ උපාධිධාරීන් 50,821 බඳවා ගන්නා ලද අතර, එම පිරිසෙන් 41,284කට රාජ්‍ය සේවය යටතේද, ඉතිරි අභ්‍යාසලාභීන්ට පළාත් රාජ්‍ය සේවය යටතේද සංවර්ධන නිලධාරී තනතුරෙහි ස්ථිර පත්වීම් ලබා දී ඇත.

(ii) පුහුණු කාල සීමාව තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන් සඳහා වන ව්‍යාපෘතිය යටතේ පුහුණුව සඳහා යොදවන ලද අතර, සේවා අවශ්‍යතාව මත අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් සභා යටතේ වන ආයතන සඳහා යොමු කරන ලදී.

(iii) පුහුණු කාල සීමාව තුළදී මසකට රුපියල් 10,000 පුහුණු දීමනාවක් ගෙවන ලදී.

(iv) පුහුණු කාල සීමාව වසරකි.

අනුයුක්ත කරන ලද ආයතනවල මාණ්ඩලික නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පුහුණුව සිදු කරන ලදී.

(v) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිය විෂය පථයට අදාළ වන පරිදි පුහුණුවක යොදවන ලද අතර සියලු උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා පොදු පුහුණු අත්පොතක් භාවිත වූයේ නැත.

(vi) 2013 වර්ෂයේදී උපාධිධාරී අභ්‍යාසලාභීන් බඳවා ගැනීමක් සිදු වූයේ නැත.

(vii) සංවර්ධන නිලධාරී MN 4 -42006 (A). වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රුපියල් 15,215 හිමි වේ.

ඊට අමතරව ජීවන වියදම් දීමනාව හා රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

වැටුප් පරිමාණය රුපියල් 15,215 - 10 x 215 - 4 x 240 - 7 x 320 - 15 x 360 - රුපියල් 25,965.

ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රුපියල්) |
|---|---|---|
| III | 01 | 15,215 |
| II | 12 | 17,605 |
| I | 23 | 20,925 |

(ආ) අදාළ නොවේ.

# ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත
## இலங்கைச் சமுத்திரப் பல்கலைக்கழகச் சட்டமூலம்
## OCEAN UNIVERSITY OF SRI LANKA BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ.භා. 2.05]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා (යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - இளைஞர் அலுவல்கள், திறன் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dullas Alahapperuma - Minister of Youth Affairs and Skills Development)
ගරු කථානායකතුමනි, "ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, මම මේ විවාදයට සම්බන්ධ වන්නේ, -ආරම්භ කරන්නේ- ඉතාම ගෞරවනීය හැඟීමක් සහිතවයි. විශේෂයෙන් අද දවස, මේ නිමිත්ත මේ රටේ තෘතීය අධ්‍යාපනයට, මේ රටේ නාවික, ධීවර සහ සාගර ක්ෂේත්‍රවලට විශේෂ වැදගත්කමක් සහිත දවසක්, මාතෘකාවක් සහ ක්ෂේත්‍රයක් බව ආරම්භක වශයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. ගරු කථානායකතුමනි, ඔබතුමා මට වෙන් කර ඇති විනාඩි 30ක කාලය තුළ මගේ කථාව පරිච්ඡේද තුනකට ලඝු කරන්නට, ගොනු කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

පළමුවන පරිච්ඡේදය තමයි මේ හා බැඳුණු කෘතවේදීත්වය; ස්තුතිය ප්‍රකාශ කිරීම. දෙවෙනි පරිච්ඡේදය තමයි සාගර විශ්වවිද්‍යාලය අවශ්‍ය වන්නේ ඇයි සහ එහි අනාගත අභිලාෂ පිළිබඳව කථා කිරීම. ඒ වාගේම, අවසාන පරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපනය එහෙම නැත්නම් නිපුණතා සංවර්ධනය පිළිබඳව විෂය භාර අමාත්‍යවරයා විධියට මම අදහස් දැක්වීමට බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මාගේ කථාවේ පළමුවෙනි පරිච්ඡේදය ආරම්භ කරමින් කෘතවේදීත්වය පිළිබඳව කථා කරන්නට කැමැතියි. මගේ විශේෂ කෘතවේදීත්වය ප්‍රදානය විය යුතු වන්නේ අතිගරු ජනාධිපතිතුමාටයි.

ගරු කථානායකතුමනි, එතුමා තමයි මේ පුංචි දූපත්වාසී අපි ලෝකයේ බලවත් රටක් විධියට නැඟී සිටින්නට නම් දිය, ගොඩ සහ අහස කියන මේ තුනම ජය ගත යුතුයි කියන මහා අධිෂ්ඨානය අපේ ජාතික න්‍යාය පත්‍රයට ඇතුළත් කළේ. එතුමා තමයි ඒ සාකච්ඡාවට මේ රට පෙළගැස්වූවේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම සාගර විශ්වවිද්‍යාල පිළිබඳ සංකල්පය මේ රටේ ඉතිහාසයේ පළමුවෙනි වතාවට විධිමත් අධ්‍යාපනයක් තුළ සාකච්ඡාවට ලක් වෙන්නේ, -ආරම්භ වෙන්නේ - 1997 ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විධියට අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා තමන්ගේ වෘත්තිය ආරම්භ කරමින් කරනු ලැබූ කථාවේදීයි. ඉන් අනතුරුව එතුමා 1999 ජූනි මාසයේ 23වන දා ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය - අපි NIFNE යන නමින් හඳුන්වන ආයතනය- පිළිබඳ පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කළා.

21වැනි ශත වර්ෂයේ සාගර ආර්ථිකයක් පිළිබඳව ලෝකය පුරාම කථා බහ කරන වෙලාවේ, මේ සංකල්පය අපේ දේශපාලන ශබ්ද කෝෂයට ඇතුළත් කරපු දේශපාලනඥයා විධියට වාගේම, ඒ සංකල්පය වඩාත් ප්‍රායෝගික තලයකට ගෙනැවිත් අපේ දරුවන්ට සාගර විද්‍යාව පිළිබඳව පළල් මට්ටමින් අධ්‍යාපනය ලබන්නට අවශ්‍ය පරිසරය සකසන්නට අත දිගු කරපු මහා නායකයා විධියට අතිගරු ජනාධිපතිතුමාට මේ අවස්ථාවේ පළමුවෙන්ම අපේ කෘතවේදීත්වය ප්‍රකාශ කරන්න මා කැමැතියි.

ගරු කථානායකතුමනි, මේ පනතට අනුමැතිය දීපු අපේ කැබිනට් මණ්ඩලයට, විශේෂයෙන් කැබිනට් අනුකාරක සභාවේ සභාපති ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා ප්‍රමුඛ මගේ මිත්‍ර, සහෝදර කැබිනට් මණ්ඩලයට මා ස්තුතිවන්ත වන අතරේ, මේ සම්බන්ධයෙන් ඉතිහාසය පුරාම මේ පාර්ලිමේන්තුවේදී දැක්වූ දායකත්වයට, ඉදිරිපත් කළ සාධාරණ විවේචනවලට සහ ප්‍රායෝගික යෝජනාවලට ඔබ සියලු දෙනාට කෘතවේදීත්වය පළ කරන්න කැමැතියි. විශේෂයෙන් අපේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව නියෝජනය කරන පක්ෂ විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මන්ත්‍රීතුමියන්ලාට විශේෂ ස්තුතියක් කරන්නත් මා මේ අවස්ථාව පාවිච්චි කරනවා. මොකද ගරු කථානායකතුමනි, අපේ උපදේශක කාරක සභාව ඉතාම සක්‍රිය, ඉතා හොඳ අදහස් හුවමාරු වන, තර්ක විතර්ක හුවමාරු වන ඉතා හොඳ මධ්‍යස්ථානයක් වන නිසා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, NIFNE ආයතනය සාගර විශ්වවිද්‍යාලයේ ගර්භාෂය කියලා අපට හඳුන්වන්නට පුළුවන්. මේ ආයතනය 1999 දී ස්ථාපනය කළත්, ඉතා දුෂ්කර කොන්දේසි යටතේ තමයි පවත්වා ගෙන යන්න සිද්ධ වුණේ. ඇත්ත වශයෙන්ම 2003 ඉඳලා අවුරුදු 6කට ආසන්න කාලයක් මෙහි කටයුතු නැවතිලා තිබුණා; නිෂ්ක්‍රිය වෙලා තිබුණා; අකර්මණ්‍ය වෙලා තිබුණා. මේ දුෂ්කර තත්ත්වය යටතේ වුවත් ජාතික ඉංජිනේරු සහ නාවික ආයතනය පිළිබඳව විශ්වාසය තබපු මේ රටේ දරුවන්ට -අදත් මහජන ගැලරියේ ඒ දූලා පුතාලා විශාල පිරිසක් ඉන්නවා- සහ ඔවුන්ගේ දෙමාපියන්ට ඒ විශ්වාසය අඛණ්ඩව තබාගෙන සිටීම පිළිබඳව මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අවම පහසුකම් යටතේ තමයි උපාධි පාඨමාලාවලට ඔවුන් සම්බන්ධ වුණේ. උපාධි පාඨමාලා පවත්වා ගෙන යන්න අවශ්‍ය පරිසරය පවා නැතිව, සම්පත් නැතිව, දිගුකාලීන බලාපොරොත්තුවක් විතරක් දල්වා ගෙන මේ කරපු කැප කිරීම පිළිබඳව ඒ සියලුම දූලා පුතාලාටත්, ඒ දෙමාපියන්ටත්, ඒ ආචාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී සහයෝගය දැක්වූ නීතිපතිතුමා ප්‍රමුඛ නීතිපති දෙපාර්තමේන්තුවට, නීති කෙටුම්පත් සම්පාදකතුමා ඇතුළු ඒ දෙපාර්තමේන්තුවට, අපේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට අමාත්‍යාංශය විධියටත්, පුරවැසියකු විධියටත් මේ අවස්ථාවේ මගේ ස්තුතිය ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය - මගේ වෘත්තීය සගයන්- විටින් විට මේ සාගර විශ්වවිද්‍යාලය පිළිබඳ සංවාදයට එකතු වුණා. මා ඔවුන් වෙතත් මගේ දයාව සහ සහෝදරත්වය ප්‍රදානය කරන්නට කැමැතියි, අප ධෛර්යවත් කිරීම සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමනි, ඒ වාගේම NIFNE ආයතනයේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයට, ආචාර්යවරුන්ට, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරින්ට, විශේෂයෙන්ම මගේ

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

සහෝදර නියෝජ්‍ය අමාත්‍ය මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමාට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. එතුමාට තමයි විෂයයක් හැටියට සාගර විශ්වවිද්‍යාලයේ අධීක්ෂණය සම්පූර්ණයෙන්ම පවරා තිබෙන්නේ. එතුමා කළ කැප කිරීම පිළිබඳව එතුමාටත් මගේ කථාවේ පළමු පරිච්ඡේදය අවසන් කරමින් ස්තුතිය ප්‍රකාශ කරන්න කැමැතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

**අනතුරුව කථානායකතුමා *මූලාසනයෙන් ඉවත් වුයෙන්,* නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] *මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR ] *took the Chair.*

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි සාගර විශ්වවිද්‍යාලය ගැන කථා කරන්න ඉස්සෙල්ලා NIFNE ආයතනය පිළිබඳව කථා කරන්න ඕනෑ. මහා සාගරය හා බැඳුණු අපේ ශ්‍රී ලංකාවේ භූගෝලීය පසු බිම ගැන බලනකොට අපේ පදිංචිය ඉන්දීය සාගරයේයි. ඒ පිළිබඳව කිසියම් මූලික කාරණා ටිකක් - ඔබතුමන්ලා දන්නා කාරණා, අලුත් දේවල් නොවෙයි- සඳහන් කළ යුතුයි කියලා මා අදහස් කරනවා.

ඒ ඉතා වැදගත් කාරණා පහ, හය අතරේ තිබෙන එක කාරණයක් තමයි බටහිර සහ නැඟෙනහිර යා කරන මුහුදු මාවත ආසන්නයේම අපේ රට පිහිටා තිබීම. ඒ වාගේම අපි දන්නවා, ජාත්‍යන්තර වෙළෙඳාමෙන් සියයට 30ක් පමණ සිදුවන්නේ අප ආසන්නයේ තිබෙන සාගරය හරහා බව. ඒ වාගේම ලෝකයේ බහාලුම් ප්‍රවාහනයෙන් සියයට 50කට වඩා සිදුවන්නේ මේ කලාපය හරහාය කියන එකත් අපට අලුත් කාරණයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපේ මුහුදු සීමාවේ තෙල් පිළිබඳව, ගෑස් පිළිබඳව ගවේෂණය කරනවා. අපේ රටේ ඒ පිළිබඳ කර්මාන්ත ආරම්භ කරන්න බලාපොරොත්තු වනවා. ඒ වාගේම අපේ මුහුදු සීමාවේ ඩොලර් බිලියන ගණනක් වටිනා ඉල්මනයිට්, ග්‍රැනයිට් වැනි නිධි තැන්පත් වෙලා තිබෙනවා.

අපේ ධීවර අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මහතා මේ ගරු සභාවේ හිටියා. හිටපු ධීවර අමාත්‍ය මිල්රෝයි ප්‍රනාන්දු මහතා මගේ ඉදිරිපිට ඉන්නවා. අපේ රටේ ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතාවෙන් සියයට 12ක් සම්පාදනය කරන්නේ ධීවර සම්පත හරහාය කියන එකත් අපි දන්නා ප්‍රධාන කාරණයක්. ඒ වාගේම අපේ මහ පොළොවට අයිති භූමි ප්‍රමාණය වාගේ අටගුණයක හිමිකමක් අපට ඉන්දියන් සාගරයේ තිබෙන බවත් අපි සියලුදෙනා මේ වන විට දන්නා කාරණාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අන්තර්ජාතික සාගර නීති ප්‍රඥප්තිය යටතේ, එහි එකඟතාවන් ඇතුළේ අපි විශ්වාස කරනවා, අපි බලාපොරොත්තු වෙනවා අපේ මුහුදු සීමාව වශයෙන් සමකයේ සිට අංශක 4ක් දකුණට අපේ රට වාගේ 23 ගුණයක සීමාවක් ජල මතුපිටින් නොවුණත් මුහුද අභ්‍යන්තරයෙන් -මුහුද පතුලෙන්- අපේ අයිතියට ලැබේවි කියලා. මේ මොහොතේ අපි ඉතාම ගෞරවයෙන් බලා සිටිනවා එය පිළිගන්න. එය ඉතාම සශ්‍රීක ප්‍රදේශයක්. හිමාලය මතින් එන රොන් මඩ ප්‍රමාණය විතරක් ටොන් මිලියන ගණනක් මේ මුහුදු කලාපයේ වාර්ෂිකව තැන්පත් වනවා. එය විශාල කඳු පන්තීන් සහිත මුහුදක්. දැනට එක කඳු පන්තියක් අපේ විද්‍යාඥයන් ඇතුළු NARA ආයතනය හඳුනාගෙන තිබෙනවා. එය අපේ රටේ ප්‍රමාණයෙන් සියයට 65ක් පමණ වන ප්‍රදේශයක්; දැවැන්ත කඳු පන්තියක්; සශ්‍රීක පොළොවක්. මෙන්න මේ කාරණා සියල්ල එක්ක බැලුවාම ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය වැනි ආයතන කෙතරම් වැදගත් වනවාද? සාගර විද්‍යාව, නාවික විද්‍යාව ආදි වෘත්තීය ක්ෂේත්‍රයන් අප පුළුල් කරගත යුතුයි; නූතනත්වය මෙයට කැඳවාගත යුතුයි; නවීනත්වය කැඳවාගත යුතුයි; ඒ වෙනුවෙන් අපි පාඨමාලා සහ ආයතන සකස් කළ යුතුයි කියන කාරණය තමයි අවධාරණය කරන්න මා මේ උත්සාහ ගන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ සුවිශේෂී දවසේ මේ සාකච්ඡාව තුළ මා කියන්න කැමැතියි ධීවර සමුද්‍ර විද්‍යාව, සමුද්‍ර තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවලට අපි ප්‍රවේශ වන්නට ඕනෑ බව. සාම්ප්‍රදායික ධීවර කර්මාන්තයේ යෙදෙන ජනතාව හමුවේ තිබෙන අවදානම දුරු කරලා, ඔවුන්ට නූතන තාක්ෂණය ලබා දීලා, ඔවුන්ට සමාජ පිළිගැනීම සකස් කර දීලා, ජාතික ආර්ථිකයට වැඩි බරක් ලබා දෙන්න පුළුවන් වන විධියට මේ ක්ෂේත්‍රය සකස් කළ යුතුයි කියලා අපේ රටේ පළමුවැනි වතාවට පළමුවැනි පුහුණු මධ්‍යස්ථානය ස්ථාපිත වන්නේ 1963 වර්ෂයේයි. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නාමය මා ඉතාම කෘතවේදීව මේ මොහොතේ සිහිපත් කරන්න කැමැතියි. ඊට පසුව තමයි 1999 මහින්ද රාජපක්ෂ ගරු ධීවර අමාත්‍යතුමා විසින් ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පිළිබඳ පනත ගෙන එන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, NIFNE ආයතනය පැවතුණේ ධීවර අමාත්‍යාංශය යටතේයි. නමුත් අතිගරු ජනාධිපතිතුමා ප්‍රතිපත්තිමය තීන්දුවක් ගනු ලැබුවා, මේ රටේ සැලකීම අඩුවෙන් තිබුණ තෘතීයික අධ්‍යාපනයට -තෘතීයික අධ්‍යාපනයේ වෘත්තීය ක්ෂේත්‍රයට- අදාළ රාජ්‍ය ආයතන සියල්ලම එක වහලක් යටට, එක පාලනයක් යටතට පත් කරන්නට ඕනෑය කියලා. අන්න ඒ අනුවයි NIFNE ආයතනය, නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යටතට පත් වන්නේ.

NIFNE ආයතනය යටතේ දිවයින පුරා පුහුණු මධ්‍යස්ථාන අටක් මේ මොහොතේ ක්‍රියාත්මක වෙනවා; ප්‍රධාන මණ්ඩප දෙකක් ක්‍රියාත්මක වෙනවා. වාර්ෂික සිසුන් ප්‍රමාණය 1,600ක් පමණ වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා බඳවා ගැනෙනවා. උපාධි පාඨමාලා තුනක් දැනට ක්‍රියාත්මක වෙනවා. අඩු පාඩුකම් ඇති. ඔබතුමන්ලා මතු කරාවි, ඒ ඒ තැන්වල තිබෙන අඩුපාඩු. මතු කරන්න දෙයක් නැහැ, අකිල විරාජ් මන්ත්‍රීතුමනි, අපි එය පිළිගන්නවා. අපි දන්නවා. මම ඒකයි ආරම්භයේදීම කිව්වේ, මේ දරුවෝ මොන තරම් දුෂ්කර කොන්දේසි යටතේද ඒ අධ්‍යාපන කටයුතු කර ගෙන යන්නේ කියලා.

මේ අවස්ථාවේදී අපේ ගරු කථානායකතුමා මුලසුනෙන් බැහැරව ගිහින්. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අපේ දේශපාලන නායකයා විධියට එතුමාගේත්, හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමා විධියට ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේත් විශේෂ මැදිහත්වීම යටතේ ඉතාම රමණීය භූමි භාගයක්, මම හිතන්නේ ලෝකයේ සාගර විශ්වවිද්‍යාලයකට වඩාත්ම ගැළපෙන තැනක්, -එක පැත්තකින් වරාය, අනෙක් පැත්තෙන් කළපුවට මැදි වුණු අක්කර හතළිස්පහක රමණීය භූමි භාගයක්- අපට මේ සඳහා ලබා දීලා

තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපි ලබන අවුරුද්දේ එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනවා. අතිගරු ජනාධිපතිතුමා දැනටමත් මුදල් අමාත්‍යාංශයෙන් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරන්නට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම අමතරව ජාතික භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහාත් අවශ්‍ය මැදිහත් වීම ලබා දී තිබෙනවා.

2001 වසරේදී මේ පාඨමාලා සඳහා සහභාගි වුණේ සිසුන් 58 දෙනෙක් පමණයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නමුත් පසු කාලීනව එය ක්‍රමයෙන් වැඩි වෙලා තිබෙනවා. අද පුළුල් පරාසයක් තුළ විකාශනය වන සාගර හා නාවුක ක්ෂේත්‍රයට අවශ්‍ය පුහුණු අවශ්‍යතා සඳහා ඉල්ලුම වැඩි වෙමින් තිබෙන බව අපි අධ්‍යයනය කර තිබෙනවා.

මේ ගැන අපේ අවධානයට යොමු කර අලුතෙන් පාඨමාලා රාශියක් සකස් කරමින් පවතිනවා. විශේෂයෙන්ම ප්‍රධාන අරමුණු 7ක් යටතේ අප මෙම සාගර විශ්වවිද්‍යාලය ස්ථාපිත කරන්න බලාපොරොත්තු වෙනවා. එනම්,

1. ධීවර, සමුද්‍ර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම.
2. යම් ප්‍රදේශයක මිනිස්බල අවශ්‍යතා සපුරාලීම අරබයා ධීවර හා සමාන ක්ෂේත්‍රවලට අදාළ තාක්ෂණික අධ්‍යාපන පාඨමාලා සඳහා අවස්ථාව ලබා දීම.

   මෙතැනදී චෝදනාවක් එයි. සාගර විශ්වවිද්‍යාලය පිහිටෙව්වාම මේ පනතේ මූලික අරමුණ -ඒ කියන්නේ සාම්ප්‍රදායික ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයා සහ ඒ කර්මාන්තයට ඇතුළත් වෙන්න බලාපොරොත්තු වෙලා සිටින ඔහුගේ පවුල්වල අය වෙනුවෙන් ගොඩ නැඟුණු ආයතනයක් උපාධි පාඨමාලාවලට විවෘත කිරීම හරහා ඒ සාම්ප්‍රදායික කර්මාන්තය අභාවයට යනවා නේද කියා.- පිළිබඳව සැකයක් ඇති වෙන්න කිසිම හේතුවක් නැහැ. මේ පනතේ 5 (i) (29) වගන්තිය අනුව අප ජාතික ධීවර හා සමුද්‍රීය පුහුණු ආයතනය - NIFMAT- ස්ථාපිත කර -එය අලුත් අධ්‍යක්ෂවරයෙක් යටතේ ක්‍රියාත්මක වෙනවා.- මෙතෙක් පවත්වාගෙන ආ වෘත්තීය පුහුණු පාඨමාලාවලට අමතරව සමුද්‍රීය ක්ෂේත්‍රයේ සියලුම මට්ටම්වලට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීමට කටයුතු කරනවා.
3. ධීවර හා සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන් අතර ධීවර, සමුද්‍ර හා සමුද්‍රීය අංශවලට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම.
4. ධීවර, සමුද්‍ර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ව්‍යාප්ත පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම.
5. විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය සහ තාක්ෂණික පාඨමාලා සැපයීම.

   දැනට මේ විශ්වවිද්‍යාලයේ උපාධි පාඨමාලා සමත් කළ ඇතැම් දරුවෝ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පාඨමාලාවලට ඇතුළත් වෙලා සිටින බව අපේ සභාපතිවරයා මා දැනුවත් කර තිබෙනවා.
6. ධීවර, සමුද්‍ර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට ඇති දක්ෂතාවය සහ හැකියාව මත පදනම්ව ඉංජිනේරු ශිල්පය, විද්‍යාත්මක, තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුවීමේ පද්ධති යන ක්ෂේත්‍රවල ප්‍රගති සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම.
7. ජාතික වෘත්තීමය සුදුසුකම් ඇති තැනැත්තන් සඳහා අධ්‍යාපන පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම සහ සමුද්‍ර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල ඔවුන්ගේ ප්‍රවීණත්වය වැඩිදියුණු කිරීම සඳහා සහ ශාස්ත්‍රීය සුදුසුකම් අත්පත් කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම.

සාගර විශ්වවිද්‍යාලය කොතැනටද කැඳවා ගෙන යන්න බලාපොරොත්තු වන්නේ; අභිලාෂය මොකක්ද කියන කාරණා පිළිබඳව දීර්ඝ සටහනක් තිබෙනවා. මගේ තුන් වන පරිච්ඡේදය තමයි ඉතිරිව තිබෙන්නේ. තවත් විනාඩි 5කට වඩා කාලයක් ඉතිරිව නැතැයි කියා මා සිතනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, you have only five more minutes.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා අවසාන පරිච්ඡේදයෙන් කියන්නේ නිපුණතා සංවර්ධනය පිළිබඳවයි. මේ රටේ ඉතිහාසයේ නිදහසෙන් පසු පැවැති හැම ආණ්ඩුවකටම නිපුණතා සංවර්ධනය පිළිබඳව ලොකු අතපසුවීමක්, නොසලකා හැරීමක් හා අඩු තක්සේරුවක් තමයි තිබුණේ. 1893 තමයි මේ රටේ වෘත්තීය අධ්‍යාපනය ආරම්භ වන්නේ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් 1893දී මරදානේ කාර්මික විද්‍යාලය පටන් ගන්නවා. හැබැයි, ශත වර්ෂයක් ගත වුණා. ජෝශප් මයිකල් පෙරේරා හිටපු ධීවර ඇමතිතුමනි, වෘත්තීය අධ්‍යාපනයට නූතනත්වය ගෙන එන්න, ජාතික මට්ටමින් ඒ පිළිබඳ ආකර්ශනයක් ඇති කරන්න අපේ හැම ආණ්ඩුවක්ම පියවර ගත්තා. මම නැහැයි කියන්නේ නැහැ. හැබැයි, එය ප්‍රමාණවත් වුණේ නැහැ. ජාත්‍යන්තර වෙළෙඳ පොළත් සමඟ ගැට ගහන්න - එකතු කරන්න- ශ්‍රී ලංකාවේ වෙළෙඳ පොළට අදාළ ශ්‍රම වෙළෙඳ පොළ හඳුනා ගන්න ඒක match කර ගන්න අවශ්‍ය බොහෝ ක්‍රියා මාර්ග අප ගත්තේ නැහැ. ඒක ඉතිහාසයේ අපට වුණු ලොකු අත්වැරැද්දක්. ජාතික සමඟිය ගොඩ නඟන්න අප අසමත් වුණේ යම්සේද මෙයත් අපට වුණු ලොකු අතපසුවීමක්.

ඒ නිසා අපට අද ඉතාම ගෞරවයෙන් ඔබතුමාට කියන්න පුළුවන්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මේ යුගයේ දී ඉතාම වැදගත් තීන්දු පහක් අරගෙන තිබෙනවා; ක්‍රියාත්මක කර තිබෙනවා කියන එක. ඒ පළමුවැනි තීන්දුව තමයි, මේ රටේ ජාතික නිපුණතා සම්මතයක් ගොඩනැඟීම. National Vocational Qualification - NVQ - මට්ටම් 1 - 7 දක්වා, උපාධිය දක්වා යන්නට පුළුවන් විධියට ජාතික වෘත්තිය නිපුණතා සම්මතයක් ගොඩනැඟුණා. Framework එක හැදුණා. එය අවුරුදු 100කට පසුව අපේ රටේ වෘත්තීය අධ්‍යාපනයේ සිදු වුණු දැවැන්ත වෙනසක්. ඒ පළමුවැනි එක. දෙවැනි එක තමයි, මේ යටතේ දරුවෙකුට උපාධිය දක්වා යන්න අවශ්‍ය පසුබිම නිර්මාණය වුණා. වෙනම විශ්වවිද්‍යාලයක් ගොඩනැඟුණා. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - UNIVOTEC - යටතේ මේ රටේ දරුවෝ ඉතිහාසයේ පළමුවැනි වතාවට - Z-score තුළින් නොවෙයි - කාර්මික විද්‍යාල ඇතුළේ NVQ මට්ටම් 4 - 5 දක්වා ඒ ඉණිමඟ දිගේ ඇවිල්ලා BTech. උපාධිධාරින් විධියට ජාතියට එකතු වුණා. ජාතික ආර්ථිකයට තමන්ගේ දායකත්වය දෙන්න ඉදිරියට ආවා. මට මතක විධියට එය ආරම්භ වුණේ 2012 ජනවාරි මාසයේ 17වැනිදා. ඒක වැදගත් පියවරක්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තවත් ඉතාම වැදගත් පියවරක් ගෙන තිබෙනවා. මේ අවස්ථාවේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ගරු සභාවේ නැහැ. ද්විතීයික අධ්‍යාපනය සහ තෘතීයික අධ්‍යාපනය අතරේ පාලමක් නොතිබුණු එක තමයි තිබුණු බරපතළම අර්බුදය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිපුණතා සංවර්ධනය සඳහා අපි හැම වෙලාවකම යොමු කරන්නට උත්සාහ ගත්තේ පාසල් හැර යන දරුවන්, විභාග fail වන දරුවන්. එහෙම නැතිව පාසල් පද්ධතිය ඇතුළට, ද්විතීයික අධ්‍යාපනය ගෙන එන්න උත්සාහ කළේ නැහැ. කන්නන්ගර මැතිතුමාගේ කාලයේ පාසල් විෂයන් විධියට තිබුණු දේත් අපි පසුව ඉවත් කර ගත්තා. මේ රටේ ඉතිහාසයේ අරගෙන තිබෙන ඉතාම වැදගත් තීන්දුවක් තමයි උසස් පෙළ සඳහා අපි වෙනම විෂය ධාරාවක් ලෙස තාක්ෂණ විෂය ධාරාව ගොඩනැඟීම. එයට පෙකණි වැලක් නිර්මාණය වුණා. නැත්නම් වෘත්තීය අධ්‍යාපනය සඳහා එන දරුවන් ගර්භාෂයකින් නොවෙයි ආවේ. ඕපපාතික දරුවන් විධියටයි සිටියේ. ඒ නිසාම සමාජයේ පිළිගැනීම නැති වුණා. මේ සභාවේ මීට පෙරත් මා කියලා තිබෙනවා, නිපුණතාව කුල ක්‍රමයක් ඇතුළේ සිර කරලයි තිබුණේ. කුල ක්‍රමයක් ඇතුළට ගාල් කරලයි තිබුණේ. රාජ ආණ්ඩු කාලයේ ඉඳලා ඒ ඒ වෘත්තීන් ඒ ඒ කුලවලට සීමා කරලා තිබුණා. හැබැයි, බටහිර යුරෝපය ජය ගත්තේ පාසල් පද්ධතියට මේවා හඳුන්වා දීම තුළිනුයි. ප්‍රමාද වෙලා හරි අවුරුදු 122කට පසුව අද මේ පාසලයි, වැඩ බිමයි අතරේ පාලම නිර්මාණය වෙලා තිබෙනවා.

ඊළඟ කාරණය තමයි, University Colleges අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ කියන්නේ අවුරුද්දකට අවම වශයෙන් 2000කට පමණ අධ්‍යාපනය ලබන්න පුළුවන්. එක පැත්තකින් සාගර විශ්වවිද්‍යාලයට අදාළ NIFMAT ආයතනය තුළින් ගොඩනැඟෙන දරුවා වන්නට පුළුවන්, අනෙක් පැත්තෙන් වෘත්තීය පුහුණු අධිකාරිය VTA, NAITA ආයතනය, තරුණ සේවා සභාව, මේ කුමන හෝ ආයතනයකින් එන දරුවන්ට උපාධි පාඨමාලාවක් දක්වා යන්නට ජාතික වෘත්තීය සුදුසුකමේ 6 මට්ටම, 5 මට්ටම ලබා ගන්නට පුළුවන් විධියට - සමහර අවස්ථාවලදී පෞද්ගලික අංශයත් එක්ක එකතු වෙලා - කටයුතු කර තිබෙනවා. මේකට භේදයක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. රාජ්‍ය අංශය විතරයි නිපුණතා සංවර්ධනය කරන්නට ඕනෑ කියලා මිථ්‍යාවක් නැහැ. ඒ තීන්දුව අද අරගෙන තිබෙනවා. මේ යටතේ ඒ ශ්‍රම බලකාය වෙනුවෙන් නිර්මාණය වුණු සහ දේශීය අවශ්‍යතාව මුල් කර ගත් නව පාඨමාලා විතරක් 27ක් අපි අලුතෙන් නිර්මාණය කර තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමාගේ ගම් පළාත වන කුලියාපිටියේ විශ්වවිද්‍යාල විද්‍යා ආයතනය - University College - තව මාස දෙකකින් අපි විවෘත කරනවා. ඒක ඉතාම වැදගත් තීන්දුවක් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ වාගේම අවසාන කාරණාව වශයෙන් මා කියන්න කැමැතියි,- කාරණා හයක් තිබෙනවා. පහක් ගැන මම කිව්වා. - ජාතික වෘත්තීය සුදුසුකම; නිපුණතා සුදුසුකම; රාමුව; SLQF - Sri Lanka Qualifications Framework - ජාතික නිපුණතා සම්මතය ගොඩනැඟෙනවා; ඒ රාමුව ගොඩනැඟෙනවා. ඊට පසුව උපාධි පාඨමාලාවෙන් එහාට ගමන් කරන්න අවශ්‍ය නම්, මේ ක්ෂේත්‍රයෙ ඉන්න දරුවෙකුට මේ විශ්වවිද්‍යාලය තුළින් ඉදිරියට යන්න අලුත් පාරක් ගොඩ නැඟෙනවා. අවශ්‍ය නම් පශ්චාත් උපාධියක්; ආචාර්ය උපාධියක් දක්වා යන්න පුළුවන්. ඒ සුදුසුකම් රාමුව, ශ්‍රී ලාංකීය සුදුසුකම් රාමුව ගොඩ නැඟෙනවා. ඒක ඉතාමත් වැදගත් කාරණාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මා ඔබතුමාට මේ කාරණයත් කියන්නට කැමතියි. ආණ්ඩුව විධියට රාජ්‍ය වැය සම්පත් ප්‍රමාණය ගත්තොත්, රාජ්‍ය භාණ්ඩාගාරය වෙන් කරන මුදල් ප්‍රමාණයට වඩා වර්ෂ 2016 වෙනකොට ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ ලෝක බැංකුවෙන් විතරක් ඩොලර් මිලියන 400ක් මේ රටේ දරුවන්ගේ නිපුණතා සංවර්ධනය සඳහා වෙන් කර තිබෙනවා. අප දැනටම ඒ වැඩකටයුතු ආරම්භ කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා නිවේදනය කරන්නට පෙර මා මගේ කථාව අවසාන කරනවා.

මා අවසාන වශයෙන් ඉල්ලන්නේ මෙයයි. රටේ නිපුණතා සංවර්ධනය ජාතික අවශ්‍යතාවක්. ඒ අනුව අප සාගරය ජය ගන්නේ කොහොම ද? සාගරය ජය ගැනීම සඳහා අවශ්‍ය වන එක ප්‍රධාන ආයතනයක් අද දවසේ ජාතියට තිළිණ කරනවා; ජාතික ප්‍රතිපත්තීන් තුළට අද දවසේ අප ඇතුළු කරනවා. මේක ආණ්ඩුවකට තනිවම කරන්නට පුළුවන් දෙයක් නොවෙයි. විපක්ෂයේ සහයෝගයත් අවශ්‍යයි. මැදිහත් වීම් අවශ්‍යයි. සාධාරණ විවේචන අවශ්‍යයි. ඒ වාගේම පෞද්ගලික අංශයේ මැදිහත් වීම අවශ්‍යයි. CINEC ආයතනය තිබෙනවා. වසරකට විදේශීය ශිෂ්‍යයන් විතරක් සිය දෙනෙකුට වඩා ආසියානු- අප්‍රිකානු මහා ද්වීප ආශ්‍රිතව මේ අධ්‍යයන කටයුතුවල නිරත වෙනවා. අපට පෞද්ගලික අංශයේ සහයෝගය අවශ්‍ය වෙනවා. පෙද්ගලික අංශයේ ඒ මැදිහත් වීම අප ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප මේ අවස්ථාවේ ජාතියෙන් ඉල්ලීමක් කරනවා. මේ රටේ අනාගතය ගොඩ නැඟෙන ප්‍රධාන කුළුණු දෙකක් තිබෙනවා. එක කුළුණක් තමයි දැනුම. අනෙක් කුළුණ තමයි සාගරය. අප අත නොතැබූ - untouched - අසීමිත සම්පත් ප්‍රමාණයක් සාගරයේ තිබෙනවා. ඒ සම්පත් ප්‍රමාණය ප්‍රයෝජනයට අරගෙන, ලෝක දේශපාලන සිතියමේ ඉතාම දිදුළන රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා වන වැඩ පිළිවෙළ අප ආරම්භ කර තිබෙනවා. අපට පාටවල් පිළිබඳ ප්‍රශ්න ඇති. නමුත් මෙය පොදුවේ අප සියලු දෙනාම එකඟවන කාරණාවක්. ඒ වෙනුවෙන් මේ වැදගත් පනත් කෙටුම්පත සම්මත කරන්නට අපි සියලු දෙනාම එකතු වෙමු. මේ වැදගත් ආයතනය ලංකාවේ ඉතාම සම්භාවනීය ආයතනයක් බවට පත් කරන්නට සියලු දෙනාගේම ආශිර්වාදය ලබා දෙන්නටය කියා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා. 2.33]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාමත් හොඳ කථාවක් කිරීම පිළිබඳව ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ කථාව අවසාන කළ තැනින් මා මගේ කථාව ආරම්භ කරන්නටයි යන්නේ. නමුත් වෙලාව මදි. කරන්නට දෙයක් නැහැ. CINEC ආයතනය ගැන තමුන්නාන්සේ සඳහන් කළා. නමුත් Ceyline ආයතනය ගැන කිව්වේ නැහැ. එදා ඇමතිවරයා හැටියට මේ දෙකම පටන් ගන්න මූලික කටයුතු ආරම්භ කරලා හුඟක් බැණුම් ඇහුවේ මමයි. [බාධා කිරීමක්]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු මන්ත්‍රීතුමා, Dockyard එකේ- [බාධා කිරීමක්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

නැහැ. Dockyard එක නොවෙයි. මේ ආයතන දෙක. අපට තිබෙන අවස්ථාවන් රාශියක් අප අමතක කර තිබුණා. ධීවර ක්ෂේත්‍රයේ ඉතා හොඳ පුහුණුවක් ලබා දීමට අවශ්‍ය වන පදනම වැටුණේ, 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනතෙන් ඇති කළ ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයෙන්ය කියන එක අප කවුරුත් පිළිගන්නවා. නමුත් ඒක හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. ඒක තමයි තිබෙන ඇත්ත කථාව. ඒ නිසාම ඒක අසාර්ථකයි කියන්නටත් බැහැ. එදා අප මේ විධියටම ඒ වැඩකටයුතු පිළිබඳව ඉතා හොඳින් සාකච්ඡා කර සකස් කර ගත්තා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ ආරම්භ කළ මේ සාගරය ජයග්‍රහණය කිරීමේ වැඩ පිළිවෙළ ගැන කල්පනා කරනකොට, තමුන්නාන්සේ සඳහන් කළ CINEC ආයතනය සහ Ceyline ආයතනය යන දෙකම ඒකාබද්ධ සද්ධන්තයෝ දෙන්නෙක් වාගෙයි. අද මෙයින් බිහි වෙච්ච දරුවෝ මාසයකට ලක්ෂ තුන හතරක වැටුපක් ලබනවා. ඒ අපේ තිබුණු පොඩි සම්පතක්. ධීවරයන් පුහුණු කිරීමත් එක්කම නාවිකයන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙළත් ඇති කිරීම තුළින් මේ තත්ත්වය ඇති වුණා. මේ ආයතනයේ ක්‍රියාකාරිත්වය ගෙන ගිය අයට මා ස්තුතිවන්ත වෙනවා. ඒ පළමුවන පුහුණු කිරීම්වලට කිසිම වියදමක් නැතිව පුහුණුව ලබා දී ඒ පුහුණු වූ අය මුහුදට යන අවස්ථාවේ මුදල් හම්බ කරන්නටත් ක්‍රමවේදයක් හදා දුන්නා.

ඒ නිසා මා මේක අවස්ථාවක් කර ගන්නවා, එතුමාට ස්තුතිය ප්‍රකාශ කරන්න. මා ඒ පදනම මත ඉඳගෙන තමයි කථා කරන්නේ. ධීවරයා නැති විය යුතු නැහැ; ඇති විය යුතුයි. ධීවර කොටස් කීපයක් ඉන්නවා. ඒ, සාමාන්‍ය ධීවරයා, පොඩි ධීවරයා යනුවෙනුයි. ඒ වාගේම අපි දන්නවා, බහුදින යාත්‍රාවලින් ඈත මුහුදට ගිහිල්ලා ඒ අයට නාවික වශයෙන් පුහුණුව ලබා දෙන බව. මේ හැම පුහුණුවක්ම තමුන්නාන්සේ කියපු Ceyline Group of Companies ආයතනය සහ CINEC ආයතනය හරහා අපි නොමිලේ ලබා දුන්නා. මේක තමයි, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ඇති කරපු වෙනස. මේ වෙනස නිසා මම හුඟක් බැණුම් ඇහුවා. අපි ඒ අනුවම ගාල්ලේ වරාය හා සම්බන්ධ වහලා තිබුණු නිවාඩු නිකේතනයක් මේ ආයතනයට දුන්නා. ඉතාම ලස්සනට හදලා, එහි වැඩ කරන්න යන කොට එදා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිතුමා හැටියට හිටපු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ ආයතනය ආපසු රජයට පවරා ගත්තා. දැනුත් ඔබතුමා ඒ ස්ථානයට ගියොත් ඒ කාරණය වැටහේවි. නැවත හිතන්න තිබෙන දේ පිළිබඳවයි මම කිව්වේ. අපි කරපු නිසා වෙනස් කරන්නවත්, තමුන්නාන්සේ කරපු නිසා වෙනස් කරන්නවත් කියලා නොවෙයි මම කියන්නේ. ආපසු මේ කාරණය පිළිබඳව හිතන්න. නමුත් වැදගත් ගමනක් අපිට යන්න පුළුවන්.

අපේ ජාතික ආර්ථිකයට වඩාත්ම හොඳ දේ tourism කියලා කවුරුත් කියනවා. මම නම් ඒ කාරණය පිළිගන්නේ නැහැ. Tourism නිසා විශාල වශයෙන් පරිසරය දූෂණය වෙනවා; අපේ සංස්කෘතිය වෙනස් වෙනවා. නමුත් නාවික අංශය පැත්තෙන් බැලුවොත්, නාවික අංශය තමයි හොඳම ආදායමක් ලබන්න පුළුවන්, බුද්ධිමත් ජනතාවක් බිහි කරන්න පුළුවන් අංශය.

ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමනි, ඒ පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කිරීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. වෙලාව ලැබිලා තිබෙන හැටියටයි මා කථා කරන්නේ. නමුත් වෙනමම මේ ගැන කථා කළොත් හොඳයි කියලා මා හිතනවා. "ධීවර" කියන වචනය වෙනුවට "සාගර" කියන වචනය තමුන්නාන්සේ යොදලා තිබෙනවා. ඒක මම වැරැදියි කියලා කියන්නේ නැහැ. නමුත් සාගරය ගැන කියන කොට ප්‍රධානම තැන ලැබෙන්නේ ධීවරයාටයි. රට වටේම සිටින ධීවර දරුවන්ගේ අධ්‍යාපනය බැලුවොත් එය ඉතා පහත් තත්ත්වයකයි තිබෙන්නේ. [බාධා කිරීමක්] අයින් කරලා නැහැ. "සාගර විශ්වවිද්‍යාලය" කියලා යන කොට එතැන බොහොම අඩු ආදායම් මට්ටමකට තිබෙන්නේ; දැනුම යම් මට්ටමකට තිබෙන්නේ; පිළිගැනීම යම් මට්ටමකට තිබෙන්නේ. සමහර පාසල්වලට ධීවර දරුවෝ කියලා ඒ දරුවන් ඒ පාසල්වලට ගත්තේ නැහැ. නමුත් ඒ අය වෙන වෙන මාර්ගවලින් පාසල්වලට ගිහිල්ලා හොඳ අධ්‍යාපනයක් ලැබුවා. මේ ධීවර පවුල්වල දරුවන්ට විශේෂ අවධානයක් ලබා දෙන්නේ කොහොමද කියන කාරණය ඔබතුමාගේ සැලකිල්ලට භාජනය විය යුතුයි. ඉතාම හොඳ දැනුමක් තිබෙන, අඩු තරමින් රජයෙන් මුකුත් ඉල්ලන්නේ නැති - තෙල් මිල වැඩි කරලා ඒ ගොල්ලන් හොයා ගත්ත ආදායම් මාර්ගය අහිමි විනාශ කරපු - සාමාන්‍යයෙන් ඔරුවෙන්, තෙප්පමෙන්, බෝට්ටුවෙන්, බහුදින යාත්‍රාවලින්, නැව්වලින් පවා ගිහිල්ලා ධීවර කර්මාන්තයේ යෙදෙන දෙමව්පියන්ගේ දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපනය වැඩිදියුණු කර ගැනීමට මේ විශ්වවිද්‍යාලය හරහා ලැබෙන ක්‍රමවේදය කුමක්ද? ඒක තමයි ඉතාමත්ම වැදගත් වන්නේ කියන කාරණය පිළිබඳව මමා මගේ දැනුමේ මට්ටමින් තමුන්නාන්සේට ඉදිරිපත් කරන්නම්.

මේ සම්පත වටිනාම සම්පතක් වාගේම බොහොම අධික වියදම් දරන සම්පතක්. පුහුණු වීම් සම්බන්ධයෙන් ගත්තාම මා දන්නා විධියට එවැනි ආයතන කීපයයි තිබෙන්නේ. මම අධ්‍යයනය කරලා තිබෙන ආකාරයට එයින් එක ආයතනයක් තමයි, CINEC කියන ආයතනය. ඒක ජාත්‍යන්තර මට්ටමට දියුණු වෙච්ච ආයතනයක්. මේ විධියේ ආයතන තව ඇති කරන්න මොන විධියේ වැඩ පිළිවෙළක්ද අපි ඇති කළ යුත්තේ? විශ්වවිද්‍යාලයක් ඇති වූ පමණින්, ඒක රජයේ ආයතනයක් වූ පමණින් ඒ කාරණය ඉෂ්ට වන්නේ නැහැ. ඒ සඳහා අපි ගත යුතු ක්‍රියා මාර්ග රාශියක් තිබෙනවා.

මා ඊළඟට තමුන්නාන්සේට මතක් කරනවා, මේ ආයතන දෙකටම සම්බන්ධයක් නැති, තමුන්නාන්සේ කියපු "නාරා" ආයතනය පිළිබඳව. එය අතිසුවිශේෂ බුද්ධිමතුන් ඉන්න ස්ථානයක්. ඉතා ඉහළ බුද්ධිමතුන් එහි සිටිනවා. ඒ අය ගැන මා හොඳට දන්නවා. ඔවුන් හොඳට වැඩ කරලා තිබෙනවා.

සාගරයේ තිබෙන නොයෙක් දේ පිළිබඳව කරන අධ්‍යයනය - oceanography - එතැනින් ආපු එකක්. මුහුදු පතුලේ තිබෙන වැලි වැනි නොයෙක් සම්පත් පිළිබඳව පරීක්ෂණ කරලා වටිනාකමක් තිබෙන ද්‍රව්‍ය හොයා දීම පිළිබඳව, මුහුදු පැළෑටි පිළිබඳව ඒ වාගේම ධීවරයින්ට ඕනෑ කරන ද්‍රව්‍ය, මත්ස්‍යයින්ට ඕනෑ කරන ආහාර සොයා ගැනීම සඳහා සහ ඒවා නිෂ්පාදනය කිරීම පිළිබඳව ඉතා ඉහළින් පරීක්ෂණ කරන තැනක් තමයි, "නාරා" ආයතනය. ඒක තමුන්නාන්සේලාත් දන්නවා. "ධීවරයින්" කියන වචනය ගැන මම මතක් කළේ ඒකයි. ඒ වාගේම මේ ආයතනය හරහා චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ මසුන්ගේ ගමන් මාර්ගය හොයලා වටිනා මසුන් හඳුනා ගෙන එයින් විශාල මුදලක් ලැබෙන පිළිවෙළට කටයුතු කිරීමත් මේකට ඇතුළු විය යුතුයි. මම කියන්නේ නැහැ, එය ඇතුළු වෙලා නැහැ කියලා. බොහෝ දුරට ඒ පිළිබඳව අධ්‍යයනය කරන්න අමාරු වුණා. නමුත්, අපට මේ පිළිබඳව දැනුමක් ලබා ගන්න අවශ්‍ය වෙනවා.

මේ විශ්වවිද්‍යාලයෙන් පිට වන දරුවෙකු - විශේෂයෙන්ම ධීවර පවුලක දරුවෙකු හෝ වෙනත් පවුලක දරුවෙකු - ලොකු ආර්ථික

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

ශක්තියක් ඇතුව පිට වන දරුවෙකු බවට පත් විය යුතුයි. මේක තමයි අපේ අවසාන තීන්දුව විය යුත්තේ. අපේ අධ්‍යාපනය ක්‍රමය අනුව අද උපාධිය ලබා ගත් තරුණ තරුණියෝ රුපියල් 10,000ක් වැටුප වශයෙන් ලැබෙන රැකියාවකට ගිහිල්ලා පුටුවක්, මේසයක් නැතිව වැඩ කරන තත්ත්වයට අසරණ වෙලා සිටිනවා. ඒ බුද්ධිමත් දරුවෝ. අපි ඒ අය ගැන කල්පනා කරනවා. නමුත්, මේ සාගර විශ්වවිද්‍යාලයෙන් පිට වන සෑම දරුවෙකුටම වාසනාවකට හොඳ වැටුපක් සහිත රැකියාවක් ලබා ගන්න පුළුවන්. Ceyline Group of Companies එකෙන් යන දරුවන් පළමුවැනි ශ්‍රේණියේ, දෙවෙනි ශ්‍රේණියේ cadet officersලා විධියට යනවා. එහෙම ගියාම ඔවුන්ට ලොකු වැටුපක් ලැබෙනවා. සමහර විට රුපියල් ලක්ෂ පහක් පමණ ඔවුන්ට ලැබෙනවා. ඒ අනුව ඔවුන්ට අපටත් වඩා වැඩි වැටුපක් ලැබෙනවා. මේ ක්ෂේත්‍රය විවෘත වෙලා තිබෙනවා. මේ ක්ෂේත්‍රය තුළින් ඔවුන්ට ලෝකය පිළිබඳව මේ ජය ගැනීම කරන්න ලැබෙනවා. නමුත්, මේ විශ්වවිද්‍යාලය හරහා පමණක් ඒක කරන්න ලැබෙන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේදී මා විශේෂයෙන් ඔබතුමාට තවත් කාරණයක් මතක් කරනවා. ඒ ජයග්‍රහණයට අපි ගිය ගමන ඔබතුමන්ලා නවත්වන්න එපා. "නාරා" ආයතනයේ තිබෙන සම්පත් ටික ඉවත් කරන්න එපා. ඒ සම්බන්ධතාව මෙතැනටත් ඇති කරන්න. ඒ අතිවිශාල උතුම් සම්පතක්. ඒ වාගේම අපට ඉදිරියට යන්න තිබෙන කාරණාවලදී ඒ ආයතනයේ සහයෝගය ලබා ගන්න. තමුන්නාන්සේ මේ පනත් කෙටුම්පතේ සඳහන් කරලා තිබෙන විශ්වවිද්‍යාලයේ බලතල පිළිබඳව බොහොම බුද්ධිමත්ව බලන්නට ඕනෑ. ඒ බලතල අපි පාවිච්චි කරන කොට, එක්තරා පන්තියක දරුවෝ කොන් වෙලා මෙහි අධ්‍යාපනය ලබන්න ගියොත් එය සමාජයට විශාල විනාශයක් වනවා. මොනවා කෙරුවත්, මෙයින් පිට වන දරුවන් ආත්ම ශක්තියක් ඇති දරුවන් විධියට, සමාජය පිළිගන්නා දරුවන් විධියට අපි එළියට දමන්න ඕනෑ. ඔබතුමන්ලා දන්නවා, අද කලා උපාධිය තිබෙන දක්ෂ දරුවෝ විශ්වවිද්‍යාලවලින් පිට වනවා. නමුත්, ඔවුන්ට සමාජයේ පිළිගැනීමක් නැහැ. වෛද්‍යවරයෙකු බිහි වුණොත්, ඒක හරි. ඉන්ජිනේරුවෙකු බිහි වුණොත්, ඒක හරි. විද්‍යාඥයෙකු බිහි වුණොත්, ඒක හරි. නමුත්, කලාව පිළිබඳව ඒ තත්ත්වය නැහැ. කලාව කියන්නේත් අපට අත්‍යවශ්‍ය දෙයක්; අපේ සංස්කෘතියට විශාල බලපෑමක් කරන දෙයක්. අපි ඒ කලා උපාධියේ මට්ටමට යන්න හොඳ නැහැ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා බලාපොරොත්තු වන විධියට මේ විශ්වවිද්‍යාලය ඉතා හොඳ තත්ත්වයට ගෙන යන්න එක්සත් ජාතික පක්ෂය හැටියට අපට දෙන්න පුළුවන් උපරිම සහයෝගය අපි ලබා දෙනවා. එතැනදී දේශපාලනයක් නැහැ. ආණ්ඩු මාරු කරන වෙලාවට අපි දේශපාලනය කරමු. ඒක වෙන කතන්දරයක්. මේ රටේ දේශපාලනය ගාවා ගන්නේ නැතිව කරන්න පුළුවන් මෙවැනි දේවල් අපි හඳුනා ගනිමු. මෙහි තව බොහෝ අඩු පාඩුකම් තිබෙනවා. මම මේවා එකින් එක කියන්න යන්නේ නැහැ. මොකද, 1996 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත අහෝසි කරලායි අද අපි මෙතැනට ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. එතකොට අපට හිතන්න තිබෙනවා, "නාරා" ආයතනය පිළිබඳව. එය ඉතා උසස් තත්ත්වයක තිබෙන ආයතනයක්; බුද්ධිමත් අය සිටින ආයතනයක්. ඒ ගොල්ලන් පර්යේෂණ කරනවා; අලුත් සොයා ගැනීම් කරනවා; training කරනවා. ඒවා පිළිබඳව අපි කොහොමද මේ සම්බන්ධතාව ඇති කරන්නේ?

ඒ විතරක් නොවෙයි. අද අපට තවත් හොඳ සම්පතක් තිබෙනවා. ඔබතුමාට මා එය මතක් කරන්න කැමැතියි. මිරිදිය මසුන් සහ සුරතල් මසුන්. ඒ අපට හොඳ ආදායමක් උපයන්න පුළුවන් අලුත් ක්‍රමවේදයක්. නමුත්, මේ ක්‍රමවේදය කොයි විධියට සකස් වනවාද කියලා මට තවම පැහැදිලි නැහැ. සාගරය ජය ගැනීම සඳහා එක්සත් ජාතික පක්ෂයත් බොහෝ දේවල් කරලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ධීවර කර්මාන්තය වැටිලා තිබුණු වෙලාවක -1977 දී- එම කර්මාන්තයට ජීවයක් දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි. පළමුවෙන්ම එන්ජින් ලබා දීලා, බෝට්ටු ලබා දීලා මෙම කර්මාන්තය යාන්ත්‍රිකරණයට ගෙනැවිත් ඊට ශක්තියක් ලබා දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි. අපට තවමත් ඒ බෝට්ටුවල නම මතකයි. ඒවාට කිව්වේ "අබුඩාබි බෝට්ටු" කියලායි. ධීවර කර්මාන්තයේ යම් යම් අංශ වඳ වී ගෙන යන වාතාවරණයක් ඇති වෙලා තිබුණා. අතීතයේ ඒවා නඟා සිටුවන්න ශක්තියක් දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මහින්ද රාජපක්ෂ මහත්මයාට ස්තුතිවන්ත වෙනවා වාගේම, ධීවර කර්මාන්තයේ පෙරළියක් ඇති කළ, ධීවරයාට ඓතිහාසික ජයග්‍රහණයක් ලබා දුන් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාල පරිච්ඡේදයත් මම මේ අවස්ථාවේ ඉතාම ගෞරවයෙන් සිහිපත් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා මෙවැනි විශ්වවිද්‍යාලයක් පටන් ගැනීම හොඳයි. අපේ බුද්ධිමත් තරුණ තරුණියන් ඉන්නවා. අලුත් මඟකට යොමු වෙන කොට මේකට පෞද්ගලික අංශයත් සම්බන්ධ කර ගැනීම ඉතාම වැදගත් වෙනවා. මා ඒ සඳහා ගරු ඇමතිතුමාට ආරාධනා කරනවා. මා හිතන හැටියට ඔබතුමා ගිහින් ඇති, CINEC එක ඇතුළේ තිබෙන නැවට. එය මේ කලාපයේම තිබෙන අලුත්ම තාක්ෂණ ක්‍රමයක්. මම එතැනට ගිහින් තිබෙනවා. අද එතැනින් පුහුණු වෙන අයට පෞද්ගලික අංශයේ විදේශ රැකියා ලැබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා ඇති මීගමුවේ තිබෙන Don Bosco ආයතනය ගැන; Diyagala Boys' Town එකේ තරුණයන් පුහුණු කරන තැන. මම කථානායකවරයා වශයෙන් කටයුතු කළ කාලයේ එස්.බී. දිසානායක ඇමතිතුමා එක්ක කථා කරලා Don Bosco ආයතනයට මුදල් විශාල ප්‍රමාණයක් ලබා දුන්නා. එතැන පුහුණු වන අයට පිට රට යන්න පුළුවන්; අලුත් රැකියා ලබන්න පුළුවන්. එතැනින් පිට වෙන කවුරුවත් අතරමං වෙන්නේ නැහැ. ඔවුන්ට හොඳ සමාජයීය තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා පෞද්ගලික අංශයේ ප්‍රයෝජනයත් මේ සඳහා යොදා ගන්න.

මෙන්න මේ කාරණයත් මම ඉතාම කනගාටුවෙන් යුතුව මතක් කරන්න ඕනෑ. මේ අංශය අද හොරකම් අතින් ඉතා භයානක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. නැව්වල යනවා කියලා පිට රට ගෙනියලා, අතරමං කරලා භයානක තත්ත්වයකට පත් කරලා සල්ලිත් නැති වෙන අය ඉන්නවා. මේ පිළිබඳව යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත් හොඳයි. නැව්වල යන්න පුහුණුවක් ලබා ගෙන CDC ලබා දීමේදී ඒවා හරියට කරන එක ඉතා වැදගත් කියලායි මා හිතන්නේ. ඒක වෙනම අංශයක්. ඒ පුහුණුවීම් අංශයත් මෙතැනට ඇතුළු කරන්න. සමහර විට ඒ සහතික ගත්තත් කරන්න දෙයක් නැහැ. ලෝකය ජය ගන්න ඉදිරියට එන්න ඕනෑ ක්‍රමය මොකක්ද? මෙය පමණක් නොවෙයි, ලෝකයේ තිබෙන නාවික ආර්ථික ක්‍රමය, බඩු ප්‍රවාහනය ගැන කියා දෙන්න ඕනෑ.

හම්බන්තොට වරාය හැදුවාම ඒකට නැව් එන්න ඕනෑ. නැව්වල මිනිසුන් එන්න ඕනෑ. එතැන වැඩ කරන අය ඉන්න ඕනෑ. අද ලෝකය දියුණු වෙනවා. ඒ දියුණු වෙන තැනට මේ සාගර විශ්වවිද්‍යාලය පත් කරන්නේ කොහොමද කියන එක ගැන මම හිතන්නේ හැම දෙනාගේම අවධානය යොමු විය යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ගොඩක් දුරට කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ පිළිබඳව -

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු මන්ත්‍රීතුමනි, Don Bosco ආයතනය, මැටියගනේ ඇතුළු ඒ හැම තැනටම මම පෞද්ගලිකව ගිහින් තිබෙනවා. ඒ පියතුමන්ලා සමඟ මගේ ඉතාම සුහද, සමීප සම්බන්ධතාවක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. Father Pinto මෙම ආයතනය ආරම්භ කළ දිනයේ සිටම අපේ බොහොම සමීප සම්බන්ධයක් තිබෙනවා. අප තීන්දුවක් ගත්තා, ජාතික වෘත්තිය සුදුසුකම - NVQ - පස්වෙනි මට්ටම ලබා දෙන පළමුවෙනි පෞද්ගලික ආයතනය මෙය විය යුතුයි කියා. ඒ ගෞරවය දුන්නා Don Bosco ආයතනයට. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රදේශය නිසායි මම මේ කාරණය විශේෂයෙන්ම කියන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු ඇමතිතුමනි, මුල් අවස්ථාවේදී මම එතැනට උදවු කළ කෙනෙක්. එස්.බී. දිසානායක ඇමතිතුමාත්, රවි කරුණානායක මැතිතුමාත් ඇතුළුව අප ගොඩාක් උදවු කළා. එම ආයතනය දියුණු කරන්න මාස් පතා අප රුපියල් ලක්ෂ පහ ගණනේ දුන්නා. මම කියන්නේ හැම ආණ්ඩුවලින්ම මේවා වෙලා තිබෙනවා කියලායි. Diyagala Boys' Town එක වාගේ ආයතන විවෘත කරන්න. නුවරඑළියේ එකක් තිබෙනවා. ඒවා හැම අංශයෙන්ම දියුණු කරන්න. මම ඒකයි කිව්වේ, මේ සාගර විශ්වවිද්‍යාලය කියන නම ආවාම, එතැනටත් පුළුල් අර්ථ කථනයක් දෙන්න කියලා. විවිධ අංශවලින් යුත් මේ විධියේ විශ්වවිද්‍යාලයක් අවශ්‍යයි. විදේශ විනිමය මේ රටට ගේන්න අලුත් විප්ලවයක් කළේ ඇඟලුම් කර්මාන්තයයි. අද හොඳම ඉල්ලුමක් තිබෙන්නේ ඒකටයි. ඇඟලුම් කර්මාන්තය ඊට ඉහළ තත්ත්වයකට ගේන්න, design කරන්න පුළුවන් තැනක් බවට පත් කරන්න, හොඳ පඩියක් ලැබෙන දිසාවට එය යොමු කරන්න කටයුතු කළ යුතුයි.

ජාත්‍යන්තරව රැකියා ලැබෙන අංශයට අපේ අදහස් යොමු කරලා නැහැ. පෞද්ගලික අංශය මේ සම්බන්ධව දැනුවත් කිරීම අවශ්‍ය වෙනවා. මම දිගින් දිගටම කථා කරන්නේ නැහැ. ඔබතුමාගේ අවධානය මම මේ කිව්ව කරුණු කෙරෙහි යොමු කරාවි කියලා හිතනවා. අපි තව තවත් උදවු දෙන්න අවශ්‍යයි. අපි විශාල වශයෙන් මුදල් වියදම් කරලා ආයතන හදනවාට වඩා ගොඩනැඟිලි තිබෙනවා නම්, භූමිය තිබෙනවා නම් ඒවාට පොඩි පොඩි උදවු කළොත් ඒ තාක්ෂණය, ඒ ක්‍රමවේදය තුළින් ජාත්‍යන්තරයත් සම්බන්ධ කරගෙන මේ රට ඉදිරියට අරගෙන යන්න පුළුවන් වෙනවා.

ගරු ඇමතිතුමනි, මම තමුන්නාන්සේට මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. සාගර විශ්වවිද්‍යාලය හදනකොට, ධීවර අංශය ගැන කථා කරනකොට මුහුදක් තියේවිද දන්නේ නැහැ. මුහුද ඔක්කෝම ඉවර කරනවා. Seabed එක ඉවර කරනවා. [බාධා කිරීමක්] අහගන්න, එක පාරට ඒවා මේවා අහන්නේ නැතුව. ගරු ඇමතිතුමනි, විදේශ නැව්වලට මාළු අල්ලන්න අවසර දීලා තිබෙනවා. මගේ කාලයේදීත් මේක වුණා, චීනයට අවසර දීලා. මේ ගොල්ලෝ සම්පූර්ණයෙන්ම seabed එක විනාශ වෙන විධියට තමයි trawling කළේ. මාළු හැදෙන තැන්, බෝවෙන තැන් විනාශ වුණා. අද ඒ ටික මේ ලංකාවේ සිදු වෙනවා. මේක තමුන්නාන්සේලාගේ අවධානයට යොමු විය යුතු කාරණයක්. අපේ මුහුදේ තිබෙන සම්පත් සියල්ලම විනාශ වෙලා ඒක ධීවරයන්ටත් බලපාලා, මත්ස්‍යයන්ටත් බලපාලා මහා භයානක තත්ත්වයක් ඇති වෙලා මේ මුහුද අපට ප්‍රයෝජනයක් ගන්න බැරි තත්ත්වයට පත් වෙලා යනවා. දැනටත් මෙය ක්‍රියාත්මක වෙනවා. අද ඔබතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරනවා. පෞද්ගලික ආයතන, විදේශීය ආයතන කීයක් trawling ක්‍රමයට මේ රටේ ධීවර කර්මාන්තය කරනවාද? සල්ලි හම්බ කිරීම තමයි ඔවුන්ගේ පරමාර්ථය. ඔවුන්ට එතැනින් එහා පරාමාර්ථයක් නැහැ. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරලා අපේ සාගරය ආරක්ෂා කර ගැනීම, මාළු බෝවෙන තැන් - breeding places - ටික ආරක්ෂා කර ගැනීම ඉතාම වැදගත්. ඒවා ආරක්ෂා නොවුණොත් අපට ලොකු ප්‍රශ්නයක් ඇති වෙයි. මාළු විතරක් නොවෙයි, මුහුදේ තිබෙන අනෙක් සම්පතුත් ආරක්ෂා කළ යුතුයි. ගරු ඇමතිතුමනි, කොරල්පර ආදී මේ ඔක්කෝම විනාශ වෙන තත්ත්වයට එනවා, විදේශිකයන් ඇවිල්ලා අර trawling ක්‍රමය ක්‍රියාත්මක කරන නිසා. ඒ bottom trawling ක්‍රමය ගැන හොයලා බලන්න. මේ trawling ක්‍රමයට මත්ස්‍ය සම්පත නෙළා ගන්නා විදේශීය ආයතන කොච්චර ප්‍රමාණයක් BOI එකේ register කරලා තියෙනවාද කියලා මම විස්තර ඉල්ලුවා. මට උත්තර දෙන්නේ නැහැ. ඒ තොරතුරු ගන්න අමාරුයි. ඒ නිසා ඔබතුමා ඒක හොයලා බලන්න. මේ ධීවර කර්මාන්තය ජාත්‍යන්තරයට ගෙන යන්න. ජාත්‍යන්තර මුහුදට යන්න පුළුවන්, එහි මාළු අල්ලන්න පුළුවන් තත්ත්වයට ඒ පුහුණු කිරීම් කරනවා නම් වඩාත් හොඳයි.

ගරු ඇමතිතුමනි, මේ පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙහි ආරම්භය තැබුවේ එක්සත් ජාතික පක්ෂයයි කියන එක විතරක් මතක් කරන්න කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 2.54]

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාගේ කථාවෙන් පස්සේ ඒ කථාවත් පාදක කොටගෙන මගේ කථාවට ප්‍රවේශයක් ලබා ගන්න මම කල්පනා කළා. සාගර ක්ෂේත්‍රය තුළ නැත්නම් නාවික ක්ෂේත්‍රය තුළ අපට තිබෙන අවකාශය පිළිබඳවත්, අනාගතයේදී අපේ රටේ තරුණ තරුණියන්ට ඒ තුළින් අධ්‍යාපන පැත්තෙන් වාගේම ආර්ථික පැත්තෙන් ප්‍රතිලාභ ලබා ගත හැක්කේ කෙසේද යන්න පිළිබඳවත් එතුමා ප්‍රකාශ කළා. ඒක තමයි අතිගරු ජනාධිපතිතුමන් එදා ධීවර අමාත්‍යවරයා වෙලා ඉන්න කාලයේ ඒ සම්බන්ධයෙන් කටයුතු කළේ. ඊට පෙර ගරු සිරිමාවෝ මැතිනිය එක්තරා අවස්ථාවකදී ධීවර ක්ෂේත්‍රයේ දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව කථා කළා.

විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමන් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ කාල සීමාව තුළ සාගර විශ්වවිද්‍යාලය ආරම්භ කරලා එතුමන් එදා බලාපොරොත්තු වුණේ ධීවර ක්ෂේත්‍රයේ නියැලී ඉන්න අපේ දෙමව්පියන්ගේ දරුවන්ට අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් ඉහළට යන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරන්නයි. විශේෂයෙන්ම පාසල් හැර යන එහෙම නැත්නම් පාසල් අධ්‍යාපනය කඩාකප්පල් වෙන ධීවර ක්ෂේත්‍රයේ ඉන්න තරුණයන්ට ඩිප්ලෝමා පාඨමාලාවක සිට පසුකාලීනව උපාධි පාඨමාලාවක් දක්වා ගමන් කරන්න පුළුවන් පරිසරය නිර්මාණය කරන එක තමයි එදා සාගර විශ්වවිද්‍යාලය නැත්නම් ඉංජිනේරු පීඨය ස්ථාපනය කිරීමේදී අතිගරු ජනාධිපතිතුමන් බලාපොරොත්තු වුණේ.

වර්තමාන ශ්‍රී ලංකාව තුළ ධීවර ක්ෂේත්‍රය දිහා බැලුවාම එය පාරම්පරික ධීවර ක්ෂේත්‍රයෙන් ඔබ්බට ගිහිල්ලා තිබෙනවා. එදා වැල්ලේ ඉඳන් මාළු අල්ලපු දෙමව්පියන් අද මහ මුහුදට ගිහිල්ලා සති ගණන්, මාස ගණන් ගත කරමින් ධීවර ක්ෂේත්‍රයේ කටයුතු කරනවා.

[ගරු නාමල් රාජපක්ෂ මහතා]

අද තාක්ෂණය ගෙනැල්ලා ධීවර ක්ෂේත්‍රය නව මාවතකට යොමු කළා වාගේම පසු ගිය වසර කිහිපය තුළ කරදිය සහ මිරිදිය යන ක්ෂේත්‍රයන් දෙකෙහිම නව පිබිදීමක් රට තුළ ඇති වුණා කිව්වොත් මා නිවැරදියි. සාගර විශ්වවිද්‍යාලය -එහි ඉංජිනේරු පීඨය- මෑත ඉතිහාසය තුළ නොයෙක් ආන්දෝලනයන්ට ලක් වුණු ආයතනයක් විධියට තමයි හම්බන්තොට, නැත්නම් තංගල්ලේ ජීවත් වන ජනතාව විධියට අපි නිරන්තරයෙන් දැක්කේ. ධීවර ක්ෂේත්‍රයේ නියැලෙන දෙමව්පියන්ගේ දරුවන් වාගේම රට පුරාම සිටින තරුණ තරුණියන් තම ජීවිතය ගොඩනඟා ගැනීමේ, තම රැකියාව ගොඩනඟා ගැනීමේ බලාපොරොත්තුව ඇතුව සාගර විශ්වවිද්‍යාලයට ඇතුළු වෙලා ඒ තුළින් සමාජයීය වශයෙන් තම ආර්ථිකය ගොඩනඟා ගන්න උත්සාහ කරන කොට ඒ තරුණ තරුණියන්ට නොයෙක් නොයෙක් අභියෝගවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ අභියෝග ජය ගන්න ඔවුන් නිරන්තරයෙන් කටයුතු කළා. ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාට අද මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ඒ සඳහා සෘජුවම මැදිහත් වෙලා සාගර විශ්වවිද්‍යාලය ඇති කරලා ඒ නංගිලා මල්ලිලා, -ඒ තරුණ තරුණියන්- එදා මුහුණ දුන් අභියෝග ජයග්‍රහණය කරවන්න අවශ්‍ය නීතිමය රාමුව හදලා ඔවුන්ගේ අධ්‍යාපනයට නිසි වටිනාකමක් ලබා දෙන්න කටයුතු කිරීම පිළිබඳව. මෑත ඉතිහාසය තමයි මේ රටේ අධ්‍යාපනයේ නිදහස ඉහළින්ම පිළිබිඹු වූ කාල සීමාව වෙන්නේ. එක් පැත්තකින් මහින්දෝදය විද්‍යාගාර වාගේම තාක්ෂණ විෂය නිර්දේශය ඇති වුණා. ඒ වාගේම සාගර විශ්වවිද්‍යාලය ඇති කිරීම තුළින් දරුවන්ට -තරුණ තරුණියන්ට- පාසල තුළ ලබන වෘත්තීය පුහුණුව වාගේම -ඔවුන් ලබන රැකියාවක් ඉලක්ක කරගත් අධ්‍යාපනය වාගේම- අනාගතයේදී විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ප්‍රවේශ වෙන්න පුළුවන් අවකාශයත් නිර්මාණය කරන්න හැකි වේ යැයි අපි දැඩි සේ විශ්වාස කරනවා.

අද රටේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ගැන නොයෙකුත් මතිමතාන්තර තිබෙනවා. විශේෂයෙන්ම Z-score අගයත් - Z-score මායිමත්- එක්ක බොහෝ වෙලාවට දක්ෂ ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වෙනවා. ඉහළ Z-score අගයක් අරගෙන විශ්වවිද්‍යාලයට යන ළමයි අති දක්ෂයෝ. හැබැයි, යම් කිසි හේතුවකින් ලකුණකින් දෙකකින් - points ගණනකින්- Z-score එක අඩු වෙලා විශ්වවිද්‍යාලයට යන්න බැරි වෙන කොට අප තුළම තර්කයක් ඇති වෙනවා ඒ තරුණ තරුණියන් අදක්ෂයෝද කියලා. සමාජය තුළ ඔවුන්ට නොයෙක් පීඩාකාරී අවස්ථාවලට මුහුණ දෙන්නත් සිද්ධ වෙනවා. සාගර විශ්වවිද්‍යාලය ඇති කිරීම තුළින් ඒ තරුණයන්ට ඉංජිනේරු ක්ෂේත්‍රය තුළ සහ අනෙකුත් ක්ෂේත්‍රවල යම් අවකාශයක් ලබා ගන්න පුළුවන් පරිසරය නිර්මාණය වනු ඇතැයි අපි දැඩි සේ විශ්වාස කරනවා. ඒ තුළින් අප බලාපොරොත්තු වුණා වාගේ මේ රට නාවුක කේන්ද්‍රස්ථානය බවට පරිවර්තනය වෙන කොට ඒ නාවුක කේන්ද්‍රස්ථානයේ සැබෑ අයිතිකාරයන්, කොටස්කරුවන් බවට පත් වෙන්න අපේ ගම්වල දෙමව්පියන්ගේ දරුවන්ට අවකාශ නිර්මාණය වෙන්න, අවස්ථාවන් වැඩියෙන් නිර්මාණය වෙන්න සාගර විශ්වවිද්‍යාලය කොටස්කරුවෙක් වෙයි කියන දැඩි විශ්වාසය තරුණ මන්ත්‍රීවරයෙක් විධියට මා තුළ තිබෙනවා.

අපි තව එක් කාරණයක් මතක තබා ගන්න ඕනෑ. විශේෂයෙන්ම සාගර විශ්වවිද්‍යාලය ආරම්භ කරන කොට එදා අතිගරු ජනාධිපතිතුමන් බලාපොරොත්තු වුණේ සාගර විශ්වවිද්‍යාලය තුළින් ධීවර ක්ෂේත්‍රයේ නියැළෙන දෙමව්පියන්ගේ දරුවන්ට අධ්‍යාපනය හදාරන්න පුළුවන්, නැත්නම් ඩිප්ලෝමාධාරීන් වන්නට පුළුවන්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා යන්න පුළුවන් පරිසරය නිර්මාණය කිරීමයි. නව විශ්වවිද්‍යාල රාමුව තුළින් ඒ දරුවන්ටත් සාගර විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය හදාරන්න නිසි අවස්ථාවක් ලැබෙයි කියා අප විශ්වාස කරනවා. සාමාන්‍යයෙන් ඕනෑම රටක බැංකු ක්ෂේත්‍රය ආරම්භ කරන්නේ ගමෙන්. ගමේ දුප්පත් මනුස්සයන්ගෙන් රුපියල් දෙක තුන එකතු කරලා මුදල් ප්‍රමාණය වැඩි වුණාට පස්සේ ඒ බැංකුවලින් වැඩිපුර ණය දෙන්නේ කෝටිපති ව්‍යාපාරිකයන්ටයි. වැල්ල පාගලා එන දුප්පත් ධීවරයාගේ දරුවන්ට අපි සාගර විශ්වවිද්‍යාලය හදලා, ඒ දරුවන්ගේ සටනින් ඒක විශ්වවිද්‍යාලයක් බවට පත් වුණාට පස්සේ ඔවුන්ගේ ඊළඟ පරම්පරාවට ඒ අවකාශය විවර නොවුණොත් අපි බලාපොරොත්තු වුණු, අතිගරු ජනාධිපතිතුමන් එදා බලාපොරොත්තු වුණු පරමාර්ථය ඉටු නොවී එය ධීවර ක්ෂේත්‍රයේ දෙමව්පියන්ගේ දරුවන්ට අහිමි වේ යැයි දැඩි බියක් අප තුළත් තිබෙනවා. ගරු ඇමතිතුමා ගන්නා උත්සාහය තවත් සාර්ථක කරන්න නම් මා විශ්වාස කරන විධියට ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ඒ දරුවන්ටත් මේ ක්ෂේත්‍රය තුළින් සාගර විශ්වවිද්‍යාලයෙන් NVQ මට්ටම ලබාගෙන ඉහළට යන්නට පුළුවන්, පසු කාලීනව පශ්චාත් උපාධියක් වුණත් ගන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කළොත් එය වඩාත් සාර්ථක වෙයි.

විශ්වවිද්‍යාලයක් වාගේම රටේ ඉන්න ධීවරයන්ගේ කාලෝචිත ප්‍රශ්නවලට, ගැටලුවලට පිළිතුරු ලබා දෙන්න පුළුවන් ආයතනයක් බවට මෙය පරිවර්තනය වුණොත් එය තවත් සාර්ථක වේ යැයි අප විශ්වාස කරනවා. විශේෂයෙන්ම කාලගුණය පිළිබඳව, මායිම් පිළිබඳව, නව තාක්ෂණය පිළිබඳව, මත්ස්‍ය සම්පත ආරක්ෂා කර ගෙන තමන්ගේ ආර්ථිකය දියුණු කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳව, අනික් පැත්තෙන් තමන් ලබන ආදායම කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක පිළිබඳව මේ ආයතනය තුළින් ගමේ ධීවරයාගේ දරුවන්, තරුණ ධීවරයන් - මිරිදිය සහ කරදිය දෙපැත්තේම- දැනුවත් කළොත්, ඔවුන් මෙහි කොටස්කරුවන් බවට පරිවර්තනය කළොත් සාගර විශ්වවිද්‍යාලය තුළින් එදා අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වුණු අරමුණු ඒ ආකාරයෙන්ම ඉටු වේ යැයි මම දැඩි සේ විශ්වාස කරනවා.

අපේ දකුණේ බිහි වුණු, හෙළයේ මහා පඬි රුවනක් වුණු කුමාරතුංග මුණිදාස ශූරීන් කිව්ව වදනක් මට මේ අවස්ථාවේ මතක් වෙනවා. ඒ තමයි, "අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී." ඒ නිසා අපි අලුත් දේවලට යන්න ඕනෑ ගරු ඇමතිතුමනි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ වාගේම අනෙක් ක්ෂේත්‍රයන්වලත් අභියෝග භාර ගන්න ඕනෑ. අපි අපේ රට නාවික කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කරනවා නම් මේ ශිෂ්‍ය පරම්පරාව, සහෝදර නංගිලා මල්ලිලා වෙනුවෙන් අනාගතයේ සාගර විශ්වවිද්‍යාලය වාගේ තවත් විශ්වවිද්‍යාල, ආයතන අනෙකුත් ක්ෂේත්‍රයන්වලත් බිහි කරන්න ඕනෑ. පරිසර ක්ෂේත්‍රයේ වෙන්න පුළුවන්, ඛනිජ වැලි ක්ෂේත්‍රයේ වෙන්න පුළුවන්, අපේ රටට ආවේණික වුණු සහ අපට ලෝකය හමුවේ ආර්ථික වශයෙන් ශක්තිමත්ව දෙපයින් හිට ගන්න පුළුවන් ආයතනවල අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා මෙවැනි ආයතන බිහි වෙන්න ඕනෑ කියන දැඩි විශ්වාසය අප සතුව තිබෙනවා.

අවසාන වශයෙන් ගරු අමාත්‍යතුමනි ඔබතුමාට, සාගර විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ සියලුම දෙනාට, එහි අධ්‍යාපනය හදාරන අපේ නංගිලා මල්ලිලාට මම සුබ පතනවා. ඔබ එදා සටන් කළේ, ඔබ එදා හඬක් නැඟුවේ ඔබගේ දෙමව්පියන්ගේ මුදල්වලින් අධ්‍යාපනය හදාරලා ලෝකයේ ඉහළ පෙළේ රැකියාවක් කරන්න පුළුවන් පරිසරය ලබා ගන්න පුළුවන් සාගර විශ්වවිද්‍යාලය -නාවික ඉංජිනේරු ආයතනය- විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කරන්නයි. අද ඒ සටනේ ජයග්‍රහණයේ ප්‍රතිලාභ ලබන්නේ ඔබත් ඊළඟ පරම්පරාවත්. ඒ නිසා අපි මේ ආයතනය ආරක්ෂා කර ගනිමු. අපි මේ ආයතනය ගොඩ නඟමු. මා හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශපාලනය කරන කෙනෙක්. ඒ සඳහා නිරන්තරයෙන්ම අපේ සහයෝගය ලැබෙනවා. අපේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාත් අපට ඒ සඳහා

සහයෝගය ලබා දෙයි කියලා මං විශ්වාස කරනවා. මෙය පිහිටා තිබෙන්නේ තංගල්ලේ. අපේ ගමේ, ධීවර ක්ෂේත්‍රයේ වාගේම රට මැද හැම කොනකම ජීවත් වන අපේ තරුණයන්ට මේ විශ්වවිද්‍යාලය තුළින් අධ්‍යාපනය ලබා ලොවක් ජය ගන්න පුළුවන් පරපුරක් බිහි කරමුය කියන ආරාධනය කරමින් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Selvam Adaikkalanathan. Before he starts, will an Hon. Member propose the Hon. Praba Ganesan to take the Chair?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Before he takes the Chair I want to tell you -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Azwer.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
மாக்கொல அநாதை இல்லத்திலிருந்து 135 பேர் இங்கு வந்து 'கலரி'யிலே அழகாக அமர்ந்திருக்கின்றார்கள். இப்படி யானவர்கள் பாராளுமன்றத்துக்கு வந்துவிட்டு வீட்டுக்குச் செல்லும்பொழுது அவர்களுக்கு ஏதாவது ஒரு நினைவுச் சின்னத்தைக் கொடுத்தனுப்ப வேண்டும் என்ற வேண்டு கோளை நான் விடுக்க விரும்புகின்றேன். இது சம்பந்தமாக ஏற்கெனவே தனி உறுப்பினர் பிரேரணையொன்றையும் நான் பிரேரித்திருக்கிறேன்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
நாங்கள் அவர்களை வரவேற்கின்றோம். நீங்கள் கூறியதற் கமைய, அதுபற்றிய தீர்மானத்தைச் சபையிலே எடுப்போம்.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I propose that the Hon. Praba Ganesan do now take the Chair.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் *அக்கிரா சனத்தினின்று அகலவே,* மாண்புமிகு பிரபா கணேசன் *அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. PRABA GANESAN *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you may speak.

[பி.ப. 3.05]

**ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தச் சந்தர்ப்பத்தைக் கொடுத்ததற்காக உங்களுக்கு நன்றி தெரிவிக் கின்றேன். அஸ்வர் ஐயா அவர்கள் சொன்னதுபோல, இந்தப் பாராளுமன்றத்திற்கு வருகை தந்திருக்கின்ற எங்களுடைய சகோதரர்களுடைய அநாதைப் பிள்ளைகளை முதலிலே வரவேற்கின்றேன்.

இலங்கைச் சமுத்திரப் பல்கலைக்கழகம் சட்டமூலம் சம்பந்தமான விவாதத்திலே கலந்துகொள்வதில் மட்டற்ற மகிழ்ச்சியடைகின்றேன். குறிப்பாக, எங்களுடைய வட மாகாணத்தை எடுத்துக்கொண்டால், ஒரு காலத்திலே அது இலங்கையின் மொத்த கடல்வள வருமானத்தின் மூன்றிலொரு பகுதியை ஈட்டிக்கொடுத்த பிரதேசமெனலாம். ஆனால், இன்றைக்கு எங்களுடைய கடல் வளம் சுரண்டப்படுகின்றது. கடல்சார்ந்த கற்கைநெறிகளைக் கற்க முடியாமல் எங்களு டைய இளைஞர் - யுவதிகள் மிகவும் கஷ்டப்படுகின்றார்கள். அவர்களுடைய வாழ்க்கை வேறு திசைக்கு மாற்றப்படுகின்ற சூழல் ஏற்பட்டிருக்கின்றது. அந்த வகையில், இன்று இந்தச் சட்டமூலம் சபையில் சமர்ப்பிக்கப்பட்டமையானது எங்களைப் பொறுத்தமட்டில் வரவேற்கக்கூடிய ஒரு விடயமாகும்.

வட மாகாணத்திலே - யாழ்ப்பாணப் பல்கலைக்கழகத்திலே இது தொடர்பான டிப்ளோமா கற்கைநெறிதான் போதிக்கப் பட்டுக்கொண்டிருக்கின்றது. இந்தச் சந்தர்ப்பத்தில் நான் ஒரு வேண்டுகோளை விடுக்க விரும்புகின்றேன். அதாவது, நான்கு வருடங்களைக் கொண்ட இந்தப் பட்டப்படிப்பை மேலும் தரமுயர்த்த வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன். உண்மையில் வடக்கைப் பொறுத்தமட்டில் அது கடல்சார்ந்த இடமாக இருப்பதால் மீனவ சமூகம் அங்கே கூடுதலாக வாழ்ந்துகொண்டிருக்கின்றது. இந்தச் சூழலில் அவர்களுடைய எதிர்காலம் கருதி, தொடர்ச்சியாக அவர்கள் கடலுக்குச் சென்று ஆராய்ச்சிகளில் ஈடுபட்டு, அதனூடாகக் கடல் வளங்களைப் பெருக்குகின்ற வாய்ப்புக்களை ஏற்படுத்திக் கொடுத்தாக வேண்டும். பல்கலைக்கழகம் செல்கின்ற எங்களு டைய இளைஞர் - யுவதிகள் பொதுவாக அரசாங்க வேலை வாய்ப்புக்களைத்தான் எதிர்பார்க்கின்றார்கள். என்றாலும், அவர்கள் பல்கலைக்கழகத்திலிருந்து வெளியேறிப் பல வருடங்களுக்குப் பின்புதான் அரசாங்கம் அவர்களுக்கு வேலைவாய்ப்புக்களைக் கொடுக்கின்றது. ஆகவே, கடல் சார்ந்த பிரதேசங்களிலிருக்கின்ற எங்களுடைய இளைஞர் - யுவதிகள் கடல்சார் கற்கைநெறிகளைக் கற்று கடல் வளங்களை அல்லது ஏனைய மீன்பிடி சம்பந்தமான உற்பத்தி களைப் பெருக்குவது சம்பந்தமான ஆராய்ச்சிகளிலும் ஈடுபடுவதற்கு அவர்களை ஊக்குவிப்பது சாலச்சிறந்ததென்று நான் நினைக்கின்றேன்.

[ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]

உண்மையிலே மன்னார் மாவட்டம் கடல் சார்ந்த ஒரு மாவட்டமாகும். அங்கே கூடுதலாக மீனவ சமூகத்தினர் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். எனவே, அங்கும் இத்தகைய ஒரு சமுத்திரப் பல்கலைக்கழகமொன்றை உருவாக்க வேண்டுமென்ற கோரிக்கையை நான் முன்வைக்கின்றேன். மன்னார் அதற்குத் தகுதியான ஓர் இடமாகும். அந்த வகையில், எங்களுடைய இளைஞர் - யுவதிகள் அப்பல்கலைக்கழகத்தைப் பயன்படுத்தி தங்களுடைய எதிர்கால வாழ்வைச் செழிப் பாக்கிக்கொள்வார்கள். அப்போது அரசாங்கத்தின் மானியங் களை எதிர்பார்க்காது தமது சொந்தக்காலிலே நிற்கின்ற தன்மை அவர்களுக்கு ஏற்படும். அரசாங்க உத்தியோகத்தை எதிர்பாராது இந்த நாட்டின் வருமானத்தைப் பெருக்குகின்ற வாய்ப்புக்களும் அவர்களுக்கு ஏற்படும்.

அங்கு ஆழ்கடல் தொழில்நுட்பம் பிரயோகிக்கப் படுவதில்லை. அதேநேரம் மன்னார், யாழ்ப்பாணம் ஆகிய மாவட்டங்களிலே இந்திய 'ரோலர்'களின் வருகையினால் - அவர்கள் தடை செய்யப்பட்ட மடிகளைக்கொண்டு இழுப்பதன் மூலம் - எங்களுடைய கடல் வளங்கள் சூறையாடப்படுவதால் அங்கு மீனுற்பத்தியாகின்ற நிலைகள் காணப்படுவதில்லை. அந்த வகையிலே அங்குள்ள மீனவ சமூகம் இன்று வறுமைக் கோட்டுக்குக்கீழ் வாழ்ந்துகொண்டிருக்கின்றது.

இந்தப் பல்கலைக்கழகங்களை நீங்கள் உருவாக்கினால், உண்மையிலே எங்களுடைய இளைஞர் யுவதிகள் பயன டைவர். அவர்களால் மீனுற்பத்தி அல்லது கடல்சார்ந்த உற்பத்திகளைப் பெருக்குவதற்கான வாய்ப்புக்கள் ஏற்படும். அதேநேரம் எதிர்காலத்திலே அந்த இளைஞர் யுவதிகள் தங்களு டைய சொந்த வாழ்க்கையை நிர்ணயித்துச் செயற்படவும் வாய்ப்புக்கள் இருக்கின்றன.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මන්නාරමේ නැති වුණාට දැනට ලංකාව පුරාම ප්‍රාදේශීය මධ්‍යස්ථාන අටක් තිබෙනවා. ඒ මධ්‍යස්ථාන අට එහෙම ම ඉදිරියට යනවා. එයින් එකක් තිබෙන්නේ යාපනයේ. තව එකක් මඩකලපුවේ තිබෙනවා. ඒ නිසා උතුරේ සහ නැඟෙනහිර දරුවන්ට ඒ ආයතනවලින් අධ්‍යාපනය ලබා ගන්න පුළුවන්. පළමුවන අදියරේදී මීට වඩා මධ්‍යස්ථාන ව්‍යාප්ත කරන්නේ නැතිව, මේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන අටේ දැනට තිබෙන ප්‍රශ්න විසඳා ගෙන ඒවා ශක්තිමත් කරන්න තමයි මේ මොහොතේ අපි කල්පනා කරන්නේ. ඒ අනුව, උතුරේ දරුවන්ට යාපනයේ මධ්‍යස්ථානයෙන් අධ්‍යාපනය ලබන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා.

ඊට අමතරව, ජර්මන් රජයේ විශාල මූල්‍ය ආධාරයක් ඇතිව NAITA ආයතනය යටතේ hostel පහසුකම් සහිතව ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයක් කිලිනොච්චිය නගරයේ ඉදි කිරීමට කටයුතු ආරම්භ කරන්න යනවා.

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
நான் கௌரவ அமைச்சர் அவர்களிடம் ஒரு வேண்டு கோளை விடுக்க விரும்புகின்றேன். அது என்னவென்றால், இப்பொழுது இல்லாவிட்டாலும் எதிர்வரும் காலங்களிலே நீங்கள் மன்னாரிலும் குறித்த நிறுவனம் ஒன்றை அமைத்துச் செயற்படுத்த வேண்டும் என்று நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்கின்றேன்.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මන්නාරමට දැනට දීලා තිබෙනවා. ඔබතුමා විශේෂයෙන් එයට මහන්සි වුණා.

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
நன்றி.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
දැනට එහි අධ්‍යයන කටයුතු ආරම්භ කරලා තිබෙනවා.

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
வடக்கைப் பொறுத்தமட்டிலே, அங்கு மீனுற்பத்தியின் மூலம் இந்த நாட்டுக்கு வருமானத்தை ஈட்டிக்கொடுத்த காலம் ஒன்றிருந்தது. இப்பொழுது அது குறைந்து கொண்டிருக் கின்றது.

இலங்கைச் சமுத்திரப் பல்கலைக்கழகத்தை நிறுவுவதன் மூலம் அந்தக் கல்வியைப் பட்டப் படிப்பாக மாற்றினால், தங்களுடைய சமூகம் சார்ந்த சிந்தனையோடு இன்றைக்கும் கடற்றொழில் செய்தாலும் பெரிய அளவிலே வளர முடியாமல், வாழ முடியாமல் திண்டாடிக்கொண்டிருக்கின்ற எங்களுடைய மீனவர் சமூகத்துக்கு நல்லதோர் எதிர்காலத்தை ஏற்படுத்த முடியும். அதேநேரம், அந்த இளைஞர் - யுவதிகள் அந்தக் கல்வியைப் பெறுவதனூடாக எங்களுடைய தேசத்திலே, எங்களுடைய பிரதேசத்திலே வாழும் மக்களின் வளத்தையும் இளைஞர் யுவதிகளின் வாழ்க்கையையும் மேம்படுத்த முடியும். ஆகவே, அத்தகைய சூழலை நீங்கள் எங்களுடைய பிரதேசத் திலும் உருவாக்க வேண்டும் என்று கேட்டு, விடைபெறு கின்றேன். நன்றி, வணக்கம்.

[අ.භා. 3.13]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, දිවංගත අග්‍රාමාත්‍ය එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමන් එදා කිව්වා, "මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි" කියලා. ඒ ආදර්ශ පාඨය පරමාදර්ශයට ගනිමින්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එදා විශේෂයෙන්ම ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ආරම්භ කළේ මේ රටේ ධීවර ජනතාවටයි, එහෙම නැත්නම් ඒ අංශයේ නියැලෙන අයටයි කියලා කෙනකුට හිතන්න පුළුවන්. නමුත් අපි නොදකින එක පැත්තක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට අයිති මුළු සම්පත් ප්‍රමාණය ගත්තොත්, ගොඩ බිමෙන් අපට අයිතිය තිබෙන්නේ සියයට 12යි. නමුත් සියයට 88ක අයිතියක් තිබෙනවා, මුහුදේ. එහෙම නැත්නම් මුහුද යට. අපි අමතක කරලා තිබුණු ඒ දේ, අපි නොදැක්ක ඒ දේ මේ රටේ ජනතාවට සේවය කිරීමේ අභිලාෂයෙන් එදා අතිගරු ජනාධිපතිතුමාගේ දූර දක්නා නුවණින් දැක්කා. මේ පුංචි සියයට 12 ප්‍රමාණයේ ගොඩබිමේ වැටවල් ගහ ගෙන මායිම් කරන්න කටයුතු කරන මොහොතකදී, මුහුද යට තිබෙන සියයට 88ක ප්‍රමාණයේ සම්පත කෙරෙහි අවධානය

යොමු කරලා තමයි ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ආරම්භ වුණේ. කන්ද උඩ රට මිනිසුන් හැටියට එදා අපි හිතුවා, මෙය දකුණේ අයට විතරක් කරන දෙයක්ද කියලා. නැහැ. ඇත්තෙන්ම මෙය රට ගැන හිතලා කරපු දෙයක්. අපි නොදකින, මුහුද යට තිබෙන සියයට 88ක සම්පත ගැන හිතලා තමයි මේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ආරම්භ කළේ.

ඉදිරි අනාගතයේදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ සාධනීය කළමනාකරණයක් තුළින් මිනිස් ශ්‍රම බල කායක් හදලා මේ සම්පත් උපයෝජනය කර ගන්න කටයුතු කරයි කියා මා හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාගරය යට සම්පත තිබුණාට වැඩක් නැහැ, එයින් ප්‍රයෝජනය ගන්න පුළුවන් ශ්‍රම බලකායක් අපට නැත්නම්. අපේ සේද මාර්ගයේ නැව් යන්න පුළුවන් හම්බන්තොට වරායට මායිම්ව. නැවක් කැඩුණාම ඒක හදා ගන්න, නැවක වතුර leak එකක් ඇති වුණාම ඒක පාස්ස ගන්න පුළුවන් තාක්ෂණයක් අපට නැත්නම් අපට ආදායමක් ගන්න බැහැ. අපි පොළොව මත තිබෙන ඇඟලුම් කර්මාන්තය ගැන, එහෙම නැත්නම් රබර් කර්මාන්තය, තේ කර්මාන්තය ගැන හිතුවත් ජනාධිපතිතුමා දැක්කේ මුහුද යට තිබෙන සම්පතයි. නමුත් අපේ දරුවා එතැනට යොමු කරන්න අපේ දරුවාට ඒ තාක්ෂණය තිබුණේ නැහැ.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය තුළ අධ්‍යාපන ක්‍රම දෙකක් තිබෙනවා. එකක් වෘත්තීය අධ්‍යාපනය. අනික් එක උපාධි අධ්‍යාපනය. වෘත්තීය අධ්‍යාපනය තුළින් ධීවර සහ සාගර විද්‍යාව, මුහුදු බඩු ප්‍රවාහනය සම්බන්ධයෙන් නාවික ඉංජිනේරු තාක්ෂණය, වතුර යට වැද්දුම් ශිල්පය, මිරිදිය මසුන් ඇති කිරීම වැනි දේ හදාරන්න පුළුවන්. උපාධිය සීමිත විෂයයකට සීමා වනවා. උපාධියට තිබෙන්නේ සාගර ඉංජිනේරු විද්‍යාව වැනි විෂයයක්. ඒ නිසා මේ ආයතනය ඉතා වැදගත්. මොකද, අපි මේ දැනුම ලබන්නේ නැතුව අර සියයට 88ක් වන සාගර සම්පතින් ප්‍රයෝජනය ගන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ප්‍රයෝජනය ගැනීම තමයි එදා අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම වුණේ. මේ සියයට 88ක සාගර සම්පතේ ප්‍රයෝජන ගන්න නම් අපි පුහුණු ශ්‍රම බලකායක් හදන්න ඕනෑ. අන්න ඒ ශ්‍රම බලකාය නිර්මාණය කර ගැනීමේ ආයතනය විධියට තමයි ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය හැදුවේ.

අද මේ ආයතනයට සම්බන්ධ ප්‍රාදේශීය ආයතන 10ක් තිබෙනවා. මඩකලපුව, යාපනය, තංගල්ල, මට්ටක්කුලිය වාගේ හැම ප්‍රදේශයකම මේ ප්‍රාදේශීය ආයතන තිබෙනවා. ඒ නිසා, මේ රටේ උතුරු නැඟෙනහිර ඇතුළු හැම ප්‍රදේශයකම ඉන්න දරුවන්ට මේ අධ්‍යාපනය ලබන්න පුළුවන් පහසුකම ලැබී තිබෙනවා. ඒකත් හොඳ දෙයක්. මොකද, රටේ එක පැත්තකට විතරක් සීමා වෙලා නැහැ. හුඟක් විට කියන්නේ, රටේ එක කොටසකට පමණක් කරනවා කියලායි. නැත්නම් මහ ජාතියට විතරක් කරනවාය කියලා. නමුත් එහෙම නොවෙයි. එතුමා මුළු රට දිහාම බලලා තිබෙනවා. ඒ සම්පත එතුමාගේ ප්‍රදේශය වන තංගල්ලේ ජනතාවට විතරක් නොවෙයි. උතුරු නැඟෙනහිර ජනතාව වෙනුවෙනුත් ලබා දීලා, අපට ඇඟිල්ල දික් කරන අයට හොඳ ආදර්ශයක් ලබා දී තිබෙනවා. ඒ මඟින් රටේ හැම හැම දරුවෙකුටම වෘත්තීය අධ්‍යාපනයක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්තල ගුවන් තොටුපොළ ගැන අද හුඟක් විවේචනය කරනවා. ඊයේ පෙරේදා පියංකර ජයරත්න ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහලා, කඩල කඩයක තරම්වත් ආදායමක් නැහැයි කියලා හිනා වුණා. ඊළඟට හම්බන්තොට වරාය ගැන කියනවා, වරායේ ගලක් තිබෙනවා; ගොඩබිමක් වරායක් කරලා කියලා. නමුත් අපි එක දෙයක් දකින්න ඕනෑ. මේ රට ගොඩ ගත්ත ජනාධිපතිවරු, අගමැතිවරු හිටියා. නමුත් තමන්ගේ ප්‍රදේශයට කිසි වැඩක් කළේ නැහැ. ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා හැටියට කටයුතු කරන අපේ බැසිල් රාජපක්ෂ මැතිතුමා ගම්පහ දිස්ත්‍රික්කය භාර ගන්නා විට අඩු ගණනේ ඒ ප්‍රදේශයේ ගුවන් පාලමක්වත් දමා තිබුණේ නැහැ. හොඳට බලන්න ඔය විවේචනය කරන මත්තල ගුවන් තොටුපොළ, හම්බන්තොට වරාය සහ හම්බන්තොට අධිවේගී මාර්ගය. ඒවා තමයි මේ රටේ ඉදිරි අනාගතයේදී අපි දකින දර්ශනය. මොකද, ඒ තමයි අනාගතයේ අපේ ආදායම් උත්පාදන මාර්ග. තේ, රබර්, පොල් සහ විදේශ රැකියා නියුක්තියෙන් විතරක් නොවෙයි අප ආදායම් උපයා ගත යුත්තේ. විශාල කර්මාන්ත ආරම්භ කළාට අවශ්‍ය අමු ද්‍රව්‍ය නැත්නම් අපි ඊළඟට ගන්න ඕනෑ මේ සම්පත්. ඒ සම්පත් එකතු කරන්න දැක්මක් තිබෙන්න ඕනෑ. ඒ ඉදිරි දැක්ම අතිගරු ජනාධිපතිතුමාට තිබෙනවා. අද ඔය හිනා වෙන කට්ටියට, අද මේවා විවේචනය කරන කට්ටියට කියන්න ඕනෑ නාවික ප්‍රවාහනය, මුහුදු ප්‍රවාහනය, ගොඩබිම් ප්‍රවාහනය කියන තුනම එකතු කරන ස්ථානයක් -hub එකක්- බවට අද හම්බන්තොට නගරය නිර්මාණය වෙලා තිබෙන බව. ඒ නිර්මාණය ගැන අපි සතුටු වෙන්න ඕනෑ. තමන් ඉපදුණු පළාතට වැඩක් කරන්න ඕනෑ.

බුදුරජාණන් වහන්සේත් ශාක්‍ය වංශිකයන් වෙත ගිහින් තමන් වහන්සේ අවබෝධ කර ගත් ධර්මය දේශනා කළා. ඒ වාගේ තමන් ඉපදුණු දුෂ්කර ප්‍රදේශයට අධිවේගී මාර්ග සෑදීම ආරම්භ කරලා, හම්බන්තොට ඉතාම විශිෂ්ට වූ ප්‍රදේශයක් බවට අද පත් කරලා තිබෙනවා. අද ඒ ප්‍රදේශයේ අධිවේගී මාර්ග, සම්මන්ත්‍රණශාලා සියල්ල තිබෙනවා. මේවා ඉතා වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිවේගී මාර්ග, වරාය, ගුවන් තොටුපොළ තිබුණාට වැඩක් නැහැ. ඒ සම්පත් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා මානව සම්පත් අවශ්‍යයි. ඒවාට සම්බන්ධ ගුවන් යානා වෙන්න පුළුවන්; නැව් වෙන්න පුළුවන්; ඒවාට තෙල් සැපයීම වෙන්න පුළුවන්. ඒ සියල්ල කරන්න පුළුවන් ශ්‍රම හමුදාවක් අපි බිහි කර ගන්න ඕනෑ. ඒ සඳහා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය අද වෘත්තීය පුහුණු අධ්‍යාපන පීඨය ආරම්භ කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ හෙට දවසේ රට භාර ගන්න ඉන්න දරුවා වෙනුවෙන්. අද සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම වෘත්තීය පුහුණුව සඳහා වෙනම පන්ති ආරම්භ කරලා, තව අවුරුදු තුන හතරකින් ඒක විශ්වවිද්‍යාල මට්ටම දක්වා යන්න පහසුකම හදලා තිබෙනවා. ඇයි ඒ? වෘත්තීය අවශ්‍යතාව. අපි නොදැක්ක දේ තමයි ඒ. අද විශ්වවිද්‍යාල තුළ නිර්මාණය කරන උපාධිය සියයට සියයක්ම රැකියා නිෂ්පාදනය කරන උපාධියක් බවට පත් කරන්න ඕනෑ. අපි එදා කළේ මොකක්ද? ආර්ථික විද්‍යාව, ඉතිහාසය, භූගෝලය කරලා කලා අංශයෙන් උපාධියක් ගත්තා. එහෙම නැත්නම් වෙනත් විෂයයන් හදාරලා උපාධියක් ගත්තා. ඒ අංශයට විතරයි යොමු වුණේ. නිදහස් අධ්‍යාපනයෙන් බිහිවන උපාධිධාරියාට අපි රැකියාවක් දුන්නාට ඔහුගෙන් රටට ප්‍රයෝජනයක් ගන්න බැරි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බිහි කළ සාගර විශ්වවිද්‍යාලය තුළින්, අපේ ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා ආරම්භ කර තිබෙන වෘත්තීය පුහුණු අධ්‍යාපනය තුළින් අපේ අනාගත පරපුරට තමන් උපතින් ගෙනා දක්ෂකම ආදායම් උත්පාදනය කරන වෘත්තියක් බවට පත් කරන්න ඕනෑ නම් ඒ තාක්ෂණික පුහුණුව ලබා දෙන්න අද කටයුතු කරලා තිබෙනවා. මේක තමයි වැදගත් වන්නේ. අපි රටවල් විධියට ගත්තාම විශේෂයෙන් ජපානය, ඒ වාගේම මුහුද ආශ්‍රිතව තිබෙන හවායි දූපත, ටස්මේනියාව වාගේ රටවල් මෙහි තව පැත්තක් දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රස්තවාදය නැති නිසා අපේ රටට පැමිණෙන සංචාරකයන්ගේ ප්‍රමාණය දොළොස් ලක්ෂය දක්වා අද ඉහළ ගොස් තිබෙනවා. ඒක විසිලක්ෂය දක්වා වැඩි

[ගරු ලලිත් දිසානායක මහතා]

කරන්නට අප කටයුතු කරනවා. අපි බොහොම ආඩම්බරයෙනුයි ඒ දේ කියන්නේ. අපි සංචාරකයන් ගෙන්වා ගන්නේ අපේ රටේ පුරාණ නටබුන් බලන්න, sceneries බලන්න විතරක් නොවෙයි. අපේ රට වටේ සියයට 88ක් වූ සාගර සම්පත තිබෙනවා. ඔබතුමාත් දකින්න ඇති ඊයේ පෙරේදා පුවත් පත්වල තිබුණ විස්තර. අපේ මුහුද යට ගිලුණු නැව් තිබෙනවා. තාක්ෂණය උපයෝගී කර ගෙන ඒවා සොයා ගෙන තිබෙනවා. අද අප ඉතා අධික ආදායම් ලබන මාර්ගයක් තමයි සංචාරක ක්ෂේත්‍රය. නමුත් විපක්ෂය කියනවා, අපේ රටට එන සංචාරකයන් වියදම් කරන්නේ නැහැයි කියලා. එහෙම නම් ඒ සංචාරකයා වියදම් කරන කෙනෙක් බවට පත් කරන්න කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා ආයතන බිහි කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ ගාලු කොටුව බලන්න කොච්චර අය එනවාද, කොච්චර අය බද්දට අර ගෙන ඇවිල්ලා පදිංචි වෙලා ඉන්නවාද? එහෙම නම් අපට ඒවා නිර්මාණය කරලා, මුහුදු පත්ලේ ගිලිලා තිබෙන පෘතුගීසි, ලන්දේසි නැව් ටික බලන්න එන්නය කියලා සංචාරකයන්ට කියන්න පුළුවන්. හැබැයි, ඒකට අවශ්‍ය පහසුකම් සලසා දෙන්න ඕනෑ.

ගොඩබිම උඩ කරන කටයුතු වාගේ නොවෙයි, මුහුද යට කරන කටයුතු අමාරුයි. ඒ වාගේම මුහුදු ක්‍රීඩා කොච්චර තිබෙනවාද? අපි මේ පැත්තට ගන්න ඕනෑ. මහනුවර ධර්මරාජ විද්‍යාලයේ හිටපු ශිෂ්‍යයෙක් හැටියට මා දන්නවා, ඒ කාලයේත් වැව වටේ කාර් රේස්, මෝටර් සයිකල් රේස් තිබුණු බව. මේ රාජපක්ෂ මහත්තයලා නොවෙයි, වැව වටේ රේස් පටන් ගත්තේ. රාජපක්ෂ කෙනෙක්, නැත්නම් මන්ත්‍රීවරයෙක් කරන්න යනවා කියලා අද ඒක අලුත් දෙයක් විධියට පෙන්වන්න හදනවා.

එදාත් ඒවා තිබුණා. අපි ඒවා දැක්කා. අද ත්‍රස්තවාදය නැති වෙලා අපේ දරුවන්ට නිදහසේ ඉන්න අවස්ථාව ලැබී තිබෙනවා. මේක වැලි කොට්ට ගොඩ ගහලා ඉතිහාසගත නගරයක් අනෙක් පැත්තට පෙරළන්න හදනවා නොවෙයි. මේක නිර්වචනය කරන්නේ ඒ විධියටයි. එහෙම නැහැ. අපි ඒ තැන් හදන්න ඕනෑ. සංචාරකයන් එන්නේ යම්කිසි දෙයක් බලලා යන්නයි. විවිධ ක්ෂේත්‍රවල සංචාරකයන් ඉන්නවා. අපේ සංස්කෘතියට ගැළපෙන ආකාරයට ඔවුන් කැමැති දේ අපි ලබා දෙන්න ඕනෑ. ඒ විධියට බලන කොට මේ මුහුදු ක්‍රීඩාවත් ඉතා වැදගත් වෙනවා. මුහුදු ක්‍රීඩා අංශයට වාගේම අපේ රටේ සියයට 88ක් තිබෙන සාගරයේ යට තිබෙන සම්පත් බලා ගන්නට, මුහුද යට සිටින ලස්සණ මසුන් බලා ගන්නට හැකි තාක්ෂණය ලබා දෙන්න පුළුවන් ශ්‍රම බල කායක් හැදුවාම අපට සංචාරකයන් ගෙන්වන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ බලාපොරොත්තුව ඒකයි. ඒ නිසා අපි සතුටු වෙනවා, දූර දක්නා නායකයෙක් හැටියට අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා සියයට 88ක් තිබෙන අපේ සාගර සම්පත තුළින් ප්‍රයෝජන ගන්නට, එහි සාධනීය කළමනාකරණයක් තුළින් ජනතාව වෙනුවෙන් ඒ සම්පත් උපයෝජනය කර ගන්නට අවශ්‍ය ශ්‍රම බලකායක් බිහි කරන්නට මේ සාගර විශ්වවිද්‍යාලය බිහි කිරීම ගැන. ඒ සම්බන්ධයෙන් අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යවරයා හැටියට අපේ ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා දක්ෂ ලෙස, -අත් දැකීම් සහිත අමාත්‍යවරයෙක් හැටියට- අනෙකුත් නිලධාරීන් සමඟ ගෙන යන ගමන ගැනත් එතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

[අ.භා. 3.20]

**ගරු විජිත හේරත් මහතා**
**(மாண்புமிகு விஜித ஹேரத்)**
**(The Hon. Vijitha Herath)**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාව කියන්නේ ඉන්දියන් සාගරයෙන් වට වුණු පුංචි දූපතක්. ඒ වාගේම රට අභ්‍යන්තරය වැව් අමුණු ගණනාවකින් සමන්විතයි. මේ පුංචි දිවයින ධීවර කර්මාන්තයෙන්, ඒ වාගේම සාගර ක්ෂේත්‍රයට අදාළ විවිධ ක්ෂේත්‍රවලින් දියුණු කිරීම රටේ සංවර්ධනයේ ප්‍රධාන පදනමක් බවට පත් වෙනවා. ඒ අර්ථයෙන් ගත්තොත් සාගර විශ්වවිද්‍යාලය අනාගතය පිළිබඳව හොඳ දැක්මක් සහිත යහපත් දෙයක් විධියට අපි දකිනවා. ක්ෂේත්‍රයේ නියුතු අයට, රට පිළිබඳ හැඟීමක් තිබෙන අයට සාගර විශ්වවිද්‍යාලයක් කියන අදහස, ඒ සංකල්පය ඇත්තටම අනාගත සංවර්ධනය පිළිබඳව හොඳ පදනමක් යොදෙනවා කියන හැඟීමක් එන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අද දින විවාදයට ගනු ලබන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත ඉවත් කරලා විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම සඳහා වුණු පනත් කෙටුම්පතක්. අපේ රටේ අධ්‍යාපනයේ, විශේෂයෙන්ම විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ උපාධි පිරිනමන ප්‍රධාන ආයතන නියාමනය කරන ප්‍රධාන ආයතනය තමයි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව. අදත්, මේ තාක් කල් අවම දූෂණයට ලක් වුණු ආයතනය තමයි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව. මෑතකදී ඒ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙනුත් විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීම දේශපාලන හිතවත්කම් මත සිදු කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. නමුත්, මෙතෙක් කාලයකට යම් හෝ සාධනීය පැත්තක් පෙන්නුම් කළ තැනක්. නමුත් ශිෂ්‍යයෝ විශාල බලාපොරොත්තුවක් තියාගෙන ඉන්නවා අපටත් විශ්වවිද්‍යාලයක් ලැබුණා, ඒ විශ්වවිද්‍යාලය තුළ අපට උපාධියක් ගන්න පුළුවන්, ඒ නිසා අපේ අනාගතය ශක්තිමත් කර ගන්න පුළුවන් කියලා. ඒ අහිංසක බලාපොරොත්තුව, සිහිනය ඔවුන් තුළ තිබෙනවා. ඒක වැරැද්දක් නොවෙයි. අපිත් දකිනවා, සාගර ක්ෂේත්‍රයේ නියුතු අයට උපාධියක් ලබා ගැනීමේ අවස්ථාවක් දිය යුතු බව. ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. ඒක අද ඊයේ ඇති වුණු දෙයක් නොවෙයි. මීට වසර ගණනාවකට ඉහත සිට ආ සංවාදයක්. ඒ සංවාදයේ ප්‍රතිඵලයක් විධියට අද මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙනවා. මේ ක්ෂේත්‍රයේ අයට උපාධි පාඨමාලාවක් ලබා ගැනීමට, ඊටත් එහා ගිහින් පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට, ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා යම් යම් අධ්‍යයන කටයුතුවල නිරතවීමට සහ පර්යේෂණ කටයුතුවල නිරතවීමට විශ්වවිද්‍යාල සහ පශ්චාත් උපාධි ආයතන පිහිටුවිය යුතුයි. ඒ පිළිබඳව කිසිදු විවාදයක් නැහැ.

නමුත් මේ පනත් කෙටුම්පතේ 66 වන වගන්තියේ ඉතා පැහැදිලිව මෙසේ සඳහන් කරලා තිබෙනවා:

> "1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන, මේ පනත මගින් පිහිටුවනු ලබන විශ්වවිද්‍යාලයට සහ ඒ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය"

එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. විශ්වවිද්‍යාලයක් ඇති කරන මේ පනත් කෙටුම්පතේ ඉතා පැහැදිලිව එසේ සඳහන් වනවා. ලංකාවේ විශ්වවිද්‍යාල පිළිබඳව තිබෙන ප්‍රධාන ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කටයුතු තීරණය වන්නේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින්. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන මේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පතට අදාළ වන්නේ නැහැ කියනවා. ඒ අනුව සාගර විශ්වවිද්‍යාලය කියන එක 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට යටත් විශ්වවිද්‍යාලයක් නොවෙයි. ඒකනේ මේ කියන්නේ. එතකොට මේක "විශ්වවිද්‍යාලයක්" කියලා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම හඳුන්වන්නේ කොහොමද? සුරංගනා සාහිත්‍ය කථාවලින් විශ්වවිද්‍යාලයක් වෙන්නේ නැහැ. මේ ශිෂ්‍යයන්ගේ අනාගත බලාපොරොත්තුව, සිහිනය සැබෑ වෙන්නේ නැහැ ඒ මඟින්. ඒ සිහිනය සැබෑ වන්න නම් සැබැවින්ම මෙය

විශ්වවිද්‍යාලයක් බවට පත් වන්නට ඕනෑ. ගොඩනැඟිලි කිහිපයක් ඉදි කළ පමණින් එය විශ්වවිද්‍යාලයක් බවට පත් වන්නේ නැහැ. ගොඩනැඟිලි ඉදි කරලා තිබෙනවා. ඒ විධියට ගොඩනැඟිලි පමණක් ඉදි කරලා, විශ්වවිද්‍යාල නමින් නාමිකව පටන් ගත්ත ආයතන ගොඩක් තිබෙනවා. අද වන විට ඒවායේ තත්ත්වය ඉතාම බේදනීයයි. අපිට මතකයි රජ රට විශ්වවිද්‍යාලය වෛද්‍ය පීඨයෙන් ආරම්භ කරනවා කියලා මහා විශාල ආන්දෝලනයක් සහිතව පටන් ගත්තා.

මෑතක් වන තුරුම රජරට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ට තමන්ගේ වෛද්‍ය උපාධිය සම්පූර්ණ කරගත නොහැකි තත්ත්වයක් තිබුණා. වෛද්‍ය උපාධිය සඳහා වූ ඉගැන්වීම් කටයුතුවලට එම විශ්වවිද්‍යාලයට මහාචාර්යවරයකු සිටියේ නැහැ. මහාචාර්යවරයකු නැතිව ඒ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ට උපාධිය පිරිනමන්න බැහැ. ගොඩනැඟිල්ල තිබෙනවා; ශිෂ්‍යයන් බඳවා ගත්තා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනෙකුත් විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා ක්‍රමවේදයටම උසස් පෙළ සමත් වුවන්ගෙන් එම විශ්වවිද්‍යාලයටත් බඳවා ගත්තා. හැබැයි උපාධිය ගන්න බැරිව ශිෂ්‍යයන්ට සිද්ධ වුණා වසර ගණනාවක් සටන් කරන්න, අරගල කරන්න, මහ පාරවල උද්ඝෝෂණය කරන්න. එහෙම උද්ඝෝෂණය කරලා තමයි, ඒ ශිෂ්‍යයන්ගේ ජීවිත පරදුවට තබලා කරපු අරගලවලින් පස්සේ තමයි යන්තම් හරි උපාධිය ගන්න පුළුවන් තත්ත්වයකට අද ඒ විශ්වවිද්‍යාලය පත් වුණේ.

ගරු ඇමතිතුමනි, මෙම ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය හොඳයි. අපි එය නරකයි කියා කිසිසේත් කියන්නේ නැහැ. හැබැයි නිකම් සාහිත්‍යමය වචනවලින්, "මේක විශ්වවිද්‍යාලයක්. ඔන්න මම සාගර ක්ෂේත්‍රයේ නියුතු අයට විශ්වවිද්‍යාලයක් හැදුවා." කියලා නිකම් බොරුවට අතිශයෝක්තියෙන් වර්ණනා කළාට විතරක් මදි. මෙය හරයාත්මකවම විශ්වවිද්‍යාලයක් බවට පත් වන්න ඕනෑ. හරයාත්මකවම විශ්වවිද්‍යාලයක් බවට පත් වන්න නම් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි විධිවිධානවලට යටත් වෙන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතේ ඉතා පැහැදිලිව තිබෙනවා, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන මේ පනත මඟින් පිහිටුවනු ලබන විශ්වවිද්‍යාලයට සහ ඒ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුයි කියලා. එහෙම නම් කොහොමද මේකට විශ්වවිද්‍යාලයක් කියන්නේ? ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය අහෝසි කරලා, ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත අහෝසි කරලා ඒ වෙනුවට තමයි "ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය" කියන එක නාමකරණය කරන්නේ. නාමකරණය කළාට, පනත් කෙටුම්පතක් සම්මත කළාට විශ්වවිද්‍යාලයක් වන්නේ නැහැ. එය විශ්වවිද්‍යාල පනතට යටත් වන්න ඕනෑ. විශ්වවිද්‍යාල පනතට යටත් වන්න නම් අදාළ අධ්‍යයන ක්‍රමවේදයන්, විභාග ක්‍රමවේදයන්, ඒ සඳහා වූ පාඨමාලා ක්‍රමවේදයන් සකස් කරලා අවශ්‍ය කරන පිළියම් යෙදිය යුතුව තිබෙනවා. මට මතකයි මීට කලින් මේ සංවාදය ආවා. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සාගර විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව හදාරන්න විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා පටිපාටියට යටත්ව සිසුන් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුයි කියන සංවාදයක් තිබුණා. එහෙම තිබියදී තමයි වෙනම සාගර විශ්වවිද්‍යාලයක් කියන සංකල්පය එන්නේ. ඒකට ප්‍රශ්නයක් නැහැ. සාගර විශ්වවිද්‍යාලයක් කියලා වෙනම එකක් ඇති වෙනවා නම් ඒක හොඳයි. එතකොට එය අපේ රටේ ධීවර කර්මාන්තයට ප්‍රයෝජනවත් වනවා. කවුරුත් පිළිගන්නා අපේ රට වාගේ විසිතුන්ගුණයක් විශාල ගැඹුරු මුහුදේ තිබෙන මහා ස්වාභාවික සම්පත් ප්‍රමාණය -අපට අයිති ඒ සම්පත් ප්‍රමාණය- අද අපි පාවිච්චි කරන්නේ නැහැ. ඒ සම්පත් පිළිබඳව පර්යේෂණ කරලා ඒ පර්යේෂණ හරහා එහි ප්‍රතිලාභ අපට ලබාගන්න පුළුවන් තාක්ෂණයක්, විද්‍යාවක් දියුණු කළ යුතුයි. ඒ සඳහා විශ්වවිද්‍යාලයක් අවශ්‍යයි. හැබැයි, ඒ විශ්වවිද්‍යාලය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් විශ්වවිද්‍යාලයක් බවට පත් වන්න ඕනෑ. අන්න ඒ අවශ්‍යතාව සම්පූර්ණ කර නැහැ කියන කාරණය ඉතාම අවධානයෙන් යුක්තව ඔබතුමාට මතු කර දෙන්න කැමැතියි ගරු ඇමතිතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පතේ 5. (1) (ඒ) උප වගන්තිය යටතේ තිබෙන්නේ මොකක්ද? එහි මෙසේ සඳහන් වෙනවා:

> "විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් සඳහා ගාස්තු හෝ වෙනත් අයකිරීම් අයකර ගැනීම;"

ඒ මොකක්ද ඒ! දැන් ඔබතුමන්ලා කිව්වේ මෙය රජය මඟින් පවත්වාගෙන යන විශ්වවිද්‍යාලයක්; මෙය ශිෂ්‍යයන්ගේ නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරන්න, ශිෂ්‍යයන්ගේ අනාගත අධ්‍යාපනය, නොමිලේ ලබා දෙන නිදහස් අධ්‍යාපනය තවත් ශක්තිමත් කරන්න ගන්නා පියවරක් කියලායි. එහෙම නම් මේ වගන්තිය එන්නේ කොහොමද? එහි සඳහන් වනවා, "විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා" කියා. ඒ කියන්නේ විශ්වවිද්‍යාලය පවත්වන දේශන හා ලබා දෙන ප්‍රායෝගික පුහුණුවයි. "විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් සඳහා ගාස්තු හෝ වෙනත් අයකිරීම් අයකර ගැනීම;" කියලායි සඳහන් වන්නේ. ඒ කියන්නේ ගාස්තු අය කරනවා කියන එකයි. එහෙම නම් මේක රජයේ විශ්වවිද්‍යාලයක්ද? එහෙම නැත්නම් මේක පෞද්ගලික විශ්වවිද්‍යාලයක්ද? ගාස්තු අය කරලා නම් ශිෂ්‍යයන්ට ශිෂ්‍යාවන්ට උගන්වන්නේ, කොහොමද මේක විශ්වවිද්‍යාලයක් වන්නේ? අද ඔබතුමන්ලා කොළය වහලා විශ්වවිද්‍යාල පනතින් මෙය ඉවත් කරනවා. ගාස්තු අය කරලා මෙය පටන්ගන්නවා කියලා කියන්නේ අර සුරංගනා කථාවලින් එන ඇත්ත විශ්වවිද්‍යාලය නොවෙයි. එහෙම නම් මේක පුද්ගලික ආයතනයක්. මෙහි සල්ලි අය කරනවා. කලින් මතු කළා university colleges ගැන. මේකත් university college එකක්ද? University college එකක් කියන අර්ථයෙන් බටහිර රටවල, -ඇමෙරිකා එක්සත් ජනපදයේ හෝ ඕස්ට්‍රේලියාවේ හෝ- තිබෙන ආකාරයට මුදල් අය කරලා ඉගැන්වීම් කරන university college කියන ආයතනයක්ද මෙය? ඒක පැහැදිලිව කියන්න. එහෙම නොවෙයි නම් ගාස්තු අය කිරීම කියන එක කරන්න බැහැ. එහෙම අය කරනවා නම් මේක නිදහස් අධ්‍යාපනය නොවෙයි. එහෙම නම්, දුප්පත් ධීවර පවුල්වල දූ දරුවන්ට තමන්ගේ පරම්පරාවෙන් උරුම වූ රැකියාව තාක්ෂණය, විද්‍යාව අනුව දියුණු කරලා නවීන ලෝකයට ගැළපෙන ආකාරයට ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා ලබා දෙන අවස්ථාවක් නොවෙයි මෙය. මේක සල්ලි අය කරලා උගන්වන ආයතනයක්. සල්ලි අය කරලා උගන්වන ආයතනයක් වුණොත් දුප්පත් ධීවර පවුල්වල අම්මා තාත්තාගේ දරුවන්ට මෙහි නිදහසේ අධ්‍යාපනය කර ගන්න පුළුවන් තත්ත්වයක් ලැබෙන්නේ නැහැ. එහෙම වුණොත් අර ශිෂ්‍යයන්ගේ අනාගත සිහින, බලාපොරොත්තු සියල්ල බිඳ වැටෙනවා. ඒ නිසා මේ වගන්තිය මාරාන්තිකයි. මේ පනත් කෙටුම්පතේ මේ වගන්තිය තුළින් ඔබතුමන්ලා බලාපොරොත්තු වනවා නම් නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරලා එහි කොටස්කරුවකු බවට මේ සාගර විශ්වවිද්‍යාලය පත් කරන්න, ඒක සිද්ධ වන්නේ නැහැ. එතැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුන්වැනි කාරණාව විධියට මා ඔබතුමාට මතු කරන්න කැමැතියි, මේ පනත් කෙටුම්පතේ II වන කොටසට අයත් වන 5. (1)(අ) උප වගන්තිය යටතේ සඳහන් කාරණය. එහි ඉතා පැහැදිලිව සඳහන් වනවා, මේ විශ්වවිද්‍යාලයේ සම්පත් පිළිබඳව අයිතිය තිබෙන්නේ කාටද කියන එක ගැන. දැන් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වන්නේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ නේ. හැබැයි, මෙහි මෙසේ සඳහන් වනවා:

[ගරු විජිත හේරත් මහතා]

"එසේ වුව ද, විශ්වවිද්‍යාලයේ යම් නිශ්චල දේපළක් ධීවර විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව බැහැර කරනු නොලැබිය යුතු ය;"

එතකොට මේ ආයතනයේ ගොඩනැඟිලි, මේ ආයතනයේ උපකරණ, නිශ්චල දේපොළ අයිති වන්නේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට ද, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට ද, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ද? උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ගැන නම් මේකේ වචනයක්වත් නැහැ. නමුත් මේකේ සඳහන් වනවා, මේ විශ්වවිද්‍යාලය යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයෙනුයි පටන් ගන්නේ කියලා. හැබැයි, මෙහි තිබෙන බඩු භාණ්ඩ, උපකරණ අයිති වෙන්නේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිතුමාටයි. ඇත්තටම ගත්තොත් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මේ විශ්වවිද්‍යාලය ස්වාධීන විශ්වවිද්‍යාලයක් විධියට පවත්වා ගන්න බැහැ. මේකේ තිබෙන මොකක් හෝ ගොඩනැඟිල්ලක් එහෙම නැත්නම් උපකරණ එහාට මෙහාට කිරීමක් කරනවා නම් අපේ රාජිත සේනාරත්න ඇමතිතුමාගේ ලියුමක් ඕනෑ; රාජිත සේනාරත්න ඇමතිතුමාගේ අවසරය ඕනෑ ඇයි ඒ? "විශ්වවිද්‍යාලයේ යම් නිශ්චල දේපළක් ධීවර විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව බැහැර කරනු නොලැබිය යුතුය." කියලා මේකේ සඳහන් වනවා. එතකොට මෙතුමා - ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා - භාරයේ තමයි, ඒ සම්පත් තිබෙන්නේ. හැබැයි, විශ්වවිද්‍යාලය තිබෙන්නේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ. මේක විහිළුවක්; මේක විකෘතියක්. මේ පනත් කෙටුම්පත හරියාකාරව සකස් කළා නම් එක්කෝ මේක එන්න ඕනෑ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතටයි.

අපි ඉතා පැහැදිලිව දකින විධියට උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ ධීවර ක්ෂේත්‍රයේ, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ, කර්මාන්ත ක්ෂේත්‍රයේ උපාධි ලබා දෙන විශ්වවිද්‍යාල වෙන වෙනම පිහිටුවන්න පුළුවන්. හැබැයි, සියලු විශ්වවිද්‍යාල උපාධි ලබා දීම මධ්‍යගත වෙන්න ඕනෑ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට; විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට. නැත්නම් මේක හරි විහිළුවක් වෙනවා. එක එක ඇමතිවරයා තම තමන්ට ඕනෑ විධියට උපාධි දෙන විශ්වවිද්‍යාල පිහිටු වූවොත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් වැඩක් නැහැ නේ. විසුරුවා හරින්න එපායැ? එස්.බී. දිසානායක ඇමතිතුමා ඉන්නේ මොකටද?

දැන් බලන්න, අපේ රටේ තිබෙන විශ්වවිද්‍යාල දිහා. නීති ක්ෂේත්‍රය පිළිබඳව, වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳව, ධීවර ක්ෂේත්‍රය පිළිබඳව, කෘෂිකර්ම ක්ෂේත්‍රය පිළිබඳව උපාධි ලබා දෙනවා. Faculty of Agriculture තිබෙනවා; Faculty of Medicine තිබෙනවා; Faculty of Law තිබෙනවා. දැන් එතකොට අධිකරණ ඇමතිවරයා කිව්වොත් අධිකරණ නීති උපාධිය මම දෙන්නම්, මම වෙනම විශ්වවිද්‍යාලයක් ඇති කරනවා කියලා, ඒ වාගේම කෘෂිකර්ම ඇමතිවරයා කිව්වොත් කෘෂිකර්ම උපාධිය මම දෙනවා, කෘෂිකර්ම විශ්වවිද්‍යාලය තිබෙන්නේ මගේ අමාත්‍යාංශය යටතේ කියලා, ඒ වාගේම සෞඛ්‍ය ඇමතිතුමා කිව්වොත් වෛද්‍ය උපාධිය අපි දෙනවා, ඒක වෛද්‍ය විශ්වවිද්‍යාලය විධියට අපි නම් කරනවා කියලා, එතකොට විශ්වවිද්‍යාල ආපසු බෙදෙනවා, එක එක ඇමතිවරුන්ගේ අමාත්‍යාංශ විෂය යටතේ. එතකොට ඇමතිවරු 106ක් හිටියොත් විශ්වවිද්‍යාල 106ක් විතර බිහි වෙනවා. ඒක හොඳයි. ප්‍රශ්නයක් නැහැ. හැබැයි එහෙම වුණොත් එස්.බී. දිසානායක ඇමතිතුමාගේ අමාත්‍යාංශය විසුරුවා හරින්න වෙනවා. එතකොට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කියන එකෙනුත් වැඩක් නැහැ. උසස් අධ්‍යාපන ඇමතිවරයා කියා කෙනෙකුගෙනුත් වැඩක් නැහැ. එක් එක් ඇමතිවරයාට අනුව විශ්වවිද්‍යාල පිහිටුවන්න ගියොත් ඒක විහිළුවක් වෙනවා. මෙතැනදීම ඒ ගැටලුව මතු වෙලා තිබෙනවා. මෙතැනදී මේ උපකරණ ටික, දේපළ ටික අයිති ධීවර ඇමතිතුමාටයි. උපාධිය ලබා දීමේ කටයුත්ත අයිති වෙන්නේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන ඇමතිතුමාටයි. එතකොට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම, උසස් අධ්‍යාපන ඇමතිවරයා මොකක්ද කරන්නේ? එතුමාට තිබෙන රාජකාරිය මොකක්ද? එතුමාට රාජකාරියක් නැද්ද? එතකොට මොකක්ද මේ උසස් අධ්‍යාපනය කියන්නේ? අන්න එතැන පරස්පරයක් තිබෙනවා. ඒ නිසා මේ මූලික කරුණු තුන මේ පනත් කෙටුම්පතේ තිබෙන ඌනතාවන් විධියට මා හඳුන්වා දෙන්න කැමැතියි. එසේ හඳුන්වා දෙන්නේ ද්වේශ සහගත චේතනාවකින් නොවෙයි. රටට සාගර විශ්වවිද්‍යාලයක් අවශ්‍යයි. සාගර විශ්වවිද්‍යාලයෙන් උපාධි ලබා දිය යුතුයි. ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. අපි ඒකට අත් දෙකම ඔසවා සහාය දෙනවා. හැබැයි, මේ තුළින් මොංගල් දරුවෙක් බිහි කරන්න එපාය කියා අපි කියනවා.

අද මේ ශිෂ්‍යයන් ලොකු බලාපොරොත්තුවක් ඇතිවයි ඇවිල්ලා සිටින්නේ. ගරු ඇමතිතුමා මේ ශිෂ්‍යයන් කැඳවා ගෙන ඇවිල්ලා තිබෙන්නේත් ඒ බලාපොරොත්තුව දෙන්නයි. ඒක හොඳයි. හැබැයි, ඊටපසුව මේ ශිෂ්‍යයන්ට මහ පාරේ පිකට් කරන්න ඉඩ තියන්න එපා. මේ දේපළ අයිති අපට නොවෙයි, ඒවා අයිති ධීවර ඇමතිතුමාටයි, අපි මොකටද මේ විශ්වවිද්‍යාලයෙන් උපාධිය ගන්නේ, අපට මේකෙන් උපාධිය ගන්න පහසුකම් නැහැ, ඒක ධීවර ඇමතිගෙන් ගන්න ඕනෑය කියලා මේ අද ගැලරියට වෙලා ඉන්නවා වාගේ හෙට මහ පාරේ පිකට් කර කර ඉන්නයි මේ ශිෂ්‍යයන්ට වෙන්නේ. ඒ නිසා ඒ තත්ත්වය ඇති කරන්න එපාය කියා අපි කියනවා. HNDE සම්බන්ධයෙන් අදත් මේ ප්‍රශ්නය තිබෙනවා. එහෙම පිහිටුවපු ආයතන ගණනාවක අදත් ඒ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා ඒ තත්ත්වය ඇති කරන්න එපාය කියා මා අවධාරණයෙන් මතක් කරන්න කැමැතියි. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත වෙලාවේදී උත්තර දුන්නා නම් ලෙහෙසියි.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ඒක මේ amendment එකට එනවා. එතැන තිබෙන්නේ මුද්‍රණ දෝෂයක් විතරයි. ඒ ගැන සමාවෙන්න. ඔබතුමාගේ කාලය ගන්නේ නැහැ. අනික් ඒවාටත් අපි උත්තර දෙනවා. ඒක මුද්‍රණ දෝෂයක් විතරයි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ඔබතුමා මතු කරන්නේ කීවෙනි එකද?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

මේක නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් එවපු පිටපත. මුද්‍රණ දෝෂයක් නිසායි ඒක එහෙම සඳහන් වෙලා තිබෙන්නේ. ඒක වැරදීමක්. වෘත්තිය පුහුණු විෂය භාර අමාත්‍යවරයා කියාත් තිබෙනවා නේ. ඇත්ත වශයෙන්ම ඒක මුද්‍රණ දෝෂයක්. මේකට amendments 8ක් විතර තිබෙනවා. මම ඒක ඉතා වගකීමෙන් කියනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

එතකොට ඔබතුමා කියන විධියට ධීවර ඇමතිතුමාගෙන් අවසරයක් අවශ්‍ය වෙන්නේ නැහැ?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
නැහැ.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
සංශෝධන තිබෙනවාය කියා ඔබතුමා කියනවා නම් මා ඒක වගකීමෙන් බාර ගන්නවා. ඒ, ඔබතුමා ඒක වගකීමෙන් කියන නිසායි. කොහොම වුණත් මා මතු කරපු කාරණාව තමයි, මේ කියපු ඌනතාවන් මේ පනත් කෙටුම්පතේ තිබෙන නිසා පරිපූර්ණ උපාධියක් ලබා දෙන්න නම් එම කරුණු සම්පූර්ණ විය යුතුයි කියන එක. ඒ කරුණු තමයි මා අවධාරණය කළේ.

ඒ විතරක් නොවෙයි. ගොඩනැඟිලි කිහිපයක් තිබුණු පමණින් මෙය සම්පූර්ණ වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, කුලියාපිටියේ අලුත් ගොඩනැඟිල්ලක් සඳහා කටයුතු ආරම්භ කරනවාය කියා ඔබතුමා කිව්වා. ඒක බොහොම හොඳයි. හැබැයි දැනට තිබෙන ප්‍රශ්න ටිකත් ඔබතුමා බේරුම් කර දිය යුතුයි. ඔබතුමා ඒ ගැන දන්නවාත් ඇති. දැනට තිබෙන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ පුහුණු අංශය ඇත්තෙන්ම අකර්මණ්‍යයි. ඒකෙන් හරියාකාර පුහුණු කිරීමක් සිද්ධ වෙන්නේ නැහැ. ඒ සඳහා අවශ්‍ය උපකරණ නැහැ. නැති උපකරණවල ලැයිස්තු, කියන්නත් අවශ්‍ය නැහැ. බොහෝ තැන්වල උපදේශකයින් පවා නැහැ. ඔබතුමා පිළිගන්නවා ඇති, මීට අදාළ විද්‍යාල 8ක් තිබෙනවාය කියන එක. ඒ අතෙන් විද්‍යාල තුනකම එක උපදේශකයෙක්වත් නැහැ. ගොඩනැඟිලි තිබෙනවා; ළමයින් ඉන්නවා; උපදේශකයන් නැහැ; උගන්වන්නේ නැහැ. නමුත් ඔබතුමන්ලා මේවා විශ්වවිද්‍යාල ලෙසට නම් කරනවා; පුහුණුව ලබා දෙන ආයතනයි කියා කියනවා. ත්‍රිකුණාමලය, කළුතර, මීගමුව ගත්තොත් ත්‍රිකුණාමලයේ එක උපදේශකයෙක්වත් නැහැ; කළුතර එක උපදේශකයෙක්වත් නැහැ; මීගමුවේ එක උපදේශකයෙක්වත් නැහැ. නමුත් building එක තිබෙනවා. උපදේශකයෙක් නැහැ. එහෙම වුණාම ඒක කොහොමද, විශ්වවිද්‍යාල ආයතනයක් වෙන්නේ? එහෙම වෙන්නේ නැහැ. ඒකයි, මම කිව්වේ. රජරට විශ්වවිද්‍යාලයේ building එක හැදුවා; ළමයින් ගත්තා. හැබැයි, මහාචාර්යවරයෙක් නැහැ. උපාධියත් නැහැ. ඒක තමයි අද තත්ත්වය. එක උපදේශකයෙක් ඉන්නවා.

ගරු ඇමතිතුමා පැහැදිලි කළා, උතුරු පළාතට විශේෂ මැදිහත් වීමක් කර තිබෙනවාය කියා. ආයතන අතෙන් දෙකක් මඩකලපුව සහ යාපනයේ පිහිටුවා තිබෙනවාය කිව්වා. ඒක බොහොම හොඳයි. හැබැයි ඒ ආයතන දෙකේ ඉන්නේ එක උපදේශකයා බැගිනුයි. මඩකලපුවේ ඉන්නේ එක උපදේශකයායි; යාපනයේ ඉන්නේ එක උපදේශකයායි. එතකොට එතැනට තිබෙනවා, අඩු සැලකිල්ලක්.

තව ආයතන තුනක් තිබෙනවා, එක් උපදේශකයෙක්වත් නැහැ. මඩකළපුවේ සහ යාපනයේ ආයතන දෙකක් තිබෙනවා. ඒ දෙකේත් ඉන්නේ එක්කෙනා බැගින් පමණයි. බිල්ඩින් තිබෙනවා. කුලියාපිටියේ බිල්ඩින් එක හදන එක හොඳයි. ඒ ගැන විරුද්ධත්වයක් නැහැ. හැබැයි බිල්ඩින් හැදුවාට මදි. ඒ අවශ්‍ය කරන උපදේශකයන්, පුහුණුවීම් සඳහා අවශ්‍ය උපකරණ සැපයිය යුතුයි. අද වෙන්නේ මොකක්ද? බාහිර උපදේශකයන් සඳහා රුපියල් මිලියන ගණන් වියදම් කරනවා. උගත්, උගන්වන්න පුළුවන්කම තිබෙන ගුරුවරු අපේ රටේ නැද්ද? ඉන්නවා. එහෙම ඉන්දැද්දී ඇයි, මේ බඳවා ගන්නේ නැත්තේ? ඇයි, ඒ අයට ඒ අවස්ථාව ලබා දෙන්නේ නැත්තේ?

ඊළඟට නේවාසිකාගාර. නේවාසිකාගාරයක් තිබෙනවා, පාලකයෙක් නැහැ. නේවාසිකාගාර පාලනය කරන්න පාලකයෙක් නැහැ. ඒ පත්වීම් දීලා නැහැ. ශිෂ්‍යයන් භාර ලේඛකාධිකාරි තැන වැඩ බලනවා. ඔහුට වෙනම වැටුපක් ගෙවනවා. ඉතින් මේ තත්ත්වය තමයි අද තිබෙන්නේ.

2000 දී මීගමුවේ දෙමහල් ගොඩනැඟිල්ලක් හදන්න පටන් ගත්තා. මුල් ගල තිබ්බා. ඒ මුල් ගල එහෙමම තිබෙනවා. අද වන තෙක් ඒ දෙමහල් ගොඩනැඟිල්ල හදලා නැහැ. ඒ ගොඩනැඟිල්ල හැදීමේ කටයුතු අවසන් කරලා නැහැ. වර්ෂ 2000 දී පටන් ගත්තේ. අපට නම් ආරංචි විධියට ඒ සල්ලිවලින් ඒ ප්‍රධාන පාලක මහත්මයාගේ ගේ වටේ තාප්පයක් නම් ගහලා තිබෙනවාලු. මේක තමයි තත්ත්වය.

සාගර විශ්වවිද්‍යාල සංකල්පය හොඳයි. හැබැයි ඒ විශ්වවිද්‍යාලය වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම පරිපූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත් වන්න නම් විශ්වවිද්‍යාල පනතට යටත් කරලා, මේ රටේ පිළිගත්ත විශ්වවිද්‍යාල ක්‍රමවේදයට අනුකූලව මේ විශ්වවිද්‍යාලයත් පවත්වා ගෙන යා යුතුයි. මුදල් අය කිරීම්, පාඨමාලා ගාස්තු අය කිරීම් වහාම නතර කරලා ඔවුන්ට නිදහස් අධ්‍යාපනය ලබා දිය යුතුයි. ඒ වාගේම මෙහි සම්පූර්ණ අධීක්ෂණය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වෙන තත්ත්වයක් ඇති කළොත් තමයි මෙහි බලාපොරොත්තු වන අරමුණ සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ගන්න පුළුවන් වෙන්නේ. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[අ.භා. 3.45]

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා (සමාජ සුබසාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து - சமூக நலன்புரி அமைச்சர்)
(The Hon. Milroy Fernando - Minister of Social Welfare)
ස්තුතියි.

අද ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා, ඒ ගැන විවාද කරලා, අනුමත කර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව මා මේ අවස්ථාවේදී අපේ ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

සාගර විශ්වවිද්‍යාලයක් අවශ්‍යයි කියන යෝජනාව ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එදා ධීවර අමාත්‍යවරයා හැටියට කටයුතු කරද්දී ගෙනා යෝජනාවක්. සමාජය පිළිගන්නා විධියට රටේ අනෙකුත් ජන සමාජයත් එක්ක ධීවරයා ඉන්න ඕනෑයි කියන මතය එදා එතුමා තුළ තිබුණා. රාත්‍රියේ මුහුදු ගිහින්, පැය ගණනක් මුහුදේ ඉඳලා මාළු අරන් තම නිවසට එද්දී, ධීවර ජනතාවට ඉන්න හිටින්න ඉතා හොඳ නිවසක් අවශ්‍යයි කියන මතය මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එදා ධීවර ඇමතිවරයා හැටියට ඉන්දැද්දී තිබුණා. ඒ නිසා තමයි එදා ධීවර අමාත්‍යාංශය යටතේ විසිරි නිවාස ක්‍රමය ධීවර ජනතාව වෙනුවෙන් එතුමා නිර්මාණය කරලා රුපියල් 25,000ක ආධාරයක් ලබා දුන්නේ. ඒ ධීවරයාට සිමෙන්ති දාපු පොළවක, උළු සෙවිලි කළ වහලයක් යට ජීවත් වන්න, අනෙකුත් ජන සමාජයත් එක්ක එකට සමාජයේ ඉන්න අවස්ථාව දෙන්න ඕනෑ කියන හැඟීමෙන් තමයි එදා ඒ ධීවර ජනතාව වෙනුවෙන් ඒ කටයුත්ත කළේ.

මිරිදිය කර්මාන්තය කරන ධීවර ජනතාව වෙනුවෙනුත් ධීවර ගම්මාන හරි ගස්සලා, එදා රුපියල් 50,000ක මුදලක් ලබා දෙන්නත්, ඒ ධීවර නිවාස හදන්න යටිතල පහසුකම්, විදුලිය, ජලය

[ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා]

හැම එකක්ම ලබා දෙන්නත් එතුමා කටයුතු කළේ ධීවර ජනතාවට සමාජයේ අනෙකුත් අයත් සමඟ එක හා සමානව ජීවත් වෙන්න අවස්ථාව ලබා දෙන්නයි. එදා එතුමා යටතේ තිබුණ නාවික පුහුණු කිරීම් මධ්‍යස්ථාන නව විධියට, විශ්වවිද්‍යාලයක් යටතට පත් කරලා ධීවර දරුවාට ධීවර කර්මාන්තය සම්බන්ධව දැනුමක් ලබා දෙන්න මේ සාගර විශ්වවිද්‍යාල ක්‍රමය නිර්මාණය කෙරුවේ, ඒ එදා ධීවර ජනතාවට තිබුණු ඇල්ම සහ ආදරය නිසායි.

අද එතුමා ජනාධිපතිතුමා වශයෙන් සිටියදී එතුමාගේ රජයේ ඇමතිවරයෙක් හැටියට ඩලස් අලහප්පෙරුම මැතිතුමා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙනවා. සාගර විශ්වවිද්‍යාලයක් රටට අවශ්‍යයි. අප දූපතක ජීවත් වන ජනතාවක්. අපට විශාල සාගරයක් තිබෙනවා. සාගරයේ නොයෙකුත් දේවල් තිබෙනවා. අපේ රට දියුණු කරන්න අවශ්‍ය කරන සම්පත් එහි තිබෙනවා. පුරාණ කාලයේ ශ්‍රී ලංකාව මුතු සම්බන්ධව බොහොම ප්‍රසිද්ධියක් දැක්වූවා. මන්නාරම් බොක්ක ප්‍රදේශයට අදත් "මුතු හලාවත" කියා කියනවා. මේ අවස්ථාවේදී ඇමතිතුමාට යෝජනා කරනවා, නැවත මුතු කිමිදීම පටන් ගන්නය කියා. මෙමඟින් අපේ රටට විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්. මැණික් හොයනවා වාගේ අපේ රටට තවත් සම්පතක් සොයා ගන්න පුළුවන්. මුතු කිමිදීම තුළින් අපට ඒ මුතු ලබා ගන්න පුළුවන් කියා මතයක් ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව තුළ තිබෙනවා. මේ අවස්ථාවේදී ඒ කටයුත්තත් කරන්න කියන විශේෂ ඉල්ලීම කරනවා. ධීවර ජනතාවට විශාල සේවයක් කළ රජයක් හැටියට අපට ඉදිරියට යන්න පුළුවන්. ධීවර ජනතාව වෙනුවෙන් අප විශාල සේවයක් කර තිබෙනවා. එදා ධීවර ඇමතිවරයා හැටියට ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විශාල සේවයක් මේ රටේ ධීවර ජනතාව වෙනුවෙන් කළා. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත ඉදිරිපත් කර අනුමත කර ගන්නට කටයුතු සැලැස්වීම උතුම් අවස්ථාවක් විධියට මම දකිනවා. ඒක ජනාධිපතිතුමාට කරන ගෞරවයක් හැටියට; ධීවර ජනතාවට කරන ගෞරවයක් හැටියට අප සලකනවා. මේක මේ රටට අවශ්‍ය දෙයක්. තමයි ධීවර පවුල්වල දරුවන්ට මේ අයිතිය ලබා දීම එතුමා තුළ තිබුණු අදහසක්. මේ සඳහා කටයුතු සකසන විට පළමුවෙන්ම මතු වුණු ප්‍රශ්නයක් තමයි මේකට ඇතුළත් වීමට ලබන සුදුසුකම් මොනවාද කියන එක. එදා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ අදහස වුණේ ධීවර පවුල්වල දරුවන්ට වැඩි අවස්ථාව ලබා දීම අවශ්‍යයි කියන එකයි. ධීවර අමාත්‍යාංශයට අයිති පුහුණු මධ්‍යස්ථානවලත් එදා ධීවර දරුවෝ තමයි හිටියේ. විශේෂයෙන්ම ධීවර බෝට්ටුවල එන්ජින් සකස් කිරීම, දැල් පාවිච්චි කිරීම, අලුත් පන්න ක්‍රම හදන හැටි එදා ඒ පාසල් මඟින් දරුවන්ට ඉගැන්වූවා. ඒ ආයතන අටම ඉතාම හොඳ දැනුමක් ධීවර දරුවන්ට ලබා දුන්නා. සාගර විශ්වවිද්‍යාලය තුළින් ධීවර ප්‍රජාවගේ දරුවන්ට විශේෂත්වයක් දක්වන්න කියා මා ඉල්ලා සිටිනවා. මොකද, මේ විශ්වවිද්‍යාලය පිහිටුවීමේ අදහස ආවේ ධීවර ජනතාව වෙනුවෙනුයි. අද ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ ඒ අයට විශේෂත්වයක්, තැනක් ලබා දීම සඳහායි කියා මා අදහස් කරනවා.

මාදැල් කර්මාන්තයට අදාළ අලුත් ක්‍රම තිබෙනවා. මාදැල් අදින්න සෙනඟ නැති නිසා අද ට්‍රැක්ටර්වලින් මාදැල් අදිනවා. නමුත් ට්‍රැක්ටර්වලින් අදින එක නතර කර තිබෙනවා. වෙනත් ක්‍රමවලින් මාදැල් අදින්න පුළුවන්. ඊට වඩා winch එකකින් අදින්න පුළුවන්. ඒ වාගේ නව ක්‍රම සකස් කරන්න පුළුවන්. ධීවර බෝට්ටු මුහුදට ගිහින් ආවාම ගොඩට ගන්න සැහෙන මහන්සියක් දරන්න සිද්ධ වෙනවා. ධීවර බෝට්ටුවක් ගොඩට අදින්න අඩු තරමින් 15 දෙනෙක් ඕනෑ. බෝට්ටුවක් ගොඩට ගැනීමේ අලුත් ක්‍රම ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය මඟින් සකස් කරන්න පුළුවන්. සාගර විශ්වවිද්‍යාලයේ ගුරුවරුන්, පුහුණුව ලබන අය, දරුවන් අලුත් ක්‍රමවලට යොමු කර ධීවර කර්මාන්තය නඟා සිටුවන්න පුළුවන්.

නව තාක්ෂණයට අනුව කටයුතු කරන්න සකස් කර දෙනවා නම් එහි වැදගත්කමක් තිබෙනවා. එදා මා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කළ කාලයේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිවරයා වශයෙන් කටයුතු කළ මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි මේ අදහස හඳුන්වා දුන්නේ. ඒ අනුව ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා විසින් අද දින ඉදිරිපත් කර තිබෙන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත පිළිබඳව මට කථා කරන්නට අවස්ථාව ලැබීම මගේ භාග්‍යයක් හැටියට සලකනවා. ධීවර ජනතාව වෙනුවෙන් විශේෂයෙන්ම අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කර තිබෙන්නා වූ සේවය ධීවර ජනතාව කවදාවත් අමතක කරන්නේ නැහැ යි කියන එකත් ප්‍රකාශ කරමින්, විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත ඉතාමත්ම හොඳ, වැදගත් පනත් කෙටුම්පතක් බව ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා, ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)

The next speaker is the Hon. (Dr.) Rajith Senaratne. You have 12 minutes.

[අ.භා. 3.55]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෙම විවාදයට සහභාගී වන්නට ලැබීම ගැන මා ඉතාමත්ම සතුටු වනවා. අපේ රටේ පළමු වරට සාගර විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම ගැන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මා ඉතාමත්ම සතුටු වනවා. දශක දෙකක් තිස්සේ නොයෙක් අය මේ ඉල්ලීම කරමින් තිබුණත්, අපේ ඩලස් අලහප්පෙරුම ඇමතිවරයා බොහොම මහන්සි වෙලා අවසානයේ දී අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා. ලබන අවුරුද්දේ උපාධි ප්‍රදානෝත්සවයට උපාධි දෙකකුත් පිරිනැමීමට නියමිතව තිබෙනවා.

1996 අංක 36 දරන පනත යටතේ එදා NIFNE ආයතනය ආරම්භ කර තිබෙනවා. ඒ NIFNE ආයතනය තමයි අද ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය බවට පත්වන්නේ. එතකොට මෙහි ධීවර, නාවික, සමුද්‍රීය ක්ෂේත්‍රයන්ට අවශ්‍ය මානව සම්පත් සම්පාදනය කිරීම සඳහා පාඨමාලා ආරම්භ කිරීම එක කරුණක්. ඒ වාගේම ධීවර ක්ෂේත්‍රයේ සිටින අයගේ දැනුම වැඩි දියුණු කිරීමත්, පූර්ව උපාධි පාඨමාලා පැවැත්වීමත් මෙහි සිදුවනවා. ඒ වාගේම NVQ හදාරන අයට තාක්ෂණය සඳහා අද ජාත්‍යන්තරයේ පිළිගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් ලබා දීමත්, ධීවර ක්ෂේත්‍රයේ සමුද්‍ර විද්‍යාව සඳහා විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ පර්යේෂණය ඇති කිරීමත් කරනු ලබනවා. 2015 දී එහි පළමුවැනි උපාධි දෙක පිරිනැමීම තමයි එතුමාගේ බලාපොරොත්තුව වන්නේ. එකක්, BSc in Integrated Coastal and Marine Resources Management. අනෙක් එක, BSc in Naval Architecture.

අපි දන්නවා, අද ලෝක වෙළෙඳාමෙන් සියයට 80ක්ම තිබෙන්නේ ධීවර සමුද්‍රීය සහ නාවික ක්ෂේත්‍රවල බව. එහි තමයි ඉහළම වැටුප් සහිත රැකියා තිබෙන්නේ. එතකොට මේ වාගේ ක්ෂේත්‍රයකට උපාධිධාරීන් බිහි කර යැව්වොත් අපේ තරුණයින්ට ඉතාමත්ම හොඳ අනාගතයක් තිබෙනවා. ඒ වාගේම මේ සඳහා

අවශ්‍ය විශේෂඥ දැනුමත් අපට ලබා ගත හැකි වනවා. 1999 දී තමයි අපි මේ ආයතනය මුලින්ම පිහිටුවා තිබෙන්නේ. මහා විශාල ධීවර කර්මාන්තයක් තිබෙන, එහි පුරෝගාමීන් වන කොරියාව වැනි රටකත් පළමුවෙන් මේ වාගේ ආයතනයක් පිහිටෙව්වේ 1998 දීයි. අපි අවුරුද්දකින් තමයි ප්‍රමාද වුණේ. Korea Institute of Maritime and Fisheries Technology කියන එක 1998 දී පැවැත්වූවා. ඒ වාගේම 1983 දී University of Maritime and Fisheries කියන විශ්වවිද්‍යාලය එංගලන්තයේ හම්බර්සයිඩ්වල හැදුවා. ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, International Maritime Organization කියලා එකක් තිබෙනවා. ඒක යටතේ World Maritime University කියන එක ස්වීඩනයේ ආරම්භ කර තිබෙනවා. මේ වාගේ අපේ ශ්‍රී ලංකාවත් ජාත්‍යන්තර ක්ෂේත්‍රයට එකතු වීමක් තමයි අද මේ සිදු වන්නේ.

නොයෙකුත් දියුණු රටවල්වල පෞද්ගලික ධීවර විශ්වවිද්‍යාල තිබෙනවා. ලංකාවේත් මෙම ක්ෂේත්‍රයේ පුහුණු කිරීම් සඳහා CINEC ආයතනය තිබෙනවා. එහි අවුරුද්දකට 15,000ක් පමණ සිසුන් පුහුණු කරනවා. එයින් 300ක් පමණ උපාධිධාරීන් වෙනවා. ඒ වාගේම Mercantile Shipping Company එකෙන් 25ක්, 30ක් විතර පුහුණු කරනවා. ඒ වාගේම ශ්‍රී ලංකා නාවික හමුදාව CINEC ආයතනය සමඟ එකතු වෙලා 200ක්, 300ක් විතර පුහුණු කරනවා. ඒ වාගේම පානදුරේ Lanka Academy එක -මමයි පානදුර වරායට ඒ පහසුකම් ලබා දීලා තිබෙන්නේ- 200ක්, 300ක් අතර ප්‍රමාණයක් පුහුණු කරනවා. NARA ආයතනය විසින් oceanography සහ hydrographyවලට මෙවැනි තාක්ෂණ උපාධිධාරීන් පුහුණු කරනවා. ඒ වාගේම රුහුණ, කැලණිය, ජයවර්ධනපුර, වයඹ යනාදී විශ්වවිද්‍යාලවල අද ධීවර කර්මාන්තය පිළිබඳව වෙනමම පීය ඇති කරලා උපාධිය ලබා දෙනවා. ඒ වාගේම CINEC ආයතනය මේ අවුරුද්දේ දී සීෂෙල්ස් සහ පීජී රටවල් සමඟ ගිවිසුම් ඇති කර ගත්තා, එහි තාක්ෂණික උපාධිධාරීන් ඒ රටවලට ලබා දීම ගැන. මේක ඉතාමත්ම වැදගත්. මොකද, අපේ රටේ වර්ග කිලෝ මීටර් මිලියන භාගයකට වැඩි ආර්ථික කලාපයක් තිබෙනවා. ඒ වාගේම අපට ඉන්දියන් සාගරයේ වර්ග කිලෝ මීටර් මිලියන 75ක් පමණ ජාත්‍යන්තර මුහුද තිබෙනවා. එතකොට එයින් වාණිජ වටිනාකමින් යුක්ත මත්ස්‍ය සම්පත මෙට්‍රික් ටොන් මිලියන 15ක් අවුරුද්දකට නෙළා ගන්නවා. ඒ වාගේම ප්‍රබලම නාවික මාර්ගය, සමුද්‍රීය කේන්ද්‍රය තිබෙන්නේ මේ රටට යාබදවයි. මේ සියලුම කාරණා නිසා සාගර විශ්වවිද්‍යාලය ඉතාමත්ම වැදගත් වෙනවා. ඒ වාගේම අද ධීවර කර්මාන්තය ගෝලීයකරණය කරලායි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනාගතයේ ගොඩ නැඟෙන්නේ නිල් ආර්ථිකයක් - blue economy එකක් - කියා ලෝක බැංකුව තීරණය කර තිබෙනවා. එම නිසා ඒ blue economy එක - growth economy එක - ඇති කිරීම සඳහා තමයි ලෝක බැංකුව දැන් සියලුම කෙටුම්පත් හදන්නේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයත්, FAO එකත්, ලෝක බැංකුවත් අනුග්‍රහයෙන් නෙදර්ලන්තයේදී එහි පළමුවන සැසිය 2014 අප්‍රේල් 22වන දා පැවැත්වුණා. මමත් ඊට සහභාගි වුණා. මේ සැසි වාරය පවත්වා, ලෝක ආර්ථිකය ගොඩ නැඟීම සඳහා pilot project එකකට මූලික රටවල් කිහිපයක් තෝරා ගෙන තිබෙනවා. ඒ pilot project එකට ශ්‍රී ලංකාවත් සහභාගි කර ගන්නටය කියා ගිය වර එහි අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් මා ඉල්ලීමක් කළා. මේ සඳහා ශ්‍රී ලංකාව තෝරා ගත්තාය කියා එතුමා මට පෙරේදා දැන්වූවා. ඒ කියන්නේ, මේ ලෝක blue economy එක හදන, පළමුවන pilot project එකට මෝදා මාළු - sea bass - ව්‍යාප්ත කිරීමේ වැඩ පිළිවෙළ සඳහා ශ්‍රී ලංකාව තෝරා ගෙන තිබෙනවා.

ආසියාතික ධීවර ඇමතිවරුන්ගේ සම්මේලනය ශ්‍රී ලංකාවේ පවත්වන්නටය කියා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයට යෝජනා ඉදිරිපත් කර, එය අපේ රටේ පැවැත්වූවා. එම සම්මේලනයේ ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වුණේ අපේ අතිගරු ජනාධිපතිතුමායි. ඒ සම්මේලනයේදී එතුමා කළ කථාවේදී ගෝලීය ජල ජීවී අරමුදලක් ආරම්භ කරන්නටය කියා එතුමා ඉල්ලීමක් කළා. මෙම යෝජනාව, 2012 වර්ෂයේදී ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයට මා ඉදිරිපත් කර එය සම්මත කර, 2013 වර්ෂයේදී ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන තීන්දු කළා. 2014 වර්ෂයේදී -මේ අවුරුද්දේදී - රෝමයේ පැවැත්වුණු FAO එකේ සම්මේලනයේදී "මහින්ද රාජපක්ෂ ගෝලීය ජල ජීවී අරමුදල" නමින් අරමුදලක් පිහිටුවන්නට අපට හැකියාව ලැබුණා. එම නිසා ධීවර කර්මාන්තයත් එක්ක අපේ රට ජාත්‍යන්තරයේ ඉදිරියට ගමන් කරන රටක් බවට පත් වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය මඟින් ලෝකයේ ධීවර කර්මාන්තය ගොඩ නැඟීම සඳහා රටවල් හයකින් යුත් bureau එකක් පත් කළා. ඇමෙරිකා එක්සත් ජනපදය, නෝර්වේ රට, බ්‍රසීලය, නවසීලන්තය හා මොරොක්කෝව සමඟ ශ්‍රී ලංකාව ද FAO එකේ පළමුවෙනි bureau එකට සහභාගි වුණා. මේ ක්ෂේත්‍රයේදී අපේ රටට කොයි තරම් පිළිගැනීමක් තිබෙනවා ද කියන එක එයින් පෙනී යනවා. ඒ වාගේම 2013 වර්ෂයේදී FAO එකේ මුල් කෙටුම්පත් මණ්ඩලයේ සභාපති ධුරය පැවරුවේත් ශ්‍රී ලංකාවටයි. ඒ වාගේම 2014 වර්ෂයේදී ඉන්දියාවේ පැවැත්වුණු ආසියා - පැසිපික් ධීවර කොමිසමේ සම්මේලනයේදී එහි සභාපති ධුරය ශ්‍රී ලංකාවට පිරිනැමුවා. ඒ වාගේම Global Expert Consultation on "Culture Based Fisheries" කියන programme එක - මේ culture-based fisheries තමයි අද ලෝකයේ අංක 1 බවට පත් වෙලා තිබෙන්නේ - සඳහා රටවල් කිහිපයක් තෝරා ගත්තා. එයින් එක රටක් වශයෙන් ශ්‍රී ලංකාව තෝරා ගත්තා. 2015 වර්ෂයේ මාර්තු මාසයේදී එය ශ්‍රී ලංකාවේ පැවැත්වෙනවා. මේ සඳහා රටවල් 30 කින් නියෝජිතයින් සියයක් පමණ සහභාගි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම white spot disease කියන රෝගය ගැන කියන්න ඕනෑ. ඒකට "Acute Hepatopancreatic Necrosis Disease" කියලායි අප කියන්නේ. ඒ රෝගය පාලනය කිරීම සඳහා ව්‍යාපෘතියක් - project එකක්- තිබෙනවා. ඒ සඳහා රටවල් එකොළහක් තීන්දු කළා. ඒ රටවල් එකොළහෙන් එක රටක් හැටියට ශ්‍රී ලංකාව තෝරා ගෙන තිබෙනවා. ඒක අපට ඉතාමත්ම වටිනවා. ඒ වාගේම ඉන්දියානු සාගර කොමිසමත් එක්ක අද අපේ රට ඉතාමත් කිට්ටුවෙන් වැඩ කරනවා. පළමුවන වරට එම සැසිවාරය 2011 දී ලංකාවේ පැවැත්වීමට අවස්ථාව ලබා ගන්නට මට පුළුවන් වුණා. 2014 දී දෙවන සැසිවාරයට ශ්‍රී ලංකාව සහභාගි කරවා ගත්තා. ඒ වාගේම Sri Lankan International Ornamental Fish Trade Conference කියන ජාත්‍යන්තර සමුළුවට මේ අවුරුද්දේ නොවැම්බර් 10 සහ 11 යන දිනවල රටවල් 20ක නියෝජිතයින් 250ක් සහභාගි වෙනවා. මේ විධියට මේ රටේ ධීවර කර්මාන්තය ජාත්‍යන්තරකරණය වෙලා ජාත්‍යන්තරයේ පිළිගැනීමට ලක් වෙලා තිබෙන අවස්ථාවක මේ සාගර විශ්වවිද්‍යාලය අපට ලබා ගැනීමට හැකිවීම ඉතාමත් වැදගත් වෙනවා. එහි ඇති නොයෙකුත් පාඨමාලාවලින් ජාත්‍යන්තරයට අවශ්‍ය ධීවර ක්ෂේත්‍රයේ අය පුහුණු කිරීමට අපට භාග්‍යය ලැබීම ඉතාමත්ම වැදගත්. මේ සාගර විශ්වවිද්‍යාලය මේ අවස්ථාවට ඉතාමත් උචිත, ඉතාමත් අවශ්‍ය දෙයක් විධියට මා දකිනවා.

අද ජාත්‍යන්තරයේ ධීවර කර්මාන්තය ගැන කොයි තරම් කථා කළත් ලංකාව අමතක කරලා කථා කරන්නට බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. හැම කලාපීය සමුළුවකදීම අපේ ලංකාව ගැන කථා කරනවා. ගෝලීය ජලජීවී වගා අරමුදල අපේ ජනාධිපතිතුමාගේ නමින් ආරම්භ කරන අවස්ථාවක, ලෝකයේ ධීවර කර්මාන්තය ගොඩ නැඟීම සඳහා ඇති කරන bureau එකට අයත් රටවල් හයකින් එකක් බවට අපේ රට පත්වෙන අවස්ථාවක අපි සිටිනවා.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ඒ වාගේම "Blue Economy" වැඩ පිළිවෙළේ pilot project එකක් කරන රටක් විධියටත් අපේ රට තිබෙනවා. ජාත්‍යන්තර ක්ෂේත්‍රයේදී අපේ රට වෙනුවෙන් ඉදිරිපත් වීමට අවශ්‍ය නිපුණතාව, අවබෝධය සහ විශේෂඥ දැනුම තිබෙන පුද්ගලයන් නිර්මාණය කිරීමටත් මෙම විශ්වවිද්‍යාලය අපට යොදා ගත හැකියි. එම නිසා මේ සාගර විශ්වවිද්‍යාලය මේ රටේ බිහි වෙන්නේ අපට අත්‍යවශ්‍යම අවස්ථාවක කියලා මම පැහැදිලිවම කියනවා. ඉදිරියේ දී අපේ ධීවර කර්මාන්තය ජාත්‍යන්තර තලයට ගෙනයන්න මේ සාගර විශ්වවිද්‍යාලය උපකාර වෙයි කියලා මම හිතනවා. අපේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මැතිතුමාත් එක්ක අද ඉඳලා අපි ඒ පිළිබඳව සාකච්ඡා කරනවා. අපේ අමාත්‍යාංශ දෙක එකතු වෙලා ජාත්‍යන්තර ක්ෂේත්‍රයට අවශ්‍ය දැනුම සහ අවබෝධය ලබා ගන්නා වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනිහිල්ලා, ධීවර කර්මාන්තය ලංකාවේ අතිවිශිෂ්ට කර්මාන්තයක් බවට පත් කරන්න අවශ්‍ය කටයුතු කරනවා.

අපි මතක් කරන්න ඕනෑ, අලුත් ටූනා - fresh tuna - මාළු අපනයනය කිරීමේදී අද ලංකාව ලෝකයේම අංක එකට පත් වෙලා තිබෙන බව. ඒ නිසා ලෝක වෙළෙඳ ව්‍යාපාරයේ අපි දැවැන්ත යෝධයෙකු බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ධීවර කර්මාන්තය සඳහා මෙවැනි සාගර විශ්වවිද්‍යාලයක් පිහිටුවීම කාටත් වඩා අපට අත්‍යවශ්‍යයි.

මම ස්තුතිවන්ත වනවා, මගේ මිත්‍ර ඩලස් අලහප්පෙරුම මැතිතුමාට. ඉතා හොඳ දේශපාලන ගමනක් යන, හොඳ දේශපාලන අවබෝධයක් තිබෙන, වැදගත් දේශපාලනඥයෙකු වශයෙන් අද මේ ගෙනයන වැඩ පිළිවෙළට ඔබතුමාට මම ස්තුති කරනවා. ඒ විතරක් නොවෙයි, ලබන අවුරුද්ද වනකොට අපේ ධීවර කර්මාන්තය ජාත්‍යන්තර අවශ්‍යතාවන් සඳහා උචිත වන ආකාරයට සකස් කරන්න අවශ්‍ය ශක්තිය, ධෛර්යය ඔබතුමාට ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. අපි ඔබතුමාට ඒ ක්ෂේත්‍ර මොනවාද කියලා කරුණු ඉදිරිපත් කරන්නම්. ඒවාට අපට උදවු කරන්න. එතකොට ඔබතුමාගේ නම මේ ජාත්‍යන්තර වැඩ පිළිවෙළේ ඉතාම ඉහළින් සඳහන් වනවාය කියන කාරණය මතක් කරන අතර, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 35ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.06]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පිහිටුවීම, පවත්වාගෙන යෑම, පරිපාලනය වාගේම පාඨමාලා සඳහා පහසුකම් සැලැසීම සඳහා අවශ්‍ය නෛතික යටිතල පහසුකම් සැපයීමේ පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමේ අවස්ථාවේ දී මගේත් අදහස් කීපයක් එකතු කරන්නට අවස්ථාව ලැබීම ගැන අතිශයින්ම සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද ධීවර ක්ෂේත්‍රය ගැන කථා වුණා. අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා වුණා. අද අපේ රටේ ධීවරයන්ට ලබා දෙන ඉන්ධන සහනාධාරය කපා හැරලා. අද ධීවරයන්ට ලබා දෙන දියවර ගම්මාන වැඩසටහන, ධීවර නිවාස වැඩසටහන අහෝසි කරලා. දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට අධ්‍යාපනය වෙනුවෙන් වැය කරන මුදල කප්පාදු කරලා. පාසල් හයසීයකට වැඩි ප්‍රමාණයක් වැහිලා. දිවා ආහාරය කප්පාදු කරලා. මහ පොළ ශිෂ්‍යාධාරය වැඩි කරන්නට රජය මැලිකමක් දක්වනවා. ඒ වාගේම විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්ෂේත්‍රය සහමුලින්ම කඩා වැටිලා. අධ්‍යාපන ක්ෂේත්‍රය සහමුලින්ම ක්ෂය වී යන යුගයක, ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ නිර්මාණයක් තුළින් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත හරහා ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන වැදගත් වැඩසටහනට විපක්ෂයේ අපි කොන්දේසි විරහිතව සහයෝගය ලබා දෙනවාය කියන කාරණය බොහොම සංතෝෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. හැබැයි, ඔබතුමාගේ මේ ධනාත්මක ක්‍රියාවලිය ක්‍රියාත්මක වන්නේ ඉතාම අසුබවාදී වාතාවරණයක් තුළ.

මොකද, මැතිවරණයක් මැතිවරණයක් පාසා ධීවර ජනතාවට ලබා දුන් ඒ සියලුම බලාපොරොත්තු සුනු විසුනු වුණු යුගයක්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ මුදල් කප්පාදුවක් ක්‍රියාත්මක වන යුගයක් තමයි අද තිබෙන්නේ. ඒ නිසා ප්‍රගතිශීලී ඇමතිවරයෙකු වන ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මේ මොහොත යුද්ධයක් අවසන් වෙලා සාමයේ ප්‍රතිලාභ රටේ ජනතාවට ලබා දිය යුතු මොහොතක්. මිග් යානාවලට, multi-barrel rocket launchersවලට, ඩෝරා බෝට්ටුවලට, නවීන යුද ආම්පන්නවලට වැය කරපු ඒ මහා ධනස්කන්ධය රටේ ජනතාවගේ ශුභ සිද්ධිය උදෙසා වියදම් කළ හැකි යුගයක ඔබතුමාගෙන් මම මෙහෙම ඉල්ලීමක් කරනවා. රටේ ජනතාවට වඩාත් ලොකු හැන්දකින් ඒ සහන බෙදා දීමේ ක්‍රියාවලිය සඳහා කැබිනට් මණ්ඩලය තුළ ඔබතුමාත් සටන් වදින්න. මම මේ අවස්ථාවේ ඔබතුමාට එහෙම යෝජනා කරනවා.

ගරු ඇමතිතුමනි, මෙම ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත හා සම්බන්ධ ක්‍රියාවලිය ක්‍රියාත්මක වන්නේ අපේ රටේ තරුණ පරපුරට ශක්තියක් ලබා දෙන්නයි, අපේ රටේ තරුණ පරපුරට නව ජීවනාලියක් උදා කරන්නයි.

එවන් අලුත් ගමනක් ආරම්භ කරන මොහොතක කනගාටුවෙන් හෝ ඔබතුමාට තවත් කරුණක් මම කියන්න ඕනෑ. මේ වැඩ පිළිවෙළේ අරමුණ "දිදුලන රටක්" වුවත්, අද යෞවන පරපුරේ අභිලාෂය, ප්‍රබෝධනය සහමුලින්ම විනාශ මුඛය කරා යන බව අපට කියන්න පුළුවන්. තරුණ අභිලාෂ සහ ප්‍රබෝධන වර්ධනය වුණු යුගයක ඒවා ප්‍රායෝගිකව සාක්ෂාත් කර ගැනීම සඳහා වන අවස්ථා අද අඩු වෙමින් යනවා. දැන් ඔබතුමාම දන්නවා, තරුණ අභිලාෂ - youth aspirations - වාගේම, ඒ හා සම්බන්ධ වන අවස්ථා - opportunities - අතර බරපතළ පරතරයක් - gap - තිබෙන බව. මේ පරතරය වර්ධනය කරන්න දේශපාලඥයෝත් ඒ අයගේ යුතුකම් ඉෂ්ට කරලා තිබෙනවා. ඒ නිසා අද ඇත්ත වශයෙන්ම අපේ රටේ තරුණ පරපුර සාගරයක් මැද හුදකලා වෙලා සිටිනවා; තනි වෙලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාත් හොඳාකාරව දන්නවා, අපේ රටේ තරුණ ජනගහනය මිලියන පහක් බව. ඒ කියන්නේ, ලක්ෂ 50ක්. මුළු ජනගහනයෙන් සියයට 26ක්. අද ඒ අය මුහුණ දෙන බරපතළම ප්‍රශ්නය තමයි, විරැකියාව. දැන් බොහොම ලස්සනට සාර්ව ආර්ථික විචල්‍යයන් පිළිබඳව මේ උත්තරීතර සභාවේ විවිධ වාද විවාද පවත්වනවා. ඒවායේදී බොහොම ලොකුවට කියනවා, අපේ රටේ විරැකියා ප්‍රතිශතය බොහොම අඩු තැනක තිබෙන්නේ කියලා. ඒක ඇත්ත. නමුත්, ඇමතිතුමනි, තරුණ විරැකියා ප්‍රතිශතය අද එන්න එන්නම වැඩි වෙලා තිබෙනවා. තරුණ

විරැකියා ප්‍රශ්නයට පැහැදිලි විසඳුමක් ලබා දෙන්නට රජය අපොහොසත් වෙලා තිබෙනවා. රැකියා නියුක්තිය උදෙසා ජාතික ක්‍රියාකාරී සැලැස්ම - Youth Employment National Action Plan - 2006 වර්ෂයේ දෙසැම්බර් මාසයේ සැලසුම් කළා. ඒක සැලසුම් කළේ විශේෂයෙන්ම ILO එකේ සහ ලෝක බැංකුවේ ආධාර උපකාර ලබා ගෙනයි. ඒ වාගේම Youth Employment Network එකත් සම්බන්ධ කර ගෙන මේ මහා ක්‍රියාකාරී සැලැස්ම හැදුවා. මෙය හැදුවේ කවුරු වෙනුවෙන්ද? හැදුවේ තරුණ පරපුර වෙනුවෙන්. මේ සැලැස්මේ තිබුණු ඉලක්කය මොකක්ද? 2010 වර්ෂය වන කොට විරැකියා ප්‍රතිශතය සියයට 15ට අඩු කරන්නටත්, 2015 වර්ෂය වන කොට එය සියයට 8 දක්වා අඩු කරන්නටත්. ඒක තමයි අරමුණ. නමුත් ගරු ඇමතිතුමනි, වාර්ෂිකව රැකියා වෙළඳ පොළට තරුණ පරපුර 150,000ක් එකතු වන බව ඔබතුමාත් දන්නවා. අද අපේ රටේ තිබෙන තාරුණ්‍යයේ මහා බරපතළ ප්‍රශ්නය මොකක්ද?

උගත්කම වැඩි වෙන්න, වැඩි වෙන්න අද විරැකියා ප්‍රතිශතය වැඩි වෙනවා. ද්විතීයික අධ්‍යාපනය ලබපු තරුණ පරපුරේ විරැකියා ප්‍රතිශතය මම දැන් කියන්නම්. පුරුෂ පක්ෂයේ 5.5යි. කාන්තා පක්ෂයේ 11.7යි. මේක තමයි ද්විතීයික අධ්‍යාපනය ලබපු තරුණ පරපුරේ විරැකියා ප්‍රතිශතය. ද්විතීයික අධ්‍යාපනය අසම්පූර්ණ වූ අයගේ විරැකියා ප්‍රතිශතය මීට වඩා අඩුයි. පුරුෂ පක්ෂයේ එය 1.7යි. කාන්තා පක්ෂයේ 3.3යි. මේ දත්තවලින් තේරෙන්නේ මොකක්ද? ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා තරුණ ශක්තිය පිළිබඳව, තරුණයන් ආරක්ෂා කර ගැනීම පිළිබඳව, යෞවනයට ලබා දෙන මහා අද්විතීය ආශ්චර්යවත් සංවර්ධනාත්මක ක්‍රියාවලිය ගැන කොයි තරම් පම්පෝරි ගැහුවත්, අපේ රටේ තරුණ පරපුරේ විරැකියා ප්‍රතිශතය වසරින් වසර වර්ධනය වෙලා තිබෙනවා.

මම ඔබතුමාට සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නම්. ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තාවට අනුව, 2013 වසරේ තුන්වැනි කාර්තුවේ සිට 4වැනි කාර්තුව වන විට වයස අවුරුදු 20-29 අතර තරුණ පිරිසේ විරැකියාව සියයට 12.2 සිට 13.7 දක්වා වැඩි වෙලා තිබෙනවා. වයස අවුරුදු 20-24 අතර අයගේ විරැකියා ප්‍රතිශතය 16.6 සිට 19.7 දක්වා වැඩි වෙලා තිබෙනවා. අවුරුදු 25-29 අතර අයගේ විරැකියා ප්‍රතිශතය 8 සිට 8.3 දක්වා වැඩි වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, යෞවනයන්ගේ අනාගතය භාර ගැනීමට සිටින, දැනටමත් ඔවුන්ගේ අනාගතය භාරගෙන, ඔවුන් වෙනුවෙන් නිර්මාණශීලී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට උත්සුක වන ඔබතුමා මේ තරුණ පරපුරේ විරැකියාවට ලබාදෙන විසඳුම මොකක්ද? ඒ වෙනුවෙන් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද? [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න. මගේ කථාව අවසන් වුණාට පසුව ඔබතුමාට අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා ඇති මේ විරැකියාව කියන ප්‍රශ්නයට එක්සත් ජාතික පක්ෂ රජයේ කාල වකවානුව තුළදී ලබා දුන්න ඇඟලුම් කම්හල් දෙසීයේ වැඩසටහන ගැන. ඒ කාලයට උචිත වූ ආකාරයට තරුණ පරපුරේ විරැකියා ප්‍රශ්නයට හොඳ ප්‍රගතිශීලී විසඳුමක් එමඟින් ලැබුණා. විරැකියාවෙන් පෙළෙන මේ උගත්, බුද්ධිමත් තරුණ පරපුර වෙනුවෙන් මෘදුකාංග ඉංජිනේරුවන් -software engineersලා- බිහි කිරීමේ වැඩසටහනක් මේ රටේ උපදිසාපති කොට්ඨාස මට්ටමින් නිර්මාණය කරන්න ඔබතුමන්ලාට බැරි ඇයි? ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමනි, ඒක තමයි අපේ රටේ තරුණ තරුණියන්ගේ බලාපොරොත්තුව. අද තාරුණ්‍යයේ හඬ මෙයයි. ඒ අයගේ අභිලාෂයන් ඉෂ්ට සිද්ධ කරන්නට වර්තමාන රජය අපොහොසත් වීම කනගාටුදායක කාරණාවක්.

ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමනි, පසු ගිය දිනවල ඔබතුමන්ලාගේ නායකත්වයෙන්, අපේ රටේ නායකත්වයෙන් පොදු රාජ්‍ය මණ්ඩලීය තාරුණ්‍ය සමුළුව මේ රටේ පැවැත්වුවා. ඒක හොඳ දෙයක්ද, නරක දෙයක්ද කියලා කවුරු හරි මගෙන් ඇහුවොත්, මම කියනවා ඒක හොඳ දෙයක් බව. හොඳ අදහස් අරමුණු කර ගෙනයි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ. ඒ අවස්ථාවේ තරුණ සවිබල ගැන්වීම් පිළිබඳව ප්‍රඥප්තියක් අත්සන් කළා. 2006 සිට 2015 දක්වා තාරුණ්‍යය ලබපු ප්‍රගතිය පිළිබඳව සොයා බලලා, තරුණ අභිවෘද්ධිය උදෙසා හොඳ ඉලක්ක සහිත වැදගත් ක්‍රමෝපාය සැලැස්මක් එහිදී නිර්මාණය කළා. ගරු ඇමතිතුමනි, මේ ක්‍රමෝපාය සැලැස්ම නිර්මාණය කරන කොට, ආර්ථික සවිබල ගැන්වීම, තරුණයන් ශක්තිමත් කිරීම, තාරුණ්‍යය සවිබල ගැන්වීම යනාදී විවිධ යෝජනාවලට ජාත්‍යන්තර සම්මුතියක්, එකඟතාවක් ඇති වුණා. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව සතුටු වන අතරේම, මේ අවස්ථාවේ මගේ මතක සටහන ආපස්සට යනවා.

ඔබතුමා දන්නවා, 1971 සහ 1988-1989 කාලයේ මේ රටේ තරුණ කැරලි දෙකක් ක්‍රියාත්මක වුණු බව. එයින් මහා ව්‍යසනයක් සිදු වුණා; තරුණ ජීවිත අහිමි වුණා; මුළු රටම ලේ ගංගාවක් බවට පත් වුණා. ඒකට ප්‍රධානතම හේතුව මොකක්ද? තරුණ අසහනය. තාරුණ්‍යය මුහුණ දුන්නු පීඩනය. විශේෂයෙන්ම ඒ කාල වකවානුව තුළදී ඒ මහා ව්‍යවසනයන් දෙක කේන්ද්‍ර කරගෙන එදා තරුණයින් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවක් නිර්මාණය වුණා. එහි සභාපතිවරයා හැටියට කටයුතු කළේ මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මැතිතුමායි. වර්තමාන විදේශ අමාත්‍ය ජී.එල්. පීරිස් අමාත්‍යතුමා එහි සාමාජිකයෙක්. මම ඩලස් අලහප්පෙරුම මැතිතුමාට මේ කාරණය කියන්න කැමැතියි. ඊයේ දවසේ කියවුණා, ජනාධිපති කොමිෂන් සභා 17කට රුපියල් කෝටි 27ක් වැය කරලා තවම ඒවා පාර්ලිමේන්තුවටවත් ඉදිරිපත් කරලා නැහැයි කියලා. මේක ඒ වාගේ හමස් පෙට්ටියට ගිය වාර්තාවක් නොවෙයි. ඒ තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශයන් එවකට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව අකුරට, තිතට ක්‍රියාත්මක කරන්න කටයුතු කළා. මට තිබෙන ප්‍රශ්නය මෙන්න මේකයි, ගරු ඇමතිතුමනි. දැන් තාරුණ්‍ය ශක්තිමත් කරන්න, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පවත්වනවා; සම්මුති ක්‍රියාත්මක කරනවා; එකඟතාවන් ඇති කර ගන්නවා. නමුත් ක්‍රමක්‍රමයෙන් ඔබතුමන්ලාගේ රජය තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශයන් බොහොම ක්‍රමානුකූලව කුණු බක්කියට ඇද දමන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

දැන් බලන්න, මේ තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව දිහා. ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. ඔබතුමා මේ වාර්තාව කියවලා නැත්නම් කියවන්න. මොනවාද මේ වාර්තාවේ තිබෙන්නේ? පොදු සමාජය දේශපාලනකරණයෙන් ඈත් කිරීම, තරුණ පිරිස සමාජ සංස්ථාවලින් බැහැර වීම සහ ආයතන පිරිහීම, තරුණයන්ගේ දුක්ගැනවිලි විසඳීම, අධ්‍යාපනය හා සේවා නියුක්තිය අතර නොගැළපීම, සමාජ අසමානතා උග්‍රකරන්නා වූ වෙනස්කම්, භාෂා ප්‍රතිපත්තිය, කුල පීඩනය, ජන වාර්ගික සමඟිය, සමාජ වටිනාකම්. අද මේ වැදගත් වාර්තාව මේ වර්තමාන රජය සහමුලින්ම කුණු බක්කියට විසි කරලා තරුණ ප්‍රජාවගේ සවිබල ගැන්වීම ගැන බොරු පම්පෝරි ගහනවා. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමනි, මම ඔබතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. මම කැමැතියි, මේ අවස්ථාවේ තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කරන්න.

මේ තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ වැදගත් නිර්දේශයක් තිබෙනවා. ඒ නිර්දේශය තමයි අපේ රටේ තාරුණ්‍ය දේශපාලනික වශයෙන් සවි බල ගැන්වීම. පළාත් පාලන මැතිවරණවලදී සියයට 40ක තරුණ නියෝජනත්වයක් ලබා දීම අනිවාර්යය කළා; ස්ථිර කළා. විප්ලව දෙකක් ක්‍රියාත්මක කරලා, භීෂණ දෙකක් ක්‍රියාත්මක වෙලා-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

அக்கிராசனத்தைப் பொறுப்பேற்பதற்காக கௌரவ உறுப்பினர் ஜானக பண்டார அவர்களது பெயரை கௌரவ உறுப்பினர் யாராவது பிரேரிக்கவும்.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු ප්‍රභා ගනේසන් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.*
*அதன் பிறகு, மாண்புமிகு பிரபா கணேசன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. PRABA GANESAN *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට සීමා සහිත වෙලාවක් තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විප්ලව දෙකක් ක්‍රියාත්මක වෙලා, මහා තරුණ පීඩනයක්, අසහනයක් මැද්දේ තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව නිර්මාණය කරලා නියෝගයක් දුන්නා, තරුණ අසහනය ඉවත් කරන්නට පළාත් පාලන මැතිවරණවලදී සියයට 40ක තරුණ නියෝජනත්වයක් ලබා දෙන්න කියලා. මොකක්ද, ඔබතුමන්ලා කළේ? 2012 පළාත් පාලන මැතිවරණ සංශෝධන පනතක් ගෙනැල්ලා ඒක අහෝසි කළා. සියයට 40ක තරුණ නියෝජනත්වයක් ලබා දීම අනිවාර්යය කිරීම ඉවත් කළා. ඒ ඒ පක්ෂවලට ඒ බලය ලබා දුන්නා. මේ වාගේ වැදගත් පනතක් ක්‍රියාත්මක වන මේ මොහොතේ, තාරුණ්‍යයේ හඬට සවන් දීලා, තාරුණ්‍යයේ අධ්‍යාපනයට ශක්තියක් ලබා දෙන මේ මොහොතේ ඒ තරුණයන්ගේ ඒ අපේක්ෂක අයිතිය -ඒ සියයට 40 වෙන් කිරීම, අනිවාර්යය වෙන් කිරීම, නෛතික වෙන් කිරීම- ඉවත් කරන්නට ඇයි ඔබතුමන්ලා කටයුතු කළේ?

ඒ වාගේම අපි එදා ඉල්ලීමක් කළා, සියයට 40ක් දෙන්න බැරි නම් තරුණයන්ට සියයට 25කුත්, කාන්තා නියෝජනයට සියයට 25කුත් ලබා දෙන්න කියලා. කනගාටුවෙන් කියන්නට ඕනෑ, රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරන බොහෝ දෙනා මේ යෝජනාව සමච්චලයට ලක් කළා. මේක දේශපාලන ලකුණු දමා ගැනීමක් කිව්වා. මේක විහිළු සහගත යෝජනාවක් කිව්වා. එතකොට තාරුණ්‍යය වෙනුවෙන්, කාන්තා පරපුර වෙනුවෙන් වැදගත්, සාධනීය, ප්‍රගතිශීලී යෝජනාවක් ගෙන එන කොට එය විහිළුවට ලක් කිරීමද තරුණ පරපුරේ අපේක්ෂාවන්, අභිලාෂයන්, අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගන්නට මේ රජය ගන්නා වූ පියවර කියලා මම අහන්න කැමැතියි.

ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමාගේ කථාවේදී සඳහන් කළා, සාගරයේ අයිතිය දිනා ගන්නට -ජයග්‍රහණය කරන්නට- සාගර විශ්වවිද්‍යාලය විශාල පිටිවහලක් වෙනවා කියලා. මම ඔබතුමාත් එක්ක එකඟ වෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, සාගරයේ අයිතිය බෙදා හදා ගන්නට පෙර මොහොතක් හිතලා බලන්න අද රටේ ජනතාවගේ අයිතිය තහවුරු වෙලා තිබෙනවාද, රටේ තාරුණ්‍යයේ අයිතිය තහවුරු වෙලා තිබෙනවාද කියලා. රටේ තරුණ පරපුර පයට පෑගෙන දූහුවිලි තරම්වත් ගණන් නොගන්නා යුගයකයි අද අපි ජීවත් වෙන්නේ. ඇයි අපි එහෙම කියන්නේ? තරුණ අසහන කොමිසමෙන් යෝජනා කළ සුදුස්සාට සුදුසු තැන ලබා දීම, දක්ෂයින්ට තැන ලබා දීම, විභාග ක්‍රමයක් හරහා මේ රටේ පරිපාලන සේවයට බඳවා ගැනීම සහමුලින්ම ඉවත් කරලා අද ගොට්ටන්ට තැන ලැබෙන යුගයක් ක්‍රියාත්මක වෙනවා. අතකොලුවන්ට, සුවච කීකරු ගෝල බාලයින්ට, දේශපාලන හෙන්චයියලාට තැන ලැබෙන යුගයක් තමයි අද ක්‍රියාත්මක වෙන්නේ. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමනි, ඔබතුමාට ප්‍රකාශ කරන්න බැරි වුණත් ඔබතුමාගේ හෘද සාක්ෂිය දන්නවා මම මේ කියන්නේ සත්‍යයක් කියලා. විභාග ක්‍රමය අහෝසි කරලා අද දේශපාලන හෙන්චයියලා ක්‍රමය ක්‍රියාත්මක වෙනවා. රැකියා බැංකු අහෝසි කරන්නය කියන යෝජනාව තමයි තරුණ අසහන කොමිසමේ තිබුණේ. ඒක අකුරටම ක්‍රියාත්මක කළා. මම වග කීමෙන් කියනවා, එවන් ක්‍රමයක් ගෙනාපු නිසා දෝෂාභියෝගයකටත් මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒක තමයි ඇත්ත කථාව.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු මන්ත්‍රීතුමා, විවාදය අවසානයේදී මම ඕකට උත්තර දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අනිවාර්යයෙන්ම. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මම තමුන්නාන්සේට කියන්න කැමැතියි කරුණාකර තාරුණ්‍ය ගැන බොරු පම්පෝරි ගහන්නේ නැතුව, කථාවත්, ක්‍රියාවත් පිළිබඳව පරතරයක් තබා ගන්නේ නැතුව, -ඉංග්‍රීසියෙන් කියමනක් තිබෙනවානේ "declaratory policy and action policy" කියලා. ඒ කියන්නේ ප්‍රකාශිත ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති- අපි ඒවා අතර තිබෙන පරතරය අවම කරන්නට ඕනෑ.

ඔබතුමා කථා කළා ටයර් සෑයවල් තිබුණු යුගයක් ගැන. අනිවාර්යයෙන්ම අපි ඒවා ගැන කනගාටු වෙනවා. ඒවායේ ප්‍රතිඵලයක් හැටියට තමයි තරුණ අසහන කොමිෂන් වාර්තාවක් නිර්මාණය කළේ. මේවා නිර්මාණය කළේ තමුන්නාන්සේලාට යුද ජයග්‍රහණයේ නාමයෙන් අහෝසි කරන්න නොවෙයි. ඒකයි මම තමුන්නාන්සේලාට කියන්නේ. අතීතයේදී සිදු වූ අඩු පාඩුකම් ගැන එළිපිට කථා කරන්න අපි භය වන්නේ නැහැ. මොකද අපි කොන්ද කෙළින් තබාගෙන දේශපාලනය කරන පුද්ගලයෝ. කැඩපතක් ඉදිරිපිටට ගිහිල්ලා අපේ අඩු පාඩුකම් අප විසින්ම ස්වයං විවේචනයට ලක් කරලා තමයි යම් පරිණත දේශපාලන ගමනක් අනුගමනය කරමින් යන්න අපි උත්සාහ කරන්නේ. ඒකෙත් අඩු පාඩුකම් ඇති. අඩු පාඩුකම් තිබෙනවා නම් පෙන්වලා දෙන්න. අපි ලැහැස්තියි හැදෙන්න. ගරු ඇමතිතුමනි, අන්න ඒ නිසා විශේෂයෙන්ම අද ක්‍රියාත්මක වන දේශපාලන හෙන්චයියාකරණයට නැවතීමේ ලකුණ තබලා, විශේෂයෙන්ම සුදුස්සාට සුදුසු තැන ලැබෙන, දක්ෂ පක්ෂ හපන්කම් තිබෙන අයට දක්ෂතාව අනුව දේශපාලන ඉණිමගේ පහළම තලයේ ඉඳලා ඉහළම තලයට යන්නට, ජන සමාජයේ පහළම තලයේ ඉඳලා ඉහළටම යන්නට, ආර්ථික ක්‍රියාවලියේ පහළම තලයේ ඉඳලා ඉහළටම යන්නට, සමස්ත ජීවනාලිය කියන ඒ ජීවන චක්‍රයේ දක්ෂයාට සුදුසු තැන ලැබෙන ක්‍රියාවලිය නිර්මාණය කරන්නට

ඔබතුමන්ලා කටයුතු කරන්න කියා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම මේ කරුණු කාරණා ඉදිරිපත් කරන කොට ඔබතුමා වරදවා හිතන්නට එපා. මේ සාගර විශ්වවිද්‍යාලය පනත ගෙන ඒම උසස් ක්‍රියාවක්. ඒක හොඳ වැඩක්.

මගේ ප්‍රතිපත්තියක් තිබෙනවා. ඒක තමයි හොඳ දේට හොඳයි කියනවා, වැරදි දේට වැරදියි කියනවා. ඔබතුමන්ලා කර ගෙන යන මේ ක්‍රියා දාමය පිළිබඳව අඩු පාඩු පෙන්වා දෙනවා. ඔබතුමාගේ කථාවේදී ඉල්ලීමක් කළා, පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මේකට සහයෝගය දෙන්නය කියලා. මේකට පක්ෂයක්, පාටක්, ජාතියක්, ආගමක්, කුලයක්, පන්තියක්, තරාතිරමක් නැහැයි කිව්වා. ඒකට මම එකඟ වෙනවා. පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව අපි මේ වැඩ පිළිවෙළට පක්ෂයි කියලා මම තමුන්නාන්සේට පුන පුනාම ප්‍රකාශ කරනවා. මේ වැඩ පිළිවෙළට පක්ෂ වෙනවා වාගේම ඔබතුමන්ලාගේ ප්‍රකාශන සහ ක්‍රියාවලියත් අතර පරස්පර ඇති වනකොට ඒවා පෙන්වා දෙන්නත් අපට අයිතියක් තිබෙනවා. ඔබතුමන්ලාටත් අඩුපාඩුකම්, වැරදි හදා ගන්නට අපි අවස්ථාව ලබා දෙනවාය කියන එක මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමනි, අපි තරුණ පරපුරේ අයිතිය ගැන කථා කළා. තරුණ පරපුරට ලබා දෙන අධ්‍යාපනික ශක්තිය ගැන, තරුණ පරපුරට ලබා දෙන නවෝදය පිළිබඳව ඔබතුමන්ලාත් අදහස් ඉදිරිපත් කළා; විපක්ෂයේ පාර්ශ්වවලිනුත් අදහස් ඉදිරිපත් වුණා. අපේ රටේ වර්තමානයේ ක්‍රියාත්මක වන මේ නින්දිත, පහත් ක්‍රියාවලිය පිළිබඳව මම තවත් නිදසුනක් ඔබතුමාට දෙන්නම්. එතැනිනුත් තැළෙන්නේ, පෙළෙන්නේ අපේ රටේ තරුණ පරපුරයි. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමනි ඔබතුමා දන්නවා; අපි හැමෝම දන්නවා අපේ රටේ දිස්ත්‍රික්ක ගණනාවක ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයක් අපේම රටේ සහෝදර ජනතාව නියං තත්ත්වයක් නිසා විපතට පත් වෙලා සිටින බව. අපි දන්නවා, රජයකට, විපක්ෂයකට, දේශපාලන පක්ෂයකට, දේශපාලනඥයින්ට, රාජ්‍ය නායකයින්ට කාලගුණික තත්ත්වයන්, දේශගුණික තත්ත්වයන් පාලනය කරන්න බැහැයි කියලා. හැබැයි, මොන යම් හෝ ව්‍යසනයක් ක්‍රියාත්මක වීම තුළින් රටක පුරවැසි පරපුර හානියට ලක් වෙනවා නම්, රටක පුරවැසි පරපුර විපතකට ලක් වෙනවා නම් ඒ අයව රැක බලා ගැනීම සර්වජන ඡන්ද බලයෙන් බිහි වුණු හැම රජයකම පරම පවිත්‍ර යුතුකමක්. නියං තත්ත්වය තුළ අපේ රටේ තාරුණ්‍යයට සිද්ධ වෙලා තිබෙන මහා ඇබැද්දිය මොකක්ද? ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමනි, අපේ රටේ ජනතාව ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයක් නියඟයෙන් පීඩා විඳිනවා. නියඟයෙන් බැට කනවා. තමන්ගේ ගොවිතැන් විනාශ වෙලා. වාරි ජලය නැහැ. පානීය ජලය නැහැ. "අනේ අපි හිඟන පුද්ගලයෝ නොවෙයි, අපි අභිමානවත් ගොවි පරපුරක්. නමුත් කරදරයට පත් වුණු මේ අවස්ථාවේ අපට සහනයක් ලබා දෙන්න"ය කියලා ජනතාව හුල්ල, හුල්ල ඉල්ලනවා; ආයාචනා කරනවා. ඒක හිඟාකෑමක් නොවෙයි. ජනතාවගේ ඉල්ලීම. ජනතාවගේ බලාපොරොත්තුව. ඒ නිසා ඒ ඉල්ලීම්වලට සවන් දීලා යුතුකම් ඉෂ්ට කිරීම රටක් පාලනය කරන රජයේ වගකීමයි. විපතට පත් වුණු ජනතාවට රජය ලබා දෙන සහනය මොකක්ද? විශේෂයෙන්ම අපේ රටේ-

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (කම්කරු හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - தொழில், தொழில் உறவுகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekara - Deputy Minister of Labour and Labour Relations)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක්, ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி)சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ විෂය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත. ගරු මන්ත්‍රීතුමා කථා කරන්නේ නියඟය සහ තාරුණ්‍යය ගැනයි. ඒක මේ විෂයයට අදාළ නැහැයි කියන එක තමයි මම කියන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි, විෂයයට අදාළව කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මම දන්නවා, නියඟයෙන් වැඩියෙන්ම බැට කාපු අම්පාර දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයෙක් හැටියට සත්‍ය වසන් කරමින් දුර්දාන්ත දේශපාලන ගමනක් යන පුද්ගලයකුට සත්‍ය එළිදැක්වෙන කොට ලොකු අමාරුවක් දැනෙන බව. වාඩිවෙලා ඉන්න පුටුවේවත් ඉන්න බැහැ. මම ඉදිරිපත් කරනවා-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා විෂයයට අදාළව කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔව්, විෂයට අදාළව තමයි කථා කරන්නේ. සාගර විශ්වවිද්‍යාලයක් ගෙනාවා, තරුණ පරපුරේ පුනර්ජීවනය උදෙසා. මම පෙන්වන්න හදන්නේ රජයේ ප්‍රතිපත්ති හරහා අද තරුණ පරපුර බැට කන ආකාරයයි. ඔබතුමා ඒකට පොඩ්ඩක් සවන් දෙන්න. ඉගෙන ගන්න. අනෙක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එතුමාට "මන්ත්‍රීතුමා" කියන්න එපා. එතුමාට නියෝජ්‍ය අමාත්‍ය තනතුරක් ලැබී තිබෙනවා. ඒ නිසා ඔබතුමාවත් මඳක් නිවැරදි කරමින්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතුමාත් පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරයෙක් හැටියට තමයි සලකන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේ අවස්ථාවේ පැහැදිලිවම කියන්න කැමැතියි, අද නියඟයෙන් විපතට පත් වුණු තරුණ පරපුරත් බැට කන බව. ඇයි, නියඟයෙනුත් බැට කාලා, වාරි ජල ප්‍රශ්නයෙන්, පානීය ජල ප්‍රශ්නයෙන් බැට කාලා, අනේ අර රුපියල් තුන්දාහේ, හයදාහේ බඩු මල්ල ගන්න තරුණ පරපුරට වැඩ බිමට යන්න සිද්ධ වෙලා තිබෙනවා, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමනි. ඒ අයට නියං සහන ලබා ගන්න වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙනවා. දවසේ කුලී වැඩ පැත්තකට දමලා, තමන්ගේ රැකී රක්ෂා වැඩ පැත්තකට

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දමලා දින 6ක් වැඩ කරන්නට ඕනෑ, රුපියල් තුන්දාහේ බඩු මල්ල ගන්න; දින 12ක් වැඩ කරන්නට ඕනෑ, රුපියල් හයදාහේ බඩු මල්ල ගන්න. වර්තමාන රජය දැන් මොකක්ද කරන්නේ? මා මේ උදාහරණ ඉදිරිපත් කරන්නේ වෙන කොහෙන්වත් නොවෙයි, රටක ජනාධිපතිවරයකු බිහි කරපු හම්බන්තොට දිස්ත්‍රික්කයෙන්මයි. බලන්න, සූරියවැව මුට්ටගල්ආර වැව හාරන්න සිද්ධ වෙලා තිබෙනවා, නියං ආධාර ලබා ගන්න. මොකක්ද මේ විහිළුව? නියඟයෙනුත් බැට කාලා, පානීය ජලයත් නැතුව, වාරි ජලයත් නැතුව ජීවිතය සම්පූර්ණයෙන්ම විනාශ වුණු මේ රටේ ජනතාවට නියං සහනාධාර ටික ලබා ගන්න වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙනවා; වැව් හාරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. කටුවන කොට්ඨාසයේත් වැව් ගණනාවක් හාරන්න අනිවාර්ය කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආධාරයක් ලබා ගන්න අනිවාර්යයෙන්ම වැඩ කරන්නට ඕනෑ නම් කොහොමද ඒක සහනාධාරයක් වන්නේ? මේ රජයෙන් නියං සහනාධාර ක්‍රියාත්මක වන්නේ නැහැ. වැඩක් කළොත් ඒ වැඩට සරිලන ආධාරයක් ලබා දෙන්නට මේ රජය කටයුතු කිරීම නින්දිත කාරණාවක්. එතකොට අපේ රටේ නියඟයෙන් විපතට පත් වුණු පවුල්වල තරුණ පරපුරට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අනේ! වයෝවෘද්ධ අම්මලාට, තාත්තලාට මේ සහන වැඩසටහනට සහභාගි වන්නට බැහැ. ඒ අය තරුණයෝ ටික යවනවා. මොනවාටද යවන්නේ? ඒ අයට සිද්ධ වනවා, රජයේ නියං ආධාර මල්ල ලබා ගන්න වැඩ කරන්න. මහ ලොකුවට කථා කරනවා, තරුණයන් සවි බල ගැන්වීම ගැන. නැවතත් වැඩ වසම් යුගයක් අද ඇවිල්ලා තිබෙන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙලා තිබෙනවා. විනාඩියක් ඇතුළත ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

විනාඩියකින් කථාව අවසන් කරන්න. කාල වේලාව සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සරත් වීරසේකර නියෝජ්‍ය අමාත්‍යතුමාත් මගේ කථාවට බාධා කරපු නිසා මට විනාඩි දෙකක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

නැහැ, නැහැ. එතුමා ඔබතුමාට උදවු කළා. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

කිසිම උදව්වක් නැහැ. මටත් උදව්වක් නැහැ. එතුමාව මෙම පාර්ලිමේන්තුවට පත් කර එවපු ජනතාවටවත් උදවු කළේ නැහැ. එම නිසා මා එතුමාගෙන් ඉල්ලීමක් කරනවා, -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

දැන් විනාඩි භාගයක් ගත වුණා. ඉතිරි විනාඩි භාගය තුළ කථාව අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නියඟයෙන් විපතට පත් වුණු ජනතාව නියෝජනය කරන දිස්ත්‍රික්කයක් අම්පාර දිස්ත්‍රික්කය. සරත් වීරසේකර නියෝජ්‍ය අමාත්‍යතුමාට කොන්දක් තිබෙනවා නම්, පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමේදී කථා කරලා, මේ ක්‍රියාත්මක වන වැඩසටහන - වැඩක් කළොත් පමණක් සහනාධාර ලබා දෙන වැඩසටහන - කරුණාකර නතර කරන්නට කටයුතු කරන්නය කියලා මා එතුමාට යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරන්නට යන මේ මොහොතේ නැවතත් මා ප්‍රකාශ කරනවා, අපේ ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා හොඳ, ප්‍රගතිශීලී ගමනක් යන පුද්ගලයෙක්ය, අලුත් වැඩක් කරන්නට උත්සාහ දරන පුද්ගලයෙක්ය කියන එක. අලුත් වැඩ වැඩියෙන් කරන්න ගියොත් එතුමාගේත් බෙල්ල කැපෙයි. එහෙමත් ගතියක් තිබෙනවා, අද දේශපාලන ක්‍රමය තුළ. ඒක එතුමා හොඳාකාරවම දන්නවා.

එතුමා සද්භාවයෙන් කරන මේ ශක්තිමත් වැඩසටහන ඉදිරියට ගෙන යන්නටත්, අද අපේ රටේ තාරුණ්‍යය ඉමහත් අගාධයකට ඇද වැටෙමින් පවතින යුගයක මා ඉදිරිපත් කළ අදහස් උදහස් පිළිබඳව එතුමාගේ අවධානය යොමු කරලා, එතුමාගේ නායකත්වයෙන්වත් ප්‍රකාශන දේශපාලනයයි, ක්‍රියාකාරි දේශපාලනයයි අතර තිබෙන ඒ මහා පරතරය - විශේෂයෙන්ම මේ රජය තුළ තිබෙන ඒ මහා පරතරය - අවම කරන්නටත් එතුමාට ධෛර්යය, ශක්තිය, වාසනාව ලැබේවා, ඒ වාගේම නියඟයෙන් විපතට පත් වුණු ජනතාවට සැබැවින්ම සහනාධාර ලබා දෙන්නට මේ රජයටත් හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි. බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.36]

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජීවිතයේ මා ප්‍රාර්ථනා කරපු ලංකාවේ ආර්ථිකයට හා අධ්‍යාපනයට වැදගත් මාතෘකාවක් තමයි, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය. 1942 සිට ලංකාවේ ගොඩ බිම විශ්වවිද්‍යාල තිබුණා. මේ රටේ හැතැප්ම දහසක මුහුදු වාටියක් තිබෙනවා; කළපු 25ක්, 30ක් විතර තිබෙනවා. ලංකාව අවුරුදු 2,000ක් තිස්සේ ජාත්‍යන්තර නාවික ගමනේ නැවතුම් පොළක් වෙලා තිබුණා. නමුත් සාගරය කියන එක අපේ දේශපාලන ශබ්ද කෝෂයට ඇවිල්ලා තිබුණේ නැහැ. සාගරය කියන්නේ ගොඩබිම ඉවර වන තැන නොවෙයි. ලංකාවේ ගොඩබිම සෙසු ලෝකයට සම්බන්ධ කරන පාලම පටන් ගන්න තැනයි සාගරය. මේ සංකල්පය කැරකිලා, කැරකිලා ගිහින් අපට සාගර විශ්වවිද්‍යාලය

කියන එකට එන්න සිද්ධ වුණා. අමතක කරන්න එපා, 1505 වසරේ ඉඳන් පෘතුගීසිකාරයෝ ලංකාවට ආ බව; ඕලන්දක්කාරයෝ ආ බව. කොළඹ කොටුව කියන එකේ වර්ග ප්‍රමාණය අක්කර 224යි. මේ අක්කර 224, අඩි 12ක ගල් බැම්මකින් ආරක්ෂා කරලා, කාලතුවක්කු 25ක්, 30ක් සවි කරලා අවුරුදු 500ක් ගත වෙලාත් අපට බැරි වුණා පෘතුගීසින්, බටහිර ජාතීන් එතැනින් එළවන්න. අපේ රජවරු හිටියා; ශ්‍රේෂ්ඨ රජවරු හිටියා. ඇවිල්ලා වෙඩි තිබ්බා. මාස 6කට වැඩි කාලයක් වටලා ගෙන හිටියා. නමුත් කොළඹ කොටුව සමතලා කරන්න බැරි වුණා. අද අපි විභාග කළ යුතුයි, කොළඹ කොටුව 1505 වසරේ ඉඳන් අද දක්වා ලංකාවේ කේන්ද්‍රය වුණේ ඇයි කියලා. ඒකට විකල්පයක් දෙන්න බැරි වුණේ ඇයි? අපි ඒ ගැන නැවත කල්පනා කළ යුතුයි. මේක ඉතා වැදගත් ප්‍රශ්නයක්, ගරු මන්ත්‍රීවරුනි. පොඩි කොළඹ කොටුවේ ඉඳගෙන මුළු ලංකාවේ ලක්ෂ ගණනක් වූ සෙනඟට ඔරොත්තු දෙමින්, මුහුණ දුන්නේ නාවික බලය නිසායි. අපට නාවික බලය තිබුණේ නැහැ. අපිට නාවික බලය නොතිබුණු නිසා ලන්දේසීන් 1766 දී නුවරට ගිහින්, ලංකාව වටේ ගව්වක ප්‍රදේශයේ වෙරළ සදාකාලිකව ලන්දේසීන්ට දෙනවාය කියලා සිංහල රජ්ජුරුවන්ගේ අත්සන ගිවිසුමකට ගත්තා. එදා ඉඳලා තමයි ලුණු ලේවාය නැති වෙලා, ලුණු පොල් කට්ටේ අර්බුදය ලංකාවේ ඇති වුණේ.

1999 දී එවකට හිටපු ධීවර ඇමති හැටියට ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ විශ්වවිද්‍යාලය ආරම්භ කළා. මට හරි කනගාටුයි. ඒ විශ්වවිද්‍යාලය එදා ආරම්භ කළත් ඒකේ නම, ඒකේ වපසරිය සාගර විශ්වවිද්‍යාලය කියන එකට ආවේ නැහැ. අවුරුදු 15ක් ධීවර හා නාවික තාක්ෂණ ආයතනය ගෙන ගියා. මම නම් තුට්ටුවකට ගණන් ගන්නේ නැහැ, ඒ ගොල්ලන්ගේ රාජකාරී කාලය. වැඩක් නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉඳලා තිබෙන්නේ ගරු සභාවේ. මොනවාද කරලා තිබෙන වැඩේ? සාගරය කියන එක ජාත්‍යන්තරව ලංකාවට පිරිනමාපු දැවැද්දක්. ඉංග්‍රීසිකාරයා එන කොට ලංකාවට අයිතිය තිබුණේ වෙරළේ ඉඳලා හැතැප්ම 3යි. ඊට පස්සේ වෙරළේ ඉඳලා හැතැප්ම 12ක් අයිති වුණා. ඒක හැතැප්ම 20 දක්වා වැඩි වුණා. අද අයිතිය, වෙරළේ ඉඳලා හැතැප්ම 200යි. ඊට එහායින් ආර්ථික කලාපයක් තිබෙනවා. ලංකාවේ වර්ග ප්‍රමාණය වර්ග සැතැපුම් 25,000යි. 175,000ක විශාල සාගර කේන්ද්‍රයක් අපට තිබෙනවා. අන්න ඒක ආර්ථිකයකට හැරවීම තමයි සාගර විශ්වවිද්‍යාලයේ ප්‍රධානම අරමුණ. කුරුල්ලෝ අල්ලන්න සාගර විශ්වවිද්‍යාල ඕනෑ නැහැ. මුළු සාගරයෙන් අපට අයිති කලාපයේ - ඉන්දියානු සාගරයේ - ලංකා මුහුදක් නිර්මාණය කරන්නයි අපට දීලා තිබෙන්නේ. ඒක කිරීම සඳහා තමයි පරණ කට්ටිය අවුරුදු 15ක් කාල් ගගා ගියේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දැන් අලුත් පරිවර්තනයක් වෙලා තිබෙනවා. පසු ගිය අවුරුදු පහේ ඉඳන් ලෝකය වෙනස් වෙලා. ලංකාව ආපහු අභ්‍යවකාශ විද්‍යාවකට ගිහිල්ලා; ලංකාව කාටවත් හිතන්න බැරි භූගෝල විද්‍යාවකට ගිහිල්ලා; ලංකාව සාගර විද්‍යාවකට ගිහිල්ලා. මේ තුන එකට අලළලා අලුත් ශිෂ්ටාචාරයක් හැදීමයි, ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සංවර්ධනය කියන වචනයේ අර්ථය. ගෙවල් දොරවල් හැදීම විතරක් නොවෙයි. මොළය හැදීමත් එයට අයිතියි. පාරවල් කාපට් කරන එක විතරක්ම නොවෙයි, ජනතාවගේ ළමයින්ගේ මොළ කාපට් කරන්නත් ඕනෑ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
හරියට හරි.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

ජනතාවගේ මොළ කාපට් කරන්න ඕනෑ ගණිතයෙන්, විද්‍යාවෙන්, භූගෝල විද්‍යාවෙන්, ඉංජිනේරු ශිල්පයෙන්, අභ්‍යවකාශ විද්‍යාවෙන්, සාගර විද්‍යාවෙන්. මේවා සම්බන්ධයෙන් අපි තවම අපේ ළමයින්ගේ රන් කිරි කට ගාලා නැහැ. ඒ කටයුත්ත භාර දුන්නු අය කොළඹ කාක්කන් වෙලා කොළඹම ලැගලා ඉන්නවා. උන් වෙරළට යන්නේ නැහැ; මුහුදට යන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1999 ඉඳලා මේ වන විට අවුරුදු 15ක් වෙනවා. ලංකාවට අයිති සාගරය පිළිබඳ සිතියමක් හදලා මේ රටේ සෑම ගෙයකටම බෙදන්න යුතුකමක් තිබුණා. ඉංග්‍රීසිකාරයා ආපු දා ඉඳලා පාසලක් පාසා ලංකා සිතියම බෙදුවා; ගෙයක් පාසා, ශිෂ්‍යයකු පාසා ඇට්ලස් පොතක් බෙදුවා. මේ අය මේ අවුරුදු 15 තිස්සේ සාගරය ගැන කථා කරනවා; සාගර කලාප ගැන කථා කරනවා; ලංකාවට අයිති වෙරළ හා මුහුද ගැන කථා කරනවා. නමුත් පාසල්වල ළමයින්ට බෙදා දෙන්න ඒවා ඇට්ලස් පොතකට ගන්න මේ කම්මැළියන් ටිකට -මේ directorsලාට- පුළුවන් වුණාද? යල් පැනපු පිරිසකට ජොබ් දෙන්න එපා. මේ අය අයින් කරන්න. අලුත් පිරිසක්; 40න් පහළ පිරිසක් ගන්න. වයස්ගත වෙච්ච අයට, පැන්ෂන්කාරයන්ට මේ ආයතන තිප්පොළවල් කරන්න එපා. ලංකාව මහා පිම්මක් පනින්නයි යන්නේ. ඒ බුද්ධිමය ඔලිම්පික් පිම්ම පනින්න අපට අවශ්‍යයි.

අද ඩලස් අලහප්පෙරුම මහත්මයාට මහත් අභියෝගාත්මක කටයුත්තකුයි කරන්න තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේගේ මේ පියවරත් එක්ක සාගර කලාපයක් පහළ වෙනවා. ඒකත් එක්කම සාගර ආර්ථිකයක් පහළ කෙරෙනවා. සාගර විශ්වවිද්‍යාලයකුත් දැන් පහළ වුණා. සාගර තාක්ෂණික විප්ලවයක් ඒ ඇසුරින් පහළ වෙනවා. ගොඩ බිම අය වැයට සාගර අය වැයක් පහළ වෙනවා. ගොඩ බිම අය වැයට ශක්තියක් වශයෙන් සාගර අය වැයක් පහළ වෙනවා. මේ කටයුතු පහ ඉෂ්ට කරන්න තිබුණා. මහින්ද රාජපක්ෂ මහත්මයා හුදකලාව 1999 දී ගත්තු පියවරක් මේක. මේ කොළඹ කාක්කෝ මොකුත් කළේ නැහැ. ඒ අයට ඕනෑ කොළඹට වෙලා ලගින්න විතරයි. නමුත් යන්න ඕනෑ මුහුදට. ඉංග්‍රීසිකාරයා මුහුදට ගියා; ජපන්කාරයා මුහුදට ගියා; සිංගප්පූරුකාරයා "Navy" කියලා මුහුදට ගියා. එංගලන්තයේ ලොකුම ගීතිකාව වුණේ "God Save the King" කියන එකයි. Rule, Britannia! rule the waves: Britons never will be slaves"; බ්‍රිතාන්‍යය සප්ත මහා සාගරය පාලනය කරාවි. අපටත් එහෙම මහා සාගරයක් තියෙද්දී, ඒ වාසනාව දීලා තියෙද්දී ලගිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයකුයි තිබෙන්නේ.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

මම ගරු ඇමතිතුමාගෙන් සහ ආණ්ඩුවෙන් ඉල්ලනවා, මේකට අලුත් පිරිසක් යොදවන්න කියලා. විද්‍යාව වෙනස් වෙලා. සාගරය කියන්නේ වතුර කඳක් නොවෙයි. ජලයෙන් යට වූ

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

වනාන්තරයක්; ජලයෙන් යට වූ සත්ත්වෝද්‍යානයක්; ජලයෙන් යට වූ ඛනිජ සම්පත් ආඪ්‍ය භූමියක්. අන්න ඒකට අර්ථයක් දෙන්න. ඒ වෙනුවෙන් ළමයින්ට dictionary එකක් දෙන්න; සිතියමක් දෙන්න. අනෙක් සියලු කටයුතුවලට වඩා ඒක වටිනවා. අපි "සාගරය, සාගරය" කියලා කියනවා. නමුත් ඒ ගැන ළමයින් දන්නවාද; ජනතාව දන්නවාද? ඒ පින්තූර ඇතුළත් calendar එකක් ගෙදර එල්ලා තිබෙනවාද? මොකවත් නැහැ. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ මහා විශාල ගමනකුයි මේ යන්නේ. සාගර කලාපයක් පහළ වේවා! ඒ සාගර කලාපයේ සාගර ආර්ථිකයක් පහළ වේවා! ඒ සාගර ආර්ථිකයට පණ දෙන සාගර අය වැයක් පහළ වෙලා ගොඩ අය වැයේ හිඟතාව සාගර අය වැයෙන් පියවේවා! ගරු ඇමතිතුමනි, ඒ සඳහා මම තමුන්නාන්සේට ශක්තිය ප්‍රාර්ථනා කරනවා. මේ කටයුත්තේදී නිර්භීතව අලුත් තාක්ෂණයයි, අලුත් තාක්ෂණ නිලධාරින් කිහිප දෙනකුයි යොදා ගන්න.

ඔය පරණ අයත් අයින් කරන්න එපා. ඒ අයටත් ඔය කොහෝ හරි ලගින්න දෙන්න. එහෙම දීලා තමුන්නාන්සේ අලුත් කට්ටිය දහ දෙනකු ගන්න. ලංකාවේ අද තිබෙන ඉදිරි ගමනට නාකි රාජ්‍ය සේවකයෝ වැඩක් නැහැ. එවුන් නාකි වැඩියි. ඒ නිසා අලුත් කට්ටියක් ගන්න. අලුත් කට්ටියක් අරගෙන අභ්‍යවකාශය, භූමි විද්‍යාව, සාගර විද්‍යාව එකට අලලා සාගර අය වැයෙන් ගොඩ අය වැය නිරුපද්‍රිතව සපථ කරන්න ලැබේවා,යි ප්‍රාර්ථනා කරමින් මා මිත්‍ර ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාට ඈත සිටින සතුරන්ට වඩා ළඟ ඉන්න නාකි මිතුරන්ගෙන් පරිස්සම් වෙන්නය කියලා අවවාද කරමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.49]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත යටතේ මටත් අදහස් කිහිපයක් ප්‍රකාශ කිරීමට ඉඩ දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

මා විශේෂයෙන්ම සතුටු වෙනවා, මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා නාකි ටික එළවන හැටි අපට මතක් කිරීම ගැන. නමුත් අපි අතිගරු ජනාධිපතිතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, කිසිම ජන පදනමක් නැති

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ටිකක් එතුමාගේ ජාතික ලැයිස්තුවෙන් අද අපට නරඹන්නට- [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු සම්බන්ධයෙන් එවැනි ප්‍රකාශයක් කරන්න එපා. එම ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඒ පුද්ගලයන්ට අපහාස කළාම ඔබතුමා ඒක ඉවත් කළේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මා මූලාසනයේ සිටින සෑම අවස්ථාවකම එවැනි ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කර තිබෙනවා. ස්ථාවර නියෝග අනුවයි කටයුතු කරන්නේ.

එම කොටස ස්ථාවර නියෝගවලට පටහැනියි. ඒ නිසා ඒ කොටස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා නිලධාරි මණ්ඩලයකට ඒ වාගේ වචන පාවිච්චි කළා. ඒ වෙලාවේ ඒකත් ඉවත් කරන්න තිබුණා. ඒ ගැන අවධානය යොමු කරන්න තමයි මා එය මතක් කළේ.

මා දැන් අදාළ විෂයයට යනවා. දූපතක් ලෙස තිබෙන අපේ රටට සාගරය ඉතාම වැදගත් ක්ෂේත්‍රයක්. විශේෂයෙන්ම ධීවර කර්මාන්තය අතින් විතරක් නොවෙයි, සාගර විද්‍යාව හා තාක්ෂණය මුල් කරගෙන මේ 21වැනි සියවසේදී විශාල ආර්ථික හා සමාජයීය පිම්මකට ළඟා වන්න පුළුවන් කියන එක සම්බන්ධයෙන් අපි සියලු දෙනාම එකඟ වෙනවාය කියා මා හිතනවා. විශේෂයෙන්ම අපේ රට තුළ මිනිස්බල අවශ්‍යතාව සපුරා ගන්නට වාගේම වෘත්තිය හා තාක්ෂණික පුහුණුවක් දෙන්නට අපේ විශ්වවිද්‍යාල පද්ධතියත් ඒ වාගේම අද ඔබතුමන්ලා නිර්මාණය කර තිබෙන මේ සාගර විශ්වවිද්‍යාලයත් ඉතාම වැදගත් වෙනවා.

අප රට වටේ තිබෙන සාගර සම්පත් කළමනාකරණයටත්, ඒවා ආරක්ෂා කිරීමටත් මෙය ඉතාම වැදගත් වනවා. ඔබතුමන්ලා දන්නවා ලෝකයේ තිබෙන විවිධ කාලගුණ වෙනස්වීම් අනුව ඉතාම බරපතළ තත්ත්වයක් අපේ මේ සාගරයට එල්ල වෙලා තිබෙන බව. එහිදී වෘත්තිය පුහුණු අංශය විතරක් නොවෙයි, පර්යේෂණ අංශය සහ අපේ සම්පත් රැක ගැනීමේ අංශයත් අපට ඉතාම වැදගත් වෙනවා, මේ ආකාරයෙන් ඉස්සරහට යන්න. ඒ නිසා අපි ස්තුතිවන්ත වෙනවා ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාට. එතුමා පක්ෂ විපක්ෂ සියලු දෙනාගෙන්ම අදහස් විමසා ඒ අවශ්‍ය සංශෝධන මේ පනත් කෙටුම්පත තුළින් ගෙනැවිත් තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, ඒ සඳහා අවශ්‍ය ශක්තිය වාගේම ඒ සඳහා අවශ්‍ය මුදල් ඉදිරියේදී ඒ ආයතනවලට ලබා දීමට සියලු දෙනාම එකතු වෙලා කටයුතු කරාවි කියලා.

අපේ රට ගොඩබිම ආර්ථිකය තුළින් වාගේම සාගර ආර්ථිකය තුළිනුත් ඉස්සරහට යන්න ඕනෑ. ධීවර කර්මාන්තය, නාවික ක්ෂේත්‍රය වාගේම සාගරය හා අනුබද්ධ සම්පත් කළමනාකරණය තුළින් ඉතාමත් දියුණු තාක්ෂණයක් තවම අපට නැහැ. තවම අපි ඒ අතින් යම්කිසි මට්ටමක සිටියත් වෙන රටවල් එක්ක සංසන්දනය කරනකොට වෘත්තියක් හැටියට සමාජය පිළිගත් රැකියා මේ රටේ බිහි කරන්න අද අපට අවශ්‍ය වෙලා තිබෙනවා. මොකද, ඉතිහාසයේදී අපේ රටට විශාල බලපෑම් එල්ල වෙලා

තිබෙන්නේ මුහුදු තීරය හරහායි. එදා පෘතුගීසින්, ලන්දේසීන්, බ්‍රිතාන්‍ය ජාතිකයන් අපව යටපත් කරන්නට යොදා තිබෙන්නේ නාවික බලයයි. ඒ අය ඉස්සෙල්ලාම වෙළඳාමටය කියා අපේ රටට ඇවිල්ලා ඊට පසුව යුදමය තත්ත්වයකට ගිහින් තිබෙනවා. අවුරුදු 500කටවත් අපට ඒ තුළින් ගැලවෙන්නට බැරි වුණා.

පෘතුගීසින්, ලන්දේසීන් වාගේම බ්‍රිතාන්‍යයන් ඉස්සර හිටපු තත්ත්වයට වඩා පසු කාලයකදී මුළු ලෝකයම අල්ලා ගන්නා තත්ත්වයකට පත් වුණේ සාගරය උපයෝගී කරගෙන ධීවර කර්මාන්තයට ඔබ්බෙන් යාම තුළිනුයි. නාවික ක්ෂේත්‍රයේ නාවික දැනුම, නාවික තාක්ෂණය උපයෝගී කරගෙන ඒ තුළින් වෙළඳාම වාගේම ඔවුන්ගේ යුදමය ශක්තිය ලෝකය පුරාම විහිදුවන්නට ඔවුන් සමත් වුණා. පසුව එහි බලපෑම ලංකාවටත් ආවා.

21වන සියවස කියන්නේ ආසියාවේ සියවසයි. ආසියාවේ අනිකුත් රටවල් වෙළෙඳ ක්ෂේත්‍රයේ ඉතාමත් වේගයෙන් ඉදිරියට යනකොට අපිත් ඒ තුළින් ඉදිරියට යන්නට අවස්ථාවක් උදා කර ගන්න ඕනෑ. ඒ සඳහා අපේ ලංකාවේත්, තාක්ෂණයෙන් උසස්, ජාත්‍යන්තරය පිළිගන්නා පුහුණු ශ්‍රම බල කායක් හදන්න ඕනෑ. ඒ සඳහා අපේ අධ්‍යාපන ආයතනවලින් එළියට යන තරුණ තරුණියන්ට රැකියා උත්පාදනය වාගේම, තාක්ෂණය දීමේ ක්‍රමවල මීට වඩා පුළුල් වෙනසක් කරන්න ඕනෑය කියා තමයි මේ අවස්ථාවේදී මම සඳහන් කරන්නේ.

ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාත් දන්නවා, මේ රටේ National Youth Survey එකක් ක්‍රියාත්මක වුණු බව. ඒකෙදි පෙන්වා දී තිබුණා අපේ රටේ Advanced Level සමත් නැති තරුණ පරපුර සියයට 48ක් විතර ඉන්නවාය කියා. ඒ වාගේම කලා අංශයට නැඹුරු වෙලා සිටින සියයට 22ක් විතර ඉන්නවාය කියා තිබුණා. අපේ රටේ මේ තරුණ පිරිසට රැකියා උත්පාදනය කිරීම අද විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අද වනකොට මේ රටේ තරුණ විරැකියාව ඉතාමත් ඉහළ මට්ටමක තිබෙනවා. ළඟදී අපි UNDP එකේ වැඩසටහනකට සහභාගී වුණා. ඒකෙදි එක්සත් ජාතීන්ගේ සංගමයෙන් "National Human Development Report 2014 on Youth and Development" නමින් වාර්තාවක් එළිදැක්වුවා. ඒකෙන් පෙන්වා දී තිබෙනවා, ලංකාවේ අවුරුදු 15 - 24 අතර තරුණ පරපුරේ විරැකියාව සියයට 18.5ක්ය කියා. ඒක ඉතාම බරපතළ ප්‍රශ්නයක්. මොකද, ඒක සමාන වෙන්නේ ඇෆ්ඝනිස්ථානයටයි. මේ කලාපයේ රටවල් අතරින් ඇෆ්ඝනිස්ථානයේ විතරයි වයස අවුරුදු 15 -24 තරුණ පිරිස අතර සියයට 19.5ක විරැකියාවක් තිබෙන්නේ. ලංකාවේ ඒ ප්‍රමාණය සියයට 18.5යි. නේපාලය, බංග්ලාදේශය, ඉන්දියාව, පාකිස්තානය ආදී සියලුම රටවල්වල තරුණ මට්ටමේ විරැකියාව සියයට 10ට වඩා අඩු කර ගැනීමට ඒ අයට හැකි වෙලා තිබෙනවා. අපි මේ ගැන සොයා බලන්න ඕනෑ. මොකද, අපි පුහුණු කරන දෙය නොවෙයි රැකියා වෙළෙඳ පොළ ඉල්ලන්නේ. අපේ තරුණ පිරිස මොන අධ්‍යාපන සුදුසුකමක් ලැබුවත් ඔවුන් ගිහින් රැකියාවක් සොයනකොට තමන්ට අවශ්‍ය රැකියාවක් ලබා ගන්න බැරි වීම නිසා එක එක කාලවලදී මේ රටේ තරුණ අසහනය එන්ට එන්ටම වැඩි වීම නිසා මේ රටේ මොන විධියේ විනාශයන් වුණාද කියන එක අපි දැක තිබෙනවා. නමුත් වරින් වර පත් වුණු රජයන් යම් යම් පියවර ගන්න බැරිව අද වන කොටත් ඒ ප්‍රශ්නය හරිහැටි විසඳලා නැහැයි කියන එක තමයි මගේ මතය වෙලා තිබෙන්නේ. මොකද, අද ඒ ප්‍රශ්නය යම්තාක් දුරට හෝ විසඳිලා තිබෙන්නේ අපේ තරුණ තරුණියෝ විශාල වශයෙන් අපේ රට අතහැරලා ගිහින් තිබෙන නිසායි. මම නියෝජනය කරන ප්‍රදේශයේ පවා තරුණයෝ දහස් ගණනක් ආර්ථික වශයෙන් මේ රටේ ඉස්සරහට යන්න බැරිව අද මේ රට අතහැරලා වෙන රටවලට ගිහිල්ලා, ඒ රටේ තිබෙන ආර්ථිකය හරහා රැකියා කරලා ලබන මුදල් තමයි ලංකාවට එවන්නේ. ඒ වාගේම අද ඔබතුමන්ලා, රාජ්‍ය අංශය, ලෝකයේ තිබෙන විශාලතම අංශයක් බවට පත් කරලා, ඒ තුළිනුත් රැකියා මට්ටම යම්කිසි දුරකට විසඳිලා තිබෙනවා. නමුත් ඒ දෙකම මේ ආර්ථිකය තුළින් විසඳුණු ප්‍රශ්න නොවෙයි. ඒ නිසා අපි මේ ගැන ඉතා ගැඹුරු අධ්‍යයනයක් කරන්නට ඕනෑ, මේ රටේ ආර්ථිකය තුළින් අපේ තරුණ තරුණියන්ට හරිහැටි රැකියාවක් ලබා දෙන්නේ කොහොමද කියලා. එසේ කරන්නට නම් අද ලංකාවේ තිබෙන අධ්‍යාපන මට්ටම අනුව ඒ ආයතන, රැකියා වෙළෙඳ පොළ මොනවාද ඉල්ලන්නේ, ඉදිරි 21වන සියවසේදී කොහොමද ඒ තුළින් බද්ධ කරන්නේ කියන එක ගැන මීට වඩා පුළුල් අධ්‍යයනයක් කරලා, පක්ෂ විපක්ෂ අප සියලු දෙනාම එකතු වෙලා එය විසඳීමට පියවරක් ගන්න ඕනෑ. ඒ වාගේ පියවරක් ගැනීම අද අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. මොකද, එන්න එන්නම තරුණ විරැකියා ප්‍රශ්නය විසඳන්නට බැරි වෙලා තිබෙන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර කර්මාන්තයට සාගර විශ්වවිද්‍යාලය ඉතා වැදගත් වන බව අපි දන්නවා. අපේ ලංකාවේ ධීවර කර්මාන්තය, එක් කාලයක සමාජයෙන් කොන් වුණු කර්මාන්තයක් හැටියට හැඳින්විලා තිබුණා. ඒ නිසා මේ වාගේ ආයතන හරහා ධීවර කර්මාන්තයට නව ජීවයක්, නව තාක්ෂණයක්, නව ශ්‍රමයක් ලබා දිය හැකියි. ඒ වාගේම අපේ තරුණ තරුණියන්ට ඒ තුළින් සමාජයේ පිළිගැනීමක් හදා දෙන්නට අපට පුළුවන් නම්, අපේ තරුණ තරුණියෝ ධීවර කර්මාන්තය හරහා තව තවත් ඉදිරියට යන්නට එයි කියන එකයි මගේ අදහස වන්නේ.

අපි දන්නවා, අපි නාවික කේන්ද්‍රස්ථානයක ඉන්නා බව. අපේ මුහුදු මාර්ගය ගත්තාම අපේ තරුණ තරුණියන්ට නාවික අංශයේ හොඳ පුහුණුවක් දෙන්න පුළුවන්. ඒකට නැඹුරුතාව අඩුයි. මොකද, පාසල් මට්ටමේ සිට අපේ තරුණ තරුණියන්ට ඉදිරියට යන්නට පුළුවන් මොන අංශයෙන්ද කියන එක පිළිබඳ දැනුවත්කමක් නැහැ. අපේ තරුණ තරුණියෝ බොහෝ දෙනෙක් පුරුදු වෙලා ඉන්නේ, රජයේ යම් කිසි රැකියාවක් කරන්න, එහෙම නැත්නම් සම්ප්‍රදායික ක්ෂේත්‍රයක රැකියාවක් කරන්නයි. නමුත් ඉන් ඔබ්බට ගිහිල්ලා, ලංකාවේ තිබෙන සම්පත් උපයෝගී කර ගෙන ඒ සම්පත් තුළින් ලෝකයේ දියුණුම කර්මාන්ත, දියුණුම රැකියා ක්ෂේත්‍ර නිර්මාණය කරන්නට අපට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි, සාගර සම්පත් ආරක්ෂා කර ගැනීම. ඔබතුමන්ලා දන්නවා, සාගර සම්පත් ගැන, අපට විදේශ රටවලින් පවා විශාල බලපෑමක් එල්ල වෙලා තිබෙන බව. ඉන්දියානු ධීවරයෝ වාගේම, එක් එක් රටවලින් ඇවිත්, අපේ කොඩිය ගහගෙන අපේ මුහුදේ මසුන් ඇල්ලීමේදී සමහර වෙලාවට අපේ සාගර සම්පත් ටික විනාශ කිරීමේ අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ නිසා අපි ඒ සාගර සම්පත් ආරක්ෂා කර ගන්නේ කොහොමද, අපි අනුගමනය කරන්න ඕනෑ මොන වාගේ ප්‍රතිපත්තිද කියන එක මේ විශ්වවිද්‍යාලය හරහා, ඒ පර්යේෂණ හරහා හඳුන්වා දෙන්නත් අපට පුළුවන් වෙනවා.

අවසාන වශයෙන් මා මේ කරුණ අවධානයට යොමු කරනවා. මේ සාගර විශ්වවිද්‍යාලය හරහා අපේ තරුණ තරුණියන්ගේ විරැකියාව අඩු කිරීමට නම්, ඒ අදාළ පුහුණුවීම්, ඒ පාඨමාලා ජාත්‍යන්තරයට ගැළපෙන අන්දමින් අපි සකස් කළ යුතුයි. ඒ තරුණ තරුණියන් මේ විශ්වවිද්‍යාලයෙන් එළියට ගියාම හුදෙකලා නොකර, ඒ අයට අවශ්‍ය රැකියා අපි මේ රටේ නිර්මාණය කළ යුතුයි. එක්කෝ ඒ අයට රජයේ රැකියා දෙන්න වෙනවා. එහෙම නැති වුණොත් මේ රටේ තරුණ අසහනය වර්ධනය වෙනවා. නැත්නම් ඒ අය මේ රට අතහැර යනවා. ඒ කරුණු අවධාරණය කර ගෙන ඉදිරියට යමු කියමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු ගීතාංජන ගුණවර්ධන මහතා නියෝජ්‍ය අමාත්‍යතුමා. එතුමා නැහැ.

ගරු ෆීලික්ස් පෙරේරා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.04]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පිහිටුවීම පිළිබඳව පළමුවෙන්ම අපේ ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතුමා 1999 ජුනි 23 වන දා මේ පනත පාර්ලිමේන්තුවට ගෙනාපු වෙලාවේ ජේවීපී එකේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, "මේක මොකටද, මේක ඉංජිනේරු ආයතනයක් " කියලා. එතකොට ජනාධිපතිතුමා කිව්වා, "මේක මුල් පියවර. අනෙක් කටයුතුත් අපි කරනවා" කියලා. නමුත් 2001 දී ඒ ආණ්ඩුව පැරදුණා. නමුත් අද එතුමාගේ ප්‍රාර්ථනාව ඉෂ්ට කිරීමට අපේ පක්ෂයේ භාණ්ඩාගාරික, අපේ හිතවත් ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමා මේ කටයුත්ත කරනවා. එතුමා පක්ෂයට විතරක් නොවෙයි, සාගරයටත් භාණ්ඩාගාරික වේවායි කියන එකයි මගේ ප්‍රාර්ථනාව. ඒ මොකද කියනවා නම්, අපි සාගර සම්පත හරියට කළමනාකරණය කළොත් අපට පුළුවන් විශාල විදේශ විනිමයක් ලබා ගැනීමට.

අපි මේ ගැන කථා කරන්න ඕනෑ ප්‍රධාන දෙයක් තිබෙනවා. අපේ ධීවර කාර්මිකයන් ඉන්නේ 218,000යි. ජනගහනය ප්‍රතිශතයක් වශයෙන් බලද්දී ඒ ප්‍රමාණය සියයට 1ටත් අඩුයි. ධීවර කර්මාන්තයේ යෙදෙන පවුල් හැටියට බලද්දී පවුල් ලක්ෂ 15ක් ඉන්නවා. නමුත් කර්මාන්තයේ යෙදෙන ධීවර කාර්මිකයන් ඉන්නේ 218,000යි.

මුහුදට භය නැති අය අපි දැක්කා. මුහුදට භය නැති නිසා තමයි බෝට්ටුවල නැඟිලා ඕස්ට්‍රේලියාවට පැනලා යන්නේ. ඒකට හේතුවක් තිබෙනවා. ඒ හේතුවට පිළියම් කිරීමට අපේ ඇමතිතුමාට පුළුවන් වේවි.

ධීවර කටයුතුවලට තාක්ෂණය ලබා දෙන්න ඕනෑය කියන නිගමනයේ අපි සියලු දෙනාම ඉන්නවා. මේක මහා සාගරයක්. සාගරය කියන එක සම්පතක්. පුංචි මාළුවාගේ සිට මුතු ඇටය දක්වා සාගරයෙන් නෙළා ගන්න පුළුවන්. සාගරය ගැන කථා කරද්දී ලෝකයට එවන ඔක්සිජන් ප්‍රමාණය ගැන හිතන්න පුළුවන්. ගොඩබිම කඳුවලට වඩා විශාල කඳු සාගරයේ තිබෙනවා. සාගරය ගැන කථා කරද්දී, ඊට සුදුසු ඇමති කෙනෙක් අපට ලැබිලා තිබෙනවා.

සාමාන්‍යයෙන් කථාවක් තිබෙනවා, තල්මසෙකු වෙන්න එපා, ඩොල්ෆින් මාළුවෙක් වෙන්න කියලා. ධීවරයා ආදරේ ඩොල්ෆින් මාළුවාට. නාවිකයෝ ආදරේත් ඩොල්ෆින් මාළුවාට මිසක් තල්මසාට නොවෙයි.

ධීවරයාට ප්‍රමුඛත්වය දෙන්න කටයුතු කරන්න කියලා තමයි මම ඉල්ලන්නේ. අද දෙවන පරම්පරාව ධීවර කර්මාන්තයේ යෙදෙන්නේ නැහැ. ඒ අය බොහෝ දෙනෙක් තාක්ෂණයත් එක්ක handphones අරවා මේවා භාවිත කරමින් laptops අතේ තියා ගෙන සිටිනවා මිසක් මුහුදට යන්න කැමැති නැහැ. නමුත් හොඳ වේතනයක් ලැබෙනවා නම්, හොඳ income එකක් ලැබෙනවා නම්, තාක්ෂණය හොඳට පුරුදු කරනවා නම්, ආර්ථිකය ශක්තිමත් වෙනවා නම් හැමෝම කැමැත්තෙන් මුහුදට යයි. ඒ ආරක්ෂාවත්, තාක්ෂණයත් වාගේම තවත් නොයෙක් දේවල් අප ලබා දෙන්න ඕනෑ.

මේ රට මුහුදෙන් වට වූ රටක්. එම නිසා සාගරය සම්බන්ධව බිහි කරන්න ඕනෑ මහා ඇදුරන් නොවෙයි; මහා ආචාර්යවරු නොවෙයි. ප්‍රායෝගිකව ජනාධිපතිතුමාත් ඒක කියලා තිබුණා. මේ පාඨමාලා හැදෑරීම සඳහා සිසුන් බඳවා ගැනීමේදී ධීවර ප්‍රජාවගේ දරුවන්ට තැනක් දෙන්න කියලා මා ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. ඒක තමයි අපේ ප්‍රාර්ථනාව. එහෙම කළොත් තමයි මේ කර්මාන්තය දියුණු කරන්න පුළුවන්. ධීවර පවුල්වල උපදින දරුවන්ට සාගරය ගැන මහාචාර්යවරු දක්වා ඉගෙන ගැනීමට අවශ්‍යතාව තිබෙන්න පුළුවන්; ලබා ගන්න පුළුවන්, වෘත්තියට අදාළව.

දැන් බලන්න, කොරියාවේ රැකියා සඳහා අපෙන් කට්ටිය ඉල්ලනවා. කට්ටියක් ඕස්ට්‍රේලියාවට යනවා. තව කට්ටියක් කොරියාවට යනවා. ඊට පස්සේ කොරියන් නැව් ඇවිල්ලා අපේ මුහුදේ මාළු අල්ලාගෙන යනවා; අපේ මත්ස්‍ය සම්පත නැති වනවා. ඊට පස්සේ අපට මසුන් ආනයනය කරන්න තමයි වෙන්නේ. ඉතින් මෙවැනි කරුණු කාරණා ගැන අපේ ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. එතුමා හොඳ කළමනාකරණයක් තිබෙන කෙනෙක්. එතුමා අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ හිටපු ඇමතිවරුන් විවේචනය නොකරමින් තමන්ගේ වැඩ කටයුතු කරගෙන යන කෙනෙක්. ඒකත් සුවිශේෂ ලක්ෂණයක්. ප්‍රවාහන අමාත්‍යවරයා වශයෙන් එතුමාත් කටයුතු කළා, මාත් කටයුතු කළා. එතුමා භාර ගත් තැන ඉඳලා ඉස්සරහට යන අමාත්‍යවරයෙක්. [බාධා කිරීමක්] ඔව්, පිටුපස බලලා අඩු පාඩු කියන කෙනෙක් නොවෙයි. භාරගත් තැන ඉඳලා ඉස්සරහට යන ඇමතිවරයෙක්. ඒ නිසා අපි එතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා. එතුමා positive thinking තිබෙන කෙනෙක්. ඒ නිසා අපි හිතනවා, අපට මේ කාර්ය කරන්න පුළුවන් වෙයි කියලා.

කථාවක් තිබෙනවා නේ, "පවස නිවන දිය බිඳක් නොවී ඇයි මහා සාගරයක් වූයේ" කියලා. මහා සාගරයක් වුණාට එයින් වතුර ටිකක් බොන්න බැහැ. මහා සාගරයේ ලුණු හැදිලා තිබෙන්නේ ජලය ගලන්නේ නැති නිසා කියලා එක්තරා කෙනෙක් කියලා තිබෙනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. ජලය ගලන්නේ නැති නිසා මහා සාගරයේ ලුණු තිබෙනවාය කියනවා. දැන් බේරේ වැව බලන්න. ජලය පල් වෙලා නිසා කොළ පාට වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ පාට තමයි බේරේ වැවට ඇවිල්ලා තිබෙන්නේ, පල් වෙලා නිසා.

විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ තාක්ෂණය පාවිච්චි කරලා මුහුද හරහා අපට ලොකු දෙයක් කරන්න පුළුවන් බව.

මේ සාගර විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු සරල විධියට ත්‍රෛ භාෂාවෙන්ම කළොත් හොඳයි. අපේ වාසුදේව නානායක්කාර ඇමතිතුමා ත්‍රෛ භාෂාව පිළිබඳව සුවිශේෂයෙන් කටයුතු කරනවා. ධීවර දරුවන්ගේ ආවේණික භාෂාවෙන් ඉගෙන ගෙන ඒ උපාධිය ලබා ගන්නත්, ඒ තනතුරු සඳහා අවශ්‍ය ශක්තිය ලබා ගන්නත් හැකි වන පරිදි භාෂා තුනෙන්ම ඉගැන්වීමේ කටයුතු කරන්න කියලා ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා. එයට හේතුවක් තමයි, ධීවර කර්මාන්තයේ ඉන්න අයගෙන් වැඩි පිරිසක් උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ජීවත් වන අය වන නිසා. මුහුද අරගෙන බැලුවොත්, මුහුදෙන් තුනෙන් දෙකක් අයත් වන්නේ උතුරු නැඟෙනහිරටයි. උතුරු නැඟෙනහිර ද්‍රවිඩ ජනතාවත් ඉන්නවා; මුස්ලිම් ජනතාවත් ඉන්නවා. මේ ද්‍රවිඩ ජනතාවත්, මුස්ලිම් ජනතාවත් වැඩි වශයෙන් භාවිත කරන පොදු භාෂාව තමයි ද්‍රවිඩ භාෂාව. එම නිසා ඒ ගැනත් හිතන්න කියලා

ගරු ඇමතිතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා. එසේ කළොත් තමයි මෙයින් ප්‍රයෝජනයක් ලැබෙන්නේ. තාක්ෂණය භාවිතයෙන් තමයි මාළු ඇල්ලීම කරන්න පුළුවන් වෙන්නේ.

ඊළඟට, මේ bottom trawling කියන එක අපි පොඩ්ඩක් නතර කර දමන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා මේකට පිළියමක් යොදන්න. ඔබතුමාට මේක කොහොම හරි නතර කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඔබතුමා කියන ඒවා ආණ්ඩුව සමස්තයක් වශයෙන් පිළිගන්නවා. නමුත් ඔබතුමාට පක්ෂයේ ලොකු තනතුරක් නම් ලැබිලා නැහැ. ඇමතිතුමනි, අපේ මත්ස්‍ය සම්පත සම්පූර්ණයෙන්ම භාරගෙන අරගෙන යන තත්ත්වයක් තිබෙනවා. Indian Ocean Tuna Commission - IOTC - එකේ සාමාජිකත්වය අපි ලබාගෙන තිබුණා. අපේ නිලධාරින් ඒ සම්මේලනයට යැව්වා. ගිය අවුරුද්දේ තමයි මාලදිවයින එහි සාමාජිකත්වය ලබාගෙන තිබෙන්නේ. ඉතාම වැදගත් කාරණයක් විධියට මෙය හඳුන්වන්නට බැහැ. අපි මහද්වීපයක් නම්, quota system දමලා මේ මාළු ඇල්ලීම කළාට කමක් නැහැ. නමුත් අපේ රට දූපතක්. ලංකාව වටේටම තිබෙන්නේ මුහුද. ඒ නිසා මේ කරුණු කාරණා ගැන ගරු ඇමතිතුමා හොඳට කල්පනා කරලා කටයුතු කරන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Trawling කරන්නේ කවුද?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මම දන්නේ නැහැ, කවුද කරන්නේ කියලා. Trawling කරන්නේ ධීවර කර්මාන්තයේ යෙදෙන අය මිසක් දේශපාලනඥයෝ නොවෙයි නේ. [බාධා කිරීමක්] මම දන්නේ නැහැ, ඕවා මට කියන්න එපා. කොහොම වුණත්, ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරන අපේ රටේ ධීවර කර්මාන්තය රැක ගැනීම ගැන අපි කල්පනා කරන්නට ඕනෑ.

ධීවරයා බය නැහැ. එයට උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. මා ධීවර හා ජලජ සම්පත් ඇමතිවරයා වශයෙන් කටයුතු කරපු කාලයේ සුනාමි ව්‍යසනයෙන් පසුව ධීවර වරායන් 18ක් හැදුවා. පානදුරේත් ධීවර වරායක් හදන්න චීනය භාර ගත්තා. එහි ධීවර වරායක් හැදුවා. නමුත් අසාර්ථක වුණා. නැවත වරක් රුපියල් ලක්ෂ 3,000ක් දුන්නා. ඒකත් අසාර්ථක වුණා. පස්සේ අසාර්ථක වුණේ ඇයි කියලා ධීවරයන්ගෙන් ගිහින් අහපුවාම මොකද කිව්වේ? අපේ අදහස් ගත්තේ නැහැ යි කියලායි ඒගොල්ලන් කිව්වේ. ඒ ධීවරයන්ගෙන් අදහස් ගත්තා නම් හරි. ඒගොල්ලෝ දන්නවා සැලැස්ම හැදෙන්න ඕනෑ කොහොමද කියලා. මුහුද ගැන අපි කල්පනා කරද්දී, මුහුද පිළිබඳව හොඳම අදහස් තිබෙන්නේ ප්‍රායෝගිකව මුහුද ආශ්‍රිතව ඉන්න අයට. ඒ කාලයේ Vessel Monitoring System තිබුණේ නැහැ. ඉර බලලා, හඳ බලලා, තරු බලලා තමයි ගොඩට ආවේ. මුහුද මැදට ගියාම කොහේවත් පෙනෙන්නේ නැහැ. කොතැන ඉන්නවාද කියලා දන්නේත් නැහැ. නමුත් ඉර, හඳ, තරු බලලා ගොඩට එන්න පුළුවන් හැකියාවක් ධීවරයාට තිබුණා නම්, ධීවරයාට තාක්ෂණයත් දුන්නොත් කොහොම කටයුතු කරයිද? මාළු ඉන්න තැන් පෙන්වන්න පුළුවන්. දැන් Vessel Monitoring System එකක් හදන්න පුළුවන්. ඒවාට යන පිරිවැය කොච්චර ද කියා ඔබතුමාට බලන්නට පුළුවන්. ඔබතුමාටත් මේ සාගර විශ්වවිද්‍යාලය තුළ අත් හදා බැලීම් කරන්නට පුළුවන්. මහාචාර්යතුමා මෙහි ඉන්නවා. එතුමාට පුළුවන් වේවි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමා, ඔබතුමාට නියමිත කාලයෙන් තව විනාඩි දෙකක කාලයකුයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ඉතාමත් කෙටි කර ඉක්මනින් අවසාන කරන්නම්.

මේ රටේ ධීවර කර්මාන්තය වෙනුවෙන් යම් දෙයක් කළා නම් ඒ කළේ අපේ අතිගරු ජනාධිපතිතුමායි කියන එක මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. එතුමා ඒවා කොහොම කළා ද කියා කියනවා නම්, එක්සත් ජාතික පක්ෂ රජයේ කාලයේදී ජලජීවී වගාවත් නතර කර දැම්මා, බාරයක් වෙලා. අපේ ජනාධිපතිතුමා ඇවිල්ලා අද නැවත වරක් මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන හදලා තිබෙනවා. අභ්‍යන්තර ජලාශවල මසුන් ඇති කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අද රට මැද ඉන්න මිනිසුන්ටත් මාළු කෑල්ලක් කන්න පුළුවන් වෙලා තිබෙනවා. එම නිසා මේ සම්බන්ධයෙන් අපේ ආණ්ඩුවට අභියෝග කරන්නට කිසිම කෙනෙකුට බැහැ. මොකද අපේ ආණ්ඩුව ගත් ප්‍රතිපත්ති තීන්දුව උඩ තමයි අද මේ කර්මාන්තය කර ගෙන යන්නේ. මේකත් හොඳ ප්‍රතිපත්ති තීන්දුවක්. මේ ගත් ප්‍රතිපත්ති තීන්දුවේ ප්‍රතිඵල අපට අනාගතයේදී පෙනේවි. ඒක හරියට කර ගත්තොත් අපටම නැව් ටික හදා ගන්නටත් පුළුවන්.

මා ධීවර අමාත්‍යවරයා හැටියට කටයුතු කළ කාලයේ බෝට්ටුවක් හැදුවා මට මතකයි. Engine එකෙනුයි, රුවලෙනුයි දෙකෙන්ම බෝට්ටුව ගෙනි යන්න පුළුවන්. Mr. Pierre Pringiers කියන බෙල්ජියමේ තානාපතිතුමා තමයි ඒකට ආධාර කළේ.

NARA ආයතනයෙන් පර්යේෂණයක් කළා. මුහුදේ බෝට්ටුව යනකොට සුළඟ එද්දී සුළඟ පාවිච්චි කරලා බෝට්ටුව පදවාගෙන යනවා. බෝට්ටුව පදවන්න රුවල අතින් අදින්න ඕනෑ නැහැ. Switch එක දැම්මාම රුවල වැඩ කරනවා. තත්පර දෙකයි යන්නේ switch එක දාන්න. එයින් ඉන්ධන පිරිවැයත් ගොඩක් අඩු කර ගන්නට පුළුවන් වෙනවා. ඒ වාගේ පර්යේෂණ ඔබතුමා කළොත් ඉන්ධන සහනාධාරය දෙන්න අවශ්‍ය වන්නේ නැහැ. ධීවරයා යාචකයෙක් නොවෙයි. ධීවරයාට මාළුවෙක් දෙන්න ඕනෑ නැහැ, බිලී පිත්තක් දෙමු. බිලීපිත්තක් දීමේ හැකියාව තිබෙන්නේ අපේ දක්ෂ ඇමතිතුමාටයි කියන එක මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. තව බොහෝ මන්ත්‍රීවරුන් කථා කරන්නට සිටින නිසා මා වැඩිපුර කාලය ගන්නේ නැහැ.

මේ රටේ මාළු ආනයනය, අපනයනය යන දෙකම කරනවා නේ. අප මොනවා කථා කළත්, අපේම මාළු ටික අල්ලාගෙන ගිහිල්ලා, අපේම මාළු ටික මෙහාට එවන කට්ටියකුත් ඉන්නවා. මුහුද මැදදී මාරු කර ගන්නා අයත් ඉන්නවා.[බාධා කිරීම්] එහෙම නොවෙයි. ඉන්න ඉන්න. මා කියන්නම්. මා කාටවත් චෝදනා කරන්නේ නැහැ. මා මේ කාටවත් චෝදනා කරනවා නොවෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා කථාව අවසාන කරන්න. කාලවේලාව අවසානයි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මේ ධීවර කර්මාන්තයේ හැටියි ඒ. සමාවෙන්න. මා එහෙම කියන්නේ චෝදනාවක් හැටියට නොවෙයි. එදා ඉඳලා තිබුණු සිරිතක් ඒක. මොකද, අපේ තාක්ෂණය නැති කමින් තාක්ෂණය දන්නා අය තාක්ෂණය හරහා අපවත් පීඩනයට පත් කරනවා. අපේ මත්ස්‍ය සම්පත නෙළා ගන්නවා. තාක්ෂණය දන්නවා නම්, මෙහේ ඉඳලා ඒ ගැන බලන්න අපට පුළුවන් වෙනවා.

CCTV කැමරාව සවි කර ගත්තාම, ඔබතුමාගේ handphone එකෙන් ඔබතුමාට ගෙදර ගැන බලන්න පුළුවන් නේ. ලෙහෙසියෙන්ම පුළුවන්. ඒ වාගේ තාක්ෂණයක් තිබෙන මේ කාලයේ මේවා පොඩි ප්‍රශ්න. එම නිසා ධීවර විශ්වවිද්‍යාලය ආරම්භ කර ප්‍රායෝගික විධියට කටයුතු කොට අපේ ධීවර කර්මාන්තය රැක ගන්නය කියා මා ඉල්ලා සිටිනවා. මා යටතේත් ධීවර ඉංජිනේරු ආයතනය තිබුණා. ඒ අය අපත් එක්ක ඉතාමත් හොඳට වැඩ කළා. එහිදී ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පළමුවන උපාධි ප්‍රදානෝත්සවය තිබ්බා. ශිෂ්‍යයන්ගේ ප්‍රශ්නයක්ය කියලා අවුරුදු හතරක් ඇදි ඇදී තිබුණා. නමුත් අප ඒ ශිෂ්‍යයන්ට කථා කරලා කිව්වා," සල්ලි ඕනෑ නැහැ. නිකම් ඉගෙන ගන්නය "කියා. ප්‍රශ්නය විසඳා ගත්තා. ප්‍රායෝගිකව ඒ ප්‍රශ්නය විසඳා ගත්ත එකේ ප්‍රතිඵලයක් හැටියට තමයි ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පළමුවන convocation එක තිබ්බේ. මා ඔබතුමාට මේ කාරණය කියන්නට කැමැතියි. ඇමතිතුමා මටත් වඩා ප්‍රායෝගිකයි. එතුමා මේ කටයුත්ත කරාවි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. බොහොම ස්තුතියි.

ඊළඟට ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.16]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මට මේ සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මා සතුටු වෙනවා. මා මගේ කථාව ආරම්භ කරන්නට පෙර අපේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් වන ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමාගෙන් මේ කාරණය අහන්නට කැමතියි. එතුමා කිව්වා, මුහුද මැදදී මාළු ටික හුවමාරු කර ගන්නා අය මේ ආණ්ඩුවේ ඉන්නවාය කියා. මේ රටේ මාළු විකුණනවාය කිව්වා. මේවා සාමාන්‍ය මිනිසුන්ට කරන්නට බැහැ. මේ රටේ ආණ්ඩුවක් තිබෙනවා. ආණ්ඩුවක බලවතුන් ඉන්නවා. බලවත් ඇමතිවරු ඉන්නවා. ආරක්ෂකයෝ ඉන්නවා. මේ ඔක්කොම තියෙද්දී සාමාන්‍ය මිනිසුන්ට නම් මේවා කරන්නට බැහැ. ලාම්පුව පත්තු කර ගෙන බෝට්ටුවේ ගිහිල්ලා මුහුදේ මාළු අල්ලන දුප්පත් ධීවරයාට නම් මේවා හුවමාරු කර ගන්නට බැහැ. මූලාසානාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුද ඒ බලවතුන් කියා මා එතුමාගෙන් අහනවා. [බාධා කිරීම්] හරි. හරි. ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමනි, මා ඔබතුමාට බාධා කළේ නැහැ.

අපේ ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා මේ අවස්ථාවේ සභාවේ හිටියා නම් හොඳයි. ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා කථා කරද්දී දිගින් දිගටම ගරු ඇමතිතුමාට කිව්වා, "මේ නාකි ටික එළවන්න ඕනෑ"ය කියලා. මම දන්නා විධියට නම් එතුමාටත් දැන් වයස අවුරුදු 80කට කිට්ටුයි. ප්‍රශ්නය තිබෙන්නේ එතැනයි. මම දන්නේ නැහැ, "නාකි ටික එළවන්න ඕනෑ" කියන එකෙන් එතුමා බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියලා. එතුමා එහෙම හතර සැරයක් කිව්වා. තරුණ මන්ත්‍රීවරයෙකු වශයෙන් මම කියනවා, "නාකි එහෙම එළවන එකත් අසාධාරණයි" කියලා. මොකද, ඒගොල්ලන්ගේ තිබෙන අත් දැකීම්, පළපුරුද්ද යොදා ගන්න පුළුවන් නම් ඒ ගොල්ලන් තියා ගන්න ඕනෑ. ඊට පස්සේ අයින් කරන්න ඕනෑ කෙනෙකු ඉන්නවා නම් අයින් කරන්න. මොකද, අත් දැකීම් කියන ඒවා ලෙහෙසියෙන් ගන්න බැහැ නේ. කෙනෙකු පරිණත වෙන්න වෙන්න, වයසින් මුහුකුරා යන්න යන්න තමයි බොහෝ දේවල් පිළිබඳව අත් දැකීම් ලබන්නේ; හසළ දැනුමක් ඇති වෙන්නේ. ඒ අත් දැකීම්වලින් අපේ රටට ප්‍රයෝජනයක් ගන්න ඕනෑය කියන එකයි තරුණයෙකු විධියට මම නම් කියන්නේ. නමුත් වයස අවුරුදු අසූ ගණනකට කිට්ටු මන්ත්‍රීවරයෙකු විධියට එතුමා "නාකි එළවන්න ඕනෑ" කියලා දිගින් දිගටම කිව්වා. මම දන්නේ නැහැ, එතුමා එහෙම කිව්වේ මොකද කියලා. කෙසේ වෙතත් ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් එතුමා ඒ කාරණය කිව්වා.

අපි ස්තුතිවන්ත වනවා, ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාට. පුද්ගලයෙකු විධියටත් එතුමාට අපේ පොඩි ගරුත්වයක් තිබෙනවා. මොකද, එතුමා අලුත් වැඩක් කරන්න හදන කෙනෙක්. ඒ වාගේම අනික් අමාත්‍යාංශවලට වැඩිය එතුමාගේ විෂයය භාර අමාත්‍යාංශය හොඳ line එකක යනවා. ගොඩක් වෙලාවට එතුමා මේ තත්ත්වය තේරුම් අරගෙන තිබෙනවා. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පතට අපි සහයෝගය දෙනවා. ඒ වාගේම, මේ විශ්වවිද්‍යාලය තවත් දියුණු වෙලා අනාගතයේ දී තව ප්‍රගතිශීලී දේවල් එයට එකතු වේවි කියා අප බලාපොරොත්තු වෙනවා. මෙය ආරම්භය විතරයි. පොඩි පොඩි අඩු පාඩු තිබෙනවා. නමුත් ඒ අඩු පාඩු හදාගෙන ඉදිරියට යන්න ඕනෑ. මම ඇත්තටම ඒ අඩු පාඩු ගැන කථා කරන්න බලාපොරොත්තු වන්නේත් නැහැ. මොකද, ඊට වැඩිය මේක හොඳ දෙයක්. ඕනෑම දෙයක් පටන් ගනිද්දී අඩු පාඩු තිබෙන්න පුළුවන් නේ. ඒ නිසා අපි අඩු පාඩුම කිය කියා ඉන්න හොඳ නැහැ. නමුත් මේ කටයුත්ත පටන් අරගෙන තිබෙනවා. මේකේ අරමුණ හොඳයි; පදනම හොඳයි. ඒ නිසා මේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ආරම්භ කිරීම පිළිබඳව, විපක්ෂය හැටියට අප එතුමාට ස්තුතිවන්ත වන්න ඕනෑ. ඒ වාගේම -

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව ලබා දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අපේ ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාට කථා කරන්න අවසර ලබා දෙනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මෙය ගෞරවයෙන් කරන ඉල්ලීමක්. ඔබතුමා education එක බාර shadow minister විධියට, මට පුංචි මතයක් කියන්න. විජිත හේරත් මන්ත්‍රීතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. අපේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාත් ගියා. එතුමන්ලාට උත්තර දෙන්න විධියක් නැති නිසයි මම මේ ප්‍රශ්නය අහන්නේ. එක්සත් ජාතික පක්ෂයේ මතය ගැනයි මම අහන්නේ. විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා, "1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට මේක ඇතුළු කරන්න" කියලා. මේ දරුවන්ටත් තරගකාරි විභාගයකින් - Z-score එකෙන් - මේ විශ්වවිද්‍යාලයට ඇතුළත් වන්න පුළුවන් වන විධියට හදන්න කියලානේ කියන්නේ. ඒක එක්සත් ජාතික පක්ෂය ඉන්න මතයද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
එහෙම මතයක අපි තවම නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මෙය විශේෂ කාර්යයක්.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඒක තමයි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඔබතුමාට මම කියන්නම්. අපි පිළිගන්නේ මේක විශේෂ විශ්වවිද්‍යාලයක් හැටියටයි. [බාධා කිරීමක්] ඒ වාගේ. විභාග පාස් වන්නේ නැතිව පිට රටට ගිහිල්ලා භාෂාව ඉගෙන ගෙන එන අය ගොඩක් ඉන්නවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
බොහොම ස්තුතියි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
විශේෂඥයින්ගේ දැනුම අරගෙන මේ ගැන තවදුරටත් අප සාකච්ඡා කරන්න ඕනෑ. එය එක පාරටම කියන්න අමාරුයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම නැවත වතාවක් ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අමාත්‍යතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහිත් යොමු කරන්න ඕනෑ. ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව මේ රටේ වයස අවුරුදු 5ට වැඩි ජනගහනය එක්කෝටි අසූපන්ලක්ෂ විසිහත්දාස් හයසිය අසූතුනක් වනවා. අපි විශේෂයෙන් මේ කාරණය කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ. මම හිතනවා, ඔබතුමා ඒ කාරණය කෙරෙහි අවධානය යොමු කර තිබෙනවාය කියලා. පාසල් නොයන අය සියයට 3.8ක් ඉන්නවා. 1 වසරේ සිට 5 වසර දක්වා පමණක් පාසල් යන ළමුන් සියයට 23.6ක් ඉන්නවා. 6 වසරේ සිට 10 වසර දක්වා පාසල් යන අය -O/Levelවත් නැති අය- සියයට 40ක් ඉන්නවා. මේ රටේ ජනතාවගෙන් O/Levelවත් නැති අය සියයට 40ක් ඉන්නවා. O/ Level හා සමාන අය සියයට 17ක් ඉන්නවා. A/Level හා සමාන අය සියයට 12ක් ඉන්නවා.

ගරු ඇමතිතුමනි, උපාධිධාරින් ඉන්නේ සියයට 2.7යි. ඒ කියන්නේ, යමක් හිතන්න පුළුවන්, ඉහළ මට්ටමේ අය ඉන්නේ සියයට 2.7යි. සියයට 70ක් විතර ඉන්නේ අඩුම ගණනේ O/Level සුදුසුකමවත් නැති අයයි. දේශපාලන අවබෝධයක් නැති නිසා ගොඩක් අය මෙතැනට එවන්නේ වෙන වෙන තැන්වල "hit" වන අයයි. කථාවක් තිබෙනවානේ, "Any publicity is better than no-publicity" කියලා. ජරා වැඩක් කරලා කුමන හෝ ක්‍රමයකින් ජනප්‍රිය වෙලා මාධ්‍යවල මතු වුණාම ඒගොල්ලන්ට ලක්ෂ ගණන්වලින් ඡන්දය දෙනවා. මැරකමක් කරලා හරි කමක් නැහැ එනවා. මම හිතන හැටියට ඒ නිසා තමයි, ඒ අය ඒ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ.

ගරු අමතිතුමනි, O/Levelවත් නැතිව ඉන්න සියයට 70ක් වාගේ පිරිස කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ අමාත්‍යාංශයට තමයි ඒ පිළිබඳව විශාල වගකීමක් පැවරී තිබෙන්නේ. ඒ නිසා ඔබතුමා මේ කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ. මම කලින් කිව්වා වාගේ මේ අය පිළිබඳව අලුතෙන් හිතලා අනාගතයේදී මේ අයට රැකියා අවස්ථා ඇති කරන්නේ කොහොමද, මොන අංශවලින්ද කියන එක පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. අපිට ගොවිතැන මත පමණක් යැපෙන්න බැහැ. ඒකෙන් අදහස් කරන්නේ නැහැ, ගොවිතැනෙන් ඈත් වනවා කියලා. නමුත්, ගොවිතැන් කටයුතුවල යෙදෙන ප්‍රමාණය අද අඩු වෙලා තිබෙනවා. අද ගොවිතැන් කටයුතුවල යෙදෙන අයත් ඵලදායීතාව වැඩි කර ගන්නා ක්‍රමවේද අනුගමනය කරනවා.

අපේ රටේ සිටින ශ්‍රමිකයින් විවිධ අංශවලට යොද වන්නේ කොහොමද? දැන් බලන්න, පිලිපීනය දිහා. පිලිපීනය ලෝකයටම නාවිකයෝ සපයනවා. පිලිපීනය ලෝකයටම හෙදියෝ සපයනවා. ඒ වාගේම මානව සම්පත දියුණු කරන්නේ කොහොමද කියලා අපි බලන්න ඕනෑ. මානව සම්පත දියුණු කරන්න නම්, එක එක ක්ෂේත්‍ර ඔස්සේ ශ්‍රමිකයින් යොද වන්නේ කොහොමද කියන එක ගැන අපි අවධානය යොමු කරන්න ඕනෑ.

දැන් බලන්න, ඉන්දියාවේ බැංගලෝර් වාගේ ප්‍රදේශවල තොරතුරු මධ්‍යස්ථාන - IT centres - තිබෙනවා. පරිගණක මධ්‍යස්ථාන ඇති කරලා තිබෙනවා. ඉන්දියාවේ බැංගලෝර් වාගේ ප්‍රදේශවලින් ලෝකයටම IT engineersලා දෙනවා. බලන්න, ඒකෙන් එන විදේශ විනිමය. එක් පැත්තකින් රටට විදේශ විනිමය එන විධියටයි අපි අධ්‍යාපනය යොමු කරන්න ඕනෑ. එනම්, රටට ආර්ථික වශයෙන් වාසිදායක වන විධියට. කියුබාව විශාල වශයෙන් වෛද්‍යවරු බිහි කරනවා. මම එක සැරයක් ඒ රටට ගියාම දැක්කා, -අපේ මහ ලේකම්තුමාත් ගියා.- ඒ රටේත් නොමිලයේ ශිෂ්‍යත්ව පවා ලබා දෙනවා. කියුබාව විශාල වශයෙන් වෛද්‍යවරු සහ හෙදියෝ බිහි කරනවා. ඒ රටේ හැම තැනකම වාගේ ඒගොල්ලන් වෘත්තිකයන් වශයෙන් පුහුණු කරන හොඳ training centres තිබෙනවා. කියුබාවයි, වෙනිසියුලාවයි අතර agreement එකක් තිබෙනවා. මේ හුවමාරුව මොකක්ද? කියුබාවෙන් වෛද්‍යවරු වශයෙන් එළියට යන හැම කෙනෙක්ම අවුරුදු තුනක් ගියාට පස්සේ වෙනිසියුලාවට සේවය ලබා දෙන්න ඕනෑ. ඒකේ අනෙක් පැත්ත තමයි, වෙනිසියුලාවෙන් පෙට්‍රල්, ඩීසල් ටික ඔක්කෝම කියුබාවට නොමිලයේ හම්බ වනවා. ඒ අනුව කියුබාවේ වෛද්‍යවරු 15,000ක් වෙනිසියුලාවේ ඉන්නවා. වෙනිසියුලාවෙන් පෙට්‍රල්, ඩීසල් සහ බොර තෙල් ටික නොමිලයේ කියුබාවට හම්බ වනවා. බලන්න, ඒ රටවල් මානව සම්පත තුළින් කොපමණ ආර්ථිකමය වාසියක් ලබා ගෙන තිබෙනවාද කියලා. අන්න ඒකයි අපි කියන්නේ, මානව සම්පත කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑය කියලා. පාරවල් carpet කරලා, අරවා මේවා හදලා පමණක් රටට ප්‍රයෝජනයක් අත් වන්නේ නැහැ. ඊට වැඩිය සම්පතක් අපට තිබෙනවා. ඒ මානව සම්පතයි. ඊට වඩා වටින වෙන සම්පත් අපට නැහැ.

ඒ වාගේම ලෝකයේ සිටින බොහෝ අය අතර තිබෙන අදහසක් තමයි, වෙන රටවල සිටින ශ්‍රමිකයින් එක්ක බැලුවාම නිර්මාණශීලී හැකියාව වැඩි, ඉදිරියට ගිය, හිතලා වැඩක් කරන්න පුළුවන් ශ්‍රමිකයෝ ලංකාවේ ඉන්නවා කියන එක. අපි මේ තත්ත්වය දියුණු කරන්න අවශ්‍ය පදනම දමන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මේ සඳහා තමුන්නාන්සේගේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අවධානය යොමු වන්න ඕනෑ. අපේ රටේ සිටින මේ ප්‍රමාණය සියයට 70ක් වාගේ වනවා. මේ ප්‍රමාණයට අනාගතයේදී රැකියා ලබා දෙන්නේ කොහොමද කියලා අපි හිතන්න ඕනෑ. ඒ රැකියා සාමාන්‍ය රැකියා නොවෙයි.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

වර්තමානය වන විට ආණ්ඩුවේ රැකියා කරන ලක්ෂ 17ක් පමණ ඉන්නවා. නමුත්, රජයේ සේවයෙන් විශ්‍රාම ගිය අයට විශ්‍රාම වැටුප ගෙවා ගන්න අපට බැහැ. ආණ්ඩුවට රජයේ සේවකයින්ගේ මූලික වැටුප වැඩි කරන්නත් බැහැ. ඒ වාගේම විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා ගන්නත් බැහැ. විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගන්න බැරිව 17,000ක් පමණ ඉන්නවා. මේකයි යථාර්ථය. එතකොට අපි කල්පනා කරන්න ඕනෑ අපි අලුත් මාර්ගවලට යනවාද කියන එක. මොනවාද අලුත් මාර්ග? අලුත් මාර්ග තමයි, ලෝකයේ වෙනස් වන වටපිටාවත් එක්ක අපේ පාඨමාලාත් රැකියා අභිමුඛ පාඨමාලා වන්න ඕනෑය කියන එක. අනෙක් අංශ දුර්වල කරන්න ඕනෑය කියලා ඒකෙන් අදහස් වන්නේ නැහැ. අපේ අවශ්‍යතාව මත ඒවා නිර්මාණය වන අතර, රැකියා අභිමුඛ පාඨමාලා ඇති වන්න ඕනෑ.

දැන් බලන්න, 2001-2004 කාලයේ රාජගිරියේ පිහිටු වූ HSBC එකේ BPO - Business Process Outsourcing - ආයතනය. මේකේ තවම පුරප්පාඩු - vacancies - තිබෙනවා. ඇමෙරිකාවේ, ඒ වාගේම යුරෝපීය රටවල ශ්‍රමයට කරන ගෙවීම වැඩියි. ඒ රටවල dollarsවලින්, eurosවලින්, එහෙම නැත්නම් යෙන්වලින් තමයි ගෙවීම් කරන්නේ. මේ රටවල් ඔක්කෝම ඉල්ලුම හා සැපයුම මත නේ ක්‍රියා කරන්නේ. අන්තිමට ලාභය පදනම් කර ගෙන නේ දියුණු රටවල් තීරණ ගන්නේ. ඒගොල්ලන් මොකද කරන්නේ? අපි වාගේ රටවලට අන්තර්ජාලයෙන්ම තොරතුරු දෙනවා. එතකොට ඒ දත්ත සකසන එක ඇතුළු ඒ ඔක්කෝම කටයුතු BPOsවලින් කෙරෙන්නේ. ඒ වාගේ දේවල් කරලා ආපහු අන්තර්ජාලය හරහාම ඒ රටවලට තොරතුරු යවනවා. එතකොට බලන්න, අපේ රටට කොපමණ විදේශ විනිමයක් එනවාද කියලා. අපේ රටේ තොරතුරු තාක්ෂණය - IT - හා සම්බන්ධ අංශ දියුණු කළොත් හොඳයි. මම හිතන හැටියට ඒකට උපාධිකාරයෝ ඕනෑ නැහැ, A/Level pass අය ඕනෑ නැහැ. සමහර විට තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් මූලික දැනුමක් තිබෙනවා නම්, O/Level පමණක්වත් තිබෙනවා නම්, ඒ සඳහා ප්‍රමාණවත්. කොම්පියුටරය අත පත ගාලා ඒක ඉගැන්වීම හරියට කරලා ඒ අධ්‍යාපනය ලබා දුන්නොත් අවුරුදු හතරක් විතර යනකොට ඒ අංශයෙන් හොඳ දියුණුවක් ලබා ගන්න පුළුවන්. දැන් NIBM එකෙන් ඒක කරනවා. ඒ වාගේ ආයතන තවත් තිබෙනවා. නමුත්, ඒක ප්‍රමාණවත් මදි. ඒ වාගේම ඒ ආයතනවල quality එක වැඩි කරන්න ඕනෑ. ඒ වාගේම තවත් වැඩි පිරිසක් ඒ සඳහා යොමු කරන්න ඕනෑ. ඒක රජයෙන් කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. මොකද, සමහර අයට මුදල් ගෙවා ඉගෙන ගන්න විධියක් නැහැ. මම කනගාටුවෙන් වුවත් කියනවා, නිදහස් අධ්‍යාපනය කියලා කිව්වාට අද නිදහස් අධ්‍යාපනයක් නැහැ. හැම තැනම හැම දේම කෙරෙන්නේ සල්ලිවලට.

අනුලා විද්‍යාලයේ විදුහල්පතිතුමිය දෙමව්පියන්ට යවා තිබෙන ලිපියක් මම දැක්කා. එම ලිපියේ රුපියල් අටදහස් ගණනක හා නවදහස් ගණනක මුදලක් සඳහන් කරලා තිබෙනවා. "එම මුදල් ගෙව්වේ නැත්නම් ඔබේ දරුවාව පාසලට භාර ගැනීමට නොහැකියි" කියලා ඒ ලිපියෙන් කියනවා. දැන් රජයේ පාසල් පවා පෞද්ගලික පාසල් මට්ටමට ඇවිත් තිබෙනවා. මේක ඉතාම භයානක තත්ත්වයක්. මේ රටේ අහිංසක ගොවීන්ගේ, කම්කරුවන්ගේ දරුවන්ට එහෙම මුදල් ගෙවීමට ශක්තියක් නැහැ. ඒ අයට තුන් වේලවත් කන්න විධියක් නැහැ. අද විදුලි බිල අහස උසට නැගලා. විදුලි බිල වැඩි කරලා විදුලිබල මණ්ඩලයේ පාඩුව අවම කර ගත්තා. දැන් ලාභ ගන්න හදනවා. මිනිසුන්ට ඒ බර දමලා ආණ්ඩුව ඒකෙන් ඈත් වෙනවා. මේ දේවල් ගැන මීට වඩා ගැඹුරින්, පුළුල්ව හිතන්න ඕනෑ කාලය ඇවිත් තිබෙනවා කියලායි අප කියන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒ දෙය කරන්න පුළුවන්.

උසස් අධ්‍යාපන අංශය ගත්තත්, අධ්‍යාපනය ගත්තත් මේක තේරුම් ගන්න බවක් නම් පෙනෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බලන්න, පසු ගිය කාලයේ කර තිබෙන දේවල්. මේ සිද්ධිවලට සම්බන්ධ ලියුම් සියල්ල මා ළඟ තිබෙනවා. මම එක සිද්ධියක් විතරක් කියන්නම්. ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක් පාර්ලිමේන්තු Letterhead එක පාවිච්චි කරලා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ලියුමක් යවා තිබෙනවා. සම්බන්ධීකරණ ලේකම්වරයෙකුට පාර්ලිමේන්තු Letterhead එක පාවිච්චි කරන්න බැහැ. උසස් අධ්‍යාපන ඇමතිවරයාගේ minute එකකුත් ගහලා එම ලිපියෙන් කියා තිබෙනවා, සානුකම්පික හේතු මත විශ්වවිද්‍යාලයට බඳවා ගන්න කියලා. සානුකම්පික හේතු මත විශ්වවිද්‍යාලයට බඳවා ගන්න පුළුවන්ද? මොන රටේද එහෙම වන්නේ? අපේ ආණ්ඩු කාලයේ "ජනසවිය" හිමිව තිබූ අයට ගුරු පත්වීම් දුන්න එකටත් මම විරුද්ධයි. ඒක තමයි මගේ පෞද්ගලික අදහස. එහෙම පත්වීම් දෙන්න හොඳ නැහැ. ගුරුවරු, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු කියන්නේ මේ රට ඉදිරියට ගෙන යන්න සිටින නියමුවන්. ඒ අය වෙන වෙන හේතු මත බඳවා ගන්න බැහැ. රටේ නීතියක් තිබෙනවා. ඒ සියලු නීති ක්‍රියාත්මක වෙන්නේ නැහැ. බලන්න, කොයි තරම් වැරදි පූර්වාදර්ශයක්ද කියලා. හරි නම් ඒ අදාළ නිලධාරියා ඉල්ලා අස් වෙන්න ඕනෑ. මෙහෙම කරන්න ගියාම මොකක්ද වන්නේ?

දැන් පාසල්වලට දේශපාලනඥයන් යනවා. එතුමන්ලා ගායකයන් එක්ක පාසල්වලට ගිහින් සුදුසු නැති සින්දු කියනවා. මම ඒ අවස්ථාවල ඒ තැන්වල නොසිටියත්, අපට ලැබෙන තොරතුරු අනුව ඒවා නිවැරදියි. ඒ නිසා මම කියන්නේ මේවා මෙසේ විය යුතු නැහැයි කියලායි. බලය තිබෙන එක් කෙනෙක් දෙන්නෙක් මෙහෙම කළාම අනික් අය හෙමිහිට මේවා කර ගන්නවා. මේක ඉතාම නරක තත්ත්වයක්.

තමුන්නාන්සේලා දකින්න ඇති, පසු ගිය දිනවල උසස් පෙළ විභාගයේ ආර්ථික විද්‍යා ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් මතු වුණු ගැටලුව. මේ රටේ A/Level විභාගයේ ප්‍රශ්න පත්‍ර හදන මහාචාර්යවරු 42ක් පමණ සිටිනවා. ඔය ආර්ථික විද්‍යා ප්‍රශ්න පත්‍රය සම්බන්ධව කියලා ඒ අයගෙන් 39දෙනෙක් අත්සන් කර ලිපියක් දුන්නා, ආර්ථික විද්‍යා ප්‍රශ්න පත්‍රය සකස් කරන Professor D. Atapattu මහතා ඉන් ඉවත් කරලා වෙන කෙනෙකුට ඒක දුන්නාය කියලා. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ කෙනෙකුට නොවෙයි එම ප්‍රශ්න පත්‍රය සකස් කරන්න දුන්නේ. වෙනත් අංශයක කෙනෙකුටයි. ඔහු තමයි පසු ගිය කාලයේ ප්‍රශ්න පත්‍රය හැදුවේ. එහෙම ප්‍රශ්න පත්‍ර හදලා ඇති වුණු ගැටලු ගැන ඔබතුමන්ලා දන්නවා නේ. කලින් මම මේ සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත් කරලා කරුණු ඉදිරිපත් කළා. අන්තිමට බලන්න ඒක ගිය හැටි. දැන් ඒ අය පස්සෙන් එළවනවා. ඒක හරි වැරදියි. ඕනෑම මහාචාර්යවරයෙකු වෙන්න පුළුවන්, ආචාර්යවරයෙකු වෙන්න පුළුවන්, වැරැද්දක් තිබෙනවා නම් ඒක පෙන්වා දෙන්න පුළුවන්. මේවා ප්‍රජාතන්ත්‍රවාදී රටවල්. ඒකාධිපති රටවල් නොවෙයි නේ. වැරැද්දක් වෙනවා නම් ඒක කියන්න නිදහස තිබෙන්න ඕනෑ. ඒ ප්‍රශ්නය ඔස්සේ උසාවිවලට ගිහින් කටයුතු කරන එක වැරදියි. දැන් ඒ අය තුළ භය ඇති කරනවා. අප හැමෝම දන්නවා නේ, දැන් ඒ ආචාර්යවරුන් තුළ භය ඇති කරනවා. වෙන වෙන විධියෙන් ඒ අයට විවිධ බලපෑම් එල්ල කරනවා. මේවා වැරදියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම කරන්න දෙන්න හොඳ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
එක්සත් ජාතික පක්ෂය වශයෙන් අප ඒ ගැන කනගාටුව පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, මොනවා වුණත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ විභාගවලින් බඳවා ගත් බව. ඉස්සර හිතවත්කම්වලට ගුරු පත්වීම් දුන්නා. අපේ ආරම්භක කාලයේත් එහෙම ගුරු පත්වීම් දුන්නා. නමුත් කැබිනට් මණ්ඩලය විරුද්ධ වෙද්දී, විභාගවලින් ගුරුවරුන් බඳවා ගන්නා ක්‍රමය ඇති කරන්න අපට පුළුවන් වුණා. අපේ ආණ්ඩු කාලයේ අධ්‍යාපන පරිපාලන සේවය ඇති කළා; විද්‍යා පීඨ ඇති කළා. අප එවැනි ප්‍රගතිශීලී දේවල් කළා. ඒ නිසා අධ්‍යාපනය ගැන කථා කරන්න, නිදහස් අධ්‍යාපනයේ මේ කරන කප්පාදුවට එරෙහි වන්න අපට අයිතියක් තිබෙනවා.

මට කථා කරන්න වැඩි කාලයක් නැහැ. ඒ සුළු කාලයේදී අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් දිගට හරහට ආචාර්ය උපාධි දෙන්නත් පටන් අරගෙන තිබෙනවා. ඉන්දියාවේ බැංගලෝර්වල ශ්‍රී රවි ශංකර් මැතිතුමාටත් - "Art of Living" කියන ආයතනයේ නිර්මාතෘ- ඩොලර් 3,500කට ආචාර්ය උපාධියක් දීලා, එතුමා එය ආපසු භාර දී තිබෙනවා. මමත් එම ආයතනයට ගිහින් තිබෙනවා. මෙම ආයතන ගැන කවුරුවත් බලන්නේ නැද්ද? මම නම් කියන්නේ, මේවා ගැන සොයා බලන්න අඩුම ගණනේ උපාය මාර්ග සංවර්ධන මණ්ඩලයක් හරි වෙනත් කුමක් හෝ ආයතනයක් තිබෙන්න ඕනෑ කියලායි . දැන් මෙම ආයතනවලට අයිතිකාරයෙක් නැහැ නේ. බලන්න, දැන් ඩොලර් 3,500ට ආචාර්ය උපාධි දෙනවා. ඒ ප්‍රවෘත්තිය ඉන්දියාවේ පුවත් පත්වලත් පළ වෙලා තිබෙනවා. බලන්න, මෙවැනි දේවල්වලින් ලංකාවට කොයි තරම් අපකීර්තියක් වෙනවාද කියලා. "The Indian Express" පුවත් පතේ මේ ගැන පළ වෙලා තිබෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු මන්ත්‍රීතුමනි, අපි සාකච්ඡා කරන්නේ සාගර විශ්වවිද්‍යාලය සම්බන්ධවයි, ආචාර්ය උපාධි ගැන නොවෙයි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මම දන්නවා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට ඒ ගැන අවබෝධයක් නැහැ. ඒකයි වෙලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, සාගර විශ්වවිද්‍යාලය කිව්වාම මුහුදම නොවෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න. [බාධා කිරීමක්] ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා, කාලය අවසන්, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මට කථාව අවසන් කරන්න දෙන්නේ නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එතුමා ඒ දවස්වල මහින්ද රාජපක්ෂ මහත්තයාට බැන්න එක තමයි කළේ. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මා අවසන් කරන්නම්. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, මම විශ්වවිද්‍යාල දෙකකින් උපාධි දෙකකුත් අරගෙන නීතිඥවරයෙක් හැටියට ඉඳගෙනයි මේ කථා කරන්නේ. මම අවබෝධයෙනුයි කථා කරන්නේ. ඔබතුමා කරුණාකර වාඩි වෙන්න. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියනවා, මේ දේවල් කෙරෙහි අවධානය යොමු කරන්නය කියලා. ඒ වාගේම අපි අමාත්‍යතුමාට සුබ පතනවා. මේ විශ්වවිද්‍යාලයේ කටයුතු සාර්ථක වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. දේශපාලන බලපෑම් අධ්‍යාපනයට විතරක් නොවෙයි දැන් විශ්වවිද්‍යාලවලටත් ඇවිල්ලා තිබෙනවා. ඒ ගැන සම්පූර්ණ අවධානය යොමු කරන්නය කියලා මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු සරත් වීරසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.35]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (කම්කරු හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - தொழில், தொழில் உறவுகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekara - Deputy Minister of Labour and Labour Relations)
මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අද අපි සාකච්ඡා කරන්නේ දැනට ක්‍රියාත්මක වන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය විශ්වවිද්‍යාලයක් බවට උසස් කරලා ඒක පවත්වා ගෙන යාම සහ ඒකේ පරිපාලනය සම්බන්ධයෙනුයි. ධීවර, සමුද්‍ර තාක්ෂණය ඒ වාගේම සමුද්‍ර විද්‍යාව, නාවුක ක්ෂේත්‍රවල නියැළෙන පුද්ගලයන්ගේ වෘත්තීමය තාක්ෂණය සහ විද්‍යාත්මක දැනුම දියුණු කරලා ඒ තුළින් රැකියා උත්පාදනය කිරීම හා අපේ තිබෙන අසීමිත සම්පත් ගවේෂණය කරලා ඒ තුළින් රටේ දැනට සිදු වෙන දැවැන්ත සංවර්ධනයට දායකවීමක් තමයි අපි මේ ආයතනය හරහා කරන්නේ.

ඉන්දියානු සාගර කලාපයට අයත් රටවල් 20ක් මීට වසර ගණනාවකට පෙර සංගමයක් හැදුවා, IORA - Indian Ocean Rim Association - කියලා. අපත් ඒකේ සාමාජිකයෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට එම සංගමය තුළින් විද්‍යාත්මක, ගවේෂණ සහ අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් බවට මේ විශ්වවිද්‍යාලය පත් කරන්න පුළුවන්. ඒක තමයි අපට මේ අවස්ථාවේදී ගන්න පුළුවන් විශේෂ වාසිය.

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

ඇත්ත වශයෙන්ම මම සාගරය හා සම්බන්ධව නාවික හමුදාවේ වසර 35ක පමණ කාලයක් සේවය කරපු නිසා මටත් යුතුකමක් තිබෙනවා, මේ සාගර විශ්වවිද්‍යාලය ගැන නැත්නම් සාගරය ගැන, අපේ උරුමයන් ගැන යම් කිසි දෙයක් කියන්න. අපට සාගර විශ්වවිද්‍යාලයක තිබෙන අවශ්‍යතාව ගැන බොහෝ මන්ත්‍රීවරු පැවසුවා. ප්‍රමාද වෙලා හෝ සාගර විශ්වවිද්‍යාලයක් අපට ලැබෙනවා නම් ඒක ඉතාම සාධාරණීකරණය කරන්න පුළුවන්. මොකද සුවිශේෂ වූ නාවික සම්ප්‍රදායක් අපට තිබෙනවා; සුවිශේෂ වූ නාවික උරුමයක් අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම කියනවා නම් මේ සාගරය අපට භාග්‍යයක්. අපට අභාග්‍ය සම්පන්න ප්‍රතිඵලත් මේ සාගරය විසින් ලබා දීලා තිබෙනවා. අපේ ශිෂ්ටාචාරය, අපේ ආර්ථිකය, අපේ සමාජය, අපේ සංස්කෘතිය මේ සියලු දෙයක්ම පෝෂණය වෙන්න, හැඩ ගස්වන්න ඇත්ත වශයෙන්ම සාගරය උපයෝගී වුණා. විජය රජ්ජුරුවෝ ඉස්සෙල්ලාම තැම්මැන්නාවට ආවේ සාගරයෙන්. අපට ශ්‍රී මහා බෝධිය ලබා දුන්නා, සංඝමිත්තා තෙරණිය. එතුමියත් ආවේ සාගරයෙන්. රෝමානු අධිරාජ්‍ය, චීනය, අරාබි දේශය සමඟ අපි තානාපති සේවය කළේ සාගරය හරහායි. ඉන්දියානු අර්ධද්වීපය ඉතාමත් ශක්තිමත් අර්ධද්වීපයක්. එය අභියස රටක් විධියට අවුරුදු 2,500ක් තිස්සේ අපේ ස්වාධිපත්‍ය තියා ගෙන, ස්වාධීනව අපට උරුම සංස්කෘතියත් රැකගෙන අපට ඉන්න පුළුවන් වුණේ ඇත්ත වශයෙන්ම මේ සාගරය නිසායි. එම නිසා සාගරය අපේ ලංකාවට - අපේ රටට- අතිවිශේෂයි. ඒ වාගේම සාගරය නිසා අභාග්‍ය සම්පන්න දේවලුත් සිද්ධ වුණා. අපට විදේශ ආක්‍රමණ ඇති වුණා. ලන්දේසින්, පෘතුග්‍රීසින්, ඉංග්‍රීසි ජාතිකයන් ආවේ සාගරයෙන්.

ඇත්ත වශයෙන්ම කියනවා නම්, අපේ රටේ ත්‍රස්තවාදය ආරම්භ කළේ ඉන්දියාවෙන්. [බාධා කිරීමක්] ත්‍රස්තවාදය ආරම්භ කළා, ඉන්දියාවෙන්. නඩත්තු කළා. ඇත්ත වශයෙන්ම ත්‍රස්තවාදය දියුණු තියුණු වුණේ සාගරය නිසායි. ඒ වාගේම තමයි, සුනාමිය. ඒ නිසා විශාල මිනිසුන් සංඛ්‍යාවක් මරණයට පත් වුණා; අපේ දේපළ සියලු දෙයක්ම විනාශ වුණා. ඒ සාගරය නිසායි. සාගරයයි, නාවිකයනුයි අතර අපේ සංස්කෘතියට බද්ධ වුණු දැඩි සම්බන්ධයක් තිබෙනවා.

පන්සිය පනස් ජාතක පොතේ තිබෙන වලාහස්ස කියන ජාතක කථාවෙන් කියැවෙනවා, අපේ කාන්තාවෝ නාවිකයන්ව වසඟයට ගන්න පුළුවන් උපක්‍රම ප්‍රගුණ කරලා තිබෙන බව. අපට ඒකෙන් තේරෙනවා, අපේ සාගරය අපේ නාවික සංස්කෘතියට මොන තරම් බද්ධ වෙලා තිබෙනවාද කියන එක.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி)சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
මට විනාඩි 10ක කාලයක් පමණයි තිබෙන්නේ. ඒ නිසා ඔබතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න බැහැ.

ඇත්ත වශයෙන්ම අපේ රට පිහිටා තිබෙන්නේ සාගර ක්‍රමෝපාය ස්ථානයක. ඒ කියන්නේ strategic location එකක. ඒ නිසා ඇත්ත වශයෙන්ම අපටම උරුම වුණු නාවික සම්ප්‍රදායයක් අපි ගොඩනඟා ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවැනි පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේදී - we have had trade transactions with Burma. When King Parakramabahu I sent a fleet of ships to Burma, the Burmese King apprehended the sailors and confiscated all the loot. පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ බුරුමයත් සමඟ අපේ වෙළෙඳ ගනුදෙනු තිබුණා. එතකොට බුරුමයේ රජතුමා අපේ නෞකා රාජසන්තක කළාට පස්සේ පළමුවැනි පරාක්‍රමබාහු රජතුමා මොකක්ද කළේ? මඩකලපුවේ සිට ත්‍රිකුණාමලය දක්වා නැව් තටාංගන 5ක් හැදුවා. මහවැලි නදිය අභියස නැව් තටාංගන 5ක් හැදුවා; රුවල් නෞකා 300ක් නිෂ්පාදනය කළා; නැවියෝ 30,000ක් බඳවා ගත්තා. කිත්තිනගරගිරි සහ ආදිත්‍ය දම්ලාදිකාරි කියලා අද්මිරාල්වරු දෙදෙනෙක් පත් කළා. ඊට පස්සේ Koddiyar Bay, එහෙම නැත්නම් ත්‍රිකුණාමලයෙන් ගිහිල්ලා බුරුමයට ගහලා බුරුමය යටත් කරගෙන අපේ වත්දිත් අරගෙන, අපේ නැවියොත් අරගෙන නැවත වරක් Koddiyar Bayවලට, නැත්නම් ත්‍රිකුණාමලයට ආවා කියලා සෙල්ලිපියක තිබෙනවා. එහෙම නම් අපි නෞකා හැදුවේ අවුරුදු දහස් ගණනකට ඉස්සෙල්ලායි. Naval architecture කියන එක, එහෙම නැත්නම් නාවික වාස්තු ශිල්පය අපේ උරුමයක්. ඒකෙන් පන්නරය අරගෙන නවීන තාක්ෂණයත් බද්ධ කරලා තමයි, අද මේ සාගර විශ්වවිද්‍යාලය පිහිටුවන්නේ.

ඒ විතරක් නොවෙයි. හයවැනි පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේදී මදුරාසිය සමඟ ඇති වුණු සටනේදීත් මදුරාසියට නෞකා යවලා රාවන් වලවරායා පරද්දලා අපි නැවත වරක් ආවා. ඒ පිළිබඳව ලස්සන කවි දෙකක් තිබෙනවා.

පිට රටකදී වුව
වුණොත් අප හට පාඩුව
කළොත් අරියාදුව
අපේ රජවරු ගත්තෙ වාඩුව

නෞකා සැදෙව්වා
මදුරාසියට යැව්වා
බුරුමෙට ගැහැව්වා
අපේ කිතු ගොස දසත යැව්වා

We have inherited naval architecture. ඒ කියන්නේ ඒක අපිත් සමඟ බැඳුණු දෙයක්. ඒක තවදුරටත් ගොඩනඟා ගන්න එකයි සාගර විශ්වවිද්‍යාලයෙන් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි ගොඩයාය කියන්නේ ජාත්‍යන්තර වරායක්. සේද මාවත - The Silk Route එක - වැටිලා තිබුණේ ඒ හරහායි. ගොඩපවත්ත පන්සලේ දෙවැනි ශතවර්ෂයේ සෙල්ලිපියක තිබෙනවා, රේගු මුදල් ලබා ගත්තේ කොහොමද කියලා. ඒකෙන් අපට තේරෙනවා, මොන තරම් හොඳ තාක්ෂණයක්, මොන තරම් හොඳ සංවිධානාත්මක පරිපාලනයක් අපේ රටේ තිබුණාද කියන එක. අවුරුදු සිය ගණනකට ඉස්සෙල්ලා ඊජිප්තුවේ සුල්තාන්වරයාට නෞකා 20ක් හැදුවාය කියලා අපේ ඉතිහාසයේ සඳහන් වෙනවා. ඒ වාගේම ක්‍රිස්තු වර්ෂ 4වන සියවසේදී මහානාම රජ්ජුරුවෝ ජිං පරම්පරාවට අයිති චීන අධිරාජ්‍යයාට නෞකාවකින් මැණික් එබ්බවූ බුදු පිළිමයක් යවලා තිබෙනවා. අවුරුදු දහස් ගණනකට ඉස්සෙල්ලා කොහොමද චීනයට ගියේ, කොහොමද බුරුමයට ගියේ? ඒ දවස්වල GPS - Global Positioning System - තිබුණේ නැහැ; ඒ දවස්වල Satellite Navigation System තිබුණේ නැහැ. ඒ විධියට ගියේ තාරකා ශාස්ත්‍රයට අනුවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - තාරකා ශාස්ත්‍රය ගැන කියනවා නම් - පහළොස්වන ශතවර්ෂයේ තොටගමුවේ ශ්‍රී රාහුල හාමුදුරුවෝ අධිපතිකම දැරූ විජයබා පිරිවෙනේ විෂයයන් කිහිපයක් ඉගැන්වූවා. ගණිතය ඉගැන්වූවා, ත්‍රිපිටකය ඉගැන්වූවා, ඒ වාගේම රංගන කලාව ඉගැන්වූවා,

තාරකා විද්‍යාව ඉගැන්වූවා. ඒ නිසා අපට තේරෙනවා මොන තරම් හොඳට සංවිධානය වුණු විශ්වවිද්‍යාල පද්ධතියක් අපේ රටේ තිබුණාද කියන එක ගැන. ඒක තමයි අපි දැන් පණගස්වන්න හදන්නේ. ඒ වාගේම ටොලමී, ෆාහියන්, හියුංසාං මේ සියලු දෙනාම අපේ රටේ නාවික ශක්තිය ගැන කියලා තිබෙනවා. ඒ නිසා සාගර විශ්වවිද්‍යාලය අපට අමුතු දෙයක් නොවෙයි.

අපි සාගරය ගැන ඉගෙන ගත යුත්තේ ඇයි? ලෝක ජනගහනයෙන් තුනෙන් එකක් ඉන්නේ ඉන්දියානු සාගර කලාපයේයි. ඒ වාගේම තමයි ඛනිජ තෙල් සහ ගෑස් සම්පත්වලින් සියයට 40ක් තිබෙන්නේ මේ කලාපයේයි. අපේ ආර්ථික කලාපය EEZ - Exclusive Economic Zone එක - කිලෝමීටර් 200ක් දිගු වෙනවා. අපේ land area එක වාගේ - ගොඩබිම වාගේ - 23 ගුණයක සාගරයක් අපට අයිතියි. ඇත්ත වශයෙන්ම අපට වර්ග කිලෝමීටර් දහහතරලක්ෂයක් අයිතියි. අපට එහි අසීමිත සම්පත් තිබෙනවා. සාගර විශ්වවිද්‍යාලය තුළින් අපි මේ කලාපය ගවේෂණය කළොත් ඒ සම්පත් අපට උකහා ගන්න පුළුවන්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி)சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
මගේ කථාව ඉතාම කෙටියෙන් අවසන් කරන්නම්.

හැම දේකටම විරුද්ධ වන JVP එක - ජනතා විමුක්ති පෙරමුණ - අද මේකටත් විරුද්ධ වුණා. මම හිතුවේ නැහැ JVP එක කවදාවත් මේකට විරුද්ධ වෙයි කියලා. නමුත් කොරහෙත් කිඹුල්ලු දකින JVP එක අද මොනවාද කියන්නේ? මේ විශ්වවිද්‍යාලයටත් සාමාන්‍ය සම්ප්‍රදාය අනුව බඳවා ගන්නය කියලා කියනවා.

ඔබතුමා දන්නවා, සාමාන්‍ය සම්ප්‍රදාය අනුව බඳවා ගත්තොත් 130,000ක් විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලබනවා. නමුත් Z-score එක අනුව විශ්වවිද්‍යාලයට යන්න පුළුවන් 25,000කට පමණයි. ලක්ෂයක් පමණ අනාථ වෙනවා. එහෙම නම් ඒ දරුවන්ගේ බෙල්ල කැපීමක් තමයි ජනතා විමුක්ති පෙරමුණ කරන්නේ. අද ජනතා විමුක්ති පෙරමුණ TNA එකවත් - දෙමළ ජාතික සන්ධානයවත්- නොකළ යෝජනාවක් කරන්නේ මේ අහිංසක දරුවන්ට ලබා ගන්න පුළුවන් උපාධියත් නැති කරන්නයි. බෙල්ල කපනවාය කියන එක ජනතා විමුක්ති පෙරමුණට විශේෂ දෙයක් නොවෙයි. අම්පාර දිස්ත්‍රික්කයේ ඉන්නවා, වීරසිංහ කියලා පළාත් සභා මන්ත්‍රීවරයෙක්. එතුමාට වයස අවුරුදු 12 කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ අය එතුමාගේ තාත්තාව මිදුලට අරගෙන ගිහිල්ලා දණගස්සලා බෙල්ල කපලා මැරුවා. ඒ වාගේ දේවල් ශාරීරික වශයෙන් කරනවා වාගේම අධ්‍යාත්මික වශයෙනුත් කරනවා. ඉතින් මේ අවස්ථාවේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාත්, විජිත හේරත් මන්ත්‍රීතුමාත් මේ සභා ගැබේ නැතිවීම ගැන අපි කනගාටු වෙනවා. ඒකෙන්ම තේරෙනවා එතුමන්ලා ඉදිරිපත් කළේ පුහු තර්කයන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අද දරුවන්ගේ tuitionවලට; අතිරේක පන්තිවලට දෙමව්පියන් කොච්චර මුදල් වියදම් කරනවාද? මාසයකට රුපියල් 10,000ක් පමණ වියදම් කරනවා. එතකොට අවුරුද්දකට රුපියල් 120,000ක් වියදම් කරනවා. එහෙම නම් මුදල් වියදම් කරලා උපාධිය ගන්නවාය කියන එකේ කිසිම ගැටලුවක් මට පෙනෙන්නේ නැහැ.

අවසාන වශයෙන් King's College, Londonවල මහාචාර්ය හෂ් පටෙල් කියා තිබෙනවා "ඉන්දියන් සාගර සංවර්ධන ව්‍යායාමයේ ලංකාව ප්‍රවිෂ්ටයක්" කියලා. Sri Lanka is key to the Indian Ocean Development Plan. ඇමෙරිකානු ක්‍රමෝපාය විශේෂඥ රොබට් කෙප්ලන් කියා තිබෙනවා "ක්‍රමෝපායික ලෝකයේ ශ්‍රී ලංකාව ගුරුත්ව කේන්ද්‍රයක්" කියලා. ඒ කියන්නේ, "The centre of gravity in the strategic world is Sri Lanka". ඒ වාගේම තමයි අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කියා තිබෙනවා, ලංකාව ආසියාවේ කේන්ද්‍රස්ථානය බවට පත් කරනවාය කියලා. එසේ පත් කරන්න නම් ඇත්ත වශයෙන්ම මේ විශ්වවිද්‍යාලය තුළින් ලබා දෙන දැනුම හා ගවේෂණ තුළින් අපට ලංකාව ආසියාවේ ආශ්චර්ය කරා ගෙන යන්න පුළුවන්ය කියන එක මා ඉතා පැහැදිලිව කියමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.45]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා හිටියා නම් හොඳයි. එතුමා ඉන්න කොට මේ මාතෘකාව සම්බන්ධයෙන් කථා කරන්න අපි කැමැතියි.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් කිහිපයක් පළ වුණා. එහිදී මතු වුණු මූලික කාරණයක් සම්බන්ධයෙන් වචනයක් කියමින් මගේ කථාව පටන් ගන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ විශ්වවිද්‍යාලයට සාමාන්‍ය ක්‍රමයට බඳවා ගන්න කියන අදහස ජනතා විමුක්ති පෙරමුණේ කථිකයන් සහ තවත් අය කිව්වා කියලා අපේ ගරු සරත් වීරසේකර නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේකට ප්‍රධාන හේතුව තමයි රටේ පවතින දේශපාලන තත්ත්වය. දැන් ඔබතුමා කිව්වා 130,000ක් විතර විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලැබුවත් ඇතුළත් කර ගන්නේ 25,000ක් විතර කියලා. මම හිතන විධියට 28,000ක් 30,000ක් විතර තමයි ඇතුළත් කර ගන්නේ. අනෙක් සියලු දෙනාම පයින් ගහලා එළියට දමනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම මේ තර්කයක් විතරයි ඉදිරිපත් කරන්නේ. මේ විධියට සාමාන්‍ය ක්‍රමයට ඇතුළත් කර ගත්තොත් තව 3000ක් නැත්නම් 500ක් හෝ සුදුසුකම් ලබන පුද්ගලයන් තමයි ඇතුළත් වන්නේ. එහෙම නැත්නම් පිටරටින් හරි වෙනත් දේශපාලන හේතුවක් මත ඇතුළත් වන පිරිස නොවෙයි. ඔබතුමාටත් මතක ඇති ඊයේ පෙරේදා පුවත් පත්වල දැක්කා, තරුණ මන්ත්‍රීවරයෙක් - බලවත් මන්ත්‍රීවරයෙක්- තමන්ගේ හැඳුනුම්කම මත, සානුකම්පිත හේතු මත කියලා පාර්ලිමේන්තු Letterhead එක පාවිච්චි කරමින් ඇමතිතුමාට ලියුමක් ලියලා, ඇමතිතුමා ඒකට අත්සනක් යොදලා ක්‍රමය වෙනස් කරලා; නීතිය වෙනස් කරලා අවුරුදු තුනකට පස්සේ ඒ සිසුවා විශ්වවිද්‍යාලයට බඳවා ගන්න කියලා ඉල්ලීමක් කර තිබෙන බව. මේක රටේ නීතිය තනිකරම විකෘති කිරීමක්. ඔබතුමා දන්නවා සුද්දන්ට පින් සිද්ධ වෙන්න හරි කාට හරි පින් සිද්ධ වෙන්න අපට මේ රටේ හොඳ අධ්‍යාපන ක්‍රමයක් ලැබී තිබෙන බව. මේ රටේ සියයට 92ක සාක්ෂරතා හැකියාවක් තිබෙනවා. ආසියාව ගත්තොත් වැඩිම සාක්ෂරතා හැකියාව තිබෙන්නේ අපේ රටේ. ඔබතුමන්ලා සියයට 98ක්ද, 99ක්ද කියලා කිව්වා. ඒක

[ගරු සුජීව සේනසිංහ මහතා]

ඇමතිවරුන්ට මන්ත්‍රීවරුන්ට වැරදිලා කියලා මම හිතනවා. එහෙම සාක්ෂරතා හැකියාවක් ලංකාවේ නැහැ. සියයට 92ක් නැත්නම් 91යි දශම ගණනක් තිබෙන්නේ. හැබැයි, ඒකත් හොඳ අගයක්. ඒක ඔබතුමන්ලා කළ දෙයක්වත් අපි කළ දෙයක්වත්, එක්සත් ජාතික පක්ෂය කළ දෙයක්වත් නොවෙයි. අවුරුදු ගණනාවක් තිස්සේ අපේ රටේ තිබුණු අධ්‍යාපන ක්‍රමය වාගේම බටහිර අධ්‍යාපන ක්‍රමය අපට හඳුන්වා දීලා ඒ අනුසාරයෙන් අපි ලබා ගත් දෙයක් තමයි මේ සාක්ෂරතා හැකියාව; අධ්‍යාපන මට්ටම. හැබැයි ඒක ඉතා හොඳයි.

අපි යම්කිසි ආකාරයකට ලංකාවේ දූෂණය ගැන කථා කළොත් දේශපාලනය ගැන කථා කළොත් බේරිලා තිබෙන්නේ මේ universities ටික විතරයි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබූ ඇමතිවරු කිහිප දෙනෙක් හරි මෙතැන ඉන්න පුළුවන්. අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබූ කෙනෙක්ද, නීති විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ කෙනෙක්ද දන්නේ නැහැ. ඔබතුමාත් දන්නවා, මේවාට දේශපාලනඥයන්ට ඇඟිලි ගහන්න බැහැයි කියලා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවේ බලයේ මහත බලන්න, මේකටත් ඇඟිලි ගහන්න මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් වුණා නේ. "බලය" කියන එක බලන්න. බලයෙන් තමන්ගේ ඔළුව පිස්සු හැදිලාද දන්නේ නැහැ, වෙන දෙයක් වෙලාද දන්නේ නැහැ. තමන්ට කරන්න බැරි දෙයක්, කවදාවත් මේ රටේ කවුරුවත් නොකළ දෙයක් කරන්න ඉදිරිපත් වෙන්න තරම් මේ රට බංකොලොත් වෙලා තිබෙනවා.

මා හිතන හැටියට මෙය විශාල ප්‍රශ්නයක්. මෙය අපේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. මේ දේවල් සිදු නොවිය යුතුයි. සමහර විට ඒ මන්ත්‍රීවරයා අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳව නොදැනුවත්ව වෙන්න පුළුවන්, එය කරන්න ඇත්තේ. ඒක තමයි මන්ත්‍රීවරු කියන්නේ සාමාන්‍ය ක්‍රමයට ඇතුළත් කර ගන්න කියලා. ප්‍රායෝගිකව සාමාන්‍ය ක්‍රමයට ඇතුළත් කර ගන්න බැහැ. ඒක අපි දන්නවා. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට ප්‍රශ්න තිබෙනවා. සාමාන්‍ය ක්‍රමයට ගත්තොත් සමහර විට අපේ දුප්පත් ධීවරයකුගේ ළමයකු, එහෙම නැත්නම් වෙනත් දරුවකු, අධ්‍යාපන සුදුසුකම් නොලැබූ දරුවකු ඇතුළු නොවෙන්න පුළුවන්. මේ ක්‍රමය හොඳයි. හැබැයි අපට තිබෙන ප්‍රශ්නය මේකයි. ඔබතුමන්ලාගේ දේශපාලන බලය තහවුරු කර ගන්න මේ රටේ දේශපාලනය ක්‍රියාත්මක කරලා තම තමන්ගේ හෙංචයියලාගේ දරුවන් ඇතුළත් කරන්න පටන් ගත්තොත් අපි බලාපොරොත්තු වන ඉලක්කය කරා යන්න බැරි වනවා.

මා මේ කාරණය කියන්න හේතුවක් තිබෙනවා. අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා හිටපු ජනාධිපති ප්‍රේමදාස මහත්මයා ගැන සඳහන් කළා. එතුමා තමන්ගේ පක්ෂයේ අනාගතයට වඩා රටට ආදරය කළා. විශේෂයෙන්ම ඔබතුමන්ලාට මතක ඇති, 1988-1989 කාලයේදී වුණු සිදු වීම් හේතුකොටගෙන ජනාධිපති කොමිසමක් පත් කළ බව. ඒ කොමිසමෙන් කිව්වා, තරුණ අසහනය - [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මට කථා කරන්න ඉඩ දෙන්න. ඒ ගැන කථා කරන්න ගියොත් ඔබතුමාටයි, මටයි හැන්දෑ වන කල් කථා කරන්න වනවා. පරණ සිද්ධීන් කථා කරන්න ගියොත් -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමනි, එතුමාට බාධා කරන්න එපා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මා හිතන හැටියට හොඳ කථාවක් කර ගෙන යද්දී වැදගත් නියෝජ්‍ය ඇමතිවරයෙක් මේ වාගේ බාධා නොකළ යුතුයි. විශේෂයෙන්ම එතුමාගෙන් ඉල්ලා සිටිනවා, මගේ කථාවට බාධා කරන්න එපාය කියලා. මා කාටවත් රිද්දන්න කථා කරනවා නොවෙයි. සාමාන්‍ය දෙයක් කථා කරන්නේ. හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා පත් කළ ජනාධිපති කොමිසමෙන් උත්තරයක් දුන්නා, තරුණ අසහනය ඇති වෙන්න ප්‍රධාන හේතුව දේශපාලන පත්වීම් දීමයි කියලා. එක්සත් ජාතික පක්ෂ රජයක් බලයට පැමිණියත් දේශපාලන පත්කිරීම් කරන්න අපිත් නැඹුරු වෙනවා. හැබැයි මෙය නැවැත්විය යුතුයි, ඇමතිතුමනි. මෙය දිගටම කළොත් දේශපාලන පක්ෂ අනුව තෝරා මෙය කරන්න ගියොත් තරුණයන් විශාල අසහනයකට ලක් වෙලා නැවත ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්.

මෙම අවස්ථාවේදී ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා මේ ගරු සභාවට පැමිණෙන එක හොඳයි. ඇමතිතුමනි, ඔබතුමා මා අගය කරන ඇමතිවරයෙක්. ඔබතුමා පිරිසිදු දේශපාලනඥයෙක් කියා හය නැතුව කියන්න පුළුවන්. මා දැක්කා, බොහෝ මන්ත්‍රීවරු ඔබතුමාට හුඟක් හොඳ කියනවා. ඔබතුමා සන්තෝෂ වෙන්න, ඔබතුමාගේ දේශපාලන ජීවිතය ගැන. හැබැයි ඔබතුමාට මා එක කාරණයක් කියන්න ඕනෑ. මා දන්නේ නැහැ, එය විවේචනයක්ද කියලා. විශේෂයෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනිසි ක්‍රියාකාරිත්වය ගැන කථා කරද්දී ඔබතුමාගේ සහෝදරයකු විදේශයක යම්කිසි තනතුරක් දරනවාය කියා කියනවා මට ඇහුණා. ඒකේ ඇත්ත නැත්ත මොකක්ද කියලා මා දන්නේ නැහැ. වෘත්තීමය සුදුසුකමක් මත එතුමා ඒ තනතුරට පත් කරලා නැත්නම්, මා හිතන හැටියට එය ඔබතුමාට පොඩි කැළලක්. ඔබතුමා සම්බන්ධයෙන් සඳහන් කර තිබෙන නරක දෙයක් හැටියට මා දැක්කේ ඒක විතරයි. ඔබතුමා සම්බන්ධයෙන් ඒ කරුණ සඳහන් කරද්දී මගේ හිත පොඩ්ඩක් රිදුණා. ඒ හැරෙන්න ඇමතිතුමනි, අපි ඔබතුමාට ඒ ගෞරවය දෙන්න ඕනෑ. මා හිතන හැටියට ඔබතුමා පිරිසිදුව තමන්ගේ දේශපාලනය කර ගෙන යනවා. මෙය හොඳ ක්‍රියාදාමයක්. අපි ඔබතුමාට කියන්නේ ඔබතුමාගේ ඒ දේශපාලන පිරිසිදුභාවය දිගටම පවත්වා ගෙන යන්න, මෙයට කිසිම ආකාරයකට දේශපාලනය බලපාන්න ඉඩ දෙන්න එපාය කියලායි.

අද මට පොඩි ඉඟියක් ලැබුණා. නාමල් රාජපක්ෂ මැතිතුමා අද මේ සභාවට ඇවිල්ලා කථා කළා. මා දන්නවා, විශේෂයෙන්ම අන්තර්ජාතික තරුණ සම්මේලනය මේ රටේ පවත්වද්දී ඔබතුමා සහ නාමල් රාජපක්ෂ මැතිතුමා අතර පොඩි පොඩි ප්‍රශ්න ඇති වුණාය කියලා. හැබැයි ඔබතුමා එතරම් දක්ෂයි. අද ඔබතුමාට හැකියාව ලැබුණා -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔය ඉතින් "රාජපක්ෂ" කියන නම කියන කොට අස්වර් මන්ත්‍රීතුමා නැඟිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉවසන්න. ඔබතුමා තරුණ මන්ත්‍රීවරයෙක්. ඔබතුමා හොඳට හැදෙන්න. - [*Interruption*.] Sir, that particular person to whom he is referring as the brother of the Hon. Dullas Alahapperuma, has appeared before the Committee on High Posts which comprises Members of the Opposition also. They have given him clearance and sent him as the most suitable person to occupy that place. This Hon. Member is talking nonsense. - [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මොනවා හෝ කැවිලා තිබෙනවා නම් ඒවා එළියට දමන්න පාර්ලිමේන්තුව යොදා ගන්න හොඳ නැහැ. මා දන්නවා, විශේෂයෙන්ම එක්තරා නමක් කිව්ව ගමන්ම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

හරක් වෙදෙකුත් ඇවිල්ලා එළියේ ඉන්නවා. මේ පාර්ලිමේන්තුවේ එක්තරා නමක් කිව්ව ගමන්ම පොඩ්ඩක් කෑ ගහනවාට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අපි කියන්නේ, ඒ වාගේ තුච්ඡ තත්ත්වයට වැටෙන්නේ නැතුව මේ පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කරමින්, විශේෂයෙන්ම අවුරුදු ගණනක් -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
තමුන්නාන්සේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නම් ස්ථාවර නියෝග නිවැරැදිව ඉගෙන ගන්න ඕනෑ. He is casting aspersions on the Members of the House which he must withdraw or it must be expunged. - [*Interruption.*]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තමයි පුන්නක්කු දෙන්න ඕනෑ. සල්ලි නොවෙයි දෙන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි.
ඒ කොටස ඇත්තටම ගැළපෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මොකක්ද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එය මන්ත්‍රීවරුන්ට අයුතු ලෙස චෝදනා කිරීමක්. මා එම කොටස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මා කිව්ව සිංහල තේරෙන්නේ නැතුවද මා දන්නේ නැහැ. පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරයකුගේ නමක් සඳහන් කරන්න අයිතිය තිබෙනවා. [බාධා කිරීමක්] හොඳ නැති දේ - [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මන්ත්‍රීවරයෙකුගේ නමක් සඳහන් කරන්න පුළුවන්. හැබැයි මන්ත්‍රීවරයෙකුට අයුතු චෝදනා කරන්න බැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොඳ නැති දේ මා බේරා ගන්නම්. රීති ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමා මට කියන්න. මන්ත්‍රීවරයෙකුගේ නම සඳහන් කරලා මා යම් දෙයක් කිව්වොත් මම ඒක ඉල්ලා අස් කර ගන්නම්. මම මන්ත්‍රීවරයෙකුගේ නමක් සඳහන් නොකළ වෙලාවක මට හොඳ නරක කවුරුත් කියා දෙන්න එපා. මම කරන්නේ මගේ කථාව.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ස්ථාවර නියෝගවලට අනුව කථා කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි. [බාධා කිරීම්] පාර්ලිමේන්තු මන්ත්‍රී කියා මම කිව්වේ නැහැ. මා කිව්වේ, මන්ත්‍රීවරයෙක් කියලා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වෙන්න පුළුවන්. ඔබතුමා මට කියනවා නම් - [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය යනවා. කථාව කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බාධා නොකර ඔබතුමාත් මට උදවු කරන්න. අනවශ්‍ය බාධා කිරීම් නොකර ඔබතුමන්ලා මට උදවු කරන්න. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකර ගරු අස්වර් මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මගේ කථාව කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ සම්බන්ධයෙන් මම නියෝගයක් කළා. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි. බාධා කිරීම් වැඩියි. මම ඉල්ලා සිටිනවා, බාධා කිරීම් නොකර මට කථාව කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා. වැදගත් කථාවක් කරන කොට, අපි ඇමතිවරයකුට යමක් කියන කොට බාධා නොකර අපට ඒ අවස්ථාව ලබා දෙන්න.

ගරු ඇමතිතුමනි, මන්ත්‍රීවරු විශේෂයෙන්ම "සාමාන්‍ය ක්‍රමය" තුළ කියලා සඳහන් කළේ, මෙහි තිබෙන දේශපාලන බලපෑම්. ඔබතුමා අදහස් කරන දේ හොඳයි. සාමාන්‍ය ක්‍රමය ඕනෑ නැහැ. සාමාන්‍ය විශ්වවිද්‍යාල ක්‍රමයට ගියාම එක පිරිසකට විතරයි ඇතුළත් වෙන්න පුළුවන්. ඔබතුමා අදහස් කළ දේ සම්බන්ධයෙන් අපි එකඟ වෙනවා. හැබැයි මෙතැන තිබෙන ප්‍රශ්නය ගරු ඇමතිතුමනි, සාමාන්‍ය විශ්වවිද්‍යාලයකට ශිෂ්‍යයෙක් ඇතුළත් කරන්න කියලා යම් මන්ත්‍රීවරයෙකුගෙන් -අපි කියන්නේ, එක් කෙනෙකු නොවෙයි. මේක කීප දෙනෙකුගෙන් වෙන්න පුළුවන්- දේශපාලන බලපෑමක් සිදු වනවා නම් අනිවාර්යයෙන්ම ඔබතුමාගේ සාගර විශ්වවිද්‍යාලයටත් ඒක වෙන්න පුළුවන්. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, දේශපාලන බලපෑම්වලට ලක් නොවී තමන්ගේ බලය පාවිච්චි කරන්න කියලා. ඔබතුමාගේ හොඳ නම දිගටම පවත්වා ගෙන යමින් ඔබතුමා ශක්තිය යොදලා වැඩ කරයි කියා අපි බලාපොරොත්තු වනවා. ඔබතුමා මේ ගත්ත පියවර ඉතාම හොඳයි.

ගරු ඇමතිතුමනි, මේ ආයතනය මඟින් පිට රට රැකියා සහ මේ රටේ රැකියා සඳහා අපට විශාල සම්පතක් තිබෙනවා. එනම් ලංකාවේ සාක්ෂරතාව ඉහළ මට්ටමක තිබෙනවා. අපේ රටේ අධ්‍යාපන ක්‍රමයට තවම දේශපාලනඥයන් වැඩිය අත ගහලා නැහැ. අත ගහන්න දැඟලුවත් අත ගහ ගන්න බැහැ. මොකද, ඒ ක්‍රමය හොඳට රටේ ස්ථාපිත වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමාට ලෙහෙසියි මේ ආයතනය තුළින් බලාපොරොත්තුවන ඉලක්කයට යන්න. ප්‍රාථමික අධ්‍යාපනය ලබන දරුවන්ට සියයට 92ක වාගේ සාක්ෂරතාවක් තිබෙනවා නම් ඕනෑ ප්‍රදේශයක මේක ව්‍යාප්ත කරන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, මෙම ඉගැන්වීම දෙමළ භාෂාවෙන් මොන විධියට කෙරෙනවාද කියන එක ගැන මට දැනීමක් නැහැ. මගේ කථාව අවසානයේ මම ඔබතුමාට පොඩි වෙලාවක් ලබා දෙන්නම් ඒ පිළිබඳව පැහැදිලි කිරීමට. මේක දෙමළ භාෂාව කථා කරන ප්‍රදේශ තුළ ඔබතුමාට ව්‍යාප්ත කරන්න පුළුවන් නම් වඩා හොඳයි. ගරු ඇමතිතුමනි, මෙම සාගර විශ්වවිද්‍යාලවලින් ඉගෙන ගන්නා දරුවෝ අවුරුදු හයක් විතර යන කොට එහිම කථිකාචාර්යවරයෙකු බවට පත් කරන්න පුළුවන්. ඒ විශ්වවිද්‍යාල සඳහා වෙනම පාඨමාලාවක් ආරම්භ කරලා කොටසක් තෝරා ගෙන අධ්‍යාපනය ලබා දෙන්න. ඒ සඳහා ඔබතුමාට පෞද්ගලික ආයතනවලින් ශිෂ්‍යත්ව ආධාර ලබා ගන්න පුළුවන්. විශේෂයෙන්ම ජපානය වාගේ රටවල trawlersවලින් මාළු අල්ලා විශාල වශයෙන් සැමන් නිෂ්පාදනය කරන ආයතන තිබෙනවා. මහින්ද විජේසේකර මැතිතුමාටත් ඒ ආයතනයක කොටසක අයිතියක් තිබුණා. මම එම ආයතනවලට අදාළ නඩු දෙක, තුනකට පෙනී සිටියා. ඒවා ලංකාවත් එක්ක සම්බන්ධ වෙලා කෝටි ගණන් හම්බ කරන ආයතන. අපට ශිෂ්‍යත්ව 100ක් දෙන්න, 150ක් දෙන්න කියලා ඒ ආයතනවලින් ඉල්ලන්න. ඒ මඟින් අපේ දුප්පත් ජනතාවට සහනයක් ලබා දෙන්න.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමාට මේ කාරණය කියන්න ඕනෑ. මම ළඟදී මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට සහභාගි වුණා. රාජිත සේනාරත්න ඇමතිතුමාත් ඒ අවස්ථාවේ හිටියා. අපේ අහිංසක ධීවරයෙක් තමන්ගේ පොඩි බෝට්ටුවට රක්ෂණ සංස්ථාවෙන් සම්පූර්ණ රක්ෂණාවරණයක් ලබා ගෙන තිබෙනවා. බෝට්ටුව මුහුදේ ගිලිලා දවස් දෙකක් තිබිලා, සුනු විසුනු වෙලා වෙරළට ගොඩ ගැහුවාට පස්සේ රක්ෂණ සංස්ථාව කියනවා, වන්දි මුදල් දෙන්න බැහැ කියලා. ඉතා අමාරුවෙන් ජීවත් වන පිරිසක් තමයි වෙරළබඩ ප්‍රදේශයේ ඉන්නේ. ඒ අය වෙනුවෙන් ඔබතුමාට කළ හැකි විශේෂ කාර්ය භාරයක් තිබෙනවා. ඒ ධීවරයන්ගේ දරුවන් වෙනුවෙන් කළ යුතු කාර්ය භාරයක් තිබෙනවා. ඔබතුමන්ලා බලාපොරොත්තු වන ආසියවේ ආශ්චර්යය තවම මේ රටේ ඇති වෙලා නැහැ. ඒ පුද්ගලයෝ ලාම්පුවක් පත්තු කර ගෙන දවස් 17ක්, 18ක් අමාරුවෙන් මුහුදේ ගත කරනවා. ගෙදර එන්නේ කොහොමද කියා හිතා ගන්න බැහැ. ඔබතුමා දන්නවාද රක්ෂණ සංස්ථාවෙන් කිව්වා, වැඩියෙන්ම අනතුරුවලින් මිය යන්නේ ධීවරයන් කියලා. ඒ වාගේම වැඩියෙන්ම අනතුරට ලක්වන්නේ ධීවර බෝට්ටු. හැබැයි රක්ෂණ සංස්ථාවෙන් ඒ වන්දි මුදල් ලබා දෙන්නේ නැහැ. දවස් දෙක, තුනක් ගිහින් බෝට්ටුව වෙරළට ගොඩ ගැහුවාට පස්සේ, ඇමතිතුමා කියද්දීත් වන්දි මුදල් දෙන්නේ නැහැ. මම කියන්නේ, ඔබතුමන්ලා විශේෂයෙන්ම ධීවරයෝ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. ඉතාම දුක්ඛිත ජීවිතයක් ගත කරන පිරිසක් තමයි මේ ධීවරයෝ.

ගරු ඇමතිතුමනි, අපි තවම තාක්ෂණය අතින් මැලේසියාව, තායිලන්තය තරමට දියුණු වෙලා නැහැ. අපි ඒක පිළිගන්නවා. හැබැයි බලන්න coastal belt එක. මැලේසියාවේ කිලෝ මීටර් 4,675යි. තායිලන්තයේ කිලෝ මීටර් 3,219යි. ලංකාවේ කිලෝ මීටර් 1585යි. අපට වැඩිය දෙගුණයක්, තුන් ගුණයක් වාගේ ඒ ගොල්ලන්ගේ coastline එක වැඩියි. හැබැයි බලන්න ඇමතිතුමනි, ඒ ගොල්ලන්ගේ මත්ස්‍ය ආදායම. මත්ස්‍ය ආදායම පමණයි මම ඔබතුමාට සඳහන් කරන්නේ. මැලේසියාවේ මත්ස්‍ය ආදායම ටොන් එක්මිලියන තුන්ලක්ෂ අනූදාහයි. තායිලන්තයේ ටොන් තුන්මිලියන හත්ලක්ෂ හතළිස්තුන්දාහයි. ලංකාවේ ටොන් එක්ලක්ෂ හැටතුන්දාහයි. ඇත්තටම ගරු ඇමතිතුමනි, අපේ තාක්ෂණය ඒ පැත්තෙන් දියුණු වෙලා නැහැ.

ඔබතුමා වෙරළබඩට ගියොත් පෙනේවි. පවුල් කිහිපයක් මුල් කරගෙන -ඒ ප්‍රදේශයේ ජනතාවට ගන්න මුදල් නැහැ- පවුල් 10කට, පවුල් 15කට society ක්‍රමයට ට්‍රෝලර් යාත්‍රාවක් දෙන්න පුළුවන්. එහෙම නැත්නම් ලොකු නැවක් දෙන්න පුළුවන්. මේ ආයතනය මඟින්, සාගර විශ්වවිද්‍යාලය මඟින් ආධාර ලබා ගෙන මේ වාගේ ව්‍යාපෘතියක් රට පුරා ව්‍යාප්ත කරන්න ඔබතුමන්ලාට පුළුවන් නම් ඉදිරි අනාගතයේදී ධීවර ක්ෂේත්‍රයේ යම් කිසි සංවර්ධනයක් දකින්නට පුළුවන් වෙයි කියලා මම හිතනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා. ඒ කාලය ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාට පැහැදිලි කිරීමකට ලබා දෙනවාද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ, දෙන්නේ නැහැ. ඔබතුමන්ලා බාධා කළ නිසා දෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. එහෙම නම් ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම fish production ගැන බලන්න. 2000 වර්ෂයේ සිට බැලුවොත් 2000 දී, as a percentage of GDP, 2.7යි. 2013 වන විට එය 1.3ට බැහැලා. බාගයකට වැඩිය බැහැලා. 2.7 තිබුණු එක 1.3ට බැහැලා. මම හිතන විධියට ඔබතුමන්ලාට විශේෂ කාර්ය භාරයක් තිබෙනවා. අපේ රට දුප්පත් රටක් බව අපි පිළිගන්නවා. අපි කියන්නේ නැහැ ඔබතුමන්ලාගේ ආණ්ඩුව නිසාම මෙය වෙනවා කියලා. නමුත් අපි කියන්නේ ඔබතුමන්ලා දැමිය යුතු තැනට නොවෙයි සල්ලි දමන්නේ කියලායි. හම්බන්තොට වරායට නොවෙයි සල්ලි අවශ්‍ය වුණේ. මත්තල ගුවන් තොටුපොළට නොවෙයි සල්ලි අවශ්‍ය වුණේ. හම්බන්තොට ක්‍රීඩාංගණයට නොවෙයි සල්ලි අවශ්‍ය වුණේ. අපි කියන්නේ මේකයි. අපි කථා කරන්නේ රටේ අනාගතය ගැන හිතලායි. එහෙම නැතිව ඊර්ෂ්‍යාවට, ක්‍රෝධයට නොවෙයි. අපි කියන්නේ, මේවා හදන්න ඕනෑ තැන්වල හදන්න කියලායි. ඔබතුමන්ලා දැන් මේ විශ්වවිද්‍යාලය හදන්නේ හම්බන්තොට නේද? ඒකට අපේ විරුද්ධත්වයක් නැහැ. සාගර විශ්වවිද්‍යාලය හෝ වෙනත් යම් ධීවර කර්මාන්තයක් හෝ හම්බන්තොට ආරම්භ කළාට අපේ විරුද්ධත්වයක් නැහැ. ජනාධිපතිතුමාගේ ගමට ඒවා දෙන්න ඕනෑ. අපි කියන්නේ නැහැ එපා කියලා. නමුත් අපි කියන්නේ අනවශ්‍ය දේවල් කරන්න එපා කියලායි. මේ රටේ දුප්පත් ජනතාව ඉන්නවා. එදා වේල හොයා ගන්න බැරිව අමාරුවෙන් ජීවත් වන ජනතාවක් රටේ ඉන්න විට අනවශ්‍ය වියදම් නැවැත්විය යුතුයි. ඉදිරි අනාගතයේදී මේ අංශය දියුණු කිරීමට ඔබතුමාට ශක්තිය ලැබෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා. අවුරුදු දෙකක් තුළ අපි ඔබතුමා සමඟ කථා කරන්නම්, මේ විශ්වවිද්‍යාලය හරහා නිර්මාණය කළ රැකියා ප්‍රමාණය පිළිබඳව. විදේශ රටවලින් අපට විශාල රැකියා ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන්. මැලේසියාව, තායිලන්තය වාගේ ආසියාව අවට තිබෙන දියුණු රටවලට රැකියා සඳහා පුද්ගයින් යැවීමට අපට පුළුවන්. මම ඔබතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා. මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ විශ්වවිද්‍යාලය සඳහා විශාල මුදලක් යොදන්න, මේකෙන් ගන්න පුළුවන් උපරිම ප්‍රයෝජනය ගන්න කියලා. අපේ රටට රැකියා ලබා දීලා, විදේශවලට රැකියා සඳහා යවලා ආදායම ලබා ගන්න පුළුවන් විධියට උපරිම සහයෝගය ලබා දීලා, රටට යමක් කිරීමට ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.00]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කරුණු කිහිපයක් සඳහන් කරන්නට මම බලාපොරොත්තු වෙනවා. මම ඊයේ උපදේශක කාරක සභාවේදී කරුණු කිහිපයක් අමාත්‍යතුමාගේ අවධානයට ලක් කළා. මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ අගෝස්තු මාසයේ 06වන දායි. ඒ අනුව අද වන විට සති දෙකයි. ඒ වාගේම මම පසු ගිය පාර්ලිමේන්තු සතියේදී මේ සභාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාගෙන් රීති ප්‍රශ්නයක් ඇහුවා. ඒ තමයි, මේ පනත් කෙටුම්පත ඒ වන විටත් උපදේශක කාරක සභාවට යොමු කරලා තිබුණේ නැහැ කියන එක. ඒ අනුව සහකාර මහ ලේකම්තුමිය මේ ස්ථානයට මට ලිඛිතව දැනුම් දීමක් කළා 19වන දින -ඊයේ දින- උපදේශක කාරක සභාව රැස්වීමට යොදාගෙන තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට එක කාරණයක් තමයි, 06වන දා පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා අද විවාදයට ගන්නවා. "මේ පනත් කෙටුම්පත ගැසට් කරලා තිබෙනවා. මෙහෙමයි. මෙහෙමයි" කියා කියන්න පුළුවන්. නමුත් ඕනෑම පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාම තමයි රටේ අනිකුත් අයගේ අවධානයට ලක් වන්නේ. විශ්වවිද්‍යාලයක් පිහිටුවීම සම්බන්ධ පනත් කෙටුම්පතක්, එතරම් වැදගත් යැයි සලකන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සති දෙකක් වැනි කෙටි කාලයක් තුළදී සංවාදයට භාජනය කිරීමට ඉඩ දීම සුදුසු නැහැ කියන කාරණය මම ඊයේත් මතු කළා. ඒ වාගේම උපදේශක කාරක සභාව පැවැත්වුණේ ඊයේයි. ඊයේ මේ පනත් කෙටුම්පත උපදේශක කාරක සභාවට යොමු කරලා, අද පාර්ලිමේන්තුවේ සම්මත කරනවා. එහෙම නම්, ඇයි එහෙම කළේ කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ වාගේම, ඒ වන විටත් උපදේශක කාරක සභාවේ අවධානයට යොමු කරලා තිබුණේ නැහැ. ඊයේ ඇමතිතුමා ඒකට උත්තරයක් දුන්නා. මේ විවාදයේදී අවසාන වශයෙන් උත්තර දෙන කෙනෙකු ඒ සම්බන්ධව තවත් පැහැදිලි කිරීමක් කළොත් හොඳයි. මොකද, උපදේශක කාරක සභාවේදී ඒ පිළිබඳව මම විතරයි දැන ගත්තේ. දැන් රටම ඒ කාරණය පිළිබඳව දැන ගත යුතුයි.

දෙවෙනි කාරණය මෙයයි. සත්‍ය ලෙසම මෙයින් කරන්නේ "ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය" කියන නම වෙනස් කිරීමයි. වෙන මොකුත් නැහැ. නම වෙනස් කරනවා, "විශ්වවිද්‍යාලය" කියලා. කෙනෙකුට හිතෙන්න පුළුවන් විශ්වවිද්‍යාලය කියලා-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

*අනතුරුව ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කාරක සභාපතිතුමා** *මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு,* மாண்புமிகு ஜானக பண்டார அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. JANAKA BANDARA *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය විශ්වවිද්‍යාලයක් බවට පත් වෙනවා, උපාධි ප්‍රදානය කරන ආයතනයක් බවට පත් වෙනවා, ලොකු වෙනසක් වෙනවා කියලා කෙනෙකුට කියන්න පුළුවන්. 2002 දී අති විශේෂ ගැසට් නිවේදනයකින් ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයට උපාධි ප්‍රදානය කිරීමේ අවරසය දීලා තිබෙනවා. එම නිසා ඇත්තටම සිදු වන්නේ නම වෙනස් කිරීම පමණයි. කොහොමත් මෙම ආණ්ඩුවේ ගොඩක් ව්‍යාපෘතිවල තිබෙන්නේ නම වෙනස් කිරීම විතරයි. වෙන අමුතු දෙයක් නැහැ. ඒ නිසා ඒ ගැන පුදුම වෙන්න දෙයක් නැහැ.

මට තිබෙන වෙලාව විනාඩි 5කට සීමා වන නිසා මම නිශ්චිත ප්‍රශ්න කිහිපයක් අහන්නට කැමැතියි. ඇමතිතුමනි, ඔබතුමා හෝ, - ඔබතුමා කථා කළ නිසා ඒ අවස්ථාව නැතිව ඇති- වෙනත් කවුරුන් හෝ ඒ සඳහා උත්තර දෙයි කියා මා බලාපොරොත්තු වෙනවා. ඔබතුමා ඊයේ කිව්වා උපකුලපතිවරුන්ගේ සේවය අවුරුදු 65 දක්වා ලබා ගැනීමට අවස්ථාව විශ්වවිද්‍යාලවල තිබෙනවා කියලා. අද විවාදයට ගනු ලබන පනත් කෙටුම්පත 1978 විශ්වවිද්‍යාල පනතට අදාළ එකක් නොවෙයි. මේ පනත් කෙටුම්පතේ ඒ බව සඳහන් වෙලා තිබෙනවා. විශ්වවිද්‍යාල පනතට අදාළව ඒ කාරණය හරි. එම නිසා මම මේ සභාවේදී රජය වෙනුවෙන් ආණ්ඩු පක්ෂයෙන් දැන ගන්නට කැමැතියි, විශ්වවිද්‍යාල පනතට සම්බන්ධ නොවන ආයතනයකත් විශ්‍රාම යන වයස අවුරුදු 65ක් කළේ ඇයි කියලා. විශ්වවිද්‍යාල පනතට අදාළ ආයතනවලට අවුරුදු 65 හරි. නමුත් විශ්වවිද්‍යාල පනතට අදාළ නොවන තැන්වලදී රාජ්‍ය සේවයේ විශ්‍රාම යන වයස අවුරුදු 60යි. එම නිසා ඊයේ දුන්නු උත්තරයේ පටලැවිල්ලක් තිබෙනවා.

මගේ දෙවෙනි ප්‍රශ්නය මෙයයි. මෙම උපාධි පාඨමාලාව ක්‍රියාත්මක වන්නේ NVQ - 5 මට්ටමට කලින් විතරයි. ඊට පසු අවස්ථාවක් නැහැ. ඒ නිසා ධීවරයන් සහ ධීවර කර්මාන්තය ආශ්‍රිතව ජීවත් වන ආර්ථික හැකියාව අඩු අයට NVQ 5 න් පසුව ආපසු ගාස්තු ගෙවලා තමයි ඉගෙන ගන්න වෙන්නේ. ඒ නිසා මෙමඟින්, අපේක්ෂිත අරමුණ ඉෂ්ට වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සඳහා ධීවර අමාත්‍යාංශයේ උපකරණ, සම්පත් තමයි යොදවා ගන්නේ. ඒ නිසා එහි ප්‍රතිලාභ, නොමිලේ, නිදහසේ අධ්‍යාපනය ලබා ගැනීමට අයිතිය තිබෙන අයට ලැබිය යුතුයි. නමුත් එහෙම ලැබෙන්නේ නැහැ. මම මේ පදනමට විරුද්ධයි. ඒ නිසා මේ පනත් කෙටුම්පතට මගේ විරෝධතාව ප්‍රකාශ කරනවා.

දැන් මේක තමයි ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ. මොකක්ද? පෞද්ගලික විශ්වවිද්‍යාල ගෙන ඒමේ ප්‍රතිපත්තිය. ඒ වෙනුවෙන් මරාගෙන මැරෙන සටනක් කරනවා උසස් අධ්‍යාපන ඇමතිතුමාත්, සමහර අයත්. නමුත් පෞද්ගලික විශ්වවිද්‍යාල ගෙන එන්න බැරි වෙලා තිබෙනවා. ඇයි බැරි වෙලා තිබෙන්නේ? මේ රටේ ඒ සම්බන්ධයෙන් ලොකු විරෝධයක් තිබෙන නිසා. ඒ වෙනුවෙන් විශාල මිලක් මේ රටේ තරුණයන්, ශිෂ්‍යයන්, බුද්ධිමතුන් ගෙවා තිබෙනවා. ඒ නිසා පෞද්ගලික විශ්වවිද්‍යාල ගෙන එන්න බැරි වෙලා තිබෙනවා. දැනටත් ඒ පනත් කෙටුම්පත පස්සට ගිහිල්ලායි තිබෙන්නේ. නමුත් දැන් වෙන පාරකින් ඒවා එනවා. පෞද්ගලික විශ්වවිද්‍යාල හදන්න පනතකින් පෞද්ගලික ආයතනවලට ඉඩ දෙන්නේ නැතිව, උපාධිය මුදලට විකිණීම ආණ්ඩුව හරහා කරනවා. කොහොමද ඒක කරන්නේ? මීට කලින් පාර්ලිමේන්තුවට ගෙනාවා ජෝන් කොතලාවල ආරක්ෂක පීඨයෙන් වෛද්‍ය උපාධිය මුදලට දීම සඳහා පනත් කෙටුම්පතක්. ගෙනැල්ලා ඒක සම්මත කළා. මම විරුද්ධ වුණා එහිදීත්. මේ පාර්ලිමේන්තුවේ ගණපූරණයත් නැතිව ඒ පනත් කෙටුම්පත සම්මත කළා. පෞද්ගලික ආයතනවලට උපාධිය විකිණීමේ අයිතිය දෙන්න බැරි නිසා, ආණ්ඩුව දැන් ඒ විධියට කරනවා. කොහොම හරි කරනවා. ඒ වැඩේ හරිද? මීට කලින් ආරක්ෂක අමාත්‍යාංශයත් සම්බන්ධවන විධියට එකක් ගෙනාවා. දැන් වැඩේ ලේසියි. රාජපක්ෂ කෙනකු ගෙනෙන විධියට වැඩේ ගෙනෙනවා.

අපි කවුරුත් දන්නවා, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ වැඩි කොටසකට මැදිහත් වන්නේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා බව. ඒකට කමක් නැහැ. හෙට අනිද්දා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයත් තවත් මේ වාගේ එකක් ගෙනෙයිද දන්නේ නැහැ. මුදල් අමාත්‍යාංශයෙනුත් තවත් එකක් ගෙනෙයිද දන්නේ නැහැ. ඒ විධියට එක එක අමාත්‍යාංශවලින් උපාධි ප්‍රදානය කිරීමේ අවස්ථා නිර්මාණය කරනවා. උපාධි ප්‍රදානය කිරීමේ අවස්ථාව ලබා දෙන විශ්වවිද්‍යාලයක් නම් මේ පනත් කෙටුම්පත ගෙනෙන්න එපායැ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්! නමුත් එහෙම ගෙනෙන්නේ නැහැ. ඇයි ඒ? එතකොට වැඩේ මල්ලෙන් එළියට පනිනවා. දැන් මල්ලෙන් පැනලායි තිබෙන්නේ. ඒ නිසා මොකද කරන්නේ? පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවන්න බැරි නිසා, ඒ වෙනුවෙන් පනත් කෙටුම්පතක් ගෙනැල්ලා ඒකට ඉඩ කඩ දෙන්න බැරි නිසා, කොක්කෙන් බැරි නම් කෙක්කෙන් හරි කියලා වෙනත් විධියකට පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවනවා.

ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පිහිටෙව්වේ මුදල් ගෙවලා ඉගෙන ගන්න බැරි, මේ රටේ සාමාන්‍ය පන්තියේ අයට ඒ විෂයය පිළිබඳ ප්‍රවීණතාවක් ලබා ගන්න, උපාධියක් ලබා ගන්න අවස්ථාව සැලසීමට නම්, ඒ අවස්ථාව මෙමඟින් ලැබෙන්නේ නැහැ. මුදල් ගෙවලා උපාධිය ගන්න ව්‍යුහය මේ පනත් කෙටුම්පතේ පැහැදිලිව හදලායි තිබෙන්නේ. 43වැනි වගන්තියේ තිබෙනවා, මුදල් සම්බන්ධයෙන්. විශ්වවිද්‍යාලයට අරමුදලක් තිබිය යුතු බව එහි සඳහන් කරනවා. එම අරමුදලට මුදල් සොයා ගන්නේ කොහොමද? පනත් කෙටුම්පතේ තිබෙනවා, මුදල් සොයාගන්නේ කොහොමද, එහි රීති හදන්නේ කවුද කියන කාරණා. විශ්වවිද්‍යාලයට ඒ බලය ලැබෙනවා. මුදල් සොයා ගැනීමේ බලය මේ විශ්වවිද්‍යාලයට ලැබෙනවා. එහෙම නම් මොකක්ද මේ කරන්නේ? දැන් පටන් ගන්නේ රුපියල් 50,000න් වෙන්න පුළුවන්. නමුත් හෙට එය තවත් ලොකු ගණනක් වෙන්න පුළුවන්. ඒ සඳහා ඉඩ කඩ විවර කරනවා, ආණ්ඩුව. උපාධිය මුදලට විකිණීම පෞද්ගලිකව කරන්න බැරි නිසා, රජය මැදිහත් වෙලා රජය හරහා එය ක්‍රියාත්මක කරන්න ගෙනෙන පනත් කෙටුම්පතක් තමයි මේක. ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක පීඨය සම්බන්ධයෙනුත් මෙවැන්නක් ගෙනාවා. දැන් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හරහාත් ගෙනෙනවා. හෙට තවත් අමාත්‍යාංශයකින් ගෙනැල්ලා මේ රටේ පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවීමේ කටයුත්ත වෙනත් පාරවල් හරහා ක්‍රියාත්මක කරයි. ඒ නිසා මේ පනත් කෙටුම්පතට මගේ විරෝධය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 6.08]

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දැක්කා ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා මේ වැඩසටහන විශේෂයෙන් අගය කරමින් කථා කළ බව. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය 1999 දී පිහිටුවනු ලැබුවේ විශේෂයෙන් ධීවරයන් සඳහා වූ කටයුතු මුල් කරගෙනයි කියලා එතුමා කිව්වා. නමුත් මේ වැඩ පිළිවෙළ හන්දා ධීවර දරුවන්ට යම්කිසි අඩුවක් වේවිද කියලා එතුමා විශේෂයෙන් ඇහුවා. එතුමා එහෙම කියද්දී, අපේ ගරු විජිත හේරත් මැතිතුමා මෙහිදී සඳහන් කළා, විශ්වවිද්‍යාල උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයිතියි, 1978 විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට අදාළ නොවිය යුතුයි කියා මෙහි සඳහන් වන නිසා මෙය විශ්වවිද්‍යාලයක් වන්නේ නැහැ කියලා. ඇත්තටම මේකෙන් පෙනෙන්නේ, වෘත්තීය අධ්‍යාපනය හා ඒ ක්‍රියාකාරිත්වය පිළිබඳ ජනතා විමුක්ති පෙරමුණේ තිබෙන නොදැනුවත්කමයි. ඒ විතරක් නොවෙයි. ජාතික වෘත්තීය සුදුසුකම් - NVQ - හරහා කොහොමද දරුවකුගේ ගමන් මාර්ගය උපාධිය දක්වා සැකසිලා තිබෙන්නේ කියන එක පිළිබඳ නොදැනුවත්කමයි. ඒකයි මෙතැන වෙලා තිබෙන්නේ.

1978 විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුවම සාගර විශ්වවිද්‍යාලය පිහිටෙව්වත් යම් දේවල් වෙනස් කළ යුතුව තිබෙනවා. අපි කියන්නේ නැහැ, ඒ පනතේ තිබෙන යම් යම් ප්‍රතිපාදන මේ පනතේ නැහැ කියලා. බොහෝ දේවල් තිබෙනවා. නමුත් වෙනස් කළ යුතු දේවල් තිබෙනවා. ඒ මක්නිසාද? ඒ පනත අනුව ගියොත්, අපොස උසස්පෙළ විභාගයේ Z ලකුණ අනුව තමයි මේ විශ්වවිද්‍යාලයට දරුවන් බඳවා ගන්න වෙන්නේ; වැඩිම ලකුණ තිබෙන අය. ඊළඟට රටේ දිස්ත්‍රික්ක quota එක අනුවයි ළමයි ගන්න වෙන්නේ. එතකොට, අපේ ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා කිව්වා වාගේ, ගරු ෆීලික්ස් පෙරේරා මැතිතුමා කිව්වා වාගේ ධීවර දරුවන්ට විශේෂත්වයක් කරන්නේ කොහොමද? දැනටත් ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පවත්වාගෙන යන මේ උපාධි පාඨමාලා තුනට දරුවන් ඇතුළු කිරීම සඳහා අපි ක්‍රම දෙකක් අනුගමනය කරනවා. එකක් තමයි අපොස උසස් පෙළ සමත් දරුවන් ඇතුළත් කිරීම.

දෙවැනි එක තමයි, අපොස උසස් පෙළ අසමත් වුණත් අපොස සාමාන්‍ය පෙළ සමත්, ඒ වාගේම ධීවර ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්ද හා ක්‍රියාකාරකම්වල යෙදිලා ඉන්න අයට අවස්ථාව දෙනවා මේ උපාධි පාඨමාලාව සඳහා ඇතුළත් වෙන්න. ඒ විතරක් නොවෙයි. ධීවර ක්ෂේත්‍රය ආශ්‍රිත විවිධ වෙළෙඳ කටයුතුවල, එහෙම නැත්නම් විවිධ කර්මාන්තවල යෙදිලා ඉන්න අයට, NVQ 4 දක්වා ආපු දරුවන්ට අපි මේ උපාධිය හැදෑරීම සඳහා අවස්ථාව දීලා තිබෙනවා. ඒ නිසා මේක සම්පූර්ණයෙන් වෙනස් ක්‍රමයක්. මෙහි දරුවන්ට උගන්වන්නේ ඔවුන් රැකියා ගතකරමින්. සාමාන්‍ය විශ්වවිද්‍යාල පනත අනුව දරුවන් රැකියා ගත කරමින් ඉගැන්වීමේ ක්‍රමයක් නැහැ.

ඒ විතරක් නොවෙයි. ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමාටත් යම් කාරණයක් කියන්න තිබෙනවා. මේ දරුවන්ට මුදල් ප්‍රශ්න තිබෙනවා නම්, NVQ 5 මට්ටමේදී එළියට ගිහිල්ලා රැකියාවක් කරලා මුදල් හම්බ කරගෙන ඕනෑ නම් නැවත මේ පාඨමාලාවට එන්නත් පුළුවන්. NVQ 6 කියන්නේ උසස් ජාතික ඩිප්ලෝමාවක්. ඒ නිසා NVQ 5 මට්ටම සම්පූර්ණ කරලා රැකියාවක් කරලා -ඕනෑ නම් අවුරුදු දෙකක් රැකියාව කරලා- නැවත මේ වෘත්තීය පුහුණුවට එන්න පුළුවන්. ඒ විධියට මේ ක්‍රම ඇතුළත් කරගෙන අනිවාර්යයෙන් දරුවන්ට රැකියාවක් ලැබෙන විධියටයි මේ කටයුතු කරන්නේ. රැකියා නැතිව රැකියා විරහිත උපාධිධාරින්ගේ සංගමයට බැඳිලා රැකියා ඉල්ලමින් මහ පාරේ බුදියා ගන්නේ නැතිව, මේ හැම කෙනකුටම රැකියාවක් ලබා ගන්න පුළුවන් රැකියා පුහුණුවත් එක්කයි මේ වැඩසටහන ඉදිරිපත් කරනු ලබන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍ය විශ්වවිද්‍යාල අධ්‍යාපනයට වඩා, ශාස්ත්‍රීය හා න්‍යායික අධ්‍යාපනය ඇතුළත් අධ්‍යාපන ක්‍රමයට වඩා මේ ක්‍රමයේ ලොකු මූලික වෙනසක් තිබෙනවා. මේක වෘත්තීය අධ්‍යාපනය. මේක තමයි ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව. අපේ රටේ මේ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් රාමුවක් තිබුණාට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ, විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ තවම ඒ රාමුව ඇති කරලා නැහැ. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා ඉතා නිවැරදිව කිව්වා, ශ්‍රී ලංකා වෘත්තීය සුදුසුකම් රාමුව -SLQF- අනාගතයේ ඇති වෙනවා කියලා. නමුත් තවම ඒක ඇති වෙලා නැහැ. ඒ SLQF රාමුව එනතුරු මොන විධියටද, මොන මොන මට්ටම්වල මොන මොන සුදුසුකම් හා නිපුණතා තිබෙන අයද ඒ ඒ මට්ටම් සඳහා හඳුනා ගන්නේ කියන එකට තවම සහතිකයක් නැහැ. ඒ වුණාට, ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව යටතේ පහළ මට්ටමෙන් පටන් අරගෙන, උපාධිය දක්වා නැත්නම් තාක්ෂණික උපාධියක් දක්වා දරුවකු ගමන් කරන්නේ කොහොමද කියන එක ඉතා පැහැදිලිව මෙහි සඳහන් කරලා තිබෙනවා. ඒ නිසා ඒ වැඩ පිළිවෙළ සාමාන්‍ය විශ්වවිද්‍යාල පනතට පිටස්තරයි. මේක යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය. මේක උසස් අධ්‍යාපන අමාත්‍යාංශය නොවෙයි. ඒ නිසා මේ ස්ථාපිත කෙරෙන සාගර විශ්වවිද්‍යාලයට ඒ විශ්වවිද්‍යාල පනත අනුවම කටයුතු කළ නොහැකි බව සාමාන්‍ය බුද්ධියක් තිබෙන ඕනෑම කෙනකුට, යම් අවබෝධයක් තිබෙන ඕනෑම කෙනකුට වැටහෙනවා ඇති.

ඊළඟට ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා, මේ පනත් කෙටුම්පතේ තව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා කියලා. එනම්, මුදල් අය කිරීම් පිළිබඳව කොළේ වහලා ගහලා තිබෙනවා කියලා එතුමා කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනතේ, හතරවන වගන්තියේ (ඉ) උප වගන්තියෙන් ආයතනයේ - මේ දක්වා තිබුණු ආයතනය- බලතල පිළිබඳව මෙසේ සඳහන් වනවා:

"(ඉ) ආයතනය විසින් සපයනු ලබන අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩ සටහන් සඳහාගාස්තු හෝ වෙනත් යම් ගෙවීම් අය කිරීම; "

ඒ අනුව ගාස්තු අය කිරීමේ බලය එම ආයතනයටත් ලැබී තිබුණා. ඒ නිසා මෙතැනදී විශේෂ වෙනසක් කරලා නැහැ. අනිවාර්යයෙන්ම මෙතැනදී කර තිබෙන්නේ ඒ තිබුණු ආයතනයම ඊට වඩා පුළුල් ක්ෂේත්‍රයකට ගෙන යාමයි. අපි දිගින් දිගටම කථා කරපු විධියට සමස්ත සාගරයේ ඇති සියලු සම්පත් නෙළා ගැනීමේ හැකියාව මේ රටේ ආර්ථිකයට ලැබෙන පරිදි මෙය පුළුල් කිරීමේ කටයුත්තේදී මීට පෙර තිබුණු ආයතනයේ පැවති ලක්ෂණ ඒ විධියටම උකහාගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ආයතනය මඟින් දැනට පවත්වාගෙන යන උපාධි පාඨමාලා සඳහාත් ගාස්තු අය කරනවා. මේ උපාධි පාඨමාලා පවත්වාගෙන යාම සඳහා 2003 වසරේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මේ ආයතනය ලියා පදිංචි කර තිබෙන අතර උපාධි සහතික ප්‍රදානය කිරීමේ බලයද ලබා ගෙන තිබෙනවා. අනිකුත්උපාධි පාඨමාලා සමඟ සංසන්දනය කරනකොට, පෞද්ගලික ආයතනවල උපාධි පාඨමාලා සමඟ සංසන්දනය කරනකොට අතිශයින්ම අඩු ගාස්තු ව්‍යුහයන් තමයි මෙහි තිබෙන්නේ. කොටින්ම කියනවා නම් මේ උපාධි පාඨමාලාව

[ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා]

අවසන් කරලා නියමිත රැකියාව ලබා ගත්තාම, අපේ ජෝශප් මයිකල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියපු විධියට මාසයකට රුපියල් ලක්ෂ පහක පඩියකට නැවක රැකියාවකට යන්න පුළුවන් වුණොත් එක මාසයක පඩියෙන් සමස්ත අවුරුදු හතරක පාඨමාලාවේ මුළු මුදලම ගෙවා ඉවර කරන්න පුළුවන්. ඒ විධියේ තත්ත්වයක් තමයි අපි මේ රැකියා තුළින් ලබා දෙන්නේ. ඒ විධියේ අධ්‍යාපනයක් තමයි අපි මේ දරුවන්ට ලබා දෙන්නේ. විශේෂ උපාධියට - BSc in Marine Engineering (Special) Degree එකට- වසර 4 පාඨමාලාවක් සඳහා වසරකට අය කරනු ලබන්නේ රුපියල් 125,000ක් පමණයි. මම සොයා බැලුවා, පිටරට විශ්වවිද්‍යාලයකට ගියොත් මේ සඳහා වියදම් කළ යුතු මුදල රුපියල් ලක්ෂ 160කටත් වැඩියි. වසර හතරක විශේෂ පාඨමාලාවට මෙහිදී අය කරන්නේ රුපියල් ලක්ෂ පහක් පමණයි. මෙරට පෞද්ගලික ආයතන පිටරට ආයතනත් සමඟ එකතු වෙලා මේ පාඨමාලාව කරනවා. මෙහිදී අපේ ජෝශප් මයිකල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා දිගින් දිගටම කථා කරපු CINEC ආයතනයත් BSc in Marine Engineering පාඨමාලාව කරනවා. ඒ ගොල්ලන් මේ සඳහා අය කරනු ලබන මුදල රුපියල් ලක්ෂ 28ක් වෙනවා. මම අද උදේ ඒ ගැන අහලා බැලුවා. මේ ආයතනය හරහා අපි ඒ පාඨමාලාව රුපියල් ලක්ෂ පහක මුදලකට ලබා දෙනවා. රුපියල් ලක්ෂ 28කට ඒ පාඨමාලාව ලබා දෙන බව කියපු වෙලාවේ එහි අධ්‍යක්ෂතුමා මට කිව්වා, ඉගෙන ගන්නා කාලය තුළදී රැකියාගත කිරීමේදී ඔවුන් උපයන මුදල රුපියල් ලක්ෂ 68ක්ය කියා. එතකොට ඒ රැකියාගත කරන වෙලාවේ උපයන රුපියල් ලක්ෂ 68ක මුදලින් මේ රුපියල් ලක්ෂ 28 ගෙවා ඔවුන්ට සාක්කුවටත් මුදලක් ඉතිරි වෙනවාය කියා එතුමා දැනුම් දුන්නා.

ඒ නිසා අපි එවැනි පාඨමාලාවලට යන්න ඕනෑ. එහෙම නැතිව සෛද්ධාන්තිකව ඉගෙන ගනිමින්, අසහනයට පත් වෙලා රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංගමයට බැඳිලා, එහෙම නැත්නම් 'රැකියා දියව්' කියා පාරේ බුදියන උපාධිධාරීන්ගේ සමාජයක් ඇති කරන්න නොවෙයි අප කටයුතු කළ යුත්තේ. රැකියාවකට ගිහිල්ලා දහඩිය මහන්සියෙන් වැඩ කරලා තමන් උපයා ගන්නා මුදලේ වටිනාකම දන්නා, තමන් ලබා ගත් උපාධියේ වටිනාකම දන්නා උපාධිධාරීන් තමයි අපි මේ හරහා බිහි කරන්න යන්නේ. ඒ නිසා අලුතින් පිහිටුවන මෙම විශ්වවිද්‍යාලයේ උපාධි පාඨමාලා තුළට අපි අනිවාර්යයෙන්ම එවැනි රැකියාගත කිරීමේ පාඨමාලා අන්තර්ගත කරනවා. අපි විදේශ නැව් සමාගම් එක්ක ඇති කර ගන්නා ගිවිසුම් හරහා ඔවුන් ඒ පුහුණු වීමේ කාල සීමාවේදී කරන වැඩ කටයුතු හරහා ඔවුන්ට උපයා ගත හැකි මුදල - CINEC ආයතනය වාගේ- ඔවුන් ගෙවන මුදල වාගේ කිහිප ගුණයකින් වැඩි වෙනවා. එවැනි වැඩ පිළිවෙළවල් හරහා විශ්වවිද්‍යාලයත් ජයග්‍රහණය කරන, ශිෂ්‍යයාත් ජයග්‍රහණය කරන ක්‍රමයකට අනාගතයේදී අපි යනවා. දැනටත් එවැනි වෘත්තීය පාඨමාලාවලට ගිහින්, වෘත්තීය පුහුණුව ලබලා, රැකියාගත කරලා, ඒ රැකියාගත කිරීම් හරහා ආදායම් උපදවා තමයි මේ දරුවන්ට දැන් පවා මේ පාඨමාලා පවත්වනු ලබන්නේ. මෙම ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පතේ 5 වන වගන්තියේ (ත) උප වගන්තියට මම තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරවනවා. එහි මෙසේ සඳහන් වනවා:

"(ත) තත්කාර්ය සඳහා සාදනු ලබන යම් ප්‍රඥප්තියකට අනුකූලව අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග පිරිනැමීම;"

ඒ අනුව මේ පිහිටුවන්න යන සාගර විශ්වවිද්‍යාලය සියයට සියයක්ම ගාස්තු අය කිරීමේ විශ්වවිද්‍යාලයක් වන්නේ නැහැ. සුදුස්සන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කරන, සුදුස්සන්ට ශිෂ්‍යාධාර ප්‍රදානය කරන, ඒ සඳහා අවශ්‍ය වූ ඉඩකඩ; පහසුකම් තිබෙන ආයතනයක් විධියට තමයි මේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කරන්නේ. ඒ නිසා මේ සුළු මුදලක් අය කිරීම හරහා මෙහි තිබෙන වටිනාකම මොන ආකාරයෙන්වත් පහළ යන්නේ නැති බව මම කියා සිටිනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Deputy Minister, you have only one more minute.

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කථිකයෝ කීප දෙනෙක් කථා නොකළ නිසා මට තව සුළු වේලාවක් ගන්න පුළුවන් වෙයි කියා මා සිතනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

We need at least 10 minutes to pass the amendments. You may take two more minutes.

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

මට තව විනාඩි දෙකක් ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මීට අමතරව, අපේ ධීවරයන් සඳහා මේ පාඨමාලා ඇතුළේ විශේෂ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන් ජංගම පාඨමාලා, ධීවර ප්‍රජාවට එන්ජින් අලුත්වැඩියා කිරීමට, දැල් හා ධීවර ආම්පන්න අලුත්වැඩියා කිරීමට, අලුත් මාළු අස්වැන්න ලබා ගැනීමේ, සුරක්ෂණය කිරීමේ හා ප්‍රවාහනය කිරීමේ නව ක්‍රමවේද ආදිය පිළිබඳව දැනටත් නොමිලයේ ඉගැන්වෙනවා. ඒවා වඩාත් ප්‍රබල ලෙස මේ හරහා අනාගතයේදී ක්‍රියාත්මක වෙනවා.

ඒ විතරක් නොවෙයි, මේ ආයතනය දකුණු ආසියාවේ එකම සාගර විශ්වවිද්‍යාලය බවට පත් වෙනවා. දැනුම් හා නාවුක කේන්ද්‍රීය ආර්ථිකයක් ගැන, විශේෂයෙන් Indian Ocean Rim Association එක ගැන කලිනුත් කියවුණා. ඒ හරහා නිල් සයුරු ආර්ථිකය - Blue Ocean Economy - ඇති වීමේදී මේ සාගර විශ්වවිද්‍යාලයට විශේෂයෙන් ආසියාවේ සුවිශේෂ තැනක් ලැබෙනවා. අනාගතයේදී අපේ දේශීය දරුවෝ විතරක් නොවෙයි, විදේශීය දරුවනුත් ඇවිත් මෙහි අධ්‍යාපනය ලබනවා ඇති. ඔවුන්ටත් නොමිලයේ උගන්වන්නද අපට කියන්නේ? ඒ විදේශීය දරුවන්ගෙන් අපි විශේෂ පාඨමාලා ගාස්තු අය කරනවා. ඒ අය කිරීම හරහා මේ ආයතනයේ පැවැත්ම සඳහාත්, මේ ආයතනය දියුණු කිරීම සඳහාත් අපට වැඩි වැඩියෙන් මුදල් උපයා ගන්නට; රටට විදේශ විනිමය උපයා ගන්නට දැනුම් හා නාවුක කේන්ද්‍රීය සංවර්ධනයේ සුවිශේෂී වැඩ පිළිවෙළක් මේ හරහා ක්‍රියාත්මක කරන්නට අපට ඉඩ කඩ ලැබෙනවා. විශේෂයෙන් ඉදිරිපත් වුණු තර්ක වුණේ මේවායි. ඒ අනුව මම හිතනවා, මෙම පනත් කෙටුම්පත මේ රටේ සුවිශේෂී වෙනසක් ඇති කරන, විශේෂයෙන් තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යයක් කියලා. අපේ සාගර සම්පත නියමාකාරයෙන් මෙහෙයවා ගැනීමට හැකි වන මූලික සුවිශේෂී ස්ථානය මෙය වෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට මුල් වූ අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ වාගේම ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාටත් අපේ අවංක ආදර ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය.:*

*"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය." [ගරු ඩලස් අලහප්පෙරුම මහතා]*

*தீர்மானிக்கப்பட்டது.*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு டலஸ் அழஹப்பெரும]*

*Resolved:*

*That the Bill be referred to a Committee of the whole Parliament."- [The Hon. Dullas Alahapperuma.]*

*කාරක සභාවේදී සලකා බලන ලදී.*
*[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]*
*குழுவில் ஆராயப்பட்டது.*
*[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[*MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.]*

***1 සහ 2 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம், 2ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 and 2 ordered to stand part of the Bill.*

## 3 වන වගන්තිය.- (විශ්වවිද්‍යාලයේ මුද්‍රාව.)

වාසகம் 3.- (பல்கலைக்கழகத்தின் இலச்சினை.)

CLAUSE 3.- *(Seal of the University.)*

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, 14 සහ15වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'විශ්වවිද්‍යාලයට සම්පූර්ණ බලය සහ අධිකාරිය ඇති අතර, එම මුද්‍රාව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

***4 සිට 12 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*4ஆம் வாசகத்திலிருந்து 12ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 4 to 12 ordered to stand part of the Bill.*

## 13 වන වගන්තිය.- (පීඨයක පීඨාධිපතිවරයා.)

வாசகம் 13.- (ஒரு பீடத்தின் பீடாதிபதி.)

CLAUSE 13.- *(The Dean of a Faculty.)*

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"13 වන පිටුවේ, 11 සහ 12 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(5) පීඨයක පීඨාධිපතිවරයා ඉවත් කරනු ලැබූ විට, විශ්‍රාම ගිය විට හෝ ඉල්ලා අස් වූ විට හෝ වෙනත් යම් හේතුවක් නිසා මාස' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*13ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 13, as amended, ordered to stand part of the Bill.*

***14 සිට 18 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*14ஆம் வாசகத்திலிருந்து 18ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 14 to 18 ordered to stand part of the Bill.*

## 19 වන වගන්තිය.- (විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලය.)

வாசகம் 19.- (பல்கலைக்கழகத்தின் ஆளுநர் சபை.)

CLAUSE 19.- *(The Board of Governors of the University.)*

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"16 වන පිටුවේ, 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

' (v) නිපුණතා සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ ' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***19වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*19ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 19, as amended, ordered to stand part of the Bill.*

***20 සහ 21 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*20ஆம், 21ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 20 and 21 ordered to stand part of the Bill.*

## 22 වන වගන්තිය.- (ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව.)

வாசகம் 22.- (அனுமதிப்பு, தராதர அங்கீகார மற்றும் தர உறுதிப்பாட்டுப் பேரவை.)

CLAUSE 22.- *(The Admission, Accreditation and Quality Assurance Council.)*

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"24 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(iii) තත්ත්ව සහතික කිරීමේ සභාවේ අධ්‍යක්ෂවරයා' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***22 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*22ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 22, as amended, ordered to stand part of the Bill.*

***23 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*23ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 23 , as amended, ordered to stand part of the Bill.*

## 24 වන වගන්තිය.- (ශාස්ත්‍රීය සභාව.)

வாசகம் 24.- (கல்விப் பேரவை.)

CLAUSE 24.- (*The Academic Council*)

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"29 වන පිටුවේ, 1 වන සහ 2 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(x) විශ්වවිද්‍යාලයේ එක් එක් ශාස්ත්‍රීය අධ්‍යයන අංශවල ප්‍රධානීන්.';"

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***24 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*24ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 24, as amended, ordered to stand part of the Bill.*

***25 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*25ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 25, ordered to stand part of the Bill.*

## 26 වන වගන්තිය.- (පීඨ මණ්ඩලය.)

வாசகம் 26.- (பீடச் சபை.)

CLAUSE 26.- (*The Faculty Board*)

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"32 වන පිටුවේ, 20 සිට 23 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'(ඇ) පීඨයේ සිටින සියලු ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, මහාචාර්යවරු, සහාය මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු සහ කථිකාචාර්යවරු; ' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***26 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*26ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 26 , as amended, ordered to stand part of the Bill.*

***27 සිට 61 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*27ஆம் வாசகத்திலிருந்து 61ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 27 to 61 ordered to stand part of the Bill.*

## 62 වන වගන්තිය.- (නොමනා තැනැත්තන් විශ්වවිද්‍යාල සීමාවන්ට ඇතුළුවීම තහනම් කිරීම.)

வாசகம் 62.- (விரும்பத்தகாத ஆட்கள் சுற்றாடலினுள் பிரவேசிப்பதன் மீதான தடை.)

CLAUSE 62.- (*Prohibition on undesirable persons from entering precincts*)

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"51 වන පිටුවේ, 2, 3 හා 4 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'දිනකට රුපියල් එක් දහසක් බැගින් වූ දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් කළ යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***62 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*62ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 62 , as amended, ordered to stand part of the Bill.*

***63 සිට 66 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*63ஆம் வாசகத்திலிருந்து 66ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 63 to 66 ordered to stand part of the Bill.*

## 67 වන වගන්තිය.- (අර්ථ නිරූපණය.)
வாசகம் 67.- (பொருள்கோடல்.)
CLAUSE 67.- (*Interpretation*)

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"54 වන පිටුවේ, (1) 8 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

"අමාත්‍යවරයා" යන්නෙන් නිපුණතා සංවර්ධන විෂයය පවරා ඇත්තේ කවර අමාත්‍යවරයකු වෙත ද, එම අමාත්‍යවරයා අදහස් වේ.";

(2) 22 සිට 24 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'මහාචාර්ය, පුස්තකාලයාධිපති, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, කථිකාචාර්ය සහ සහකාර පුස්තකාලයාධිපති ද ඇතුළත්'';

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***67 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*67ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 67, as amended, ordered to stand part of the Bill.*

***68 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*68ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 68, ordered to stand part of the Bill.*

## 69 වන වගන්තිය.- (විශ්වවිද්‍යාලය පිහිටුවනතුරු විශේෂ විධිවිධාන.)
வாசகம் 69.- (பல்கலைக்கழகம் தாபிக்கப்படும் வரையிலான விசேட ஏற்பாடுகள்.)
CLAUSE 69.- (*Special Provisions pending the establishment of the University*)

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"55 වන පිටුවේ, (1) 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ජනාධිපතිවරයා විසින් නිපුණතා සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා'';

(2) 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

"(අ) නිපුණතා සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ'';

"56 වන පිටුවේ, 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(4) නිපුණතා සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***69 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*69ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 69, as amended, ordered to stand part of the Bill.*

## 70 වන වගන්තිය.- (ශ්‍රී ලංකා ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ නිලධරයන් සහ සේවකයන්ට විශ්වවිද්‍යාලයේ සේවා නියුක්තිය ලබා දිය යුතු බව.)
வாசகம் 70.- (தேசிய தொழினுட்பக் கல்வி நிறுவகத்தின் அலுவலர்களுக்கும் சேவையாளர்களுக்கும் பல்கலைக்கழகத்தில் தொழில் முனையப்படுதல்.)
CLAUSE 70.- (*Officers and servants of the National Institute of Fisheries and Nautical Engineering to be offered employment in the University*)

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"57 වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සඳහන් දිනයේ සිට විශ්වවිද්‍යාලයේ හෝ 5 වන වගන්තියේ (ඉ)' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***70 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*70ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 70, as amended, ordered to stand part of the Bill.*

***71 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*71ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 71, ordered to stand part of the Bill.*

## පොදු සංශෝධන
## பொதுத் திருத்தங்கள்
## GENERAL AMENDMENTS

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා.

"(1) පනත් කෙටුම්පතේ "සමුද්‍ර විද්‍යාත්මක" යන වචන යොදා ඇති කවර හෝ අවස්ථාවකදී "සාගර විද්‍යාත්මක" යන වචන ආදේශ කිරීමෙන්;

(2) පනත් කෙටුම්පතේ 'ධීවර විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ' යන වචන යොදා ඇති කවර හෝ අවස්ථාවක දී 'නිපුණතා සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ' යන වචන ආදේශ කිරීමෙන්"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***දීර්ඝ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*விரிவுப் பெயர் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Long Title ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදී.***
***කටහඬවල් අනුව " පක්ෂ " මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*வினா விடுக்கப்பட்டது.*
*குரல்களின்படி 'ஆம்' மேலோங்கிற்று என சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.*
*Question put.*
MR. DEPUTY CHAIRMAN OF COMMITTEES, *having collected the Voices, declared that the "Ayes" had it.*

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

Divide!

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Before that, does the House agree to extend the time?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ -පක්ෂව 24 ; විරුද්ධව 01 ; යනුවෙන් - බෙදුණේය.**
*பாராளுமன்றம் நிலைக்கட்டளை 43இன்படி பிரிந்தது: சார்பாக 24; எதிராக 01.*
*The Parliament divided under Standing Order No. 43: Ayes 24 ; Noes 01.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The first Adjournment Question is to be asked by the Hon. Janaka Bandara.

**ගරු ජානක බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஜானக பண்டார)
(The Hon. Janaka Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ගරු ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙත පහත ප්‍රශ්න යොමු කරනවා.

01. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ අරමුණ කුමක් වන්නේද?
02. 2014.07.14 දිනෙන් ආරම්භ වූ සමාජ ඒකාබද්ධ සතිය පැවැත්වීමට හේතු වූ කාරණා කවරේද?
03. එම සතියේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කුමක්ද?
04. එයින් ජනතාව වෙත ලැබුණු ප්‍රතිලාභ කෙසේද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

අපගේ කාර්ය භාරය ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, ජන වාර්ගික සුහදතාව වර්ධනය කිරීම සහ සමාජ ඒකාබද්ධතාව ඇති කිරීමයි. ඒ අනුව,

01. මෙම අමාත්‍යාංශයේ දැක්ම වන්නේ "විවිධත්වයේ එකමුතුව ශක්තියක් වූ, ද්විභාෂාවෙන් හෘදයාංගමව බැඳුණු, සියලු ජන සංස්කෘතික අනන්‍යතාවයන් සුරකින, සමගි සම්පන්න ශ්‍රී ලාංකේය ජාතියක්" යන්නයි.

එකී දැක්මට අනුව, සමානාත්මතාවය සහතික කිරීමට ජාතික ඒකාබද්ධතාවයත්, එකිනෙකාගේ අයිතිවාසිකම් ගරු කිරීම තුළින් ජන වර්ගයන් අතර සුහදතාවයත්, සියලු ප්‍රජාවන්ගේ අනන්‍යතාවයන් සුරැකීමෙන් සියලුම ජන වර්ගයන්ට තමන්ගේ අනන්‍යතාවයේ අභිමානය ලබා දීමටත් කටයුතු සම්පාදනය කරමින් එක්සත් ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනැඟීමේ කාර්යයෙහි අමාත්‍යාංශය නියැලෙමින් සිටී.

02. 2012 වසරේ දී සමාජ ඒකාබද්ධතාවය සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුව එළිදක්වන ලද අතර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සමාජ ඒකාබද්ධතා සතියක් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව 2012 වසරේ සිට සමාජ ඒකාබද්ධතා සතිය ක්‍රියාත්මක කරනු ලබයි. එකී සතිය පුරා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් විවිධ වැඩසටහන්ක්‍රියාවට නංවමින්, සමාජ ඒකාබද්ධතාවයේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම එහි අරමුණයි.

සමාජ ඒකාබද්ධතාවයේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ සමාජය, සමාජ ඒකාබද්ධතාව පිළිබඳව යහපත් ආකල්පයකට ගැනීම මේ සතිය පැවැත්වීමේ මූලික අවශ්‍යතාව, හේතු කාරණාව හැටියට සලකන්නට පුළුවන්.

3. එම සතියේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳව ඇමුණුම 01 හි දීර්ඝ විස්තරයක් සඳහන්ව තිබෙනවා.

4. ඊළඟට එයින් ජනතාව වෙත ලැබුණු ප්‍රතිලාභ හා ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව ඇමුණුම 02 හි සඳහන් සඳහන් වෙනවා.

උදාහරණයක් මම කියන්නම්. 5 වසර ශිෂ්‍යත්වය සඳහා අවශේෂ පන්තිවල සහාය ලබා ගැනීමට නොහැකි අඩු ආදායම්ලාභී දරුවන්ට සිංහල, දෙමළ මාධ්‍ය දෙකෙන්ම ශිෂ්‍යත්ව පුහුණු පන්ති ලබා දුන්නා. හැම දිස්ත්‍රික්කයකම තුන්සියයකට, තුනසිය පනහකට පමණ ආසන්න දරු දැරියන් සංඛ්‍යාවකට එයින් ප්‍රතිලාභ ලැබුණා. ඒ වාගේ විවිධ ප්‍රතිලාභ ලැබුණු කොටස් පිළිබඳව සහ ඒ ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර ඇමුණුම 02හි සඳහන් වෙනවා.

මා ඇමුණුම 01 සහ 02 **සභාගත*** කරනවා.

**සභාමේසය මත තබන ලද ඇමුණුම්:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

**ඇමුණුම 01**

**සමාජ ඒකාබද්ධතා සතිය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්:**

**i. සමාරම්භක උළෙල**

සමාරම්භක උළෙල 2014.07.14 දින පොළොන්නරුවේදී පවත්වන ලද අතර, එහි පළමු අංගය වශයෙන්, ඓතිහාසික ස්ථාන පිළිබඳව දැනුවත් කිරීමේ චාරිකාවක් සංවිධානය කරන ලදි.

දෙවැනි අංගය වශයේන පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී මහජන සංසදයක් පවත්වන ලද අතර, ආගමික නායකයින්, උතුරු මැද පළාතේ දේශපාලන නායකයින්, රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් සංවිධාන සාමාජිකයින් ඇතුළු 180 ක පමණ පිරිසක් ඊට සහභාගී විය.

උත්සවයේ තෙවැනි අංගය වූයේ නාද යාත්‍රා සංගීත ප්‍රසංගයයි. එම ප්‍රසංගය එදින ප.ව. 5.30 සිට 8.30 දක්වා වෛජයන්ති ප්‍රාසාදය අබියස පවත්වන ලදි.

**ii. උතුරු සහ සබරගමු පළාත් මධ්‍යස්ථාන විවෘත කිරීම**

උතුරු පළාත් මධ්‍යස්ථානය 2014.07.15 දින කිලිනොච්චියේදී සහ සබරගමු පළාත් මධ්‍යස්ථානය 2014.07.18 දින කුරුවිටදී විවෘත කරන ලදි.

**iii. දිප ව්‍යාප්ත 05 වසර ශිෂ්‍යත්ව වැඩසටහන**

දිප ව්‍යාප්ත 05 වසර ශිෂ්‍යත්ව වැඩසටහනක් පවත්වන ලදි. එක් දිස්ත්‍රික්කයක වැඩසටහන් දෙකක් පවත්වන ලද අතර, එක් වැඩසටහනක් සිංහල මාධ්‍යයෙන්ද, අනෙක් වැඩසටහන දෙමළ මාධ්‍යයෙන්ද වශයෙන් දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි වැඩසටහන් පවත්වන ලදි. දෙමාපියන් අහිමි සහ එක් භාරකරුවකු පමණක් සිටින දරුවන්ගේ පාසල් ගමන දිරිමත් කිරීම සඳහා ඔවුන්ට පාසල් බෑග් සහ අවශ්‍ය අනෙකුත් උපකරණ පරිත්‍යාග කරන ලදි.

**iv. භාෂා සංගම් හරහා සමාජ ඒකාබද්ධතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

දිස්ත්‍රික්ක 23ක් තුළ භාෂා සංගම් සාමාජිකයින්ගේ සම්බන්ධීකරණයෙන් සමාජ ඒකාබද්ධතා වැඩසටහන් 23ක් ක්‍රියාවට නංවන ලදි. එක් වැඩසටහනක් සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු. 50,000.00කි.

**v. ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජා මූලික වැඩසටහන් පැවැත්වීම**

සමාජ ඒකාබද්ධතා සතිය තුළ ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජා මූලික වැඩසටහන්ද ක්‍රියාත්මක කරන ලදි. පෙර පාසල්, ළමා උද්‍යාන, සනීපාරක්ෂක පහසුකම්, වැඩිහිටි නිවාස, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ප්‍රජා ශාලා ප්‍රතිසංස්කරණය කිරීමද, කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම සහ පානීය ජලය ලබාදීම වැනි ක්‍රියාකාරකම් මෙම වැඩසටහනට ඇතුලත් විය. දිස්ත්‍රික්ක 17ක් ආවරණය වන පරිදි වැඩසටහන් 34ක් ආරම්භ කරන ලද අතර, ඒවා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

**vi. සරුංගල් උත්සවය**

2014.07.19 දින දිස්ත්‍රික්ක 07ක් තුළ මුහුදු තීරයන් ආශ්‍රිතව සරුංගල් උත්සවය පවත්වන ලදි. සරුංගල් උත්සවයට අමතරව, විවිධ සංස්කෘතීන්ට අයත් ගායන හා නර්තන සංදර්ශන විවිධ කණ්ඩායම් මගින් ඉදිරිපත් කරන ලද අතර, විවිධත්වයකින් යුත් කෑම වර්ග පැමිණ සිටි පිරිස අතර බෙදාදෙන ලදි. දිවයිනේ නන් දෙසින් පැමිණි විවිධ ජන වර්ගයන්ට අයත් ජනතාව එකිනෙකා කෙරෙහි සුහදතාවයකින් සමීප කරවීම මෙම උත්සවය සංවිධානය කිරීමේ අරමුණයි.

**vii. ජංගම සේවාව**

2014.07.15 දින කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ලද ජංගම සේවාව මගින් උප්පැන්න, විවාහ සහ මරණ සහතිකද, ජාතික හැඳුනුම්පත්ද ලබාදෙන ලදි. එමෙන්ම නීති ආධාර සහ වෘත්තීය නිපුණතාවයන් සඳහා පවතින රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු සැපයීමක්ද සිදුකරන ලදි.

**viii. සමාප්ති උළෙල**

2014.07.20 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සමාප්ති උත්සවය පවත්වන ලද අතර, එයට රාජ්‍ය, රාජ්‍ය නොවන, පෞද්ගලික අංශය සහ සිවිල් සංවිධාන ඇතුළුව සමාජ ඒකාබද්ධතා ක්‍රියාවලියට සම්බන්ධ විවිධ පාර්ශවයන් සහභාගී විය.

**ඇමුණුම 02**

**වැඩසටහන තුළින් ලබාදුන් ප්‍රතිලාභ:**

1. "ජාතික සමගිය උදෙසා ජනතා ප්‍රඥප්තිය" සහ ඒ සම්බන්ධයෙන් සෑම පුරවැසියෙකුගේම වගකීම පිළිබඳව ජනතාව දැනුවත් විය. සංස්කෘතික ස්ථාන පිළිබඳ දැනුවත් කිරීමේ චාරිකාවට සහභාගී වූ සිසුන් සහ අමාත්‍යාංශ නිලධාරීන් අතීත රජ සමයේ සිට ශ්‍රී ලාංකික ජන සමාජයේ පැවති ආගමික සහ සංස්කෘතික සබැඳියාව පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි. පොළොන්නරුව දිස්ත්‍රික්කය තෝරාගැනීම තුළින් දිවයිනේ කවර ස්ථානයකටත් වඩා සිංහල සහ දෙමළ සංස්කෘතික සහජීවනය මැනවින් පිළිඹිබු කිරීමට හැකිවිය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිංහල, දෙමළ සහ මුස්ලිම් පාසල් තුනක් නියෝජනය කරමින්, සිසුන් 75දෙනෙක් සහ අමාත්‍යාංශ නිලධාරීන් 20 දෙනෙක් ඒ සඳහා සහභාගී විය.

2. විවිධ සංස්කෘතීන්ට අයත් ගීත, රිද්ම සහ තාල සංයෝජනයක් තුළින් විවිධත්වයේ අලංකාරය මෙම ප්‍රසංගය තුළින් මැනවින් විදහා දක්වන ලදි. පැමිණ සිටි සියල්ලන් මෙම වැඩසටහන තුළින් අමන්දානන්දයට පත්වූ අතර, 800කට අධික පිරිසක් සහභාගී විය.

3. අමාත්‍යාංශය මගින් සපයනු ලබන සේවාවන් මෙම පළාත් මධ්‍යස්ථාන මගින් ජනතාවට ඉටුකර ගැනීමේ හැකියාව ලැබෙන අතර, මෙම උතුරු හා සබරගමුව පළාත් මධ්‍යස්ථාන හරහා ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය ආයතන සහ ජනතාව අතර සම්බන්ධීකරණය ඉහල නැංවීමටද හැකිවනු ඇත.

4. 05 වසර ශිෂ්‍යත්වයට අදාළ ආදර්ශ ප්‍රශ්න සහ පිළිතුරු සාකච්ඡා කිරීමටත්, දරුවන්ට විභාගයට පහසුවෙන් මුහුණ දීම සඳහා පෙරහුරුවක් ලබාදීමටත් ශිෂ්‍යත්ව වැඩසටහන මගින් හැකි විය. සිසුන් 16000ක් මෙම වැඩසටහන තුළින් ප්‍රතිලාභ හිමිකර ගන්නා ලදි. අනාථ දරුවන් සහ එක් භාරකරුවකු පමණක් සිටින දරුවන් පොත් බෑග් සහ අනෙකුත් උපකරණ ලබාදීම තුළින් පාසල් යාමට උනන්දු කරවීමට හැකියාව ලැබිණි.

5. දිස්ත්‍රික්ක 23ක් තුළ භාෂා සංගම් සාමාජිකයින් හරහා ක්‍රියාත්මක කරන ලද සමාජ ඒකාබද්ධතා අන්තර් සංස්කෘතික සංහිඳියාව, භාෂා දැනුම සහ නිපුණතා සහ ආකල්ප වර්ධනය කිරීමටත්, පාසල් උපකරණ බෙදාදීමට සහ නාම පුවරු භාෂාත්‍රයෙන් සකස් කිරීමටත් හැකිවිය.

6. පෙර පාසල්, ළමා උද්‍යාන, වැඩිහිටි නිවාස සහ ප්‍රජාශාලා ප්‍රතිසංස්කරණය කිරීමටත් සනීපාරක්ෂක පහසුකම් ඉහල නැංවීමටත්, කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ ලබාදීමට සහ පානීය ජලය සැපයීමටත් ප්‍රජා මූලික වැඩසටහන තුළින් හැකියාව ලැබිණි. දිස්ත්‍රික්ක 17ක් ආවරණය වන පරිදි ව්‍යාපෘති 34ක් ආරම්භ කරන ලද අතර, ඒවා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. අගෝස්තු මාසය තුළ නව ව්‍යාපෘති 18ක් ආරම්භ කිරීමටද නියමිතව ඇත.

7. සරුංගල් උත්සවය සඳහා විවිධ සංස්කෘතික, ආගමික සහ ජනවාර්ගික කණ්ඩායම්වලට අයත් ජනතාව එකට එක්වී සහභාගී වූ අතර, විවිධ සංස්කෘතීන්ට අයත් ගායන, නර්තන සහ විවිධ සංස්කෘතීන්ට අයත් ආහාර පාන රස විඳීම තුළින් විවිධත්වයේ අගය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමටද අවස්ථාව සැලසිණි.

8. කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති ජංගම සේවාව තුළින් 1500කට අධික පිරිසකට උප්පැන්න, විවාහ, මරණ සහතික සහ ජාතික හැඳුනුම්පත් ලබාගැනීමටත් නීති ආධාර ලබාගැනීමටත් අවස්ථාව සලසා දෙන ලදි.

9. සමාජ ඒකාබද්ධතා ක්‍රියාවලියට සම්බන්ධවී සිටින විවිධ පාර්ශවයන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති සමාප්ති උළෙලට සහභාගී විය. එහිදී අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද වීඩියෝ දැක්ම තුළින් අමාත්‍යාංශයේ කාර්යභාරය පිළිබඳව ඔවුන් දැනුවත් වූ අතර, ඔවුන්ගේ ක්‍රියාකාරකම් සහ යෝජනාද එහිදී ඉදිරිපත් කරන ලදි.

මෙම උත්සවය තුළින් සමාජ ඒකාබද්ධතා ක්‍රියාවලියට සම්බන්ධ පාර්ශවකරුවන් අතර සබඳතා ජාලයක් ගොඩනගා ගැනීමටද අවස්ථාව සැලසිණි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I wish to ask this Question from the Hon. Minister of Petroleum Industries.

1. The Minister of Mass Media and Information, Hon. Keheliya Rambukwella, exposed at a press briefing that Sri Lanka is importing oil from Iran through a third party. What was the reason for doing so?

2. The Minister of Mass Media and Information also mentioned that this is known to the United States. Is that also correct?

3. If you deny Questions 1 and 2, what made the Minister of Mass Media and Information say so and is it not a very serious indictment on the Government? What is the difference between a treacherous act and this statement?

4. The Ceylon Petroleum Corporation Refinery is geared up only for Iranian oil. If so, how have you been operating the Refinery? Please advise the House of the supplier, the country of origin and the ship or vessel that brought the crude oil to Sri Lanka.

5. From December, 2012, the Ceylon Petroleum Corporation has first imported two million barrels of crude oil from a company named KASB without a L/C and thereafter, via an unknown bank in Dubai through a L/C. Please confirm this matter.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Petroleum Industries)

Sir, the Answer to the Question is as follows:

1. Sri Lanka has not imported crude oil from Iran since mid-2012.

2. Does not arise.

3. I cannot comment on someone else's thinking. We have made it clear to everyone that we have not imported crude oil from Iran since mid-2012.

4. The Refinery is now run on a mixture made up of Murban crude oil (80 per cent) and Oman Export Blend (20 per cent) and both are imported on a tender process. In the bid document, we have specially mentioned non-Iranian origins, non-Iranian ports and non-Iranian entities in the petroleum procurement process.

5. Since mid-2012, we have imported crude oil on a L/C basis and rarely on other terms. Two State banks have refrained from dealing with the sanctioned entities since mid-2012 in regard to the petroleum products. The CPC has bought crude oil from the company named M/s KASB Petroleum FZCO, UAE on the basis of the tendering process. This company (M/s KASB) was a registered supplier of the CPC.

Thank you.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය මා යොමු කරන්නේ විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා වෙතයි.

ලෝකයේ එක් එක් රටවල පුරවැසි සේවාව සැපයිම සඳහා තොරතුරු හා සංනිවේදන තාක්ෂණය භාවිතා කරන අන්දම නියාමනය කරන එක්සත් ජාතීන්ගේ "රාජ්‍ය" සංවර්ධන වාර්තවට අනුව මේ වසරේ ශ්‍රී ලංකාව අද්වීතිය දියුණුවක් ලබා තිබෙන අතර, එම සමීක්ෂණයට අනුව ලෝකයේ රටවල් 193න් ශ්‍රී ලංකාව 74 වන ස්ථානයේ පසුවේ. අනෙක දකුණු ආසියාවේ හොඳම රට බවට ශ්‍රී ලංකාව පත්ව තිබේ.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්න යොමු කරනු කැමැත්තෙමි.

01. මෙම තත්ත්වයන් ශ්‍රී ලංකාවට ළඟා කර දීම සඳහා පසු ගිය කාලය තුළ වත්මන් රජය ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් කවරේ ද?

02. ජාත්‍යන්තරයේ අනෙකුත් රටවල් හා සැසඳීමේදී ශ්‍රී ලංකාව මේ සම්බන්ධයෙන් ලබා ඇති ජයග්‍රහණ කෙසේ ද?

03. තවදුරටත් මෙම තත්ත්වය ඉහළ නැංවීම හා අනාගතයේදී ගනු ලබන ක්‍රියාමාර්ග මොනවා ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - முதலீட்டு ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Minister of INVESTMENT PROMOTION)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නවලට පිළිතුරු සපයනවා.

01. 2012 දක්වා පැවති priu.gov.lk රාජ්‍ය නිල වෙබ් අඩවිය ඉවත් කිරීම.

    නව රාජ්‍ය නිල වෙබ් අඩවිය ලෙස www.gov.lk සකස් කිරීම.

    රජයේ ආයතන 150ක් පමණ තම ස්වයං වෙබ් අඩවි මගින් සපයනු ලැබූ සේවා ICTA විසින් ඒකාබද්ධ කිරීම.

    ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් වූ රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. එම රාජ්‍ය ආයතන සියල්ලේම නම් ඇතුළත් ලේඛනය මා **සභාගත***කරනවා.

02. ජාත්‍යන්තරයේ අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කිරීමේදී ශ්‍රී ලංකාව ලබා ගත් ජයග්‍රහණ හැටියට විශේෂ ළඟා කර ගැනීම් වනුයේ මාර්ග ගත කිරීම් තුළින් තොරතුරු සේවා සැපයීමට හැකිවීමයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

03. තවදුරටත් මෙම තත්ත්වය ඉහළ නැංවීම සඳහා කටයුතු කළ හැක්කේ - ශ්‍රී ලංකාව ගනු ලබන ක්‍රියාමාර්ග වන්නේ - විදුලි සංදේශ දර්ශකය හා මානව ප්‍රාග්ධන දර්ශකය තුළින් බව හඳුනාගෙන ඇත.

"OneGov 2020" වර්තමානයේ සැලසුම් අදියරේ පවතින අතර, (උපක්‍රම 15) එම ප්‍රදේශයන්හි විදුලි සංදේශ සහ මානව ප්‍රාග්ධන කටයුතු ඒකාබද්ධ කිරීම නව උපක්‍රමය මගින් සිදු කරනු ලැබේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මේ ප්‍රශ්නය යොමු කරන්නේ කෘෂිකර්ම අමාත්‍යතුමා වෙතයි.

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇළහැර ප්‍රාදේශය ලේකම් බලප්‍රදේශයේ ඇති කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණ ද?

(ii) මෙ වනවිට දුම්කොළ වවා ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර කොපමණ ද?

(iii) කුඹුරු ඉඩම්හි දුම්කොළ වැවීම සඳහා අවසර ලබා දීමට හේතු කවරේද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දුම්කොළ වගාව පසට හානිකර බවත්;

(ii) ගොවීන් දුම්කොළ වගාවට යොමු වී තිබෙන්නේ දුම්කොළ වගාවෙන් ලැබෙන ඉහළ ලාභය හා දුම්කොළ සමාගමෙන් ලැබෙන විවිධ වරප්‍රසාද නිසා බවත්;

(iii) වී වගාවට ඇති කුඹුරු ඉඩම්වල දුම්කොළ වැවීමෙන් ආහාර අර්බුදයකට මඟ පාදන බවත්;

(iv) ජලය ලබා දීමෙන් හා කුඹුරු ඉඩම්වල වැවීමට අවසර දීමෙන් රජය දුම්කොළ වගාව ප්‍රවර්ධනයට කටයුතු කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) සමාගම දුම්කොළ වගාව ව්‍යාප්ත කිරීමට මැදිහත් වීම පාලනයට එතුමා පියවර නොගන්නේ මන්ද;

(ii) ඇළහැර ප්‍රදේශයේ වී වගාව නගා සිටුවීමට එතුමා පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ කෙසේද;

(iv) එම ප්‍රදේශයෙන් දුම්කොළ වගාව ඉවත් කිරීමට එතුමා කටයුතු කරන්නෙහිද;

(v) එසේ නම් ඒ කෙසේද; කවදා සිටද;

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අක්කර 17,250යි.

(ii) අක්කර 375යි.

(iii) වී හෝ වෙනත් ආහාර බෝග වගා කිරීමට ප්‍රමාණවත් ජලය හිඟ අවස්ථාවලදී ගොවීන් විසින් වගා ළිං ජලය පොම්ප කර දුම්කොළ වගා කරයි.

(ආ) (i) දුම්කොළ පමණක් නොව අස්වනු ලබා ගන්නා ඕනෑම බෝගයක් වගා කිරීමෙන් පසෙහි පෝෂක හානි වීම සිදු වේ. එය වැළැක්වීමට පසට කාබනික හා රසායනික පොහොර යෙදීමත්, පාංශු සංරක්ෂණ ක්‍රම යෙදීමත් සිදු කරයි.

(ii) කලින් තීරණය කළ මිලකට අස්වනු මිල දී ගැනීම හා අවශ්‍ය යෙදවුම් සියල්ල සමාගම මගින් ගොවීන්ට ලබා දීම, ගොවි අරමුදල හා ගොවීන්ගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ශිෂ්‍යත්ව ලබා දීම වැනි හේතූන් නිසාත් විශේෂයෙන්ම ගොවීන්ට අළෙවි ගැටලුවක් නොමැති වීම නිසාත් ගොවීන් වගාවට පෙළඹේ.

(iii) වී වගා කළ හැකි කුඹුරු ඉඩම්වල කිසි විටකත් දුම්කොළ වගා කිරීම සිදු නොකෙරේ.

(iv) වාරි ජලය සපයන කුඹුරු ඉඩම්වල කිසිවිටකත් දුම්කොළ වගා කිරීම සිදු නොකරයි.

(ඇ) (i) දුම්කොළ වගාව තහනම් වගාවක් නොවේ. ලංකාවේ පරිභෝජනයට ප්‍රමාණවත් වන අයුරින් හෙක්ටෙයාර් 2500ක් වගා කිරීමට අවසර ලබා දී තිබේ. නමුත් වසරින් වසර සිගරට් අළෙවිය අඩු වන නිසා මෙම වගා වපසරිය වසරින් වසර අඩු වේ. එය ඇමුණුමෙහි දැක්වේ. ඇමුණුම**සභාගත*** කරමි.

(ii) ඔව්.

(iii) කාබනික පොහොර භාවිතයට ගොවීන් යොමු කරවීමට හා කාබනික පොහොර නිෂ්පාදනයට ගොවීන් දිරිමත් කරවීමට ද්‍රව්‍යමය ආධාර ලබා දීම.

ගොවීන්ගේ වී වගාවේ අස්වැන්න ඉහළ නැංවීමට පැරණුට් තැටි භාවිත කිරීමට ගොවීන් යොමු කරවීම.

අනවශ්‍ය කෘමි නාශක යෙදීම අවම කිරීම සඳහා ඒකාබද්ධ පළිබෝධ පාලන වැඩසටහනක් හඳුන්වා දීම.

කාවු කරන ලද දහයියා භාවිත කිරීමට ගොවීන් යොමු කරවීම.

ගොවීන්ගේ වගා ගැටලු නිරාකරණය කිරීමට බෝග සායන පැවැත්වීම.

ගොවීන් අතර සංවිධාන ගොඩ නගා ඔවුන් සවිබල ගැන්වීම.

(iv) කෘෂිකර්ම අමාත්‍යාංශය පොලිස් බලතල ක්‍රියාත්මක කරනු නොලැබේ.

(v) පැන නොනඟී.

(ඈ) අදාළ නොවේ.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙතටයි.

(අ) (i) ගාලුමුවදොර අක්කර 10ක ඉඩම ෂැන්ග්‍රි-ලා සමාගමට පැවරීමේ ගනුදෙනුවේ වටිනාකම කොපමණද?

(ii) එම ගිවිසුම අත්සන් කළේ කා අතරද? කවදාද?

(iii) එම ගනුදෙනුවේ ස්වභාවය කෙසේද?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අජිත් කුමාර මහතා]

(ආ) එම ඉඩම් ගනුදෙනුවට අදාළව,

(i) එම මුදල් ලැබුණේ කවදාද? මුදල කොපමණද?

(ii) කුමන ආකාරයෙන්ද?

(iii) එම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද්දේද?

(iv) බැර කළේ නම් ඒ කවදාද?

(v) ඒ කොපමණ මුදලක්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) අදාළ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර නොකළේ නම්,

(i) අදාළ මුදල බැර කරන ලද්දේ කවර ගිණුමකටද? කවදාද?

(ii) කොපමණ මුදලක්ද?

(iii) අවසරය හා අනුමැතිය ලබා දුන්නේ කවුරුන්ද?

(iv) දැනට එම මුදල් තැන්පත් කර ඇත්තේ කවර ගිණුමේද?

(v) එම මුදලේ වත්මන් ශේෂය කොපමණද?

(vi) එම මුදල් කවර ව්‍යාපෘතියක් සඳහා භාවිත කරන්නේද?

(vii) ඒ සඳහා අවසරය හා අනුමැතිය ලබා දුන්නේ කවුරුන්ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් යොමු කරන ලද ප්‍රශ්නයට, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුර දෙනවා.

(අ) (i) ඇමෙරිකන් ඩොලර් මිලියන 125කි. (රුපියල් මිලියන 13,749යි)

(ii) රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන අනුව රජය මෙම ඉඩම ෂැන්ග්‍රි-ලා හොටෙල්ස් ලංකා (පුද්) සමාගම වෙත පහත සඳහන් පරිදි පවරන ලදී.

අක්කර 04 ඉඩම 2011 මාර්තු 11 (ඇමෙරිකන් ඩොලර් මිලියන 50 - රුපියල් මිලියන 5,499)

අක්කර 06 ඉඩම 2010 දෙසැම්බර් 28 (ඇමෙරිකන් ඩොලර් මිලියන 75 - රුපියල් මිලියන 8,250)

(iii) සම්පූර්ණ පැවරීමකි.

(ආ) (i) ඇමෙරිකන් ඩොලර් මිලියන 125ක මුදල ලංකා බැංකුවේ අංක 71213619 දරන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ (නාගරික සංවර්ධන අරමුදල්) ගිණුමට පහත ආකාරයෙන් බැර කරන ලදී.

ඇමෙරිකන් ඩොලර් මිලියන 75 (රුපියල් මිලියන 8,250) - 2010.12.28

ඇමෙරිකන් ඩොලර් මිලියන 50 (රුපියල් මිලියන 5,499) - 2011.03.09

(ii) ඉහත විස්තර දක්වා ඇත. (අදියර දෙකකින්)

(iii) ඔව්.

(iv) 2010.12.28 හා 2011.03.09 යන දින දෙක ඇතුළත මාස හතරකදී සම්පූර්ණ ගනුදෙනුව අවසන් විය.

(v) ඇමෙරිකන් ඩොලර් මිලියන 125 (රුපියල් මිලියන 13,749)

(ඇ) අදාළ නොවේ.

ඒ වාගේම මෙම ගනුදෙනුවට සම්බන්ධ ඔප්පුවේ පිටපතක්, පැවරීමේ ඔප්පුවේ පිටපතක් සහ ඒ වාගේම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට මුදල් ලැබුණු බව, නාගරික සංවර්ධන අධිකාරියේ ගිණුමට මුදල් බැර කළ බව සහ ලංකා බැංකුවේ ඒ මුදල් බැර කළ රිසිට් පත් ආදී සියලු දේවල් **සභාගත*** කරනවා. මෙම ඉඩමේ අක්කරයක සම්පූර්ණ වටිනාකම දළ වශයෙන් රුපියල් ලක්ෂ 13,790ක් වන අතර, මෙය ශ්‍රී ලංකාවේ මෙතෙක් කරන ලද ඉඩම් ගනුදෙනුවලින් කුඩා ඉඩම් ප්‍රමාණයකට ලැබුණු විශාලතම මුදල වන අතර, විනිවිදභාවයකින් යුතුව මෙය රජයේ තක්සේරුවට අනුව ලබා ගත් ඉහළම මුදල බවත් සඳහන් කරන්න කැමැතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I call upon the Hon. M.S. Thowfeek to raise the next Question. [Pause.] - Not here. Then, I call upon the Hon. Alhaj A.H.M. Azwer.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා වෙතටයි.

වතුකරය ආශ්‍රිතව ජීවත් වන වතු කම්කරු ජනතාව වෙනුවෙන් පසු ගිය කාලය තුළ මෙම රජය මඟින් විශාල සංවර්ධනයක් කර ඇති අතර, එහි ජීවත් වන කම්කරු ජනතාවට විශාල වශයෙන් සහන ලබා දී තිබේ.

ඒ අනුව, වතුකරයේ කම්කරු ජනතාව වෙනුවෙන්,

(i) ඔවුන්ගේ වැටුප් නංවාලීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද?

(ii) ඔවුන්ට සේවා පහසුකම් සැලසීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග මොනවාද?

(iii) පොදුවේ ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා කුමන ක්‍රියා මාර්ග ගනු ලැබුවේද?

இவ்வினா தோட்டத் தொழிலாளர்கள் சம்பந்தமாக இருப்பதனால், இதன் தமிழ் மொழிபெயர்ப்பையும் 'ஹன்சாட்' அறிக்கையில் பதியுமாறு கேட்டுக்கொள்கின்றேன்.

தொழில், தொழில் உறவுகள் அமைச்சருக்கான வினா:

பெருந்தோட்ட பிரதேசங்களில் வசிக்கும் தோட்டத் தொழிலாளர் சமூகத்துக்கு கடந்த காலங்களில் அரசாங்கம் பெருமளவு அபிவிருத்திகளை மேற்கொண்டுள்ளதோடு, அங்கு வசிக்கும் தொழிலாளர்களுக்கு பெருமளவு நிவாரணங்களையும் வழங்கியுள்ளது.

அதன் பிரகாரம், தோட்டத் தொழிலாளர்களுக்காக,

i. இவர்களுடைய சம்பளங்களை அதிகரிப்பதற்கு மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகள் யாவை?

ii. இவர்களுக்கு சேவை வசதிகளை வழங்குவதற்கு மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகள் யாவை?

iii. இவர்களுடைய வாழ்க்கைத்தரத்தை மேம்படுத் துவதற்கு பொதுவாக மேற்கொள்ளப்பட்ட நடவடிக் கைகள் யாவை?

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (කම්කරු හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - தொழில், தொழில் உறவுகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekara - Deputy Minister of Labour and Labour Relations)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම ප්‍රශ්නයට කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුර දෙනවා.

I. ප්‍රාදේශීය වැවිලි සමාගම් හා වතු වෘත්තිය සමිති අතර වරින් වර අත්සන් කරනු ලැබූ සාමූහික ගිවිසුම් මඟින් ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට අයත් තේ වතුවල සේවය කරන කම්කරුවන්ගේ දෛනික වේතනය ඉහළ නංවා ඇත. 2005.06.01 දිනට රුපියල් 135.00ක් වූ දෛනික වැටුප 2006.10.01 දින සිට රුපියල් 170.00ක් වී ඇත. ඉන් අනතුරුව 2009.04.01 දින සිට දෛනික වැටුප රුපියල් 285.00ක් දක්වා වැඩි වී ඇති අතර, 2011.04.01 දින සිට එය රුපියල් 380.00ක් දක්වා වැඩි වී ඇත. ඉහත දැක්වූ සාමූහික ගිවිසුම් පෞද්ගලික වතු අංශය සඳහාද ඒ ඒ අවස්ථාවේදී දීර්ඝ කරනු ලැබ ඇති අතර ඒ අනුව එම දෛනික වැටුප් ඒ ආකාරයෙන්ම පෞද්ගලික වතුවල සේවකයන් සඳහා ද අදාළ වී ඇත.

තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තයෙහි නිරත වන සේවකයන්ගේ දෛනික අවම වේතනය තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව මඟින් තීරණය කිරීමට 2014 වර්ෂයේදී පියවර ගන්නා ලදුව, 2014.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම සේවකයන්ගේ දෛනික අවම වේතනය රුපියල් 405.00ක් වශයෙන් තීරණය කර ඇත. මෙම තීරණය 2014.07.24 දිනැති අංක 1872/31 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇත. ඒ අනුව 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ දෛනික අවම වේතනය රුපියල් 380.00 වෙනුවට, 2014.08.01 දින සිට රුපියල් 405.00ක් වන දෛනික අවම වේතනය ක්‍රියාත්මක වේ. මෙම දෛනික අවම වේතනයට අතිරේකව සෑම සේවා යෝජකයෙකු විසින්ම රුපියල් 40.00ක දෛනික අය වැය සහන දීමනාවද සේවකයන් සඳහා අනිවාර්යයෙන්ම ගෙවිය යුතු වේ. ඒ අනුව තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව මඟින් ආවරණය වන සේවකයෙක් සඳහා දෛනිකව රුපියල් 445.00ක් ගෙවිය යුතු අතර, මෙම රුපියල් 445.00ක ප්‍රමාණය, සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම්, අතිකාල ගෙවීම් ආදිය සඳහාද අදාළ කර ගත යුතු වේ.

ප්‍රාදේශීය වැවිලි සමාගම් හා වතු වෘත්තිය සමිති අතර වරින් වර අත්සන් කරනු ලැබූ සාමූහික ගිවිසුම් මඟින් ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට අයත් රබර් වතුවල සේවය කරන කම්කරුවන්ගේ දෛනික වේතනය ඉහළ නංවා ඇත. 2005.06.01 දිනට රුපියල් 135.00ක් වූ දෛනික වැටුප 2006.10.01 දින සිට රුපියල් 170.00ක් වී ඇත. ඉන් අනතුරුව 2009.04.01 දින සිට දෛනික වැටුප රුපියල් 285.00ක් දක්වා වැඩි වී ඇති අතර 2011.04.01 දින සිට එය රුපියල් 380.00ක් දක්වා වැඩි වී ඇත. ඉහත දැක්වූ සාමූහික ගිවිසුම් පෞද්ගලික වතු අංශය සඳහාද ඒ ඒ අවස්ථාවේදී දීර්ඝ කරනු ලැබ ඇති අතර, ඒ අනුව එම දෛනික වැටුප් ඒ ආකාරයෙන්ම පෞද්ගලික වතුවල සේවකයන් සඳහාද අදාළ වී ඇත.

රබර් වැවීමේ හා සැදීමේ කර්මාන්තයේ යෙදී සිටින සේවකයන්ගේ දෛනික අවම වේතනයද 2014 වර්ෂයේදී රබර් වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව මඟින් තීරණය කිරීමට පියවර ගන්නා ලදුව 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන රුපියල් 380.00ක් වන දෛනික අවම වේතනය වෙනුවට මූලික රැස්වීමේදී දෛනික අවම වේතනය රුපියල් 405.00ක් වශයෙන් තීරණය කරනු ලැබ, එම තීරණය සම්බන්ධයෙන් විරෝධතා කැඳවීම් සිදු කර අවසන් කර ඇත. ඉන් අනතුරුව දෛනික අවම වේතනය ස්ථිර කර ගැනීම සඳහා 2014 සැප්තැම්බර් 02 දිනට එම පඩි පාලක සභාව රැස්වීමට නියමිතව ඇති අතර, එම තීරණය අදාළ පඩි පාලක සභාව මඟින් ස්ථිර කර ගැනීමෙන් අනතුරුව ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගෙන ගැසට් පත්‍රය හා පුවත් පත් මඟින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරනු ලැබේ. එලෙස තීරණය කරනු ලබන දෛනික අවම වේතනයට අතිරේකව රුපියල් 40.00ක දෛනික අය වැය සහන දීමනාවද සේවකයන් සඳහා අනිවාර්යයෙන්ම ගෙවිය යුතු වේ.

තවද වතු කම්කරුවන් නොවන වතු කාර්ය මණ්ඩල සේවකයන් සඳහා ආවරණය වන පරිදි වරින් වර අත්සන් කර ඇති සාමූහික ගිවිසුම් මඟින් ඔවුන්ගේ වැටුප් ද වැඩි වී ඇත. 2014 වර්ෂයේදී තාක්ෂණික, ලිපිකරු, අධීක්ෂක, වෛද්‍ය, නඩත්තු සහ සහායක ශ්‍රේණිවල වතු කාර්ය මණ්ඩල සේවකයන් සඳහා අත්සන් කරනු ලැබූ සාමූහික ගිවිසුම් මඟින් ඔවුන්ගේ වැටුප් 25% කින් වැඩි වී ඇත.

II. දැනට තනි නිවාස 25,000ක් ඉදි කර ලබා දී ඇත. ඊට අමතරව ඉන්දියානු රජයෙන් තනි නිවාස 4,000ක්ද නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගය මත නව නිවාස 50,000ක්ද සෑදීමට තීරණය කොට ඇත.

තවද කම්කරු පවුල් 135,000කට පමණ පානීය ජලයද, වැසිකිළි 128,000ක්ද ලබා දී ඇති අතර ළමා සංවර්ධන මධ්‍යස්ථාන 1,544ක් දැනටමත් පවත්වා ගෙන යන අතර වතුකරයේ නැණසල 50ක් සඳහාද දායකත්වය ලබා දී ඇත. තවද නිවාස 111,000ක අලුතින් වහල් සෙවිලි කිරීම් ද කර දී ඇති බව දන්වමි.

III. පොදුවේ ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟාලීමට සහ නිපුණතා දියුණු කිරීමට වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කර ඇති අතර, එම වැඩසටහන් අභ්‍යාස විද්‍යාලවල ක්‍රියාත්මක වෙමින් පවතින බවත් දන්වමි.

නැණසලවල් තවදුරටත් ඉදි කරමින් පවතින අතර, ඔවුන්ගේ සෞඛ්‍ය පහසුකම් සඳහා අවශ්‍ය වන ගිලන් රථද ලබා දී ඇත. එම ප්‍රදේශවල සේවය කරන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින්ට මෝටර් රථ ලබා දී ඇති බැවින් ඔවුන් එම සේවා පහසුවෙන් ඉටු කරනු ලබයි.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙතටයි.

1. මීගමුව මහරෝහලේ මසකට 50,000කට අධික රෝගීන් සංඛ්‍යාවක් ප්‍රතිකාර ලබන බවත්, හෙද 100ක්, ඖෂධවේදීන් 7ක්, කනිෂ්ඨ කාර්ය මණ්ඩලය 50ක් පමණ පුරප්පාඩු වී ඇති බවත් පිළිගන්නේද?

2. එම පුරප්පාඩු පිරවීම සඳහා කොපමණ කාලයක් ගතවේද?

3. මෙම රෝහලේ අලුතින් ඉදිකරන ලද මහල් ගොඩනැඟිල්ලේ තට්ටුවල ජල කාන්දුවක් ඇති වීම හේතුවෙන් රෝගීන් ඉවත් කිරීමට සිදුවූ බවත්, එය කඩා වැටීමේ අවදානමකට ලක්ව ඇති බවත් දන්නේද?

4. එහි පිළිසකර කටයුතු නිම කිරීමට කොපමණ කාලයක් ගතවේද?

5. රෝහලේ වාට්ටු 2ක් තුළ ඖෂධ ගබඩාව පිහිටුවීමෙන් ඖෂධවල ප්‍රමිතිය රැක ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති බැවින් හා රෝගීන් ඉවත් කිරීමටද සිදුවූ බැවින් සුදුසු ඖෂධ ගබඩාවක් ලබා දීමට කටයුතු කරන්නේද?

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

6. මෙහි මෘත ශරීරාගාරයේ ශීතකරණය කැඩී ඇති බවත්, රෝහලේ මලාපවාහන පද්ධතිය අබලන්ව ඇති බවත්, විදුලිජනක යන්ත්‍රය යල් පැන ගිය, අවශ්‍ය ධාරිතාවය සැපයිය නොහැකි එකක් බවත් පිළිගන්නේද? ඒවා යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරන්නේද?

7. මෙම රෝහලේ ඖෂධ හිඟයක්, ශල්‍යාගාරය හා අනෙකුත් විශේෂඥ අංශවල උපකරණ හිඟයක් ඇති බව පිළිගන්නේද? මෙම අඩු පාඩු හැකි ඉක්මනින් සම්පූර්ණ කිරීමට කටයුතු කරන්නේද?

8. මෙම ප්‍රදේශයේ හෘද රෝගීන් විශාල සංඛ්‍යාවක් සිටින බැවින් හෘද රෝග ඒකකයක් පිහිටුවීමට කටයුතු කරන්නේද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

| | | | |
|---|---|---|---|
| 1. | මුළු කාර්ය මණ්ඩලය අනුමැතිය | - | 299 |
| | FR 71 | - | 60 |
| | | | 359 |
| | දැනට සිටින සංඛ්‍යාව | | (307) |
| | පුරප්පාඩු සංඛ්‍යාව | | 52 |
| | නව පත්වීම් සංඛ්‍යාව | | 3 |
| | දැනට පුරප්පාඩු සංඛ්‍යාව | | 49 |

ඔව්. එයට හේතු ලෙස,

i. රෝහලට නව ඒකක එකතු වීම (ඩෙංගු රක්තපාත උණ කළමනාකරණ මධ්‍යස්ථානය විශේෂිත ඒකකය සඳහා සහ පවුල් සෞඛ්‍ය සායනය, මානසික රෝග වාට්ටුව, විකලාංග ශල්‍ය වාට්ටු ඒකක)

ii. මූලික රෝහල් තත්ත්වයෙන් දිස්ත්‍රික් මහ රෝහලේ තත්ත්වයට උසස් කිරීමෙන් ප්‍රධාන විශේෂඥ වෛද්‍යවරුන්ගේ ඒකක දෙගුණ වීම නිසා ඇති වූ අවශ්‍යතාව

iii. රෝහලට ප්‍රතිකාර සඳහා පැමිණෙන ජනතාවගේ ප්‍රමාණය වැඩිවීම

iv. කාලයක සිට පළාත තුළ නිලධාරින් ප්‍රමාණය බෙදා හැරීමේදී ඇතිවූ විෂමතාව (Maldistribution) සහ රෝහලේ සේවය කිරීමට ඇති ඉල්ලුම අවම වීම.

v. විදේශ නිවාඩු සහ ප්‍රසූත නිවාඩු දෙවසරකට වඩා ගත් සංඛ්‍යාවද ගැටලුවක් වී ඇත.

vi. ගමනාගමන බස් සේවාව ගම් ප්‍රදේශවලට රාත්‍රී 7න් පසු නොමැතිවීම.

2. 2013 වර්ෂයේදී නව පත්වීම් එකක්වත් ලබා දී නොමැත.

මධ්‍යම රජයෙන් හා වෙනත් රෝහල්වලින් ස්ථාන මාරුවීම් ලබා පැමිණෙන වැඩි දෙනෙක් ඉල්ලුම් කරනු ලබන්නේ ගම්පහ මහ රෝහල, වතුපිටිවල, දිවුලපිටිය, මීරිගම, රදාවාන, දොම්පෙ වැනි රෝහල්ය. එම රෝහල්වල දැනටමත් කාර්ය මණ්ඩල ප්‍රමාණය ඉක්මවා ඇත. බොහෝ කාලයක සිට බස්නාහිර පළාතට නව පත්වීම් මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් හෙදියන් අනුයුක්ත කර නොමැත. මෙවර 2014 වසර සඳහා බස්නාහිර පළාතට ලැබුණේ නව පත්වීම් 10ක් පමණි. ඉන් තිදෙනෙක් මීගමුව රෝහලට සැප්තැම්බර් මස 01වැනි දා සිට අනුයුක්ත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

3. තවමත් පරීක්ෂණ තත්ත්වයේ පසු වේ.

මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් විශේෂ ව්‍යාපෘතියකින් මීගමුව හා ගම්පහ රෝහල්වල "කියැන්(ග්) යැම්" නම් කොරියානු සමාගම විසින් බස්නාහිර පළාත් සභාවට ලබාදෙන ලද ගොඩනැඟිලි 02කි. මෙම ගොඩනැඟිලි 02 සඳහා උපදේශක සේවා ලබා දී ඇත්තේ "තුරෙයිරාජා සමාගම" විසිනි. මෙම ඉදිකිරීම් සිදු කරන අවස්ථාවේදී පළාත් සභාවේ ඉංජිනේරුවරුන්ගේ අධීක්ෂණයකින් තොරව ඉදිකර ඇත. මෙම ගොඩනැඟිලි 02 භාර දුන් විගසම මෙහි පැවති ජල කාන්දුව පිළිබඳව රෝහලේ කාර්ය මණ්ඩල දැනුවත් වී ඇති අතර අවස්ථා කිහිපයකදීම විදුලි කාන්දුවීම්ද සිදුවී ඇත. එය පළාත් මට්ටමින් යම් පිළිසකර කිරීම්වලින් මෙම තත්ත්වයන් යම් තරමකින් මග හරවා ගත හැකි විය. 2006 වර්ෂයේදී කියන්යැන් සමාගම සමඟ එළැඹුණු අවබෝධතා ගිවිසුමකින් පසු අලුත්වැඩියා කටයුතු ආරම්භ කළද එය අසාර්ථක විය. මේ පිළිබඳව මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයද දැනුවත් කර ඇත.

මේ පිළිබඳ ගරු සෞඛ්‍ය ඇමතිතුමා පළාත් ඉංජිනේරු කාර්ය මණ්ඩලය, පළාත් සෞඛ්‍ය ලේකම් ඇතුළුව සාකච්ඡාවක් පැවති අතර එහිදී මෙම ගොඩනැඟිල්ල තවදුරටත් පාවිච්චි කළ හැකි බවට තහවුරුවක් ලබා ගැනීමට මොරටුව විශ්වවිද්‍යාලය, පරමාණු බලශක්ති අධිකාරිය ඒකාබද්ධව පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීමට තීරණය කර ඇත. විටින් විට ඇතිවන විදුලි, වායු සමීකරණ ගැටලු සහ ජල කාන්දුවීම් නිසා ලෙඩුන් සහ කාර්ය මණ්ඩලය අපහසුතාවට පත් වේ. ඒ සඳහා අගෝස්තු 11වැනි දින පළාත් සෞඛ්‍ය අමාත්‍යතුමා, පළාත් සෞඛ්‍ය ලේකම්තුමා, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමිය ඇතුළු කණ්ඩායමක් රෝහල් නිරීක්ෂණ චාරිකාවකට සහභාගි විය. එහිදී ස්ථානීය පරීක්ෂාවක් කොට ගොඩනැඟිල්ල සඳහා වෙනත් සත් මහල් නව ගොඩනැඟිල්ලක් සෑදිය යුතු බවත් ඉහළම මාලයේ සිට පහළ මාලය දක්වා ඇති පිපිරුම්, ඉරිතැලීම්, විදුලි කාන්දුවීම්, ජල කාන්දුවීම් සියල්ල සලකා බැලීමේදී හැකි ඉක්මනින් නව ගොඩනැගිල්ලකට යා යුතු බවත් තීරණය විය.

නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට මූල්‍යමය ප්‍රතිපාදන සෙවීම කළ යුතු බවත්, දැනට එවැනි විශාල මුදලක් නොමැති වීම නිසා ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා හමුවී ඉල්ලීමක් කිරීමට සාකච්ඡා කරන ලදී.

4. අදාළ වාර්තාව ලබා ගැනීමෙන් පසු පළාත් සභාවේ ඉංජිනේරු කාර්ය මණ්ඩලය හා සාකච්ඡා කර තීරණයකට එළැඹෙනු ඇත.

5. නව ගොඩනැඟිල්ලක් ඉදි කළහොත් දැනට රෝහලේ පවත්වාගෙන යන ගබඩාව සඳහා අවශ්‍ය පහසුකම් සැපයිය හැකිය.

6. දැනට මෙම රෝහලේ මෘත ශරීරාගාර ශීතකරණ 02ක් ඇත. ඉන් එකක් ක්‍රියා විරහිත වී ඇත. ක්‍රියාකාරී මෘත ශරීරාගාර ශීතකරණයේ මෘත ශරීර 04ක් තැන්පත් කළ හැක. නමුත් දැනට එහි 08ක් තැන්පත් කරනු ඇත. මෙම මෘත ශරීර සියල්ලම රෝහලෙන් මරණයට පත් වූ පුද්ගලයන්ගේ මෘත ශරීර නොවන අතර පොලීසිය විසින් පොලිස් පරීක්ෂණ නිම වන තෙක් තැන්පත් කර ඇති මෘත ශරීර වන අතර කඩිනමින් පොලිස් පරීක්ෂණ පවත්වා ඉහත කී මෘත ශරීර ඉවත් කර ගන්නා මෙන් පොලිස්පතිතුමා දැනුවත් කරන්නේ **නම් මැනවි.**

ක්‍රියා විරහිතව ඇති මෘත ශරීරාගාර ශීතකරණය යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරමින් පවතී.

7. මීගමුව රෝහල සඳහා මධ්‍යම රජය විසින් ඩෙංගු විශේෂ හා දැඩිසත්කාර ඒකකයක් මෙන්ම ඊට අවශ්‍ය උපකරණද ලබා දී ඇත.

   2013 වසරේදී ශල්‍යකර්ම කටයුතු වෙනුවෙන් තාක්ෂණික වෛද්‍ය උපකරණ (Video laparoscopy) වටිනාකම් මිලියන 12කි.

   2014 වසරේදී විකලාංග ශල්‍ය වෛද්‍ය ඒකකයට විකලාංග ශල්‍ය ඇඳක් දැනටමත් ඇණවුම් කර ඇත. වටිනාකම ලක්ෂ 35කි.

   ඒ අනුව අනෙකුත් අඩු පාඩුද හැකි ඉක්මනින් ලබා දීමට කටයුතු කරනු ඇත.

8. හෘදය රෝග විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනෙකු දැනට හෘදය රෝග සායන 02ක් පවත්වාගෙන යන අතර විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවය උපරිම වශයෙන් ලබා ගෙන ඇත. හෘදය රෝග පිළිබඳ අංග සම්පූර්ණ ඒකකයක් ඉදිරියේදී පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙතටයි.

1. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ CM 7536 දරන පත්‍රිකාවට 2014.06.30 ලබා දී ඇති සභාපතිගේ ආවරණ අනුමැතිය පරිදි සංස්ථාවේ වයස අවුරුදු 57ට වැඩි සියලු සේවකයන් අංක 01/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයෙහි III ඡේදයට වැරදි අර්ථකථනයක් දෙමින් හා එය උල්ලංඝනය කරමින් විශ්‍රාම ගැන්වීමට කටයුතු කරන්නේද?
2. මෙම නිලධාරින් කාර්යක්ෂම හා සතුටුදායක සේවයක් කිරීමට නොහැකි පුද්ගලයන් ලෙස ගෙන ඇති තීරණයට ඔබතුමා එකඟ වන්නේද?
3. එසේ නම් මේ වන විට සංස්ථාවේ සේවය කරන අවුරුදු 57 ඉක්මවූ සියලුම නිලධාරින් විශ්‍රාම ගැන්වීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට කටයුතු කර තිබේද?
4. තව දුරටත් සේවයේ යොදවාගෙන සිටින අවුරුදු 57 ඉක්මවූ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු එවන් නිලධාරින් හා ඔවුන්ගේ වයස සහ නම් වෙන් වෙන් වශයෙන් සඳහන් කර ඔවුන් සේවයේ යෙදවීමට හේතු කවරේද යන්නත් සඳහන් කරන්නේද?
5. විශ්‍රාම ගැන්වීම හේතුවෙන් එම පිරිස හට අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන්ට ලැබී ඇති වරප්‍රසාද කඩවීමක් මෙන්ම අසමාන ලෙස සැලකීමක් සහ අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද?
6. අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන්ට මෙන් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013 අනුව සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස වන අවුරුදු 60 දක්වා සේවයේ රැඳී සිටීමට මෙම සංස්ථාවේ සේවකයන් හටද ඉඩ ප්‍රස්තාව ලබා දීමට කටයුතු කරන්නේද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කරුණු සියල්ලම සීඒ253/2014 writ application එක මඟින් උසාවියට ඉදිරිපත් කරලා තිබෙන බව ඉතා කනගාටුවෙන් වුවත් ප්‍රකාශ කරන්නට වෙනවා. මේ කරුණු සියල්ලම සහ ඊට සමාන්තර කරුණු ගණනාවක් එහි ඇතුළත් වෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී මේ ප්‍රශ්නයට අදාළව සවිස්තර ප්‍රකාශයක් කිරීමෙන් යම් පාර්ශ්වයකට හෝ අගතියක් වෙයි කියන විශ්වාසය මට තිබෙනවා. ඒ නිසා එම නඩු විභාගයෙන් පසුව මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීමට බලාපොරොත්තු වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.10ට, 2014 අගෝස්තු 21වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 7.10 மணிக்கு பாராளுமன்றம், 2014 ஓகஸ்ட் 21, வியாழக்கிழமை பி.ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 7.10 p.m. until 1.00 p.m. on Thursday, 21st August, 2014.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.